2013 දෙවන කලාපය
ISBN-1391-314X

# සන්නිවේදක

## THE COMMUNICATOR




## ලංකාවේ ජනමාධ්‍ය කොයිබටද ?

40 වන සංවත්සරය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

# සන්නිවේදකයා

## THE COMMUNICATOR

2013 දෙවන කලාපය


02 කවරයේ කතාව - ලාංකේය ජනමාධ්‍ය කොයිබට ද?

06 වෙරෝනිකා ගුවේරින්

08 මාධ්‍ය නිදහස සැබැවින් ම කා සඳහා ද? කුමක් අරබයා ද?

10 හැඟීම්වලට වහල් (නො) වීමේ නිදහස

13 නව මාධ්‍යයේ පුවත්පත් කසාදය - යා දෙක නොරත රත

14 මතකයන් රැගෙන එන පත්තිදේ කතාන්දරය

15 අතිසාරයට අමුඩ ගැසීම

17 කෙටිම කෙටි කෙටි කතාව

18 තවත් එක් වසන්තයක්

20 සැබෑ සංවර්ධනයක් කරා

22 මැනුවෙල් කැස්ටෙල්ස්

25 ලෝක සිනමාවේ මං පෑළුල් කළ පරිගණක සජීවිකරණය

29 නව සංස්කෘතියේ නිමැවුම්කරු

31 ජීවිතය, පරිසරය හා නීතිය

34 ශ්‍රේෂ්ඨ සන්නිවේදකයෙකු බිහිවන්නේ කෙසේ ද?

35 හඳුනාගත්තොත් ඔබ මා

37 ආදර වස්තුව

39 මල් පාරේ මහ වැස්සක්

40 මට මාවත් අහිමි කළා මුහුණු පොතේ කුමාරයා


### සංස්කාරක සටහන

ජනමාධ්‍ය සමාජයේ පෙරගමන්කරුවෙකි. සමාජය මනාව දැකීමේ ශක්‍යතාව ජනමාධ්‍යවේදියා සතුවිය යුතු ය. ජනමාධ්‍යය එකතැන පල්වන්නේ නම් එයින් නැගෙන්නේ දුර්ගන්ධයකි. එයින් ග්‍රාහකයාගේ මනස රෝගී වේ. ගලන ජලය පිරිසිදු ය. රැඳෙන ජලය අපිරිසිදු ය. සමාජ ගවේෂණය, නිරීක්ෂණය, සත්‍ය වාර්තාකරණය, ජනමාධ්‍යයෙන් සිදුවිය යුත්තකි. මෙය වටහාගත් ජනමාධ්‍යවේදීන් අද අපට අවශ්‍යව තිබේ.

ජනමාධ්‍ය කොයිබට ද? අපට ප්‍රශ්න කීපයක් පැන නැගී ඇත. රතුපස්වල -නුරි චතුයාගේ සිදුවීම ජනමාධ්‍ය වාර්තා කරන්නේ මෑතකදී ය. ඒ මරණ ගණනාවක් සිදු වූ පසු ය. නමුත් ඒ සිදුවීම ආරම්භ වන්නේ මීට දශකයකට පමණ පෙරදී ය. සක්විති ලා, රුවන්වැල්ලේ සෝභිත ලා සමාජයේ පිල්විහිදන්නේ ජනමාධ්‍ය තුළ රංගනයෙනි. උදාසනට රාහු කාලය කියාදෙන ජනමාධ්‍ය සවස් භාගයේ ලේ ගංගාවන් ගැන වාර්තා කරයි. මාධ්‍යකරුවන්ගේ ලෝකය අපගේ දරුවන්ගේ ජනවිඥානය කොයිතරම් පෝෂණය කරන්නේ ද? රසභාවයන් ප්‍රබුද්ධ කරන්නේ ද? ජනමාධ්‍ය නිදහස යනු පවතින දෑ එසේම අපට කියාදීම පමණක් ද? සැබෑව පාදක වූ සමාජ සංස්කෘතික දේශපාලනික යථාර්ථය සත්‍ය ලෙසින් පැහැදීම නොවන්නේ ද? අප ප්‍රශ්න කළ යුතු ය. අපගේ ජනමාධ්‍ය කොයිබට ද?

- සංස්කාරක -


## සන්නිවේදකයා

ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය.
දුරකථන : 0112-917713

ISSN -1391-314X
මිල රු : 50.00

උපදේශකත්වය
රෝහණ ලක්ෂමන් පියදාස

ප්‍රධාන සංස්කාරක
චන්ද්‍රසිරි රාජපක්ෂ

සංස්කරණය
විජයානන්ද රූපසිංහ
සමන් රාජපක්ෂ

සහය සංස්කරණය හා
පිටු සැකසුම
අමාලි උත්පලා නන්දසිරි

කවර නිර්මාණය
අරුණ ලොකුලියන

කවරයේ කතාව

# ලාංකේය ජනමාධ්‍ය කොයිබට ද?



**මාධ්‍ය වාර්තාකරණ තුළින් අද සිදුවන්නේ සමාජ නිශ්ශබ්දතාව නිර්මාණය කිරීමේ යාන්ත්‍රණයක්. ඒ නිසා අද මාධ්‍ය යනු නිශ්ශබ්දතාවයේ බැම්මයි.**

**- චරිත හේරත් -**
*ලේකම්*
*ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යංශය*

ජනමාධ්‍ය යනු පොදු අවකාශය තුළ පවතින්නක්. එය පොදු අවකාශය තුළ පැවතීම සඳහා නෛතික හා ආචාරධර්මීය පදනමක් අවශ්‍ය යි. වර්තමාන ලංකාවේ ජනමාධ්‍ය කොයිබටද කියන ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරක් දෙන්න බැහැ. ඒ, ගෝලීයකරණ ක්‍රියාවලිය හමුවේ මාධ්‍ය ස්වාධිපත්‍ය බරපතල ලෙස අභියෝගයට ලක් වී තිබෙන නිසා. මේ හේතුවෙන් ලංකාවේ මාධ්‍ය වෙළඳ පොළ ආර්ථිකයේ තවත් දිගුවක් බවට පත්වෙලා. එහි ප්‍රතිඵලයක් විදිහට මාධ්‍යයේ ස්වාධිපත්‍ය ඊට අහිමි වී තිබෙනවා. ගෝලීයකරණය තුළ මාධ්‍යයේ සංදේශ අද වෙළෙඳ පොළේ නිෂ්පාදනය වන භාණ්ඩයක් බවට පත් වෙලා. එබැවින් කුමන භාණ්ඩය වඩා සිත්ගන්නා සුළු ද? කුමන ආකාරයට මාධ්‍ය අන්තර්ගතය සැකසුවොත් වඩාත් ඉක්මණින් විකිණේ ද? ඉන් කෙතරම් මුදලක් ඉපයීමට හැකිද? යන කාරණා මත අද මාධ්‍ය අන්තර්ගතය තීරණය වෙනවා. මේ නිසා අද රූපවාහිනිය තුළ ප්‍රවෘත්ති ඉදිරිපත් කරන්නේ ප්‍රවෘත්ති අඩපැය වඩාත් ආකර්ශනීය හා වඩාත් සිත්ගන්නා සුළු කිරීමට. ඉන් ප්‍රවෘත්ති අඩපැයට ලැබෙන මූල්‍ය වටිනාකම වැඩිවෙනවා. එවිට වැඩි ප්‍රචාරණ දැන්වීම් ප්‍රමාණයක් එහි විකාශය කිරීමට හැකි යි. වාණිජ ප්‍රාග්ධනයේ ප්‍රධාන අදහස වන්නේ ගුවන් කාලය වඩාත් ආකර්ෂණීය කිරීමයි. ඒ පදනම මත අද මාධ්‍ය අන්තර්ගතයන් තීරණය කෙරෙනවා.

එහිදී ඇතැම් විටෙක සංවේදී මානව සමාජයට අනාවරණය නොකළ යුතු සිදුවීම් පවා ප්‍රවෘත්ති අඩපැයේ ප්‍රධාන ප්‍රවෘත්තියක් බවට සමාජගත කරමින් මුළු රට ම එකට අඬවන්න සූදානම් වෙනවා. මේ ප්‍රවෘත්ති අඩපැයේදී පුද්ගල අවධානය දිනා ගැනීමට මාධ්‍ය අතර ඇත්තේ තරගයක්. ග්‍රාහකයා හසුකර ගැනීමේ තරගයේදී ඊට ගැළපෙන අන්තර්ගතයකට අනුව මාධ්‍ය වැඩසටහන සකස් වෙනවා.

අතීතයේ ජනමාධ්‍යයෙන් සිදුකළේ අර්ථාන්විත ශබ්දයක් නිර්මාණය කිරීම නම්, අද මාධ්‍ය කරන්නේ නිශ්ශබ්දතාව නිර්මාණය කිරීමයි. නිදසුනක් වශයෙන් දක්වීමේදී සිරියාවේ සිදුවූ යම් සිද්ධියක් බී.බී.සී මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීමේදී සිදුවන්නේ එම සිදුවීමෙහි ඇති බහු සාක්ෂරතාව, එහි තිබෙන බහුවිධ ශබ්ද, විවිධ වූ මතු කිරීම්, කියවා ගැනීම් නිමාකර රාමුගත කියවා ගැනීමකට ග්‍රාහකයා යොමු කිරීමයි. මාධ්‍ය වාර්තාකරණ තුළින් අද සිදුවන්නේ සමාජ නිශ්ශබ්දතාව නිර්මාණය කිරීමේ යාන්ත්‍රණයක්. ඒ නිසා අද මාධ්‍ය යනු නිශ්ශබ්දතාවයේ බැම්මයි.

ලාංකේය මාධ්‍ය සංස්කෘතියේ ද අපට මේ තත්ත්වය හඳුනාගත හැකියි. මෙහිදී මාධ්‍ය ක්‍රියාකාරීත්වයෙන් පිළිබිඹු වන වැදගත් කාරණා කිහිපයක් තිබෙනවා. වැඩසටහන් නාය පතු සකස් කිරීම, සිදුවීම් පෙළ ගැසීම, එය රාමුගත කිරීම, සංස්කරණය යනාදියේ ස්වභාවය අනුව ඒවා අවබෝධ කරගත යුතු යි. ඉන් ලංකාවේ මාධ්‍ය ගමන් කරන්නේ කොයිබටද කියන ප්‍රශ්නයට අවශ්‍ය මූලික චිත්‍රණය සපයා ගන්න පුළුවන්.

නමුත් ලෝකයේ මාධ්‍ය මේ සියලු තත්ත්වයන් යටතේ යම් කාර්යයක් ඉටු කරනවා. එහිදී ලෝක ජනමාධ්‍ය තමන්ට ම අනන්‍ය වූ කාර්යභාරයක් ඉටුකරන නමුත් අපේ රටේ තත්ත්වය ඊට වඩා වෙනස්. බොහෝ ප්‍රවීණයන් මාධ්‍යයෙන් ඉවත්වීමත්, මාධ්‍යය යාන්ත්‍රණය වෙළෙඳාමක් බවට පත්වීමත් සමග මාධ්‍යයේ මූලික පරමාර්ථ ලංකාවේ මාධ්‍යයෙන් ඉවත් වෙලා. එහිදී මාධ්‍යකරුවන්ගේ ක්‍රියාදාමය, වෘත්තීය කාර්යභාරය වේගවත් සහ යාන්ත්‍රික අභියෝග හමුවට යොමු වී තිබෙනවා. ලංකාවේ ජනමාධ්‍ය සාම්ප්‍රදායිකව ක්‍රමානුකූලව ගිය ගමනත්, කාලය හා අවකාශය මැදින් ක්ෂණයකින් ගමන් කිරීමත් අතර මාධ්‍යමය හා වෘත්තීය අභියෝග රැසකට මුහුණදීමට සිදුවෙලා. මූල්‍ය වෙළඳපළ අනුව මාධ්‍ය ක්‍රියාකාරීත්වය වෙනස් විය යුතුයි. නමුත් වෙළඳපළ යාන්ත්‍රණය තුළ මාධ්‍ය හැසිරවීමේදී මාධ්‍ය මගින් සමාජයට ලබාදිය යුතු මූලික හර පද්ධති පිළිබඳ අදහස් සම්පූර්ණයෙන් ම මාධ්‍යයෙන් ඉවත්වීම නැවැත්විය යුතුයි.

සංවාද සටහන
**අමාලි උත්පලා සඳසිරි**



**ලංකාවේ ජනමාධ්‍ය 95% ක්ම යැපෙන්නේ එම ආයතනය උපයන ආදායමෙන් නෙවෙයි.**

**- වික්ටර් අයිවන් -**

*රාවය පුවත්පතේ උපදේශක සංස්කාරක*

ජනමාධ්‍ය මූලිකවම එදිනෙදා සිදුවන දේ පිළිබඳ පැහැදිලි අදහසක් මහජනයාට ලබා දිය යුතුයි. සාධාරණ හා යුක්ති සහගත ලෙස තීන්දු තීරණ ගත හැකි ආකාරයේ ශක්තිමත් වටපිටාවක් මහජනයාට ඇති කිරීම ජනමාධ්‍යයේ වගකීමයි. නමුත් එවැනි තත්ත්වයක් ඇති නොවීම කෙරෙහි බලපෑ කරුණු ගණනාවක් හඳුනා ගන්න පුළුවන්.

මූලිකවම ලංකාවේ සියලු ජනමාධ්‍යවේදීන්ට සිය සමාජ වගකීම පිළිබඳ අවබෝධයක් නැහැ. ඒ වගේම වෘත්තීය අධ්‍යාපනයක් නැහැ. අධ්‍යාපනය සහ පුහුණුව ජනමාධ්‍යවේදීන් සඳහා අත්‍යවශ්‍ය කොන්දේසි වුවත් එවැනි දේ නොසලකා හැරීම දකින්න පුළුවන්. අනෙක් කාරණය තමයි මාධ්‍ය හිමිකාරීත්වය. ලංකාවේ ජනමාධ්‍ය ආයතන වලින් 95% ක්ම යැපෙන්නේ එම ආයතනය උපයන ආදායමෙන් නෙවෙයි. අයථා ලෙස උපයන "කළු සල්ලි" වලින්. ජනමාධ්‍යවේදියා දන්නවා තමන්ගේ ආයතනය යැපෙන්නේ පිටස්තරව එන කළු සල්ලි වලින් කියලා. මේ තත්ත්වය විශාල හානියක්. මාධ්‍ය හිමිකාරීත්වය, බලයේ සිටින පක්ෂ හා පුද්ගලයින් සමග සබඳතා පවත්වමින් දේශපාලන බලයට අනියම් ආකාරයෙන් සහය වීම දකින්න පුළුවන්. මේ නිසාම තමන්ගේ ජනමාධ්‍ය ආයතනය දේශපාලකයන්ගේ උපදෙස් මත පවත්වාගෙන යාමට ජනමාධ්‍ය හිමිකාරීත්වය කටයුතු කරනවා. ජනමාධ්‍යවේදියා ද මාධ්‍ය හිමිකාරීත්වය මත යැපෙන සාධකය නිසා එයට අනුකූලව කටයුතු කරනවා.

ඒ වගේම වෙනත් කිසිම වෘත්තියක දකින්නට නොලැබෙන තරම් වන අසංවිධානාත්මක බවක් ශ්‍රී ලංකාවේ මාධ්‍ය වෘත්තිය තුළ පවතිනවා. ලංකාවේ ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තිය එකමුතුවක් නැහැ. මාධ්‍යවේදීන්ට වෘත්තිය සමිති ව්‍යාපාරයක් නැහැ. ඔවුන්ට තිබෙන ලොකුම සංවිධානය වෘත්තීය මාධ්‍යවේදීන්ගේ සංගමයයි. එහෙත් එය වෘත්තීය සමිතියකට හෝ වෘත්තීයවේදී සංවිධානයකට හෝ අයත් නොවන ලිහිල් සංවිධානයක්. මේ හේතුවෙන් ලංකාවේ ජනමාධ්‍ය සංස්කෘතියක් පවත්වා ගැනීමට නොහැකියාවක් තියෙනවා. මේ විෂමතාවය නිසාම ජනමාධ්‍යවේදියාට වෘත්තීය අභිමානයක් නැහැ.

ශ්‍රී ලංකාවේ අන් හැම වෘත්තීයක් සේම මාධ්‍ය වෘත්තීයද දූෂිතයි. සෑම වෘත්තීය ක්ෂේත්‍රයකම මෙන්ම මාධ්‍ය ක්ෂේත්‍රයේද සාරධර්ම වල නාය යෑමක් දක්නට ලැබෙනවා. ජනමාධ්‍යවේදීන්ට බලපාන ආචාරධර්ම පද්ධතියක් ස්ථාපිත වුවත් එය හුදු මවා පෑමක්. හිමිකරුවා සිය ජනමාධ්‍ය පිළිගත් ආචාර ධර්මවලට පටහැනිව අයුතු වාසි ලබා ගැනීම සඳහා යොදාගන්නා අවස්ථාවලදී පවා ජනමාධ්‍යවේදීන් නිහඬව බලා සිටින ප්‍රතිපත්තියක් අනුගමනය කළා විනා ඊට එරෙහිව කවදාවත් කිසිවක් කර නැහැ.

අද ජනමාධ්‍ය වලින් සිදුවන්නේ විවිධ මිථ්‍යා විශ්වාස සමාජ ගත කිරීමයි. මිනිසුන්ගේ විචාර බුද්ධිය රසිකත්වය වර්ධනය කිරීම සඳහා අද ජනමාධ්‍ය පෙනී සිටීමක් සිදුවන්නේ නැහැ. අද දකින්න ලැබෙන්නේ ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ විශාල පිරිහීමක්. ශ්‍රී ලංකාවේ මාධ්‍ය ව්‍යාපාරය ලෝකයේ සිදුවන මතවාද විවාද වලින් පරිබාහිර වූ දියුණු සංකල්පීය තලයකින් තොරව තාක්ෂණ දියුණුව පමණක් අවශෝෂණය කරගනිමින් ඉදිරියට පැමිණි ව්‍යාපාරයක්. සංකල්පීය වශයෙන් ලංකාවේ ජනමාධ්‍යවේදීන් ඉන්නේ දුප්පත් තැනක. මේ තත්ත්වය තුළ ලංකාවේ ජනමාධ්‍ය පවතින්නේ විශාල අවුලක. එම අවුලේ ප්‍රතිබිම්බය ලෙස ජනමාධ්‍ය හඳුන්වා දිය හැකියි. ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ මේ ගමන් මග, මේ බොරුව නිවැරදි ලෙසම තේරුම් ගන්නා දිනයක් නියත වශයෙන් එළඹෙනවා. ඒ නිසා ජනතාවට මුහුණදීමට ජනමාධ්‍ය ආයතන හා ජනමාධ්‍යවේදීන් දැන්ම සූදානම් වීම ඉතා වැදගත් යැයි මම හිතනවා.

*සංවාද සටහන*

**ජයනි අබේසේකර**



**මිලකල ලැබීමෙන් මාධ්‍යයට වන හානිය වැඩිය. මාධ්‍යකරුවා සහ මාධ්‍ය ගමන්ගන්නා වේගය තාක්ෂණික වේගයට වඩා හෙමින් සිදුවෙනවා.**

**- තිලංග සුමතිපාල -**


*කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී/*
*සුමති පුවත්පත් ආයතනය*

අතීතයේ පැවතියේ මුද්‍රණ මාධ්‍යය පමණි. වර්තමානයේ රූපවාහිනිය, ගුවන්විදුලිය පමණක් නොව අන්තර්ජාල තුළින් ද පුළුල් සන්නිවේදනයක් සිදුවෙනවා. ජනමාධ්‍ය මගින් තොරතුරු ගලායන අතර මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්කරන දේ අතරින් ගුණාත්මක දේවල් විග්‍රහ කරයි. ජනමාධ්‍යවේදය ජනමාධ්‍යවේදියකු බිහි කරයි.

අතීතයේ බෙරකරුවා කරනු ලැබුවේ ජනමාධ්‍ය කර්තව්‍යයක්'. මෙහිදී ජනමාධ්‍යකරුවාගේ භූමිකාව විවිධ පරාසයන් අනුව වෙනස් වෙනවා. ඔවුන්ගේ වගකීම හා කාර්යභාරය ද එකිනෙකට වෙනස් වෙනවා


මනුෂ්‍ය සමාජයේ මූලික පෙළගැස්ම සන්නිවේදනය ඔස්සේ සිදුවන බව දක්නට ලැබෙනවා. සන්නිවේදනය මිනිසාගේම අවශ්‍යතාවක්. ජනමාධ්‍ය සියල්ල තිබෙනුයේ ප්‍රේක්ෂක, පාඨක ශ්‍රාවක ජනතාව තුළයි. වර්තමානය වනවිට ජනතාවගේ' විනෝදාස්වාදය වෙනස් වී තිබෙනවා. ඒ අනුව මාධ්‍යකරුවාගේ අවශ්‍යතාව වැඩි වී තිබෙනවා. ඒ අනුව මාධ්‍යවේදීන් බිහිවීම සිදුවෙනවා.

මේ ඔස්සේ අත්දැකීම් අඩු පුද්ගලයන්ට බලතල ලැබී තිබෙනවා. බලතල ලැබීමෙන් මාධ්‍යයට වන හානිය වැඩියි. මාධ්‍යකරුවා සහ මාධ්‍ය ගමන් ගන්නා වේගය තාක්ෂණික වේගයට වඩා හෙමින් සිදුවෙනවා. එම නිසා මාධ්‍යකරුවාට ඉගෙනීමට කාලයක් ➡



**පාලන පක්ෂයේ පීඩනයේ ඉදිරි මිරිංමින් මිනිසාට සිය සමාජීය කාරණා පිළිබඳව සංවේදීතාවක් මාධ්‍යට නොමැත.**

**- ආචාර්ය විදුමිර විරසිංහ-**




සංවාද සටහන
චතුරිකා දිල්රුක්ෂි

වෙනස් වී නැත. පශ්චාත් ප්‍රජාතාන්ත්‍රික වාතාවරණය තුළ ඒකීය රජයක් නිර්මාණය වන අතර ජනමාධ්‍ය පාලනය කිරීමේ හා සමාජය ක්‍රමානුකූලව සකස් කිරීමේ වගකීම මාධ්‍ය වෙත පැවරුණ ද ඉන් ඔබ්බට යමින් කටයුතු කරන ආකාරය දැක ගත හැකිය. හුදෙක් ජනමාධ්‍ය ජනමතයක් නොව සංහතික මතයක් ගොඩ නැගීමට උත්සහ කරනු ලබයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්‍රියාත්මක වන්නේ පාලක පන්තියේ දෘෂ්ටිවාදයන්ට අනුවය. ඔවුන් දෛනික සිදුවීම් පිළිබඳ ආකල්ප පාලනය කරයි. ජාත්‍යන්තර හා ජාතික සිදුවීම් පාලක පන්තියේ දෘෂ්ටිවාදයන්ට අනුව හැඩ ගසනු ලබයි.

ජනමතය සංහතික මතවාදයක් ලෙසින් ගොඩනගන්නට උත්සහ කරනු ලබයි. එය සමස්ත මාධ්‍යයේම කාර්යභාරය බවට පත්ව ඇති අතර විරුද්ධ පක්ෂය, ආණ්ඩු පක්ෂය හෝ විකල්ප මතයක් ලෙසින් සමාජය තුළ මතවාද නියෝජනයට උත්සාහ නොගනී. මාධ්‍ය තර්කනයට අනුව වෙළඳපොළ තර්කනයට ද දේශපාලන තර්කනයට අනුව මාධ්‍ය තර්කනය ද ගොඩනගන්නට උත්සාහ ගනී. මෙහිදී මාධ්‍ය, දේශපාලන තර්කනය ක්‍රියාත්මක වන්නේ එකක් ලෙසිනි. රටේ සංවර්ධන අවශ්‍යතා ඉටු කිරීමේ ප්‍රබලම කාර්ය භාරයක් මාධ්‍ය වෙත පැවරී තිබුණද ඒ වෙනුවෙන් සවිඥානික වීමට උත්සහ ගනු ලබන ආකාරයක් දැක ගත නොහැක. ඔවුන් තවමත් උත්සාහ ගනු ලබන්නේ ශුද්ධ මානසිකත්වය මත සිද කටයුතු කිරීමටය. මෙයට හේතු වන්නේ ශ්‍රී ලංකාව තුළ බිහිවූ බොහෝ මාධ්‍ය ශුද්ධ සමය මුල් කර ගනිමින් බිහිවීම ය.

පශ්චාත් ලාංකේය සමාජය ආර්ථික වශයෙන් සංවර්ධන කිරීමේ කාර්ය භාරය මාධ්‍යයට පැවරී තිබුණ ද ඒ සියල්ලන්ට ම ඔබ්බට යමින් මාධ්‍ය පාලක පන්තියේ අවශ්‍යතා මත කටයුතු කරනු ලබන ආකාරය දැකගත හැකිය. ඔවුන් හුදෙක් උත්සහ ගනු ලබන්නේ පාලක පන්තියේ අවශ්‍යතා මතින් සිය නාය පත්‍රය සකස් කිරීමට මෙන්ම තමන්ගේ නිෂ්පාදන පිරිවැය වැඩිකර ගැනීමටය. ඉන් ඔබ්බට ගිය සමාජීය කාරණා පිළිබඳව සංවේදීතාවක් මාධ්‍යට නොමැත. සමාජය තුළ පුළුල් වශයෙන් කතිකාවක් ඇති විය යුතු අතර මාධ්‍ය පිළිබඳව රජයේ ප්‍රතිපත්ති වෙනස්කම් වලට ලක්විය යුතු වේ.

සංවාද සටහන

**කින්මිණි භාෂිකා විමනගේ**



**වර්තමානයේ මාධ්‍ය මර්දනයක් දැකිය නොහැකි නමුත් දැඩි ඒකාධිකාරයක් පවතිනවා.**

**- සුනිල් ජයසේකර -**

**කැඳවුම්කරු**

**නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**

මිනිසාගේ ප්‍රබල සන්නිවේදන අවශ්‍යතාවක ප්‍රතිඵලයක් ලෙස බිහිවන ජනමාධ්‍ය අද වන විට අත්‍යාවශ්‍ය සාධකයක් බවට පත් වෙලා. මිනිසා වෙත තොරතුරු සම්ප්‍රේෂණයෙහිලා මෙන්ම දැනුම පෝෂණය කිරීමෙහිලා ජනමාධ්‍ය අනුපමේය යුග මෙහෙවරක තියැලෙනවා.

වර්තමානය වන විට විද්‍යුත් හා මුද්‍රිත යන අංශ දෙකෙහිම ව්‍යාප්තියක් දක ගත හැකියි. ඉලෙක්ට්‍රොනික මාධ්‍යයේ ආගමනයත් සමග අතිදුෂ්කර මිනැම පළාතක ජනතාව විද්‍යුත් මුද්‍රිත මාධ්‍ය භාවිත කිරීමේ ප්‍රවණතාවක් දක ගත හැකියි.

නමුත් මිනැම ජනමාධ්‍යයක අපේක්ෂාවන් මෙන්ම අරමුණු තියෙනවා. නමුත් වර්තමානයේ ඉතිහාසයේ කිසිදු දිනක නොවුනු ආකාරයේ පිරිහීමක් ජනමාධ්‍යය තුළ දැකිය හැකියි. ලංකාවේ ඉතිහාසයේ සතළිස, පනහ, හැට ගණන්වල සිට මාධ්‍ය මර්දනයක් පැවතියා. වර්තමානයේ මාධ්‍ය මර්දනයක් දකිය නොහැකි නමුත් දැඩි ඒකාධිකාරයක් පවතිනවා.

රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැකෙන මූලික පදනමක් තිබෙනවා. එනම්, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය යි. මෙම සාධක තුනට අමතරව සිව්වැන්න ලෙස එක්වන්නේ ජනමාධ්‍යය යි.



ජනමාධ්‍ය ඇතුළු සියලු ක්ෂේත්‍රයන් තම ස්වාධීනත්වය අහිමි කරගනිමින් පාලන ව්‍යුහය ඉදිරියේ දණ ගසා තිබෙනවා.

විද්‍යුත් මාධ්‍ය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී ජනමාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් අවධානයක් යොමු කළ යුතු යි. නමුත් අද වන විට දේශපාලන හිතවත්කම් මත හෝ ධනපති පිරිසක් අතරේ පමණක් ජනමාධ්‍ය බෙදී යාම එහි උන්නතිය උදෙසා බාධකයක් බවට පත් වී තිබෙනවා. ජනමාධ්‍යයේ ප්‍රබල අතකොළු බවට පත්ව ඇත්තේ බුද්ධියෙන් දැනුමෙන් හීන පුද්ගලයන් වීම මෙම තත්ත්වය තව තවත් උග්‍ර වීමට හේතු වී තිබෙනවා.

විද්‍යුත් මාධ්‍ය ලැයිස්තුවේ හිමිකාරීත්වය ඇමති පවුල්වල සාමාජිකයන්ටත් ආණ්ඩු පක්ෂයේ ව්‍යාපාරික හිතවතුන්ටත් හිමිවීම කෝටි ගණනක දේපලක් විභාග කිරීමක්. උපාලි සමූහ ව්‍යාපාරයේ සභාපතිවරයා ආණ්ඩුවේ ප්‍රධාන ආයතනයක සභාපතිවරයා ලෙස පත්කිරීම පුවත්පත් සමාගමේ ස්වාධීනත්වයට බලපෑම් නොකර සිටියිද?

ලංකාදීප පුවත්පත ඇරුණු කොට පුවත්පත් සැලකිය යුතු ලාභයක් නොලබන බවට අභියෝග කළ හැකියි. එසේ අභියෝග කළ හැක්කේ පාඩු ලබමින් ද ජනමාධ්‍ය අතර ඔවුන් රැඳී සිටින්නේ මාධ්‍ය හිමිකාරීත්වයේ ගැටලු නිසායි. මාධ්‍ය ජනයාගේ මනස මෙහෙයවන ප්‍රබල සාධකයකි.

නමුත් වර්තමානයේ එහි ක්‍රියාකාරීත්වය බරපතල අගාධයකට වැටී ඇති බව පැහැදිලියි. ලංකාවේ සියලුම වෘත්තීය ක්ෂේත්‍ර මෙම ජරා ජීර්ණ තත්වයෙන් මුදවා ගැනීමට ප්‍රතිසංස්කරණමය ක්‍රියා පිළිවෙත් අවශ්‍ය වී තිබෙනවා. එය සිදුවිය යුත්තේ පාලන ව්‍යුහය තුළින්මයි.

රටව සුභවාදී අනාගතයක් පැතීමට වගකීමෙන් ක්‍රියා කරන ව්‍යවස්ථාදායකයක් විධායකයක්, අධිකරණයක් මෙන්ම ස්වාධීන මාධ්‍ය ක්‍රියාකාරීත්වයක් ද පැවතීම අත්‍යවශ්‍ය බව පැහැදිලියි. එමෙන්ම මාධ්‍ය ආචාරධර්මයන්ට නතුව ක්‍රියාකිරීමෙන් සමස්ත ජනයාගේ අනාගත සුබ සිද්ධිය මෙන්ම නිදහස් ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා අපේක්ෂාවක් තැබිය හැකි යි.

සංවාද සටහන
**ජගත් සුරියආරච්චි**

Veronika Guverin

# වෙරෝනිකා ගුවේරින්

වෙරෝනිකා ග්වේරින් උපන්නේ 1958 ජූලි 05 දින අයර්ලන්තයේ. 'රොනි' යන අන්වර්ථ නාමයෙන් ද ඇය හැඳින්වූවා ය. ගණකාධිකාරවරයෙකු වූ ක්‍රිස්ටෝපර් සහ බර්නාඩෙට්, වෙරෝනිකාගේ මව්පියෝ වෙති. කුඩා කළ සිට රහස් පරීක්ෂක ක්‍රියාකාරකම් හා ක්‍රීඩාවට ඇලුම් කළ ඇය මලල ක්‍රීඩා, අත්පන්දු හා පාපන්දු වැනි ක්‍රීඩාවන්හි දක්ෂ වූවා ය. ප්‍රාථමික අධ්‍යාපනයෙන් පසුව සිය උසස් අධ්‍යාපනය උපාධිධාරිනියක් ලෙස අවසන් කළ ඇය සිය පියා සේවය කළ කාර්යාලයේ ම සේවය කළාය.

විවිධ රැකියාවන්හි නිරත වූ වෙරෝනිකා 1990 දී සිය වෘත්තිය ගමන් මග වෙනස් කළා ය. ඇය ජනමාධ්‍යවේදිනියක් ලෙස අයර්ලන්තයේ වැඩිම අලෙවියක් සහිත පුවත්පත් ලෙස සැලකෙන, ඩෙමින් කීබඩ්ගේ කර්තෘත්වය යටතේ පැවති, සන්ඩේ බිස්නස් පෝස්ට් (Sunday Business Post), සන්ඩේ ඉන්ඩිපෙන්ඩන්ඩ් (Sunday Independent), සහ සන්ඩේ ට්‍රිබියුන් (Sunday Tribune) යන පුවපත්වල ලෙස සේවය කළා ය. පුවත්පත් වාර්තාකාරිනියක් ලෙස කටයුතු කළ අවධියේ ඇය නිරන්තරයෙන් සමාජ දූෂණ, වංචා පිළිබඳ ගවේෂණාත්මක වාර්තා පළ කරමින් ඒ පිළිබඳ සමාජ විමසුමට යොමු කිරීමේ අභියෝගාත්මක වාර්තාකරණයක නිරත වූවා ය.

1994 වෙරෝනිකා අයර්ලන්ත ගවේෂණාත්මක ලිපි ලිවීම ආරම්භ කළා ය. සන්ඩේ ඉන්ඩිපෙන්ඩන්ඩ් පුවත්පතෙන් ස්වකීය වාර්තාකරණය ඇරඹූ ඇය ඇතැම් අවස්ථාවල අපරාධ පිළිබඳ වගකිව යුතු ආයතන නිහඬ පිළිවෙත් අනුගමනය කරන තැන්හි සිය වියදමින් එකී අපරාධ සඳහා නීතිමය පියවර ගැනීමට ක්‍රියාත්මක වූවා ය.

ඇය කෝටිපති ව්‍යාපාරිකයන්ගේ සැඟවුණු ආදායම් මාර්ග පිළිබඳව මෙන් ම, මත්ද්‍රව්‍ය ජාවාරම් සිදුකරන ව්‍යාපාරිකයන් පිළිබඳව සාක්ෂි සහිතව වාර්තා පළකරමින් නිර්භයව සිය පෑන හැසිරවීය. මෙකී වාර්තාකරණයන් නිසා ඇයට 1994 ඔක්තෝම්බර් මාසයේ වෙඩි ප්‍රහාරයකට මුහුණ දීමට සිදුවිය. තවත් වරෙක අයර්ලන්තයේ හෙරොයින් ජාවාරම්වලට සම්බන්ධව කටයුතු කළ පුද්ගලයෙකු වන මාර්ටින් කහිල්ගේ (Martine Cahill) ඝාතනය පිළිබඳ සන්ඩේ ඉන්ඩිපෙන්ඩන්ස්හි විස්තරාත්මක ලිපි පළකිරීමෙන් අනතුරුව මත්ද්‍රව්‍ය ජාවාරමේ නිරත අනෙකුත් පිරිස ඇගේ නිවසට පැමිණ වෙඩි ප්‍රහාර එල්ල කළ ද ඉන් ඇයට අනතුරක් නොවී ය.

තවදුරටත් මත්ද්‍රව්‍ය ජාවාරම් පිළිබඳ සත්‍ය තොරතුරු සොයා සිය වාර්තා පළකිරීමත් සමග වෙරෝනිකා වෙත මරණ තර්ජන ගලා එන්නට විය. මත්ද්‍රව්‍ය ජාවාරම් පිළිබඳ අපරාධකරුවෙකු වූ 'ජෝන් ට්‍රේනර්' පිළිබඳ ඉදිරිපත් කළ වාර්තාවන්හි ප්‍රතිඵලයක් ලෙසඇයට එල්ල වූ මරණ තර්ජන වැඩිවිය.




මූල්‍ය වත්කම් පිළිබඳ අපරාධ වළක්වාලීමට ස්වාධීන ආයතනයක් පිහිටුවීමේ කාලීන අවශ්‍යතාව මතු කරමින් හා ඒ සඳහා අයර්ලන්ත ආණ්ඩුවේ අවධානය යොමු කළ යුතු බව අවධාරණය කරමින් වෙරෝනිකා ලිපි ලේඛන රචනා කළා ය.

අයර්ලන්තයේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරවලට සම්බන්ධ ජාවාරම් කල්ලි හා ඒවාට සම්බන්ධ දේශපාලඥයින් හෙළි කිරීමත් සමග වෙරෝනිකා වෙත ගලා ආ මරණ තර්ජන තව තවත් ඉහළ ගියේ ය.

නමුත් ඇය මත්ද්‍රව්‍ය ජාවාරම්වලට සම්බන්ධ කෝටිපති ව්‍යාපාරිකයින් හා දේශපාලඥයින් බිය ගන්වමින් තවදුරටත් වාර්තා ඉදිරිපත් කළා ය.

1995 සැප්තැම්බර් 13 වන දින මත්ද්‍රව්‍ය ජාවාරම් පිළිබඳ අපරාධකරුවෙකු වූ ජෝන් ට්‍රෙනර්ගේ ප්‍රධානියා වන ජෝන් ගිලන්ගේ ජීවන රටාව හා ඔහුගේ ආදායම් මූලාශ්‍ර පිළිබඳ ප්‍රශ්න කරමින් පළකළ වාර්තාවක් හේතුවෙන් ඇයගේ ලිවීම වහාම නතර කළ යුතු යැයි තර්ජන එල්ල විය.

එහෙත් වෙරෝනිකා නොබියව හා අඛණ්ඩව ගවේෂණාත්මක වාර්තා පළ කිරීම හේතුවෙන් 1995 දෙසැම්බර් මාසයේ දී Commitee to Protect Journalist වෙතින් ඇයට International Press Freedom සම්මානය හිමි විය.

1996 වසරේ ජුනි 26 දින වෙරෝනිකා ඝාතනයට ලක්වන විට ඇය තිස් අටවැනි වියෙහි පසු වූවාය. සිය මෝටර් රථයෙන් කාර්යාලය වෙත යමින් සිටියදී අයර්ලන්තයේ නාස් ද්‍රුවල් කැරේජ්වෙහි මාර්ග සංඥා අසළ සිය රථය නවතා තිබියදී නාඳුනන තුවක්කුකරුවන් විසින් ඇයට එල්ල කළ වෙඩි ප්‍රහාරකින් ඇය මරණයට පත් වූවා ය. ඇයගේ මරණය සිදුවන විට අපරාධ පිළිබඳ ට්‍රෙන්ට නැමැත්තාට විරුද්ධව අයර්ලන්ත මහාධිකරණයේ නඩුවක් විභාග වූයේ වෙරෝනිකාගේ ගවේෂණාත්මක වාර්තාකරණයේ ප්‍රතිඵලයක් ලෙසිනි.

ඇගේ මරණය දින දෙකකට පෙර නිදහස පිළිබඳ ලන්ඩනයේ පැවති සම්මේලනයකදී ඇය කළ ඉදිරිපත් කිරීමේ ප්‍රස්තුතය වූයේ 'සත්‍ය වාර්තාකරණය හා ජනමාධ්‍යවේදීන්ට ජීවිතයෙන් වන්දිගෙවීමට සිදුවීමේ අභියෝගය' (Dying to tell Story; Journalist at Risk) පිළිබඳව ය.

වෙරෝනිකාගේ මරණයෙන් කම්පාවට පත් අයර්ලන්ත ජනතාව ඇගේ ඝාතනයට එරෙහිව නැගී සිටිය හ. ඝාතකයන් අත්අඩංගුව ගැනීම සඳහා එරට රජයට බලකරමින් ජනතාව හඬ නැගූහ. වෙරෝනිකාගේ ඝාතනයත් සමග අයර්ලන්තයේ ඇති වූ සමාජ කතිකාවත්හි ප්‍රතිඵලයක් වශයෙන් වත්කම් අපරාධ පිරික්සීමේ විශේෂ පනතක් හා ඒ අනුව නෛතිකව ක්‍රියාත්මක විය හැකි 'අපරාධ වත්කම් කාර්යංශයක්' හඳුන්වාදීමට එරට පාර්ලිමේන්තුවට සිදුවිය. ඇගේ ඝාතනයෙන් පසුව ඉක්මුණු හිය වසර තුළ අයර්ලන්තයේ මත්ද්‍රව්‍ය අලෙවිය හා අපරාධ සිදුවීම 15% කින් පහත වැටුණේ එරට ජනතාව වෙරෝනිකාගේ ඝාතනයට එරෙහිව නැගී සිටීමේ ප්‍රතිඵලයක් ලෙසිනි.

විශේෂ පනතක් හා
ඒ අනුව නෛතිකව
ක්‍රියාත්මක විය හැකි
'අපරාධ වත්කම් කාර්යංශයක්'
හඳුන්වාදීමට
එරට පාර්ලිමේන්තුවට සිදුවිය.

වර්තමානය වනවිට, සමාජ වංචා, දූෂණ වැනි සදාචාර විරෝධී ක්‍රියා පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කරමින් සාක්ෂි සහිතව හෙළිදරව් කිරීම ගවේෂණාත්මක පුවත්පත් කලාව ලෙස හඳුනා ගැනේ. වෙරෝනිකා ගේරින් ජනමාධ්‍යවේදිනියට ගෞරව දක්වමින්, අයර්ලන්තයේ ඩබ්ලින් විශ්වවිද්‍යාලය 2007 වසරේ සිට එම විශ්වවිද්‍යාලයේ විමර්ශනාත්මක පුවත්පත් කලාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියට ලියාපදිංචි වන විද්‍යාර්ථීන් සඳහා තොම්ලේ එම උපාධිය හැදෑරීමට 'වෙරෝනිකා ගේරින් ශිෂ්‍යත්වය' පිරිනමන්නේ වෙරෝනිකා ගේරින් නාමය අමරණීය කරමිනි.

පරිවර්තනය
අමාලි උත්පලා කන්දසිරි



'අප වෙනුවෙන්
ජාත්‍යන්තර
මානව හිමිකම් සංවිධාන
හඬ නැගීම සාධාරණය,
එය
අගය කළ යුතුය.
එහෙත් අප මෙන්
සිද්ධීන් ගොනු කරන්නේ
ජාත්‍යන්තර
හීනෑ එපාකම්
සඳහා ද?
අප අපේක්ෂා කරන
ප්‍රකාශන නිදහස
සැබෑවටම
යථාර්ථයක් ද?'
පෙරළා විමසා බලමු.

# මාධ්‍ය නිදහස සැබැවින්ම කා සඳහා ද? කුමක් අරබයා ද?

මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස

මාධ්‍ය නිදහස සමරන දිනයක් දිනයේ ඉතිහාසය, එහි න්‍යායික සහ විවිධ අත්දැකීම් අපි කියවමින් සිටින්නෙමු. ලාංකේය සමාජයේ ද තිත්දෙන් අවදි වූ මිනිසුන් මෙන් එකවරම මාධ්‍ය නිදහස ගැන කථා කරන සංවිධාන, ආයතනවල විවිධ ක්‍රියාකාරකම් ඇසේ, පෙනේ.

මේ සියල්ල මධ්‍යයේ අපි අපේ හෘද සාක්ෂිය විමසා බැලිය යුතු නොවේදැයි මට සිතේ. මෙම ලිපිය ඔබ කියවන අතරතුර මාධ්‍ය ආයතන, මාධ්‍යකරුවන්, මාධ්‍ය සේවකයින් වෙත එල්ලවන ප්‍රහාරක සිද්ධීන් කොතෙක්දැයි මම නොදනිමි. ලෝකයේ ප්‍රකාශන නිදහස හා එහි අයිතිය ගැන කථා කරන අතර අපට අපේ හෘද සාක්ෂිය විමසා බලන්නට මෙය අපූරු අවස්ථාවක් යැයි මට සිතේ. මෙරට පුවත්පත් ආරම්භය හා පුවත්පත්වල ලියූ ලේඛන පාලන තන්ත්‍රයන්ට අභියෝග කිරීමේ හේතුව මත වධ බන්ධනයට හා සිර දඬුවමට ලක් කළ පුරෝගාමීන් දෙදෙනෙකු මගේ මතකයට එයි. විසිවන සියවස ආරම්භයේ බ්‍රිතාන්‍ය පාලන සමයේ "Morning Leader" පුවත්පතේ කර්තෘ වෛද්‍ය හර්මන්. ඩී. සූසා සහ දෙවන ලෝක යුද්ධය ආසන්නයේ ඉංග්‍රීසි ආණ්ඩුවට අභියෝග කළ "ජනශක්ති" පුවත්පතේ කර්තෘ එස්. ඒ වික්‍රමසිංහ යන දෙදෙනා පුවත්පතින් ඉංග්‍රීසි ආණ්ඩුව ප්‍රශ්න කිරීම නිසා ඔවුන් දඩ ගෙව යවනු ලැබිය. අප නිදහස ලැබුව දා සිට මේ වන තෙක් විවිධ හේතූන් මත මරා දමන ලද, අතුරුදහන් කරන ලද, වධහිංසාවට ලක් කළ මාධ්‍යවේදීන්ගේ ගණන සියයකට ආසන්නයැයි මට සිතේ. විශේෂයෙන් හැටේ දශකයේ ආරම්භ වී මේ වන විට එය සාමාන්‍ය පොදු සිද්ධි සමූහයක් බවට පත්ව තිබෙන්නේ ප්‍රකට සමාජ විද්‍යාඥයෙකු වූ මහාචාර්ය ගැල්ටුන් විසින් තුන්වන වන ලෝකයේ ගැටුම් හා සිද්ධීන් පිළිබඳව විවරණය කරමින් ඔහුගේ විශ්ලේෂණයක් ලෙස විග්‍රහවන "සමාජ අවසංවේදීකරණය ක්‍රියාවලිය හෙවත් කම්පා විය යුතු සිද්ධීන් සාමාන්‍යකරණයක් බවට පත් කිරීමේ ක්‍රියාවලිය යළි සිහිපත් කරවමිනි.

මෙරට නිදහසින් පසු බලයට පත් සෑම ආණ්ඩුවක්ම අඩු වැඩි වශයෙන් තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රයන්ට අනුරූපව ඊට එකඟ නොවීමේ හේතුව නිසා මාධ්‍යවේදීන්ට දඬුවම් කළ අයුරු, වධ හිංසාවට ලක් කළ අයුරු දැකිය හැකිය. පනහ, හැට දශකවල මෙසේ පීඩාවන්ට, මර්දනවලට ලක් කළ මාධ්‍යවේදීන් බොහෝ දෙනෙක් ඔවුන්ට පැවති ද්විභාෂික කුසලතාව හේතු කොට ගෙන නැත්නම් සම්බන්ධතා හේතු කොට ගෙන රට හැර ගියෝය. ටාසි විට්ටච්චි, නෙවිල් ජයවීර, මහාචාර්ය ලෙල්වන් ගුණරත්න එසේ රට හැර ගිය කීර්තිමත් මාධ්‍යවේදීන් කිහිපදෙනෙකි. එහෙත් හැටේ දශකයේ අග හා හැත්තෑව දශකයේ මුල එසේ ප්‍රකාශන නිදහස සමාජයට දැඩි බලපෑම්කාරී ගැටලුවක් බවට පත් වන ආකාරය හඳුනාගත හැකි ය. මෙහි තේරීම සංසිද්ධිය වූයේ හැත්තෑව දශකයේ දී ලේක් හවුස් ආයතනය රජයට

පවරා ගැනීමයි. අද අර්ථයෙන් ගතහොත් එම සංසිද්ධිය නිදහස් පුවත්පත් ආයතනයක් රජයට පවරා ගැනීමකි. එහෙත් එම වකවානුවේ එම අරගලය පසුපස සිටියේ වමේ හා ප්‍රගතිශීලි පීඩිතයන් වෙනුවෙන් කථා කළ උගතුන් හා බුද්ධිමතුන් ය. දේශපාලනඥයෝ ය. අවසානයේ දී අප සිදු කළ ඇත්තේ කුමක්ද? තනි පුද්ගලයෙකු හෝ ඔවුන්ගේ අධ්‍යක්‍ෂ මණ්ඩලයකගෙන් යුක්ත ව්‍යාපාරයක් රජයට පවරා ගැනීමකි. එය 'ප්‍රකාශන නිදහස' අර්ථයෙන් එදා විවරණය වූයේ නැත. ඒ වෙනුවට එදා විවරණය වූයේ පෞද්ගලික අංශය මෙහෙයවන ලද පුවත්පතක් විසින් පොදු ජනතාවගේ අදහස් යටපත් කිරීම පිළිබද දෘෂ්ටිකෝණයකිනි.

ප්‍රකාශන නිදහස පිළිබද මාක්ස්වාදී බුද්ධිමතුන්ගේ විශ්ලේෂණයන් විවිධාකාරයෙන් විවරණය කරමින් ලියවුණු ලිපි ලේඛන අතර උඩුගම් බලා යන එම ක්‍රියාවලියට අභියෝග කළ එකම පොත් පිංච මට කියවන්නට ලැබුණේ එවකට ලංකා සමාජ පක්ෂයේ මධ්‍යම කාරක සභිකයෙකු වූ වී. කරාලසිංහම්, ''පුවත්පත් නිදහස'' යන මැයෙන් ලියන ලද ලියෝන්ට්‍රොස්කිගේ ''නිර්මාණය හා නිදහස'' පිළිබද ප්‍රකාශිත අදහස් පදනම් කරගත් කෘතියයි. ප්‍රකාශන නිදහස හා මාධ්‍ය භාවිතය පිළිබද එම සංසිද්ධින්ගෙන් පසුව ගෙවී ගිය දශක කිහිපය පිරී ඇත්තේ පහරදීම්, මසවාගෙන යාම්, මරා දැමීමය. හැත්තෑව, අසූව හා අනූව දශක තුළ මෙන්ම විසිඑක්වන සියවස මුල් දශකය තුළ ද මෙම සිද්ධින් සියයට ආසන්න ප්‍රමාණයෙන් කතිකාවට ලක් වූයේ කවුරුන් පිළිබදවද? කවර සිද්ධින් පිළිබදවද? එම තෝරා ගැනීම් පසුපස ඇති සාධක පිළිබද විමසීමේදී, ලාංකේය ප්‍රකාශන නිදහස පිළිබද අරගලයේ තවත් පැතිකඩක් නිරූපණය වේ. එයින් තෝරාගත් සිද්ධි කිහිපයක් මෙසේය.

-ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන යුගයේ දිවයින, The Island ඡායාරූප ශිල්පි විමලසුරේන්ද්‍ර ඝාතනය,

- ජනාධිපති ප්‍රේමදාස යුගයේ රිචඩ් ද සොයිසා ඝාතනය,

-ජනාධිපති මහින්ද රාජපක්ෂ යුගයේ ධර්මරත්නම් සිවරාම් ඝාතනය.


මෙම කතිකාවන් පසුපස පෙනෙන ප්‍රධාන සාධක මොනවාද? ඔවුන් ප්‍රධාන වශයෙන් ප්‍රවෘත්ති තොරතුරු ඡායාරූප සපයන ලද්දේ ඉංග්‍රීසියෙන් පළවන මාධ්‍යයන්ට වීම ඊට මූලික හේතුවයි. දෙවැන්න ඔවුන් අගනුවරට කේන්ද්‍රගත වූ මාධ්‍යවේදීන් වීමයි. ඔවුන්ගේ පාඨකයින් සමාජයේ ප්‍රභූ බලවත් බලපෑම්කාරී දෙස් විදෙස් පිරිස් වීම තෙවැනි හේතුවයි. මීට අමතරව සෑම පාලන තන්ත්‍රයකදීම ප්‍රාදේශීය මට්ටමේ සිංහල, දෙමළ එමෙන් ම බහුජනතාවක් කියවන මාධ්‍යකරුවන් ගොදුරු බවට පත්විය. ඔවුහු තම ප්‍රකාශනයට විරුද්ධව බලධාරීන්වය හා ආධිපතිත්වයේ නැත්නම් වෙනත් අවි ගත් කැරලිකරුවන්ගේ ගොදුර බවට පත් වූහ. නමුත් එම සිදුවීම් ජනමතයක් හෝ ප්‍රකාශන නිදහස පිළිබද තීරණාත්මක ගැටුමක් ඇති වීමට හේතු නොවීය.

මෙරට ප්‍රකාශ නිදහස පිළිබද සැබෑ අවංක ඕනෑකම ස්වදේශික අවශ්‍යතාව මත සිදු වීද යන්න තව දුරටත් ගැටලුවකි. අප වෙනුවෙන් ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන හඬ නැගීම සාධාරණය, එය අගය කළ යුතුය.

එහෙත් අප මෙවන් සිද්ධින් ගොනු කරන්නේ ජාත්‍යන්තර ඕනෑ එපාකම් සඳහා ද? අප අපේක්ෂා කරන ප්‍රකාශන නිදහස සැබෑවට ම යථාර්ථයක් ද? පෙරළා විමසා බලමු. මාධ්‍ය නිදහස සැබැවින් ම කා සඳහා ද? කුමක් අරභයා ද?

සටහන

**ඩී. වී. සමන්තිකා මාධවී**



# හැඟීම්වලට වහල් [නො]වීමේ

# නිදහස

ආදරය, විවාහය, මරණය, රණ්ඩු දබර, පැල් රැකීම, අම්මා, තාත්තා පිළිබඳ විවිධ වූ ජනශ්‍රැති අර්ථ කරන වර්තමානය මෙන්ම අතීතය සමඟ සසඳා බැලීමේදී ඇගයීමකට ලක් කළ හැකිය. මෙහිදී ඒ ඒ පුද්ගලයා සහ සමාජයේ නිදහස, වහලීම යන කාරණා මූලිකව පෙර දැරී කරගෙන ඊට අගය කිරීමකට ලක් කර ඇති බව පෙනේ.

ජනශ්‍රැතිය පිළිබඳව ලෝකයේ විවිධ නිර්වචන ඇතත් මේ පිළිබඳව කවරෙක් නිශ්චිත අර්ථ කථනයක් නොමැත. ලෝකයේ විවිධ ජන කොට්ඨාශයන් හා ජන කුලයන් අධ්‍යයනය කිරීම තුළින් මෙම ගැටලුව අවබෝධ කර ගැනීමට හැකිය. සිරිත් විරිත් ආදැහිලි වත් පිළිවෙත් අභිචාර තුම ආදී සියලු දේ ජනශ්‍රැතිය තුළ අර්ථ ගැන්වෙයි. මෙම ජන සාහිත්‍යය ඇතුළු කර ගනිමින් ගොවිතැනෙත උපහැරණ, ආජිවෝපදේශ, ජන කවි හා ජන කථා ද ජනශ්‍රැතියෙන් පැන නැගී දිලුවන් වශයෙන් දැක්විය හැකි ය. මේ අනුව කිසියම් ජන කොට්ඨාශයක උපතේ සිට මරණය දක්වා ඇති ජීවිතය ආශ්‍රිත බැඳි ගොවිතැන සාමාන්‍ය ආදී ජන සංස්කෘතියේ සියලුම දේ ජනශ්‍රැතිය වශයෙන් දක්වේ. මානව නිදහස යනු මිනිසුන් ජන කොට්ඨාශයක පෞතික ප්‍රභූවර හා ජන සම්ප්‍රදාය අතර බැඳි සංකල්පයක් වේ. මෙම සීමාවන් හඳුනා ගැනීමෙන් තොරව සිහිවෙතැයි දුර ගමනක් යන්නට අනාගතය. ජන සම්ප්‍රදාය හා බැඳි 'තහංචි' සංකල්පය පෙර්පුරුවන් මානව නිදහසේ ඇතැම් අංශ කෙරෙහි සීමාවන් ඔවුන් විසින් කුඩා අවධියේ පටන් වැඩිහිටි අවධිය දක්වාම ඇසිකර ගෙන සිටීම පුදුමයකි. මෙම තහංචි සංකල්පය මරණේ සිරිත් අනුගමනය කළ යුතු දේ වශයෙනුත් විරිත් බැහැර කළ යුතු දේ වශයෙනුත් මානවයා විසින්ම වෙන්කොට ගෙන තිබේ.

තහංචි වල ස්වභාවය ඒ ඒ මිනිස් අවධින් අනුව වෙනස් ස්වරූපයක් උසුලයි. උදාහරණයක් වශයෙන් ගත් විට කුඩා දරුවන් හට බිම වැටී ඇති යමක් කෑමට නොදී තහංචි පනවා කරන්නේ ඔවුන් ඒ කෙරෙහි බිය ගැන්වීම තුළිනි. එනම් එසේ කෑ විට යකුන් හෝ ප්‍රේතයන්ගේ බැල්ම ඔවුන් කෙරේ ඇති වන බවට ඔවුන්ව බිය වැද්දීමක් දෙමාපියන් හෝ වැඩිහිටියන් විසින් කරන්නේ මෙය නොකළ යුතු දෙයක් වශයෙන් ඔවුන්ට ඒත්තු ගැන්වීම සඳහාය.

යෞවන අවධිය වන විට මෙම තහංචි වෙනස් වේ. ඒ ඔවුන්ගේ දැනීමට සමාන වයසීම පිළිබඳව අවබෝධයක් ලබා දීම ද සිදු කරනු ලැබේ. විවාහයේ ඇති තහංචි සංකල්පය වෙනස්ම ස්වරූපයක් ගනු ලැබේ. එනම් විවාහයේ දී හැසිරිය යුතු ආකාරය පිළිබඳව අවබෝධයක් ඒ තුළින් ලබා දීමට සැලසුම් කර ඇත.

මේ ආකාරයට ජන සම්ප්‍රදාය තුළින් පිළිබිඹු වෙන තහංචි මානව ජීවිතයේ එදිනෙදා සියලු ක්‍රියාකාරකම් වලට මෙන්ම පරිසරය කෙරෙහිද බද්ධව පවතින්නක් වශයෙන් හඳුන්වා දිය හැකිය. මෙය ලාංකේය සමාජය තුළ ඉතා ප්‍රබල නිර්ණායකයක් වශයෙන් ද පෙන්වා දීමට හැකි පිළිවන.

ගැමි සංස්කෘතියක් තුළම ජනශ්‍රැතිය පවතී. උදාහරණයක් වශයෙන් සිංහල හින්දු අලුත් අවුරුද්ද ගත් විට එය නාගරික මෙන්ම ග්‍රාමීය සමාජයට එකසේ බල පෙන්නුම් කරන්නේ ඔවුන්ගේ හැසිරීම යන එම අවුරුදු සිරිත් විරිත් අතර ඇති වර්තමානය පිළිබඳ අවබෝධය එක සමාන වේ. අත්දැකීම් වල වෙනසක් මිසුවක් ඔවුන්ගේ හැසිරීමවන්ගේ වෙනසක් නොමැත.

මානව නිදහස වර්තමානය හා සලකන විට ජන සම්ප්‍රදාය තහංචි යනු ද අර්ථ දැක්විය හැකිය.

අතීතයේ පැවති සරල සාම්ප්‍රදායික ලක්ෂණ අවසන් වී අද වන විට ආධුනික කාලිකයට පැමිණ ඇත. ප්‍රබල තාක්ෂණය හා බැඳි යාන්ත්‍රණයක් වශයෙන් ක්‍රියාත්මක වී එමෙන්ම එනම් දුරකථනය සමඟ යන විට මේ විස්තරම නොපැහැදුනකි.

වර්තමානය වන විටදී මව පිළිබඳවද සමාජය තුළ පවතින සංකල්ප පටු අර්ථකථනයට පමණක් සීමා වී ඇත. අතීතයේ තිබූ මහා පවුල් සංස්කෘතිය බිඳ වැටී නූතනය වන විටදී අලුසැම් පවුල ඉස්මතු වෙමින් පවතී. මෙහිදී බිහි වන දරුවා ගැටුම්කාරී මානසිකත්වයක් තුළින් ජීවිතය ගෙන යන්නෙත් වේ. අතීතයේ තිබූ නිදහස අද වන විට මවුන්ට අහිමිව ගොස් අවසානය.

මවගේ ගැබිබර අවධිය ඉතාමත් මනහරය. මෙය ජනශ්‍රැතිය තුළ ඉතාමත් කැපී පෙනෙන ආකාරයට අර්ථ දක්වා ඇත. මේ අවධියේදී මව 'ගැබිබර සිරියාව' ලෙස නම් කර දරු ප්‍රසූතිය සමාජ පරිසරයත් සමගම සමාජය තුළට අනුගත කර ඇත. මේ අවධියේදී මවගේ නිදහස අසීමාන්තිය. අද වන විට මෙය ක්‍රම ක්‍රමයෙන් දියවී ගොස් මවද කාර්මීකරණයට ලක් කර ඇත.

පියා යන සංකල්ප අර්ථ කථනයට ලක් කළ හොත් විශාල සමාජ වගකීමක් වශයෙන් දිග හැරෙන මෙම සංකල්පය අතීතයේදී ඇවැස්ස මස්සිනා යන සංකල්පයත් සමග ඉතා ප්‍රබල අයුරින් බැදුණ පැවතිනි. මෙහිදී ප්‍රායෝගිකත්වයට මුල් තැන ලබා දෙමින් නොවිකැන හා බැඳි ජන පිළිවෙත් නිවැරදිව හඳුනාගත් ඇසූ පිරූ තැන් ඇති පුද්ගලයාට තම දියණිය ලබාදීම සිදු විය. මේ නිසා පියා යන පුද්ගලයා සමාජය තුළ ඉතා ප්‍රබල චරිතයක් වශයෙන් හැඩ ගැසිණි.

අතීතයේ පැවති හදවතින් සුභ පැතීමේ චාරිත්‍රයද අද වන විට ජංගම දුරකථනයේ කෙටි පණිවිඩයකට සීමා වී ඇත. ඒ තරමටම මෙහි යාන්ත්‍රික ගුණාංගයන් ඔප් නැංවී ඇති ආකාරය අපට අවබෝධ කර ගත හැකිය. මෙහිදී තාක්ෂණය ධනවාදයට මූලිකව වර නැගී ඇති ආකාරය පෙන්වා දිය හැකිය.

සාපේක්ෂ වශයෙන් ගත් විටදී පැරණි සමාජයේ මානව නිදහස උපරිමයෙන් ම දක්නට ඇත. නමුත් පරිසරයත් සමග සමාජ සාධක වෙනස් වේ. එකල පැවති ගම්මැද්දෙන් පිට ගෙවල් නොසෑදීමේ තහංචිය සමාජ තත්ත්වය නිරූපණය කරන්නක් වශයෙන් පෙන්වා දිය හැකිය. මෙහිදී මිනිසුන් අතර තරගයක් නොතිබුණි. පරිසරයට මූලිකත්වය දෙමින් සමාජයේ ඉදිරි පැවැත්ම තහවුරු කිරීමට ගත් උත්සාහයක් වශයෙන් මෙය අර්ථ නිරූපණය කළ හැකි ය.




මේ ආකාරයට ජන සම්ප්‍රදාය තුළ ඇති මානව නිදහස සමාජයට අත්‍යාවශ්‍යම සාධකයක් බවට පත් වේ. නමුත් අද වන විට මෙය අව්‍යාජත්වයක් සමග හැඳී පෞද්ගලීකරණය ඔස්සේ ගැටුම්කාරී වාතාවරණයකට හැඩ ගැසී ඇතත් ලෝකයේ විවිධ සංස්කෘතීන් අතර ඇති බැදීම් බිඳනොදැමිය යුතුය. භෞතික දේවල් ද ඇතුළත් කර ගනිමින් අව්‍යාජත්වයෙන් තොරව යහපත් සමාජයක් ඇති කිරීමට පුරුදු පුහුණු විය යුතුය. එවිට ඉදිරි අනාගතයේදී දරුවන්ට ව්‍යාජත්වයෙන් තොරව වූ මානව නිදහස උපරිමයෙන් ඇති සමාජයක දිවි ගෙවීමට හැකියාව ලැබේ.

ඉදිරි ලෝකයේ ඇති වීමට නියමිත සංස්කෘතීන් අතර ඇති ගැටුම අවම කර ගනිමින් සමාජ සංස්කෘතිය තුළ එකිනෙකා අතර සංස්කෘතික වටිනාකමක් ගොඩනගා ගෙන මානව නිදහස අගය කරන සමාජයක් බිහිකර ගත හැකිවේ.

(ලාංකේය ජනශ්‍රැතියෙන් නිරූපිත නිදහස පිළිබඳව ජනශ්‍රැති පර්යේෂක මහින්ද කුමාර දළුපොත මහතා සමග සිදුකළ සංවාදය ඇසුරෙන් මෙම ලිපිය සකස් කරන ලදී.)

*සංවාද සටහන*

**සතෝරි ආරියදාස.**


hyrax
CEYPETCO
LUBRICANTS
50
1962 - 2012
CEYLON PETROLEUM CORPORATION
ENERGIZING THE FUTURE
50 Years and Beyond
CEYPETCO
LUBRICANTS
28
API JASO ISO 9001 2000 Certified Lubricants
CEYLON PETROLEUM CORPORATION
CEYPETCO
ENERGIZING THE FUTURE
ENERGIZING THE FUTURE

# නව මාධ්‍යයේ පුවත්පත් කසාදය

## යා දෙක නොරත රත

ඉක්මණින් ම වැඩිවිගෙන යන ජනමාධ්‍යයකි පුවත්පත. ලෝකයේ සංවර්ධිත රටවල බොහෝ පිරිස් එසේ සිතනවා. ඇතැම් ඇමෙරිකානු විශ්ලේෂකයින් 2040 ගණන් වන විට ඇමෙරිකානු පුවත්පත් තම අවසන් මුද්‍රිත පිටපත නිකුත් කරනු ඇතැයි දින නියම කරන්නත් පටන් අරගෙන. එහෙත් ලෝක පුවත්පත් සම්මේලනය (World Association of Newspapers-WAN) ප්‍රකාශ කරන්නේ ලොව පුරා පුවත්පත් පාඨකත්වයේ ඉහළ යාමක් පොදුවේ දක්නට ලැබෙන බවයි. කොහොම වුණත් පසුගිය දෙසැම්බරයේ සුප්‍රකට 'නිව්ස්වීක්' සඟරාව තම අවසන් මුද්‍රිත සඟරාව ප්‍රකාශයට පත්කිරීමත් සමග මේ සාකච්ඡාව අලුත් වටයකින් ආරම්භ වෙලා.

පුවත්පත් වල බිඳවැටීමත් සමගම බොහෝදෙනා නව මාධ්‍යයේ වර්ධනයක් ගැන කතා කරනවා. යුරෝපීය පුවත්පත් පිළිබඳ සමීක්ෂණවලදී පුවත්පත් කියවූ බව සඳහන් කරන බොහෝදෙනා කියවා ඇත්තේ පුවත්පත් වෙබ් සංස්කරණය බවට තහවුරු කරලා තියෙනවා.

පුවත්පත් සම්බන්ධයෙන් තිබෙන මේ තත්ත්වය ගැන සාකච්ඡා කෙරෙන අලුත්ම සිදුවීම වන්නේ ඇමෙරිකාවේ සුප්‍රකට වොෂින්ටන් පෝස්ට් (Washington Post) පුවත්පත් හිමිකාරීත්වය නවමාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයෙක් මිලදී ගැනීමයි.

වොෂින්ටන් පෝස්ට් පුවත්පත යනු ලෝකයේ ප්‍රධාන පුවත්පත් දහය අතර දිගුකලක් වැජඹුණු පුවත්පතක්. බොහෝදෙනා මේ පුවත්පත ගැන දන්නේ ඇමෙරිකානු ජනාධිපති රිචඩ් නික්සන්ට සිය ධුරයෙන් ඉල්ලා අස්වීමට මග පෑදූ වෝටර්ගේට් සිදුවීම හා සම්බන්ධවයි. එහෙත් 1974 සිදු වූ එම සිදුවීමට පෙර සිටම වොෂින්ටන් පෝස්ට් පුවත්පත දෙවන වූයේ නිව්යෝක් ටයිම්ස් පුවත්පතට පමණයි. වොෂින්ටන් පෝස්ට් පුවත්පතේ නව හිමිකරුවා වන්නේ ජෙෆ් බෙසෝ (Jeff Bezos). හතලිස් හැවිරිදි ඔහු ලෝකයේ සුප්‍රකට

**ඇමසොන් ව්‍යාපාරය ඇරඹූ බේසෝ, දශක දෙකක් තුළ ලෝකයේ ප්‍රකාශන කර්මාන්තය උඩුයටිකුරු කරනු ලැබුවා. එවැනි පෙරළියක් වොෂින්ටන් පෝස්ට් පුවත්පතේ ඔහුට කළ හැකිදැයි යන්න ඉදිරියේදී දැනගන්න ලැබේවි.**

**"ප්‍රවෘත්තිය හඹායන්න, එහි වියදම ගැන නොසිතන්න"**

අන්තර්ජාල පොත් අලෙවි ව්‍යාපාරය වන amazon.com හි අයිතිකරුවායි. ඇමෙරිකානු ඩොලර් බිලියන විසිතුනකට අධික වටිනාකමක් සහිත ව්‍යාපාරයක හිමිකරුවා වන ඔහු පෝස්ට් පුවත්පත වෙනුවෙන් වැයකර ඇත්තේ ඇමෙරිකානු ඩොලර් මිලියන 250 ක් වැනි සුළු මුදලක්. පුවත්පත මිලදී ගනිමින් ඔහු ප්‍රකාශ කර ඇත්තේ පුවත්පත පවත්වාගෙන ගිය සම්ප්‍රදායකත් කිසිසේත්ම වෙනස් විය යුතු නැති බවයි. අනෙක් අතට ඔහු පෙන්වා දෙන්නේ මෙය තම පුද්ගලික මිලදී ගැනීමක් මිස ඇමසොන් හා සම්බන්ධ ගනුදෙනුවක් නොවන බවයි

වොෂින්ටන් පුවත්පත යනු සුප්‍රකට පවුල් හිමිකාරීත්වය යටතේ පැවැති පුවත්පතක්. ග්‍රැහැම් පවුල එහි හිමිකාරීත්වය අවුරුදු අසූවක් රැකගෙන සිටියා. පුවත්පත ආරම්භවන්නේ 1877 දී. ස්ටිලොග් හචින්ස් එහි මූලාරම්භකයා. කළු ජාතිකයන් ඇතුළු විදේශිකයන්ට එරෙහි පුවත්පත් භාවිතයක් පවත්වාගෙන ගිය ඔහු 1889 දී එය විකුණා දැම්මා. 1905 දී පුවත්පත මිලදී ගත්තේ ජෝන් ආර්. මැක්ලී. 1933 දී හිටපු කතුවරයෙකු වන ඉයුජින්මෙයර් විසින් මිලදී ගත්තා. ඔහු ලෝක බැංකුවේ ආරම්භක සභාපතිවරයා ලෙස පසුව කටයුතු කළා. 1948 දී ඔහු පුවත්පත් පාලනය සිය දියණිය වූ කැතරින්ට හා ඇගේ ස්වාමි පුරුෂයා වූ පිලිප් ග්‍රැහැම්ට පැවරුවා.

1979 දී කැතරින් ග්‍රැහැම් තම පුත්‍රයා වූ ඩොනල්ඩ් ග්‍රැහැම් පුවත්පත් ප්‍රකාශකයා ලෙස පත්කළා. ඇය තවදුරටත් සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කරමින් පුවත්පත මෙහෙයවූවා.


දශක අටක් ග්‍රැහැම් පවුලට අයත්ව තිබූ පුවත්පත් අලෙවිය ගැන වත්මන් ප්‍රධාන විධායක ඩොනල්ඩ් ග්‍රැහැම්ට ඇත්තේ සුබවාදී බලාපොරොත්තුවක්.

ඔහු ඇතුළු පුවත්පත් ව්‍යාපාරය හා සම්බන්ධ ග්‍රැහැම් පවුලේ සැවොම බෙසෝගේ අදහස් හා උනන්දුව ගැන පැහැදිලා. පුවත්පත් සමාගමේ අලෙවියට එරෙහිව පවුලේ ඇතුළතින්ම මතු වූ අදහස් ඒ අනුව තරමක් යටපත් කරන්න සමත්වෙලා තිබෙනවා. පෝස්ට් පුවත්පත් සංස්කාරක මාර්ටින් බැරන් තවදුරටත් එම තනතුරේ රැඳී සිටීවි. ඒ වගේම එහි දෙදහක් පමණ වන සේවක මඬුල්ලගේත් සේවය නව පාලන රටාව තහවුරු කරන්න පොරොන්දු වෙලා.

වයස අවුරුදු තිහේදි සිය දෙමාපියන්ගෙන් ණයට ඉල්ලාගත් මුදලකින් ඇමසොන් ව්‍යාපාරය ඇරඹූ බෙසෝ, දශක දෙකක් තුළ ලෝකයේ ප්‍රකාශන කර්මාන්තය උඩුයටිකුරු කරනු ලැබුවා. එවැනි පෙරළියක් වොෂින්ටන් පෝස්ට් පුවත්පතේ ඔහුට කළ හැකිදැයි යන්න ඉදිරියේදී දැනගන්න ලැබේවි. වොෂින්ටන් පෝස්ට් පුවත්පත මිලදී ගනිමින් එහි වාර්තාකරුවන්ට ඔහු ප්‍රකාශ කළ අදහසේ එවැනි බලාපොරොත්තුවක ඉඟියක් පවතිනවා.

''ප්‍රවෘත්තිය හඹායන්න, එහි වියදම ගැන නොසිතන්න''

**විජයානන්ද රූපසිංහ**



# කාලයෙන් කාලයට මතකයන් රැගෙන යන පන්හිදේ කතන්දරය

වර්තමානයේ ඔබ අතට පත්වන පෑන විවිධ වර්ගයන්ගෙන් හා විවිධ වර්ණයන්ගෙන් සැදුම්ලත් වේ. බෝල් පොයින්ට් පෑන, රෝලබෝල් පෑන ,ෆෙල්ට් තුඩු පෑන, උල්පත් පෑන, යනාදී පෑන් වර්ග රාශියකි. නිල්, රතු, කහ, කළු, වර්ණ මේ අතර වේ. පෑන තීන්ත භාවිත කර යම් මතුපිටක, විශේෂයෙන් කඩදාසි වල ලිවීමට යොදා ගන්නා දිග සිහින් වටකුරු උපකරණයකි. ආදී කාලීන ඉන්දියානුවන් ප්‍රථමයෙන් පෑන භාවිත කර ඇති බව ඉතිහාස තොරතුරු වල සඳහන් වේ.

පැරණි මූලාශ්‍ර වලට අනුව පෑන මුලින්ම තනන ලද්දේ කුරුලු පිහාටු උණ කෝටු භාවිතයෙනි. පුරාණ සාහිත්‍ය නිර්මාණ වශයෙන් ගැනෙන රාමායණය, මහාභාරතය වැනි කෘති ලිවීම සඳහා ද මෙවැනි පෑන් භාවිත කරන ලදී. ආදී කාලීන මිසර වාසීන් පැපිරස් පත්‍රවල ලිවීම සඳහා සිහින් ඉපි බුරුසු යොදා ගෙන ඇත. හත්වන සියවසේ දී පමණ පිහාටු පෑන වෙනුවට ඉපි පෑන යොදා ගැනීම ආරම්භ විය.

පිහාටු පෑන සාදන්නේ විශාල පක්ෂියෙකුගේ පිහාටු වලිනි. මේ සඳහා බොහෝ විට පාත්තයින්ගේ පිහාටු යොදා ගනී. පිහාටුවේ කඳ තීන්ත ටැංකිය ලෙස ක්‍රියා කරන අතර තීන්ත ලැබෙන්නේ කේශාකර්ශණ ක්‍රියාව නිසාය. පිහාටු පෑන පුරාතන යුගයේ දී සමකඩ වල ලිවීමට හා කඩදාසි වල ලිවීමට භාවිත කර ඇත. පසු කාලීනව මෙය වෙනුවට ඉපි පෑන භාවිතයට ගනු ලබයි.

ඉපි පෑන පටු දික් සිදුරක් සහිත බටයකින් හෝ බම්බුවකින් කපා ගන්නා අතර මෙහි යාන්ත්‍රණය පිහාටු පෑනට සමාන වේ. මෙය දැනට භාවිතයේ නොමැති අතර ලිවීම සඳහා "තන්නි" නම් ලී පුවරු භාවිත කර ඇත.

ඉපි පෑන පකිස්ථානයේ සිසුන් විසින් ලී පුවරු වල ලිවීම සඳහා භාවිත කර ඇත. පිහාටු පෑන 1787 දී ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාව ලිවීමට හා අත්සන් ගැනීමට යොදා ගන්නා ලදී. රෝම අධිරාජ්‍ය බිඳ වැටීමෙන් පසු යුරෝපියන්ට ඉපියාවන් ලබා ගැනීම අපහසු නිසා ඔවුන් පිහාටුවලට යොමු ව ඇත. පිහාටු පෑන දහනව වන සියවස දක්වා භාවිත කරන ලදි. 1803 දී ලෝහ පෑන් තුඩ සඳහා පේටන් බලපත්‍ර ලබා ගත් නමුත් එය වාණිජ කටයුතු සඳහා යොදා ගත්තේ නැත. 1822 දී "ජෝන් මිචෙල්" විසින් ලෝහ තුඩ සහිත පෑන් නිෂ්පාදනය කරයි. ඉන්පසු ලෝහ තුඩේ ගුණාත්මක බව ක්‍රමයෙන් වැඩි වූ අතර ලෝහ තුඩ සහිත ගිල්වන පෑන් සාමාන්‍ය භාවිතය සඳහා පැමිණියේය. වර්තමානයේ අප පෑන ලෙසින් හඳුන්වන්නේ මෙයයි.

ඩබ්ලිව්. එම්. අයි. ලක්මාලි




# අතීසාරයට අමුඩ ගැසීම

විශ්ව ගම්මාන සංකල්පය අර්ථාන්විත වන්නේ නව මාධ්‍ය භාවිතයත් සමගය. වර්තමානය වන විට අන්තර්ජාලය පුද්ගල ජීවිතයේ අවියෝජනීය අංගයක් බවට පත්ව ඇත.

ලොව දසදෙස විසිරී පැවතුණ විවිධ තොරතුරු උකහා ගැනීමට මෙන්ම සන්නිවේදන සබඳතා ගොඩනගා ගැනීමටත් මහජන මතය සැකසීමටත් වර්තමානය වන විට නව මාධ්‍යය ක්‍රමෝපායයන් බහුල ලෙස භාවිතයට ගනී.

මිනිසා නිරන්තරයෙන් ම සන්නිවේදනයේ යෙදෙන අතර එය එක් ප්‍රදේශයකට එක් රටකට සීමා නොවේ. විවිධ සීමාවන් අතික්‍රමණය කරමින් ලොව දස දෙස විසිරී පැතිරුණ ජනතාව සමග ගනුදෙනු කිරීමට පුද්ගලයාට හැකියාව උදාවී ඇත. ඒ සමාජය තුළ ජනප්‍රිය අංගයක්ව පවතින ට්විටර් (Twitter), ෆේස්බුක් (Facebook) වැනි සමාජ ජාල ඔස්සේය.

මෙවැනි සමාජ ජාලා වෙබ් අඩවි වර්තමානය වනවිට අන්තර්ජාල හා පරිගණක සාක්ෂරතාවය බහුල පිරිස් අතර, තාරුණ්‍යයේ පිරිස් අතර ව්‍යාප්තව පවතී. පරිගණකයක් නොමැතිව විශේෂයෙන් ජංගම දුරකතන ආදිය ඔස්සේද අන්තර්ජාල සම්බන්ධතා ගොඩනගා ගැනීමට හැකියාවක් ඇත. එමෙන්ම නව මාධ්‍ය අදහස් ප්‍රකාශ කිරීමේ හා තොරතුරු හුවමාරු කිරීමේ පහසු මාධ්‍යයක් වන හෙයින් ද ජනතාව අතර වඩාත් ජනප්‍රියව ඇත.

වර්තමානය වන විට දැකිය හැකි කරුණක් වන්නේ නව මාධ්‍ය භාවිතයෙන් බහුල ලෙස සමාජය තුළ අපරාධ අපහාස ආදිය සිදුවන බවයි. අපරාධයක් යනු නීතිය ඉදිරියේ දඬුවමක් පැනවිය හැකි පරිදි අර්ථ ගැන්වූවකි. සමාජය තුළ පිළිගන්නා මුත් නීතිය ඉදිරියේ අර්ථ නොගැන්වූන වරදකට නීතිමය පියවර ගත නොහැකි ය. මෙම තත්ත්වය අන්තර්ජාල භාවිතයේදී දක්නට ලැබේ. අන්තර්ජාලය ඔස්සේ සිදු කෙරෙන විවිධ අපරාධ පාලනය කිරීමට සැකසුණ වෙනම නීති පද්ධතියක් නොමැති අතර විවිධ නීති ගණනාවකින් එකී ක්‍රියාකාරකම්, අපරාධ ආවරණය කළ හැකි ය.

- 2003 අංක 27 දරණ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත
- 2006 අංක 16 දරණ ඉලෙක්ට්‍රොනික් ගනුදෙණු පනත
- 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත
- 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත

මෙවැනි පනත් ගණනාවක් යටතේ අන්තර්ජාල භාවිතය පිළිබඳව නීති ක්‍රියාත්මකවේ. මෙම නීතිය හුදෙක් පරිගණකය ආශ්‍රිතව නොවූවද වෙනත් උපකරණයක් භාවිතයෙන් හෝ පරිගණකය සම්බන්ධව සිදුකෙරෙන අපරාධ ක්‍රියාවක් සඳහා වලංගුය. ඒ අනුව අන්තර්ජාලය ඔස්සේ සිදු කෙරෙන කවර ආකාරයේ හෝ ගනුදෙනුවක් ඉලෙක්ට්‍රොනික් පනත යටතට ගැනේ.

එම පනතට අනුව අන්තර්ජාලය ඔස්සේ සිදු කෙරෙන ඕනෑම අදහස් ප්‍රකාශනයක්, තොරතුරු හුවමාරුවක්, භෞතික ලියවිල්ලක් හා සමානවම සලකා නීතිය ක්‍රියාත්මක කරයි.

මේ ආකාරයට ඕනෑම වැරදි සහගත ක්‍රියාවකට නීතියෙන් දඬුවම් පැමිණ විය හැක්කේ අදාළ ප්‍රකාශය කළ කතුවරයා අනාවරණය කර ගැනීමත් සමගයි. නමුත් එලෙස කතුවරයා ග්‍රහණය කර ගැනීමට අවශ්‍ය තාක්ෂණික ඥානය හා ශක්‍යතා ලංකාව තුළ අවමය.

එවැනි තාක්ෂණික ක්‍රම අනුගමනය කරමින් අපරාධකරු ග්‍රහණය කරගත හොත් අදාළ නීති රීති යටතේ ක්‍රියාත්මක විය හැකිය. මෙවැනි වරදක් කළ පුද්ගලයන් වර්තමානයේ නීතිය ඉදිරියේ වරදකරුවන් වන්නේ, වරදකරු ලෙස සනාථ වීමෙන් නොව වරද පිළිගැනීමෙනි.

එම නිසා මෙහි පවතින නීතිරීති තත්ත්වයන් සංශෝධනයට ලක් කළ යුතුය. වර්මානය වන විටත් ජනමාධ්‍ය අමාත්‍යංශයයේ ඉල්ලීමකට අනුව සෑම වෙබ් අඩවියක්ම ලියාපදිංචි විය යුතු වුවත් ඒ සඳහා සකස් වූ නිශ්චිත නීති මාලාවක් නැත.


ඒ අනුව නව මාධ්‍ය ක්‍රමානුකූලව නියාමනය කිරීමට අවශ්‍ය නීති සම්පාදනය විය යුතුය. ඊට අමතරව අන්තර්ජාල නීතිය හා සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන් සමග ද එකඟතා ඇතිකර ගත යුතුය.

අන්තර්ජාලය තුළින් සිදුකරන වැරදි ක්‍රියාවන් නැවැත්වීම උදෙසා එයට පිවිසිය හැකි පහසු මාර්ග අවහිර කිරීම විනා වැළැක්වීම සිදුකළ නොහැකිය. එය ප්‍රායෝගික නොවේ.

ඇතැම් වෙබ් අඩවි විදේශයන්හි සිට ක්‍රියාත්මක කිරීම නිසා ඒවා පාලනය කිරීම විනා වැළැක්විය නොහැකිය. එම නිසා අවශ්‍ය නීති සකසා අන්තර්ජාල ඔස්සේ සිදු කෙරෙන බරපතල සමාජ විරෝධී ක්‍රියා පාලනයකට ලක් කළ යුතුය.

(නීතිඥ ජගත් ලියනාරච්චි මහතා සමග සිදුකළ සංවාදය ඇසුරෙන් මෙම ලිපිය සකස් කරන ලදී )

සංවාද සටහන
හිමාලි පලිහේන

මෑත කාලීනව බිහි වූ සාහිත්‍ය ඒකකයක් වුවත්, කෙටි කතාව අන් සියලු කලාංගයන් අභිබවමින් සිටියි. ලියෝන් සර්මෙලියන් නම් විචාරකයා පෙන්වා දෙන්නේ නවකතා සියයක් රචනා කිරීම පහසු වුවත් එක් කෙටි කතාවක් රචනා කිරීම අපහසු බවය. එහෙත් වචන සියයකින්වත් විස්තර කළ නොහැකි ගැඹුරු සංසිද්ධීන් වචන කිහිපයකින් ප්‍රකාශ කිරීමට තරම් නූතන කෙටි කතාකරුවාගේ මසැස පුසර වී ඇත.

එයට හොඳම නිදර්ශනයක් ජෝන්. එෆ්. කෙනඩි නම් ලේඛකයා රචනා කළ **An introduction to mordern Lit** නම් කෘතියෙන් අපට හමුවෙයි. නූතන කෙටි කතාවේ ප්‍රශස්ත බව සනාථ කිරීමට කෙනඩි සිය කෘතියේදී නිදර්ශනයක් ලෙස ඉදිරිපත් කරන මෙම කෙටි කතාව ලෝකයේ කෙටිම කෙටි කතාවයි. එහි ඇත්තේ වචන විසි තුනක් පමණි. එහෙත් ඒ වචන කිහිපයෙන් මතු අප වෙත ඉදිරිපත් කරන කතන්දරය ඉතා දීර්ඝ ය. ඒ අතින් කෙටි කතාකරුවාගේ පරිකල්පන ශක්තිය විශිෂ්ට ය.

# කෙටිම කෙටි කෙටි කතාව

**"දොරගුළු ලූ ඇගේ පරණ නිවසේ ගැහැනිය වාඩි වී සිටියාය. තමා තනි වී ඇතැයි ඇය සිතුවාය. සියල්ල මිය ගොසිනි. දොරට සැව් කෙරුණු සීනුව නාදවිය."**

**(An introduction to mordern Lit by John F. Kenady)**

ගැහැනිය හෙවත් ස්ත්‍රිය සොබා දහමේ අපූර්ව නිර්මාණයකි. ළඳරියක, දියණියක, යුවතියක, ගැහැනියක, පතිනියක, හා මවක ලෙස ඈ සමස්ත විශ්වයට ම මුදා හරිනා චමත්කාරය නිමහිම් නැත.

සමාජ සත්ත්වයෙකු ලෙස මිනිසා විසින් සමාජයේ යහපැවැත්ම උදෙසා නොයෙක් නීතිරීති පනවා ගෙන ඇත. රටකට ජාතියක් වශයෙන් නැගී සිටීමට සංස්කෘතියක් අවශ්‍ය ය. සාරධර්ම, සිරිත් විරිත්, හර පද්ධතීන් එවන් සංස්කෘතියක අනිවාර්ය අංගයන් ය. එහෙත් අද එවන් සමාජ සංස්ථාවක් තබා එහි ඡායා මාත්‍රයක් හෝ ඉතිරිව නැත. මතුපිටින් පෙන්වන මහා සංස්කෘතිය අභ්‍යන්තරයේ නැත. එය කවුරුන් හෝ සොරකම් කරගෙන ගොසිනි. අද සමාජයේ ඇත්තේ නාම මාත්‍රික සභ්‍යත්වයකි.

ලේඛකයා 'දොරගුළු' යැයි කීවේ මේ නාම මාත්‍රික හර පද්ධතියට ය. පරඬැල්පත් වූ ස්ත්‍රීත්වයට, නීතිරීති, නම් දොරගුළු දමූ පරණ නිවස වන්නේ මේ සමාජය යි. ගැහැනිය වාඩි වී සිටින්නේ මෙහි ය.

'ගැහැනිය' යන යෙදුම ද ඉතා ප්‍රබල ය. මන්ද මෙහි සිටින්නේ යුවතියක් නොවේ. ගැහැනියකි. එසේනම් ඇයට සැමියෙකු සිටිය යුතු ය. එහෙත් නැත. එම යෙදුමෙන් ලේඛකයා අපට දැනවීමට උත්සාහ කරන්නේ මේ සමාජය ඇයට කළ විනාශයේ හැඩතල ය.

සැම ගැහැනියක් තුළම මවක් හා වෙසඟනක් ජීවත් වෙති. මේ ද්විත්ව චරිතයන්ගෙන් කුමක් ඉස්මතු විය යුතු ද යන්න තීරණය වන්නේ පවත්නා සමාජ ක්‍රමය හා කාලය අනුව ය. තමාගේ අයිතියවත් තමා සතු නොවී ජීවත්වීම ඉතා බියකරු ය.

කෙටි කතාවේ සඳහන් වන පරිදි ඇය සිටින්නේ වාඩිවී ය. එසේ නම් ඇයට දෙපයින් නැගී සිටීමට නොහැකි ය. සමස්ත ස්ත්‍රීත්වයේ නිෂ්පාදය අක්‍රිය වූ සැටි එයින් ධ්වනිත වෙයි.

අවසානයේ ඇය තනිවම සුසුම් හෙළන්නී ය. කඳුළු සලන්නී ය. තමා තනි වී ඇති බව දත් ඇයට ප්‍රත්‍යක්ෂ ය. මානව දයාව, ආදරය, කරුණාව, විශ්වාසය ආදී සියල්ල මිය ගොසිනි. කොහොඹ ගසින් මී පැණි පැතීමට තරම් ඇය අසරණ වී ඇත. මේ සමාජයට ඇය තවත් වෙළඳ භාණ්ඩයක් පමණි.

පළඟැටියා පැමිණ පහනට පැන තමනුත් පිච්චී පහනත් නිවන්නා සේ කාමුක ලෝකයා ඇයට පැන, උන්ද නැසී ඇය ද නසන්නේ ය. පහන් සිල දල්වෙන්නට නොව නිවෙන්නට මර වස්තුවකි. ඇය ද එසේ ය. එහෙත් පහන් සිල නොනිවා රැකගන්නා සේ අප ඇයව රැකගත යුතු ය. පහන් සිලේ ආලෝකය වැනි පිටතට විහිදෙන රාගයක් ගැහැනිය සතු ය. එය ගින්නකි. ගින්නෙන් අප ලබාගත යුත්තේ ආලෝකය මිස අන්නි දාහය නොවේ.

එහෙත් අප එය තවම වටහාගෙන ඇති බවක් නොපෙනේ. දොරට සැව් කෙරුණු සීනුව නැවත වරක් නාද වූයේ ඒ නිසා ය. තවත් ගැනුම්කරුවෙකු පැමිණ ඇත. අවාසනාව වන්නේ සීනුව සවිකර ඇත්තේ දොරේම ය. එනම් ගැහැනියකගේ පවිත්‍රතාව සොයමින් ඇයව වදිනා මේ සමාජයම ඇයව විනාශ කිරීමට පැමිණ ඇත.

ද්වි සංකේතානුසාරී භාෂාවක සඟවා කෙටි කතාකරුවා අපට දැනවීමට උත්සහ කළ ස්ත්‍රීත්වයේ ඛේදවාචකය මෙය යි. අවසානයක් නොදකම ගමන් ගන්නා මේ සමාජය කරනා සංහාරය නවතාලිය යුතු ය. ලොවක් ලස්සන කරන ඇය ලස්සන වන්නේ එදාට ය.

ඉලේකා රුවන් පතිරණ

# තවත් එක් වසන්තයක්

**"මගේ යටගියාව මට අමතක වී නැත. එය අමතක කළ නොහැකි ය. කවරෙක් වුව මගේ යටගියාවෙන් මං අත් වුවා පමණකි."**

අතීතය, වර්තමානය, අනාගතය යන කාල මිනිස් දිවියේ කාටත් පොදු ධර්මතාවකි. එය අතැර දමා දිවි ගෙවීමට නොහැකි ය. ජීවිතය පියවරෙන් පියවර ඉදිරියට ගමන් කරන විට අනාගතයේ අරුත් ගැන්වීම උදෙසා නව සිහින අපට හමුවේ. එකී සිහින ඉටු වූ පසු මිනිසා ජීවත්වන්නේ තමාගේ සිහින ලෝකය තුළ පමණි. තමාගේ යටගියාව, අතීතය අමතක කර තමා විසින් ම මවාගන්නා ලද වීදුරු මාළිගයන්හි දිවි ගෙවීමට බොහෝ මිනිසුන් කැමති ය. තමා ඕළිඳෙකු ලෙස මෙලොව එළිය දුටුවේ නම් සමාජ තත්ත්වය ද සුරකින් ම උරුම කර ගෙන බව ඔවුහු සිතා සිටිති. එහෙත් ඔවුන් නොදන්නා එක් කරුණක් ඇත. එනම්, තම හද ගැබෙහෙන් පලා ගොස් කෙදිනකවත් තමාට ජීවත්වීමට නොහැකි බවයි. මිනැම පුද්ගලයෙකුට තමාගේ යටගියාව අමතක කළ නොහැකි ය. කළ හැක්කේ තමන්ගේ යටගියාවෙන් ඈත්ව දිවිගෙවීම පමණකි.



**"මං අමාරුවෙ වැටෙග යන විගෙත් කිසිවක් හැඟවීමට උත්සහ කරන්න එපා."**

මහ පොළොවේ පය ගසා දිවිගෙවන විට නිරතුරු සමාජයත් සමග උරෙනුර ගැටී ගනුදෙනු කිරීමට සිදුවන බව අප කවුරුත් දන්නා සත්‍යයකි. අන් අය සමග ජීවත් වනවිට සාධාරණය, අසාධාරණය, යහපත, අයහපත අප ඇග ගැටෙන්නේ නොදනුවත්වම ය. සාධාරණය, යහපත බලා එයට ප්‍රශංසා මුඛයෙන් හඬ නැගීම මිනිසුන් ලෙස අප අනුගමනය කළ යුතු ධර්මතාවකි.

එහෙත් අසාධාරණය, අයහපත ඉදිරියේ කටකුරාවෙන් දෙතොත් වසා, හඬ නොතළා, දෙසවන වසා සිටීම මිනිසත්කමද? නැතහොත් අනෙකා වැටෙන විට එදෙස බලා සරදම් පෑමද? සිතිය යුත්තේ අපිම ය.

තමාට අත්වන ඉරණම කුමක් වුව ද වැරැද්ද නිවැරදි කර යහපත් සමාජයක් ගොඩනැගීම අප සැමගේ ම යුතුකමයි. එය උත්තරීතර මිනිසත්කමකි.

**"ඔව්, ශීත කාලය පැමිණේවි. තද ශීත කු... හමාවී. හිම කැට සහිත මහ කුනුරු සුළි ... හමාවී. එහෙත් වසන්තය එනවා සත්තකයි."**

ජීවත් වෙනවා යනු වෙ... හඳුන්වන්නේ නිතරම අලුත් වෙමින් ... කරනවා යන්නයි. එහෙත් ජීවත්වෙන සියලු ... මිනිසුන්ට අලුත් වන්නට හැකි ද? වස... කාලය උදාවන්නට මත්තෙන් තද ශීත කු... හමන අතර ප්‍රබල සුළි සුළංවලට මුහු... දෙන්නට සිදුවේ. ඒත්.... අනතුරුව උදා... වසන්ත කාලය ඉතා චමත්කාර ජනක... වසන්ත කාලය තුළ සතුට, සසරල්ල පිරු... කාලයක් කරගන්නට නම් කුණාටු, සුළි ... වැනි තත්ත්වයන්ට මුහුණ දී එම අත්දැකීම ... සතු කරගත යුතු යි. එම අත්දැකීම් තුළින් ... පන්නරය තම ජීවිතය ජීවත් කරවීම උදෙ... මහා රුකුලක් වනු ඇත. අවැසි වන්නේ ... කුණාටු සුළි සුළං වලට බියේ සැඟව සි... නොව එයට සාර්ථකව මුහුණ දී වස... කාලයක් ජීවිතයට උදාකර ගැනීමට අව... පන්නරයෙන් සුපෝෂණය වීමයි.



**"ඔව්, හැම ජීව ප්‍රාණයකට ම තමාගේ ම වසන්තයකුත් තමාගේ ම සරත් සමයකුත් තියෙනවා."**

ලෝකයේ ජීවත්වන ඕනෑම මිනිසෙකුට තමාට ම වෙන් වූ යහපත් කාලයක් ද අයහපත් කාලයක් ද ඇත. එයට බලපාන ප්‍රධානම සාධකය වන්නේ තමා සිදු කරන්නා වූ යහපත් අයහපත් ක්‍රියාවන් ය.

'මුං වැපුරුවොත් මුං ද, තල වැපුරුවොත් තල ද ලැබෙයි.'

එහෙත් මුං වපුරා තල ද, තල වපුරා මුං ද අපේක්ෂා කළ නොහැකි ය. එලෙසම සමාජයට යහපතක් කළ විට යහපත ද, අයහපතක් කළ විට අයහපත ද ලැබේ. අයහපත සිදු කර කෙදිනකවත් යහපත අපේක්ෂා කළ නොහැකි ය. තම ජීවිතයේ වසන්ත කාලය උදාකර ගත හැකිවන්නේ තමාටම ය. එලෙසම ජීවිතය සරත් සමයෙන් ගහන අපූල දිවියක් කර ගැනීමට ද තමාට ම පිළිවන. එහෙත් අවශ්‍ය වන්නේ වසන්ත කාලය උදාකර ගෙන අරුත්බර ජීවිතයක් ගත කිරීමයි.

**"දන් ගස්වල කොළ හැලෙන වාරය. වසන්තයේදී ගස් පිදිගෙන එනවිට හැමෑ ලස්සනයි."**

ඉර එළිය වැඩිවන විට ඒ සූර්ය රශ්මිය ගසකට දරාගත නොහැකියි. එම රශ්මිය පරාජය කර තම ස්වරූපය රැකගැනීම උදෙසා ගස් විවිධ ආකාරයේ අනුවර්තන දක්වයි. දෘෂ්ටාන්තයක් ලෙස ගස්වල කොළ කහපාට වීම දක්විය හැකියි. ගසත් මිනිස් ජීවිතයත් බඳුයි. මිනිසා මිහිපිට තම අනන්‍යතාව රැකගෙන දිවිගෙවන විට ගසකට මෙන් ම මිනිසාට ද සූර්ය රශ්මිය බඳු වූ දරාගත නොහැකි විවිධ දුක් කම්කටුලු මතුවෙයි. නේකවිධ කරදර බාධා හමුවේ තම අනන්‍යතාව රැකගැනීම උදෙසා මිනිසා ද ගැටලුව සමග සටන් කරයි. ඒ සඳහා අනේකවිධ ක්‍රම උපායන් සැකසීම මිනිස් ස්වරූපය ලෙස හැඳින්විය හැකි ය. ගස්වලට සූර්ය රශ්මිය පාලනය කර නොහැකි ලෙසම මිනිසාට ද තම ජීවිතයට පැමිණෙන කරදර නවතාගත නොහැකි ය. ගස්වල කොළ හැලී යයි. මිනිසා කරදර හමුවේ පරාජය වේ. ගස නිරුවත් වේ. මිනිසා සැඟව සිටියි. එහෙත් මේ සියල්ල දෙස බලා සිටින සොබා දහම නිරුවත් ගසට ජීවයක් එක් කරමින් මල් වරුසා නංවයි. එවිට සොබා දහමේ අපූර්ව නිර්මාණයක් ලෙස ගස් දලුලා වැඩෙයි. මිනිස් දිවියේ කාර්කශ බව බලා සිටින දෛවය, හෙම්බත්ව හතිලන ජීවිතයට නව සුපසන් අරුතක් එක් කරමින් මිනිස් වත මඩලේ හසරැලි නංවයි. මෙවිට මුළු ලොවටම වසන්තය උදාවෙයි. ලෝකය තවත් ලස්සන වෙයි.

**(සෝවියට් සාහිත්‍යයේ හා කිර්ගිස් සාහිත්‍යයේ අසහාය ලේඛකයෙකු වශයෙන් හැඳින්වෙන චිංගීස් අයිත්මාතව් විසින් ලියන ලද, දුදිගම වී. රුද්‍රිගු සූරීන් විසින් සිංහලයට පරිවර්තනය කළ "ගුරු ගීතය" කෘතියෙන් උපුටාගත් උද්ධෘතයන් කිහිපයක් පාදක කරගනිමින් එයට ලබාදුන් ස්වාධීන අරුත් කිහිපයකි.)**

***ඉසුරු සුලෝචනා පෙරේරා***

# සැබෑ සංවර්ධනයක් කරා

සැබෑ සංවර්ධනයකට අවශ්‍ය වන්නේ යහපත් වූ ආකල්පයන් ය. එමගින් පවතින සංවර්ධනය ස්ථාවරව පවත්වා ගැනීමට හැකි වෙයි. රටක සංවර්ධනය කෙරෙහි ජනමාධ්‍යයට හිමි වන්නේ ප්‍රධාන ස්ථානයකි. ඒ පුද්ගලයාගේ ආකල්පවල සිදුවන යහපත් හෝ අයහපත් වර්ධනය කෙරෙහි ජනමාධ්‍ය ප්‍රධාන සාධකයක් වන බැවිනි.

දුප්පත්කම පිළිබඳව වූ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වැඩසටහනෙහි උපදේශකයකු වූ මිචෙල් ජයෙවට් පවසන පරිදි රටේ සංවර්ධනය සඳහා මුදල් වියදම් කොට කර්මාන්ත ශාලා ඉදිකිරීම පමණක් නොව ජනතාවගේ දුප්පත්කම නැති කිරීමට ආකල්පමය වශයෙන් දියුණුවක් ඇති කිරීමද කළ යුතුය. ඔහු මේ බව ප්‍රකාශ කළේ 2010 දී ජැමෙයිකාවේ පැවැත් වූ වැඩසටහනකදී ය.

මෙම වැඩසටහන තුළින් රටේ කෘෂිකර්මාන්තය සම්බන්ධව අලුත්ම දොරටු විවර විය. රැකියා විරහිත තරුණ කාන්තාවන් සහ පිරිමි ගිහමිනට පත්කොට තිබූ තත්ත්වය මෙම වැඩසටහන මගින් වෙනස් විය.

1990 වන විට ජැමෙයිකාවේ දුප්පත් වීමේ ප්‍රතිශතය 28.4% කි. නමුත් 2010 දී එය 17.6% කි. නූතනයේ රටවල් සංවර්ධනය නොවීම කෙරෙහි ආර්ථික හා ආහාර අර්බුදය හේතු වෙයි. ජැමෙයිකාව තුළ දුප්පත්කම අවම කිරීමට ජනතාවගේ ආකල්පමය වර්ධනයක් ඇති කිරීමට ගත් පියවර රාශියකි.

මෙහිදී රට පුරා තරුණ සංගම් පිහිටුවනු ලැබිය. මෙම සංගම් 144 ක නායකයින්ගේ එකමුතුවෙන් කණ්ඩායම් හැසිරවීම මුදල් රක්ෂිත කිරීම සමාජ රක්ෂණය හා ආරක්ෂාව වෙනුවෙන් විවිධ අවස්ථා සැලසුම් කිරීම සිදුකෙරිණි.



එමෙන් ම වැඩමුළු පැවැත්වීම තුළි මිනිසුන්ගේ උසස් අගනාකම් හා ආකල්පව වර්ධනයක් ඇති විය.

මෙලෙස සිදු වූ ආකල්ප වර්ධන එරට දුප්පතුන් බිහිවීමේ වේගය පහළ බැස්ම හේතුවිය. රුමේනියාවේ කෘෂිකර්මාන්ත දියුණු කිරීමට නව තාක්ෂණය රට හඳුන්වාදීම මෙන්ම සහයෝගිතාව, සහජීවන වැනි ආකල්පමය වර්ධනයක් ඇතිව වැඩසටහන් ද ක්‍රියාත්මක විය. ඉන් පැහැදි වන්නේ රටක සංවර්ධනයට මිනිසුන්ගේ ආකල්පවල යහපත් වර්ධනයක් ද තිබි යුතුබවයි.

ඉන්දියාව විවිධ වූ භාෂා, ආගම් දර්ශනයන්ගෙන් පිරී ඇත. ඉන්දියාව කාන්තාවට පහළ ස්ථානයක් හිමිවීම සංවර්ධන වේගය අඩාල කිරීමකි. 30 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධාන ඉන්දියාවේ පවත්වනු ලැබූ "ස්වා වැඩසටහන, මිනිසුන් ඉදිරියේ ගොඩන උසස් අගනාකම් දේශපාලනික හා සමා ලෙස ඵලදායී අන්දමින් යොදා ගනිමින් ස්ව ගරුත්වයක් භුක්ති විඳීමට ඇති ඉඩ බලගැන්වීමට සමත් විය. මෙම වැඩසට මගින් ස්වයං රැකියාවන් ආරම්භ කිරී මූලාධාර ලබාදීමක් සිදුවිය.

එමෙන්ම ග්‍රාමීය ජනසමාජ ජීවත්වන කාන්තාවන් තුළ ස්වයං ගරුත්ව හා අභිමානයක් ඇතිවන පරිදි වැඩසට ක්‍රියාත්මක විය. ඒ නිසාම වැඩසටහනේ යහ ප්‍රතිඵල දැකගත හැකිවිය. කාන්තාවන් එළ නිෂ්පාදනය සඳහා දිරි ගැන්වීම වැඩසටහනින් සිදුවිය.

කාන්තාවන්ට කළමනාකර සඳහා නිසියම් අධ්‍යාපනයක් ලබා දීම කර්මාන්ත වේගයෙන් දියුණු විය. කාන් කොන්කර තිබූ පරිසරයක ආකල් වෙනසක් සිදුකිරීම නිසා ග්‍රාමීය ජන වේගයෙන් දියුණු විය. විරැකියාව අඩු පවුලේ ආර්ථික මට්ටම ඉහළ යෑම දෙමාපියන්ට තම දරුවන්ට නිසි අ ලබාදීමට හැකි විය. එය දියුණුවේ ආයෝජනයකි.



**ලෝක ව්‍යාප්තව HIV ආසාධිතයන් මිලියන 34 ක් පමණ ජීවත් වෙති. 2011 වර්ෂයේ ආසාධිතයන්ගෙන් මිලියන 1.7 ක් HIV ආසාධිත රෝග හේතුවෙන් මියගොස් ඇත.**

ලෝකය පුරා පවතින මෙවැනි තත්ත්වයක් තුළ අප දකින්නේ කිනම් දියුණුවක් ද? ඉන්දියාවේ HIV ආසාධිතයන්ගේ ප්‍රමාණය මිලියන 2.4 කි. 2009 වර්ෂයේ එරටෙහි HIV ආසාධිතයන්ගෙන් 0.31% ක් වැඩිහිටියන් ය. ඉන් 3.5% ක් අවුරුදු 15 අඩු වයස් සීමාව අතර පුවන් ය. HIV ආසාධිතයන්ගෙන් 39% (930000) ක ප්‍රමාණයක් කාන්තාවන්ය.

මෙවැනි තත්ත්වයක් තුළ එරට ඇතිවන සමාජ ආර්ථික ගැටලු රැසකි. සමස්ත ආසාධිතයන්ගෙන් 55% ප්‍රාන්ත හතරක් පුරා පැතිර සිටියි. ආන්ද්‍ර ප්‍රදේශ් 5,00,000, මහාරාෂ්ට්‍ර 4,20,000 කර්ණාටක 2,50,000, තමිල්නාඩු 1,50,000 කි.


මෙවැනි රෝගයක් ඇති බව දැනගත් විට ඔහුට සමාජගත විය නොහැකිය. රැකියාවක නිරත වීම අපහසුය. ඒ හේතුවෙන්ම HIV ආසාධිතයන්ගේ ආර්ථික මට්ටම පහළ බසියි. ඒඩ්ස් රෝගය හේතුවෙන් ඇතිවන ලෙඩ රෝග සුවකර ගැනීමට ඖෂධ ලබා ගැනීමට විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. මේ හේතුවෙන් රජයට HIV ආසාධිතයන් නඩත්තු කිරීමට සිදුවේ. මෙම තත්ත්වය නිසා සමාජය පිළිබඳ ක්‍රෝධයක් ඇතිකර ගතහොත් HIV රෝගීහු අන් අයව ද තම රෝගයට ගොදුරු කරගැනීමට පෙළඹෙති.

මෙවැනි රෝගීන්ට තම පවුලෙන් පවා ඉවත් වීමට සිදුවේ. රෝගී තත්ත්වයට ප්‍රතිකාර ගැනීම තබා ජීවත්වීමටවත් සුදුසු ආර්ථිකයක් නොමැති වෙයි. මේ හේතුවෙන් මෙවැනි රෝගීන් රැක බලා ගැනීමට සිදුවන්නේ රජයටයි. ඔවුන් වෙනුවෙන් වෙන් කරන මුදල් රට තුළ සුබසාධන කටයුත්තකට හෝ සංවර්ධන කටයුත්තකට වෙන් කිරීමට ඇති මුදල් ය. මෙය රටක සංවර්ධනයට බාධාවකි. මෙවැනි රෝගයක් ව්‍යාප්ත වීමට ප්‍රධාන සාධකය ගණිකා වෘත්තියයි. සමාජයේ මිනිසුන් අතර කාමුක හැඟීම වැඩිවන විට ඔවුන් ගණිකාවන් සොයා යෑම සාමාන්‍ය තත්ත්වයකි. මිනිසුන්ගේ සිත් මෙවැනි හැඟීම්වලින් පුරවාලීමට ජනමාධ්‍ය ද හේතුවේ.

යහපත් ආකල්පවලින් පිරි මිනිසුන් සමාජයේ යහ පැවැත්ම නගා සිටුවයි. එය රටක සංවර්ධනයට අත්වැලකි. භෞතිකව සිදුවන වර්ධනයට වඩා අවශ්‍ය වන්නේ මිනිසා තුළ ඇතිවන ආධ්‍යාත්මික ආකල්පමය වර්ධනයකි. එය සැබෑ සංවර්ධනයට මග පාදයි.

**ශෂාන් මදුසංඛ**

# මැනුවෙල් කැස්ටෙල්ස්



ස්පාඤ්ඤයේ Albaceth, Hellin හි 1942 වර්ෂයේදී Manuel Castells Olivan නමින් මොහු උපත ලැබිය. උපතින්ම ස්පාඤ්ඤ ජාතිකයෙකි. මොහු සිය පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා විශේෂයෙන්ම උනන්දුවක් දක්වා තිබෙන්නේ තොරතුරු සහ සන්නිවේදනය පිළිබඳවය. එසේම මොහු ජාත්‍යන්තර මානුෂීය, විද්‍යාත්මක සහ දේශපාලන සංවිධානයේ සාමාජිකයෙකි. සාමය, සමාජ සාධාරණත්වය සහ ලෝකයේ ආර්ථික ස්ථායිතාවය පිළිබඳ ගැටලු වලට විසඳුම් සෙවීමේදී මහු නායකත්වය ගෙන කටයුතු කළ පුද්ගලයෙකි.

කැස්ටෙල්ස් බාසිලෝනා හි වැඩවසම් පවුලක හැදුන වැඩුණද මහු දේශපාලන වශයෙන් ක්‍රියාශීලි ලෙස කටයුතු කළේ ය. මහුගේ පරිනත දේශපාලනය මහුව ස්පාඤ්ඤයේ සිට ප්‍රංශයට යාමටද පොළඹවන ලද අතර අවුරුදු විස්සේදී මහු පැරිස් විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා ගත්තේය. එසේම සමාජ විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියද දිනාගත් අතර අවුරුදු විසිහතරේදී පැරිස් විශ්වවිද්‍යාලයේ උපදේශකවරයෙක් ලෙසට සිය සේවයද ඇරඹීය. 1967 සිට 1979 දක්වා මහු මෙම තනතුරෙහි සේවය කළ අතර ඉන් අනතුරුව 1979 කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය තනතුරු දෙකකට පත් කරනු ලැබිය. එනම් සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය තනතුර සහ පළාත් සහා නගර සැලසුම් පිළිබඳ මහාචාර්යවරයා ලෙසයි. 2001 වර්ෂයේදී මොහු බාසිලෝනා හි කැටලෝනියා විවෘත විශ්වවිද්‍යාලයේ පර්යේෂණ මහාචාර්යවරයා බවටද පත්විය. 2003 වර්ෂයේදි තොරතුරු තාක්ෂණ පිළිබඳව මහාචාර්යවරයෙකු ලෙස දකුණු කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ ඇනන්බර්ග් සන්නිවේදන පාසලට සම්බන්ධ විය.

එලෙසම කැස්ටෙල්ස් USE මධ්‍යස්ථානයේ මහජන හා ජාත්‍යන්තර සම්බන්ධතා මෙහෙයුම් පදනමේ ආරම්භක සාමාජිකයෙකු ද වන අතර අන්තර්ජාතික සබඳතා සනාතන සභාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු ද වේ.

මොහු කලක් ස්පාඤ්ඤයේ ද කලක් ඇමරිකා එක්සත් ජනපදයේ ද ජීවත් වූ අතර විවාහ වූයේ Emma Kiselyova සමග ය. 2008 වර්ෂයේ සිට මහු නූතන තාක්ෂණය පිළිබඳ යුරෝපීය ආයතනයේ සාමාජිකත්වයද දරුවේය.

**මැනුවෙල් කැස්ටෙල් ගේ අන්තර්ජාල සමාජය**

මැනුවෙල් කැස්ටෙල්ස් නාගරික භූගෝලීය විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකි. මහු භූගෝල විද්‍යාව නගර සහා අන්තර්ජාල තොරතුරු සමාජය පිළිබඳ පොත් සහ ලිපි රාශියක් ලියා ඇත. මගින් නූතන යනවාදය කාණ්ඩ 3ක් යටතේ විශ්ලේෂණය කර ඇත. "The Information Age" නම් එය තොරතුරු සමාජයේ සිද්ධාන්තය ලෙස සැලකේ. කැස්ටෙල්ස් ගේ විශ්ලේෂණය අනුව මෙහි ආර්ථික, සමාජීය, දේශපාලනික සහ සංස්කෘතික කරුණු අන්තර්ගත වේ. ඔහුගේ විමර්ශන කෘතියේ කාලය පිළිබඳ සිද්ධාන්ත සහ සමාජය බෙදීයාම සහ නූතන නාගරීකරණ සහ සමාජය පිළිබඳ තොරතුරු සඳහන් වී නොමැත. විශේෂයෙන්ම ඔහු අධ්‍යයනය කර ඇත්තේ සමාජීය ක්‍රියාවලින් සහ සන්දර්භය පිළිබඳ නාගරික තොරතුරු ලෙසය.

කැස්ටෙල්ස් සඳහන් කරන්නේ දැන් අප අවතීර්ණ වන්නේ කාර්මික යුගයෙන් තොරතුරු තාක්ෂණ යුගයකට බවයි. එහිදී සන්නිවේදන හා ජීව විද්‍යාත්මක තාක්ෂණය සොයාගනු ලැබීය. නමුත් සමාජය තාමත් ධනවාදී සමාජ ක්‍රමය තුළ රැඳී සිටිය ද මූලික පදනම වන්නේ තාක්ෂණය සහ බලශක්තියේ ක්‍රියාකාරිත්වය ක්‍රමයෙන් තොරතුරු තාක්ෂණය දක්වා වෙනස් වීම ය.

මෙම තොරතුරු තාක්ෂණය වැදගත් වනුයේ ආර්ථික, ඵලදායිතාව වැඩිකර ගැනීමටය. තොරතුරු තාක්ෂණයේ සියලු අවකාශ එක්රැස් කරමින් විශ්ව ගම්මානය නිර්මාණය කරමින් වේගවත් මෙන්ම පෙර නොවූ විරූ අයුරින් සන්නිවේදන කාර්යය හා

අන්තර් සම්බන්ධතාව කාලානුරූපව වෙනස් වී ඇත. ඔහු මෙය විස්තර කරන්නේ අන්තර්ජාලය සමාජ සංවිධාන වලට අවත් දෙයක් නොවන බවයි. තොරතුරු තාක්‍ෂණයේ ප්‍රධාන ලක්‍ෂණය වන්නේ සමාජීය රූප අධ්‍යයන විද්‍යාවයි.

තොරතුරු තාක්‍ෂණයට භාවිත කරන අන්තර්ජාලය මගින් මේ වන විට එක මධ්‍යස්ථානයක සිට කරන ලද එක් කේන්ද්‍රිය පාලනයක් වෙනුවට විකේන්ද්‍රි මෙහෙයුම් සහ පරිපාලනය ඉතා සාර්ථකව අන්තර්ජාලය තුළින් කරගත හැකි වීම ඔහු පෙන්වා දේ. මෙතෙක් පැවති නිලධාරිවාදය වෙනුවට මනා සම්බන්ධතාවකින් යුතුව කටයුතු කරගෙන යෑමට අන්තර්ජාලයේ බලය වැඩි බව පෙන්වා දේ. සමහර අන්තර්ජාල මූලාමය ප්‍රාග්ධනය ගෝලීය මට්ටමින් කරගෙන යාමේදී අන්තර් ජාලය තුළ එය කරගෙන යාම පහසු බව පෙන්වා දේ.

මෙහි සංවිධාන ඒකකය මානව සම්පත් කුසලතා හා හැකියාවන් අනුව ව්‍යාපාතික ක්‍රියාත්මක වේ. සම්පත්, සේවාදායකයන්, උපදෙශකවරුන් සහ අනෙකුත් කටයුතු එකට එකතු කර අදාළ ව්‍යාපෘතිය ඉක්මණින් සහ පහසුවෙන් සම්පූර්ණ කරගත හැකි වේ.

අන්තර්ජාලයේ ක්‍රියාකාරීත්වය සඳහා සමාගම්, ඒක පුද්ගල සම්බන්ධතා, රජය සහ අනෙකුත් ආයතන අන්තර්ජාලයට සම්බන්ධ වෙමින් අවශ්‍ය දායකත්වය ලබා දෙමින් අන්තර්ජාලය තුළින් ඔවුන්ගේ ඉලක්ක වලට ළඟා වේ. මෙම කාර්යය සඳහා නිපුණත්වයක් ඇති නම්‍යශීලී පුද්ගලයන් සඳහා මග පෙන්වන්නේ ද්විත්ව ක්‍රියාකාරීත්වයක් ඇති අන්තර්ජාලයන්ය. එනම් තොරතුරු රැස් කිරීම සහ දත්ත ගබඩා කිරීමය.

### ප්‍රාග්ධනය හා ශ්‍රමය


කැස්ටෙල්ස් තොරතුරු සහ තොරතුරු තාක්‍ෂණය යන්න පැහැදිලිව හඳුන්වා ඇත. ඔහු පෙන්වා ඇත්තේ සමාජයේ අත්‍යාවශ්‍ය අංගයක් වන්නේ තොරතුරු බවයි. ප්‍රාග්ධනය තිබුණ ද නව අන්තර්ජාල ආර්ථිකයේ වැදගත්ම කරුණ වන්නේ ආර්ථික ඵලදායිතාවයි. මෙයට උදාහරණයක් ලෙස වෙළෙඳ පොළට ප්‍රාග්ධනය ගලා ඒම වෙළෙඳ භාණ්ඩ සහ තොග තීරණය කරනු ලබන්නේ අදාළ මාතෘකා යටතේ ඇති තොරතුරු මගිනි. ජාත්‍යන්තර දේශපාලනය, දේශගුණික විපර්යාස, කාලගුණ අනාවැකි සමාජීය නැඹුරුතාවන් තොරතුරු තාක්‍ෂණයේ වැදගත් අවයව වේ. තොරතුරු හැසිරවීම සඳහා වටපිටාවෙන් ලැබෙන තොරතුරු වැදගත් වේ. මෙය හඳුන්වනු ලබන්නේ "Action of Knowledge upon knowledge it self" (Castells 2000 B P.70). දැනුම වැඩිවන විට ඵලදායිතාව ද වැඩි වේ.

කැස්ටෙල්ස් පෙන්වා දෙන්නේ අන්තර්ජාලයේ මෙහෙයවීම සහ දත්ත සැපයීම හා දත්ත බාගත කිරීමට හැකියාව ලැබෙන්නේ සහ දායකත්වය ලබා ගන්නේ තම වෙබ් අඩවියේ අරමුණු අනුව සහ තනි තනි පුද්ගලයන්ගේ ශ්‍රම දායකත්වයෙනි. එවැනි ක්‍රියාවලින් ගෝලීයකරණයේ කොටස් වශයෙන් අන්තර්ගත වී තිබේ. එහෙත් ශ්‍රමය ප්‍රාදේශිය වශයෙන් ගත් කළ එය අසම්පූර්ණ විය හැකි ය. ශ්‍රමය තනි තනිව ගෙන ජාල ගත කළ හැකි ය. මේ අන්දමින් කාර්මික යුගයේ නිරන්තර අරගල, නිෂ්පාදන ක්‍රියාවලිය අතර ගැටුම, තනි තනි සේවකයින් පංතිවලට වෙන් කිරීම සහ ධනපතින් බිහිවීම අන්තර්ජාලය තුළින් නැවත ස්ථාන ගත කළ හැකි ය. ධනවාදී ක්‍රමය අතුරුදහන් වෙමින් ඒ තුළින් නිර්ධන පංතියේ ශ්‍රම සූරාකෑම සහ සම්පත් බෙදීයාමේ විෂමතාව ඔහු විශ්ලේෂණය කර පෙන්වයි. එබැවින් අන්තර්ජාලය සඳහා ලබාගන්නා ශ්‍රමය කොටස් දෙකකට බෙදා වෙන් කර තිබේ.

අන්තර්ජාලයේ අරමුණ කරා ළඟාවීමට සේවය කරන්නන් සහ අන්තර්ජාලය කෙරෙහි අවධානය නොදක්වන්නන් යනු එම කොටස් දෙකයි. අන්තර්ජාලය ශ්‍රමිකයින් ලෙස හඳුන්වනු ලබන්නේ ස්වයං වැඩසටහන් නිෂ්පාදකයින්, මූල්‍ය වාර්තා විශ්ලේෂකයින්, සමාගම් නිලධාරීන්, ජනමාධ්‍යවේදීන්, සහ තොරතුරු කළමනාකරුවන් ය. මේ එකම අවස්ථාවේ තවත් පිරිසක් ස්භාවික සම්පත් නිෂ්පාදනයට ද, තවත් පිරිසක් කර්මාන්ත ශාලා සඳහා අවශ්‍ය ශ්‍රමය අඩු මුදලට ලබා දීමෙන් ද සරල දිවි පැවැත්මක් ගත කරන අතර මේ අය කිසිදු පංතියකට අයත් නොවේ.

කැස්ටෙල්ස් නාගරික භූගෝල විද්‍යාඥයෙක් වූ නිසා ඔහු අභ්‍යවකාශය මධ්‍යස්ථානය කරගනිමින් ඔහුගේ වැඩ කටයුතු පිළිබඳ පර්යේෂණ කළේය. මෙහි වැදගත් ලක්‍ෂණයක් වන්නේ තොරතුරු තාක්‍ෂණ යුගයේ තොරතුරු අභ්‍යවකාශය ඔස්සේ ගලා යාමට සැලැස්වීමයි. මෙය ප්‍රාග්ධනය තොරතුරු, ව්‍යාපාරික ගිවිසුම් යනාදිය

**කැස්ටෙල්ස් තොරතුරු සහ තොරතුරු තාක්‍ෂණය යන්න පැහැදිලිව හඳුන්වා ඇත. ඔහු පෙන්වා ඇත්තේ සමාජයේ අත්‍යාවශ්‍ය අංගයක් වන්නේ තොරතුරු බවයි. ප්‍රාග්ධනය තිබුණ ද නව අන්තර්ජාල ආර්ථිකයේ වැදගත්ම කරුණ වන්නේ ආර්ථික ඵලදායිතාවයි. මෙයට උදාහරණයක් ලෙස වෙළෙඳපොලට ප්‍රාග්ධනය ගලා ඒම වෙළෙඳ භාණ්ඩ සහ තොග තීරණය කරනු ලබන්නේ අදාළ මාතෘකා යටතේ ඇති තොරතුරු මගිනි.**



අන්තර්ජාලය මගින් පාලනය කරගත හැකි වේ. ඔහු තර්ක කරන්නේ සංවිධානය එකම ආයතනයක පිහිටා තිබීමෙන් එම සංවිධානයේ ක්‍රියාකාරීත්වයට තර්කානුකූල ස්ථානයක් නොලැබීමයි.

මූලික වශයෙන් තොරතුරු භාෂණය රඳා පවතින්නේ අන්තර්ජාලය මතයි. ඔහු මෙය හැඳින්වූයේ අභ්‍යවකාශ මධ්‍යස්ථානය ලෙසයි. ප්‍රාදේශිය ජනතාව සහ ස්වාධීන රාජ්‍යයන් මෙම අන්තර්ජාලයට ඇතුළත් වේ. එබැවින් අන්තර්ජාලය මිනිසුන්ගේ අත්දැකීම් වලට බාධා කිරීමට මග පාදන බව පෙන්වා දේ. බලය දේශපාලන අධිකාරිය විසින් බෙදා ගැනීම, නිෂ්පාදනය සහ පරිභෝජනය, සන්නිවේදන තොරතුරු ලබා ගැනීම යන කරුණු සඳහා මූලික ලෙස මෙය බලපායි.

අන්තර්ජාලය තුළින් දත්ත එක්රැස් කිරීම සහ දත්ත බෙදා හැරීම බලහත්කාරයෙන් යටත් කර ගැනේ. ඉහළ පැළැන්තියේ සහ පහළ පැළැන්තියේ අය අන්තර්ජාලයට සංවර්ධනය තෝරාගනු ලබන්නේ ඔවුන්ගේ අරමුණු අනුවය. නමුත් ඔවුන් අන්තර්ජාලයට මැදිහත් වීමට බලාපොරොත්තු වන්නේ නම් ඔවුන් අනතර්ජාලයට මේ පිළිබඳව අරමුණු එක් කළ යුතුය. අන්තර්ජාලයෙන් ගලා එන සමාජීය, සංස්කෘතික හා ඓතිහාසිකමය තොරතුරු සම්පිණ්ඩනය කොට මානව ඉතිහාසයට එක් කෙරේ. එබැවින් අන්තර්ජාලයේ පැවැත්ම සහ අන්තර්ජාලයේ ක්‍රියාකාරිත්වය රඳා පවතින්නේ ඒ හා සම්බන්ධ ආයතන සහ ප්‍රජාව මතයි. විවිධ ජාතීන්ට අයත් ප්‍රජා හඳුනා ගැනීම සහ ප්‍රජාතාන්ත්‍රවාදී බලය මනා සම්බන්ධතාවක් ඔස්සේ වෙනත් රටවල සිටින ජනතාව හා සංස්කෘතිය කෙරෙහි බලපෑම් ඇති කරයි. කෙසේ වෙනත් ජාතීන් පිළිබඳ හඳුනා ගැනීම, ප්‍රජාතාන්ත්‍රවාදයේ පැවැත්ම අන්තර්ජාලයට සම්බන්ධ කිරීමෙන් අනෙකුත් සංස්කෘතීන් සහ ජාතීන් පිළිබඳ මනා සම්බන්ධතාවක් ගොඩනැගේ. මෑතකාලීන ඉතිහාසයෙන් පෙන්වා දෙන්නේ කණ්ඩායම් හුදකලා නොවී අන්තර්ජාලයට සම්බන්ධ වී යහපත් ප්‍රතිචාර දක්වන බවයි. තොරතුරු ගලා ඒම සහ ස්ථාන ගත කිරීම නිරන්තර සිදුවන අරගලයක ප්‍රතිඵලයකි.

තොරතුරු සංසරණය හා නිරන්තර ගැටීම් අඛණ්ඩව සිදුවන අතර ප්‍රජා කණ්ඩායම් අන්තර්ජාලයට බැඳී පවතී. එම අදාළ කණ්ඩායම් විසින් තමන්ගේ අනන්‍යතාව සහ හුදකලා බව අන්තර්ජාලයෙන් පෙන්වා දේ. ඔබ අන්තර්ජාලයේ තර්කානුකූල විවාදය එකග වන්නේ නම් අන්තර්ජාලයේ ස්වාධීනභාවය ආරක්ෂා කරයි. ඔවුන අන්තර්ජාලයට ඔවුන්ගේ ජනප්‍රියතාව පෙන්වන්නේ ද ඒ ලෙසටය. කැස්ටෙල්ස් ගේ පළමු වැනි තත්ත්ව පරීක්ෂාව වනුයේ සමකාලීන ලෝකය තමාට හැකි ප්‍රධාන ස්ථානයක් වීම සහ එහි ශීඝ්‍රතාවය සහ සමකාලීන සමාජයේ පොදු ස්ථානයක් වීමයි. මෙහි වැදගත් වන්නේ දැනුම සහ තොරතුරුය වේගවත් වැඩීම මූලය සහ අනෙකුත් ගනුදෙනු සහ දුරස්ථ බව බිඳ වැටීම වර්ධනය වීම සහ දැනුම අතර අඩු වැඩි වීම සහ කාලයක සමාජයේ භාෂණය පිළිබඳ අවබෝධය සමකාලීන ජීවිතයේ සාර්ථකත්වය කෙරෙහි බලපායි. ඔහුගේ වැදගත් ඉලක්කය වන්නේ තොරතුරු නිෂ්පාදනය සහ තොරතුරු ලබා දෙන්නන්ගේ සහ ධනවාදය අතර අන්තර් සම්බන්ධතාවයි. ඔහු පෙන්වා දෙන්නේ වර්තමාන ආර්ථිකය හා සාමාජීය තත්ත්වය කාර්මික ධනවාදයට වඩා නව යුගයට වඩාත් ගැළපේද යන්නය.

**මනෝජ් පුෂ්ප කුමාර විනදාස**




**නූතන අම්බපාලී**

කැළැල් වසා මුව ඉසුණු වත්සුණු
දවෙන පාපය වසා සරු හැද
අඳුරු වළාවන් මැදින් ගාටන
ලගින අගුවක් හෙමින් සොයමින
අරුණට පළමුව ගණින තරුකැට
එකතු කරගෙන ගිනි නිවාලන
සතෙන් ශතයට මැරෙන විදියක
පහස නැතුව ද පවම නිවාගෙන
රුපියලෙන් ශතයෙන් මනින්නට
කාසියට යට වෙච්ච පතිවත
රාගයෙන් ඇය පාන ඉගිබිගි
පාපයක් මිස නිවාවිද ගිනි

**සාගරිකා පී. අමරසිංහ**

**ඔබට නෑසෙන කවිය**

කවිය ඔබටයි ලියා තැබුවේ
ආදරේ පිරි හදවතින්
ගයා සැනසෙමි දුරක සිට මං
ඔබට නෑසෙන සේ සෙමින්

දෙනෙත් හමු වී ඔබේ පෙරදින
පැතුම් රැඳුනා ළය සෙමින්
නෙතින් රහසින් බලා සැනසී
සිතම පැතුවා මං ඔබෙන්

සසර ආ මග ඔබේ සෙනෙහස
මට නොවී අත්සතු හෙයින්
බැඳුණු සෙනෙහෙන් විදුනා මා හද
තනිවෙලා ඇත පෙර ලෙසින්


**එච්. එන්. එච් කරුණාතිලක**

**මනමේ කුමරුගෙන් කුමරියට**

උපන් ප්‍රේමයෙන් දුක ඉඳුවර නෙත්
ඉගි කළේ එදා ඔබෙ හද මැදුරට
රන් හුයෙන් බැඳි අපේ සුළැගිලි
පෙම් පැනින් තෙමුවේ ඇඳුරු සඳ
දෛවයෝගයකින් නොවේදෝ,
පෙම් සැණකෙළියේ කරමින් සක්මන්
මතකද අපි සැරි සරුවා වනමැද
වනචර වැදි රජෙකුට දුන්නේ ඇයි
මා ප්‍රිය සොඳුරිය මගෙ රන් අසිපත
සිත්ද විට මා ගෙල ඒ වැදිරජ
ගලා ගියේ රුධිරය නොව ප්‍රේමය
නොසිතේ ඔබ මට චපල වූ වග
මහද මෝදු වූ කුළුදුල් ප්‍රේමිය
තනි වූ සඳ ඔබ හිමගිරි අරණක
පිහිටට නාවට සමාවනු මැන
අහෝ !
ඉපදී මැරෙන සසරේ
එවිට මා ඔබෙන් දුරස් වී ඇත.

**එම්. එම්. සචින්ද්‍රා පියුමාලී**

# ලෝක සිනමාවේ මං පෙව්ල් කළ පරිගණක සජීවීකරණය



විශේෂ දෘශ්‍ය ප්‍රයෝග භාවිතයෙහි විශිෂ්ටයෙකු වූ හෙයින්, මනඃකල්පිත සිනමාවේ පියා ලෙස නම් දරූ **Georges Melies** තම චිත්‍රපටවලට කැමරා, සංස්කරණ උපක්‍රමයන්හි හා චිත්‍රාගාර දර්ශනවලට (Position Studio) අමතරව සජීවීකරණය ද යොදා ගත්තේ ය. ඒ අනුව Cinderella, One man band, Blue beard, The Eruption of Mount pelee, The Trip to the Moon, The Merny Frolies of Satan, The Fairy Kindom, The Advanturous Automoble Trip සිනමාපට බිහිවිය.

සිනමාව පරිගණක තාක්ෂණය සමග බද්ධවීමට පටන් ගත්තේ මෑත අතීතයේ සිට ය. සෑම කලා මාධ්‍යයක් තුළම මහා විප්ලවයක් කිරීමට සමත් වූ පරිගණක තාක්ෂණයට, සිනමා මාධ්‍යය ආක්‍රමණය කිරීමට එතරම් අපහසු වූයේ නැත.

එසේම, එතෙක් හස්ත කර්මාන්තයක් ලෙස පැවතුණු සජීවීකරණය සඳහා ද පරිගණකය මඟින් කරනු ලැබූ තාක්ෂණික පෙරළිය, සජීවීකරණ ශිල්පීන්ට මහඟු පිටිවහලක් වූවා සේ ම, වඩාත් කාර්යක්ෂම ලෙස දෘශ්‍ය ප්‍රයෝගවලට හා සජීවීකරණයට මුල් තැන දුන් සිනමා කර්මාන්තයට නව දක්මක් එක් කරවිය.

සිනමා කර්මාන්තයේ මුල් යුගයේ, තිර රචනයේ සිට සංස්කරණය දක්වා ක්‍රියාවලිය එක් එක් අංශයන්ගෙන් පෝෂණය වුව ද, පරිගණකය හා සිනමාව බද්ධ වීමත් සමග එය පරිගණකය හා නිරන්තරව ගනුදෙනු කරන කටයුත්තක් බවට විය. පරිගණක තාක්ෂණික දියුණුවත් සමග, ඒ ඒ කාර්යයන් සඳහා විශේෂිත වූ පරිගණක මෘදුකාංග (Computer Software) බිහි විය. ඒ ඒ මෘදුකාංගයන්ට අනුකූලව සජීවීකරණය සඳහා භාවිත වන ශිල්ප ක්‍රමවල ද විවිධත්වයන් දක්නට ලැබිණි. චරිත නිර්මාණය, චලනයන් නිරූපණය කිරීම, කැමරා භාවිතය, ආලෝකකරණය, සංස්කරණය වැනි කාර්යයන් හා එහි ප්‍රතිඵල මෘදුකාංගවලට අනුකූලව වෙනස් විය. පරිගණක තාක්ෂණය නිසා සජීවීකරණයේ සිදු වූ විශිෂ්ටතම ඵලය වූයේ, රූපගත කිරීම (කැමරාව) ආලෝකකරණය, සංස්කරණය වැනි අවශ්‍යතා සඳහා භාවිත වන මෙවලම්, පූර්ණ වශයෙන් මෙම නිෂ්පාදන ක්‍රියාවලියෙන් බැහැර වීම යි. පරිගණක සජීවීකරණයේ දී දක්නට ලැබුණු විශේෂත්වයක් වන්නේ, පෙර භාවිත කළ මූලික සජීවීකරණ ක්‍රමවේදයන් හි යම් සමානතාවයක් තිබීමයි. එනම් තනි රූපයක්, රූප රාමුවෙන් රාමුවට ක්‍රමිකව වෙනස් කරමින්, රූපගත කොට හෝ වර්තනය නිර්මාණය කිරීමයි. පරිගණකය මඟින් ද්විමාන හා ත්‍රිමාන යන දෙඅංශයෙන්ම සජීවීකරණ චිත්‍රපට නිර්මාණය කරනු ලබයි.

පරිගණක සජීවීකරණය ආරම්භ වීමට පෙර සජීවීකරණ විධික්‍රම ලෙස භාවිත වූයේ Cel Animation, Clay Animation, Puppet Animation, Cut-out Animation, Felt Animation, Silhoutte Animation, Glass Animation, Sand Animation, Time Lops, Pin screen ආදිය යි. මේවායේ දී වර්ණ, හැඩතල, භාවිත වීම හුදෙක් ප්‍රාථමික තලයක පැවතියත්, වඩා නිර්මාණශීලී කාටූන් චිත්‍රපට නොතිබුණා නොවේ. මෙහිදී Walt Disney විසින් ගොඩනංවන ලද සජීවීකරණ කර්මාන්තය හා ප්‍රේක්ෂක ආකර්ශනය අඛණ්ඩව පවත්වා ගැනීම කෙරෙහි, පරිගණක තාක්ෂණයේ සුවිශේෂී දායකත්වය පිළිබඳව ද විශේෂ අවධානය යොමු විය යුතුය.

පරිගණක තාක්ෂණය හරහා නවමු ආරක් ගෙන නිර්මාණය වූ චිත්‍රපට වල තේමාව සකස් කිරීමේදී ද දැඩි වෙනසකට ලක් වූ බව



පැහැදිලිව පෙනේ. එම චිත්‍රපට වල වැඩි අවධානයක් යොමු වූයේ, පවත්නා යථාර්ථයන්ට එහා ගිය මනඃකල්පිත ලෝකයක් නිර්මාණය කිරීම හා සිහින ප්‍රවේශයකින් යුතු එවැනි දෘශ්‍ය ආඛ්‍යානයන් බිහිකිරීමයි.

මුලදී පසුතල නිර්මාණය කිරීම හෝ විශේෂ ජීවියෙක්, ස්වභාවික ජීවීන් සමග ක්‍රියා කරවමින් අපූර්වත්වයක් ඇති කරවීමට පරිගණකය යොදා ගැනීම නිසා, අභූත රූපී සංසිද්ධීන් සහිත චිත්‍රපට නිර්මාණය විය.

එවැනි තේමාවක් යටතේ මුල් කාලයේදීම නිර්මාණය වූ Stuart Little චිත්‍රපටයේ සිට, Ice Age වැනි ත්‍රිමාණ රූපී සජීවිකරණය මගින්ම සකස් වූ චිත්‍රපට බිහි කිරීම දක්වා තේමාවන් හැඩ ගැසිණි.

පරිගණක සජීවිකරණය භාවිතයත්, ඒ සඳහා අවශ්‍ය පහසුකම් සහිත මෘදුකාංග නිෂ්පාදනය වීමත් නිසා, පෙර පැවති ක්‍රමවේදයන්ට වඩා සියුම්, පහසු ක්‍රමවේදයන් මගින් චිත්‍රපට නිර්මාණය විය.

පෙර පැවති ක්‍රමවේද රූප රාමුවෙන් රාමුව ඇද නිර්මාණය කිරීමේ දී, එක් එක් චිත්‍රයක් අතර වර්ණ නොගැලපීම්, ඡායාරූප ගත කිරීමේ දී ඇතිවන ගැස්සීම් ආදිය මනාව සුමට ලෙස කිරීමට පරිගණකයට හැකි විය.

**දොස්තර හොඳ හිත,**
**ස්කූබී - ඩූ, සූර පප්පා,**
**වින් වින් වැනි කාටූන් ද මෙහි ද්විමාන**
**ගණයේ කාටූන් චිත්‍රපටයි.**

ඒ සඳහා Animo, Moho,Light Wave, Maya වැනි මෘදුකාංග බිහිවීමත්, පසුබිම නිර්මාණය කිරීම සඳහා Photoshop, Image Ready වැනි මෘදුකාංග බිහිවීමත් වැදගත් විණි.

### ද්විමාණ රූප සජීවිකරණය

සජීවිකරණය ආරම්භ වූ යුගය තොක් ආපසු හැරී බලතොත් මුලින්ම හමුවන්නේ ද්විමාණ රූපී (2D Animation) සජීවිකරණයන්ය. මෙහි කාටූන සෙල් ඇනිමේෂන් (Cell Animation) නමින් ද හඳුන්වනු ලැබීය. සියලුම රූප ද්විමාණ තලයන් ලෙසට යොදා ගැනීම මෙහිදී විශේෂ වැදගත්කමක් ගනී.

දොස්තර හොඳ හිත, ස්කූබී - ඩූ, සූර පප්පා, වින් වින් වැනි කාටූන් ද මෙහි ද්විමාන (2D) ගණයේ කාටූන් චිත්‍රපටයි. මේවායේ ඇති අඩු ලුහුඩුකම් වසාගනු වස්, ත්‍රිමාණ රූපී සජීවිකරණය (3D) ලෝකය විසින් හඳුනා ගනු ලැබූ අතර, (Real Time) කාලය පිළිබඳ ගැටලුව ද, ද්විමාන තළින් ත්‍රිමාණ තුළට මාරුවීමට ප්‍රධාන වශයෙන්ම බලපා ඇත.

### ත්‍රිමාණ රූප සජීවිකරණය

මුලින්ම පරිගණක තාක්ෂණය හරඹ කරන්නට වූයේ බටහිර සිනමා කර්මාන්තය සමගය. ත්‍රිමාණ රූපී සජීවිකරණය **(3D Animation)** යොදාගෙන නිර්මාණය කරන ලද මුල්ම සිනමාපටය වූයේ, ටෝයි ස්ටෝරි **(Toy Story)** නම් කාටූන් චිත්‍රපටයයි.

**Pixar Entertainment Studios (an Apple company)** මගින් full-length animated feature සහිත චිත්‍රපටය ලෙසට බිහි වූ **Toy Story,** ලොවපුරා තිරගත වීමත් සමගම, සිනමා කර්මාන්තයේ සුවිශාල ආන්දෝලනයක් ඇති විය. ආරම්භයේ සිට අවසානය දක්වා පරිගණක සජීවිකරණ යොදා ගනිමින් නිපදවූ, ලෝකයේ ප්‍රථම චිත්‍රපටය ලෙස සැලකෙන, මෙහි rendered සියල්ල සිදුකර ඇත්තේ පරිගණක භාවිතයෙනි. 117 dual-processor Sun SPAR Cstation-20 පහසුකම් සහිත පරිගණකයන් මගින්, එලියස් වේව් ෆ්‍රන්ට් **(Allias Wave Frount)** නැමැති සමාගම විසින් නිර්මාණය කරනු ලැබූ මායා

මෘදුකාංගය (**Maya Software**) භාවිත කරමින් සජීවිකරණය කරන ලද, මෙම චිත්‍රපටය සඳහා 100,000 frames ක් යොදා ගත් බව සඳහන් වේ. එවකට තිබූ තාක්ෂණික පහසුකම් අනුව, Computer Animation කර අවසානයේ, rendering and processing සඳහා පැය දහතුනක් ගත විය. 1995 වර්ෂයේ දී Academy Awards දොළහකට හිමිකම් කියූ ටෝයි ස්ටෝරි (**Toy Story**) ඉන් පසුව බිහිවන චිත්‍රපට සඳහා මුල් රුකුලක් වූ බව සඳහන් කල යුතුය.

දෘශ්‍ය ප්‍රයෝගයන්හි හිණිපෙත්ත ලෙස ආරම්භ වූ ත්‍රිමාණ රූපී සජීවිකරණය (**3D Animation**), ටෝයි ස්ටෝරි (**Toy Story**)චිත්‍රපටය තුළින් මල්වර විය. මෙහි සිනමාපටය තුළ මනා චරිත හැසිරවීමක් සහ උසස් තත්ත්වයේ චරිත සජීවිකරණයක් දක්නට ලැබිණි.

**Pixar Entertainment Studios (an Apple company)**, මගින් නිර්මාණය කළ තවත් අති දැවැන්ත නිර්මාණයක් වන්නේ **Stuart Little** චිත්‍රපටය යි.

සිනමාව සඳහා පරිගණක සජීවිකරණය වඩා සිදුම්ව කර දීමට මීට වසර විස්සකට පමණ පෙර විකාශෝ හි දී, සිග්රාෆ් (**Sigraf**) **නම්** වැඩසටහන **මගින්** මායා මෘදුකාංගය ලොවට හඳුන්වා දෙනු ලැබිය. ඉනික්ඛිතිව **ලෝක සිනමාවෙහි**, **විශාල** පෙරළියක් ඇති වූවා යැයි **කිවහොත් නිවැරදිය.** බින්ගෝ (**Bingo**)**නැමැති ත්‍රිමාණරූපී සජීවිකරණ කාටූනය** (**3D Animation Cartoon**) **නිර්මාණය කිරීමත් සමගම,** ලෝකයේ අවධානය **ත්‍රිමාණරූපී සජීවිකරණ** හා මායා මෘදුකාංගය වෙතට **වේගයෙන්** ඇදී යනු දක්නට **ලැබුණි. පුපුකට තවට මුහුණු** (**Bingo Face**)නිර්මාණය කර ඇති **ආකාරය** අතිශයින්ම සජීවි වීම, **මෙය ජනප්‍රිය වීමට** මලපැ ප්‍රධානතම කාරණාවකි. මෙහිදී **මුහුණේ** හැඟීම් දැනවීම අතිශය සජීවි **තත්ත්වයක** පැවතුණි.

එසේම මෙහි කලා අධ්‍යක්ෂණය උදෙසා, ෆොටෝෂොප් (**Photoshop**)මෘදුකාංගයත් සොෆ්ට් ඉමේජ් (**Soft Image**)මෘදුකාංගයත්, පී ඩී අයි එක්ස්ක්ලූසිව් (**P D I Exclusive**) නම් වූ මෘදුකාංගයත් භාවිත කර තිබේ. මෙයට එම වසරේ හොඳම සිනමාපටයට හිමි සම්මානයද ලැබුණි.

පරිගණක සජීවිකරණය තුළ 3D Animation භාවිතයේ දී මායා මෘදුකාංගය භාවිත කර ඇත්තා වූ කාටූන් නොවන,



**ලෝකය පුරා උන්මාදයෙන් වැළඳගත්**
**ටයිටැනික් චිත්‍රපටය උදෙසාත් මෙහි දෘශ්‍ය ප්‍රයෝග සඳහා**
**ත්‍රිමාණරූපී සජීවිකරණය යොදා ගෙන තිබේ.**
**මෙහි ඇති සමහර ප්‍රයෝග වෙනස් මුලද්‍රව්‍ය මුසු කරගත්**
**කලා නිර්මාණ වේ.**

**සිනමාපට රාශියක්ම** දක්නට ලැබේ. **ඇනකොන්ඩා** (**Ankonda**), ගොඩ්සිලා (**Godzila**), **ස්පයිඩර් මෑන්** (**Spider man**), **ලෝඩ් ඔෆ් ද රින්ග්** (**Load of the Ring**) , **වින් කොමාන්ඩර්** (**Win Commander**), **ඉන්ඩිපෙන්ඩන්ස් ඩේ** (**Independence day**) , **ට්විස්ටර්** (**Twister**) , **මැට්රික්ස්** (**Matrix**), **පර්ල් හාබර්** (**Pearl Harbor**)**මේ අතර** ප්‍රධාන **තැනක් ගනී. මෙහි** සියලු චිත්‍රපට වලදී දෘශ්‍ය **ප්‍රයෝග** භාවිතයේ දී මායා මෘදුකාංගය මෙන්ම, **කම්බුෂන් මෘදුකාංගය** (**Combustion Software**)හා **පෝසර්** මෘදුකාංගය (**Poser Software**) යොදා ගෙන ඇත.

### ද්විමාන රූප සජීවිකරණය හා ත්‍රිමාණ රූප සජීවිකරණය එක් ව යොදා ගැනීම

පරිගණක තාක්ෂණයේ දියුණුවේ තවත් ප්‍රතිඵලයක් ලෙස, 3D හා 2D Animation එකට Rendering කිරීමට ඇති හැකියාව දක්විය හැකිය. මෘදුකාංග වල දියුණුවත් සමග, 3D Animation වලට අමතරව Computer Graphics ද චිත්‍රපට වලදී භාවිත විය. බොහෝ දෙනා හොඳින්ම සුන්දර කරුණක් වූ කලී, ලෝකය පුරා උන්මාදයෙන් වැළඳගත් ටයිටැනික් (**Taitanic**) චිත්‍රපටය උදෙසාත් මෙහි දෘශ්‍ය ප්‍රයෝග සඳහා ත්‍රිමාණරූපී සජීවිකරණය යොදා ගෙන තිබීමයි. එහිදී ත්‍රී ඩී ස්ටුඩියෝ මැක්ස්(**3D Studio Max**) මෘදුකාංගය යොදාගෙන ටයිටැනික් නැව නිර්මාණය කර තිබිණ. මෙහි ඇති සමහර ප්‍රයෝග වෙනස් මූලද්‍රව්‍ය මුසු කරගත් කලා නිර්මාණ (**Collage**) වේ. ටයිටැනික් නැව වරායෙන් පිටත්වීම උදාහරණයක් ලෙස ගතහොත්, දර්ශනය ආරම්භ වන්නේ ජීවී නළු නිළියන් නැගී තියම ඩොක් (**Dock**) එකේ සිටින දර්ශනයකිනි. නමුත් එහි යොදා ඇති ප්‍රයෝග මගින් මිනිස්ටර් බෝට්ටුවක පසුතලය කරගත් මිනිස්සු, කුරුල්ලන්, වතුර ඉම ආදිය ද්විමාන ග්‍රැෆික් වලින් නිර්මාණය කර තිබිණි.

මෑත කාලීනව නිර්මාණය වූ **Jemes Cameron** ගේ ඇවටර් (**Avtar**) වැනි නිර්මාණ පරිගණක සජීවිකරණය හා සජීවි මිනිසුන් සම්බන්ධ කරවූ දැවැන්ත නිර්මාණ ලෙස ලෝක ප්‍රසිද්ධියට පත්වූ සිනමා කෘති ලෙස හැදින්විය හැකිය.

**දර්ශන මාපා පතිරණගේ**

# ලංකා විදුලිබල මණ්ඩලයේ පණිවිඩයකි

- නිවසේ බිත්ති මත ලා වර්ණ අලේප කර ආලෝකයෙන් උපරිම ප්‍රයෝජන ලබාගන්න
- සූත්‍රිකා විදුලි පහන් වෙනුවට වැඩි ඉතිරියක් සහිත සුසංහිත ප්‍රතිදීප්ත පහන් භාවිත කරන්න
- සැමවිට විදුලි බුබුළුවල දූහුවිල්ල පිසදමා උපරිම ආලෝකය ලබාගන්න
- විදුලි පංකා වෙනුවට ස්වභාවික වාතාශ්‍රය ලබාගැනීමට වැඩි වශයෙන් යොමුවන්න
- අනවශ්‍ය පරිදි රෙදි සෝදන යන්ත්‍ර භාවිත කිරීමෙන් වළකින්න
- අනවශ්‍ය විදුල පහන් නිවා දමන්න
- සතියක රෙදි මැද ගැනීමට ඉරිදා දහවල යොදා ගනිමු
- ශීතකරණය තුල උනුසුම් ආහාර බහාලීමෙන් වළකින්න
- සූර්යාලෝකයෙන් උපරිම සේවයක් ලැබෙන සේ නිවාස සැලසුම් කරන්න
- විදුලි උපකරණ මිලදී ගැනීමේදී ඒවායේ බලශක්ති කාර්යක්ෂමතාව පිළිබඳ සැලකිලිමත් වන්න
- වායුසමන භාවිතයේදී උෂ්ණත්ව පාලනය සෙල්සියස් අංශක 26 හි තබන්න
- සීලිං විදුලි පංකා වලට වඩා බිම සිටුවන හා මේස විදුලි පංකා බලය ඉතිරි කරයි

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

විදුලි බලයෙන් සසිරිමත් දිවියක්

# නව සංස්කෘතියේ නිමැවුම්කරු

HI HI
හුග දවසකින් Chat එකෙන් Set වුනේ
Yes dear පොඩ්ඩක් buzy
updates මොනවත් නැද්ද
නෑ dear මම phone එකෙන් fb එන්නේ
අලුත් phone එකක් ගත්තද
yes smart එකක්
ok ok

**අධික තරඹාරුව,
මානසික හුදෙකලාව,
මානසික රෝග ඇති වීම
මෙන්ම
සමාජයේ
අන්තර් සහයෝගය නැති
වීමට ද
මෙම
මාධ්‍ය සංස්කෘතිය
හේතු කාරක වී ඇත**

වර්තමාන තරුණ පරපුර තුළ වැඩි වශයෙන් මෙවැනි සංවාදයන් දක ගත හැකිය. අතීත ප්‍රජාව මුණ ගැසුණු විට ඒ ඒ පුද්ගලයන් ආ ගිය තොරතුරු විමසා සිටීම සිදු කළේ චාරිත්‍රයක් ලෙස සලකාගෙනය. නමුත් කාලයේ වෙනසත්, තාක්ෂණයේ වෙනසත් මෙම සංවාද වෙනස් කිරීමට සමත් වී ඇත. එම වෙනසට පදනම සකසන්නා වූ පෙළඹුම් කාරකයන් කවරේද යන්න විමසා බැලීම සමස්ත සමාජය දෙස විචාරාක්ෂියෙන් බලන්නා වූ අපගේ උර මත පැටවෙන වගකීමක් වේ. එහිදී ප්‍රධාන පෙළඹුම් කාරකය ලෙස සංස්කෘතිය යන්න සැලකිය හැකිය. කාර්මික විප්ලවයත් සමගම යුරෝපීය ජන සමාජය වෙත මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වඩා ශීඝ්‍රයෙන් සංසරණය වීම තුළ එතෙක් මානව සමාජය ඇදහූ සංස්කෘතියේ ස්භාවය ක්‍රමයෙන් වෙනස් විය. ජනමාධ්‍ය වඩ වඩාත් මානව ජීවිතයට සමීප වීමත් සමගම නොදැනුවත්වම එම ජනමාධ්‍ය ව්‍යුහය මානව ජීවිතය කෙරෙහි අභියෝගයක්ද එල්ල කරන්නනට විය. ඒ ඔස්සේ මාධ්‍ය සංස්කෘතියක් ලෝකයට බිහි කර ඇත. මාධ්‍ය සංස්කෘතිය තුළ දකිය හැකි නවාංගයක් ලෙස ජනප්‍රිය සංස්කෘතිය හැඳින්විය හැක. නමුත් මාධ්‍ය සංස්කෘතිය හා ජනප්‍රිය සංස්කෘතිය එකිනෙකට බද්ධ වී ඉදිරියට ගමන් කරන අන්ත දෙකක් ලෙස ද සැලකිම මනාය. එහෙව් මාධ්‍ය සංස්කෘතිය සමාජීය ජීවිතයට බලපෑම් කරන ආකාරය පිළිබඳව විමසා බැලීම ඉතා අගනේය.

අපේ සීයලා ආච්චිලා පවසන්නේ සංස්කෘතිය වල පල්ලට ගොස් ඇති බවය. බණක් භාවනාවක් කරන්නට පන්සලේ හාමුදුරුකෙනෙක් නොමැති නමුත් පැය විසිහතර පුරාම ආගමික වැඩසටහන් ජනමාධ්‍ය තුළින් විකාශනය වේ. මඟුලක් තුලාවක් අවශ්‍ය වුවත් ගම තුළ කපුවෙකු සොයා ගැනීම කලුනික සොයා ගැනීම වැනි අපහසු කාරණයකි. නමුත් පුවත්පත්වල පිටු ගණන් මංගල යෝජනා පිරී තිබේ. තමන්ට අවශ්‍ය වයස, තරාතිරම, වත්පොහොසත් කම, අධ්‍යාපන මට්ටම, කුලය ආදිය සලකා තෝරා ගත හැකි මෙන්ම තවත් කෙනෙකුට තමන්ගේ දියණිය හෝ පුතා අලෙවි කර ගැනීමට ද අවස්ථාවක් මෙමගින් ලැබී ඇත.

අනෙක් අතට මානසික රෝග, ලිංගික ආබාධ පමණක් නොව වශී ගුරුකම් , වෙද හෙදකම් පිළිබඳව තොරතුරු හුවමාරුකර ගැනිමට මාධ්‍ය සංස්කෘතිය මං මාවත් විවර කර ඇත. තමන්ගේ ශරීරයේ උස, බර පාලනය කර ගැනිමට අවශ්‍ය වෛද්‍ය උපදෙස් මෙන්ම ලබාගත යුතු ව්‍යායාම පිළිබඳව ද මාධ්‍ය තොරතුරු ලබා දි මිනිසා පොළඹවනු ලැබේ. මෙවැනි සංස්කෘතික එළඹුම් වර්තමානය වන විට ඉතිහාසයට එක් වී හමාරය.

වර්තමානය තුළ e banking, e marketing, e ticketing, e guiding, e chanelling ආදි කටයුතු ද සිදු කරගන්නා ආකාරය පැහැදිලිව දකගත හැකිය. අවස්ථාව අනුව තමන්ට ඇසිමට අවශ්‍ය ගීතය හෝ බැලීමට අවශ්‍ය චිත්‍රපටය හෝ කියවීමට අවශ්‍ය පොත තෝරා ගැනීම සිදු කළ හැකියි තමන්ට දැනගැනිමට අවශ්‍ය ප්‍රවෘත්තිය කුමක්දැයි විමසා ඊට අදාළ නාලිකාව තෝරා නැරඹීම හෝ ඇසිම පමණක් නොව තමන්ගේ දුරකථනයට ප්‍රවෘත්තිය ගෙන්වා ගැනිමේ අවකාශය ද උදා වී ඇත. කාලය අනුව රාහු කාලය කුමක්ද, ශුභ මුහුර්තය කුමක්ද මෙන්ම ලග්න පලාඵල බලා ගැනිමට ජ්‍යෝතිර්වේදීන් අවශ්‍ය නැත. ක්‍රීඩා නැරඹීමට පෝලිම්වල හිර වෙවී සිටීම අවශ්‍ය නැත. තමන්ට අවශ්‍ය ප්‍රදේශයට සංචාරයකයෑමටත් ගමන් බිමන් යෑමට බස් රථය, දුම්රිය මෙන්ම ගුවන් යානයේ ප්‍රවේශ පත්‍ර වෙන් කරවා ගැනීමට ද ගත වන්නේ සුළු වේලාවකි. වෛද්‍යවරයා මුණ ගැසිමටත්, බෙහෙත් වට්ටෝරු ලියවා ගැනිමටත් රෝහලේ පොලිම්වල ලැගිය යුතු නැත. ව්‍යාපාර හා වෙළඳ තොරතුරු දැනගැනිම, රැස්විම්වල කාලය කා දැමීමට අවශ්‍ය නැත. මුදල් හුවමාරු කර ගැනිමට බැංකුවල රස්තියාදු විය යුතු නැත.

උදේ පාන්දරම අවදි වන මිනිසාට පිරිසිදු වීම, ආහාර ගැනිම, රැකියා ගනුදෙනු කිරිම, පවුලේ වැඩකටයුතු, ළමයින්ගේ අධ්‍යාපන කටයුතු, බඩු භාණ්ඩ මිළදී ගැනිම, විනෝද වීම, යහළුවන් ඇසුරු කිරිම ආදි සියලු රාජකාරි ඉටු කර නැවත රාත්‍රියේ නින්දට යැම දක්වා සියල්ල සිදු කිරිමට මාධ්‍ය උපකාරි වී ඇති ආකාරය දකිය හැකිය. නමුත් මේ සියලු කාරණාවන් උදේ අවදිවන මිනිසා සිය සයනේ සිටම ඉටුකර ගැනිම දක්වා වෙනස් කිරිමට තරම් සංස්කෘතියක් නූතනයේ බිහි වී ඇති බව පැහැදිලි කරුණකි.

මේ සමස්ත කතාව තුළින් අවසානයේ මතු වන්නේ තත්කාලින සමාජයේ ක්‍රියාකාරීත්වය හා පැවැත්ම තීරණය කරන මිනුම් දණ්ඩ මාධ්‍ය සංස්කෘතිය බව නොවේද? ඒ නිසාම අනාගත මිනිසා මෙම මාධ්‍ය සංස්කෘතියට බිය නොවිය යුතු ද යන්න ප්‍රශ්නයක් වේ. මන්ද අධික තරබාරුව, මානසික හුදෙකලාව, මානසික රෝග ඇති වීම මෙන්ම සමාජයේ අන්තර් සහයෝගය නැති වීමට ද මෙම මාධ්‍ය සංස්කෘතිය හේතු කාරක වී ඇති බවයි.

අසිත ප්‍රභාත් මල්ලවආරච්චි


සුභ මොහොතින්
කැන්දං යන්න
011 5 400 400
SINGER
Trusted Excellence



# ජීවිතය පරිසරය සහ නීතිය

පරිසරය, කෘෂි කර්මාන්තය, සෞඛ්‍ය අධ්‍යාපනය, භූගෝල විද්‍යාව වැනි විවිධ සමාජීය විෂයන් හා සෞන්දර්යාත්මක ඇගයුම් සමග සබැඳුණු සමෝධාන විෂයකි. එසේම පරිසරය මානව ජීවිතය සෞන්දර්යාත්මක කරන එක් මූලික අංගයකි. මානවයාගේ ජීවිතය පරිපූරණ කරන්නට පරිසරය මහඟු පිටිවහලක් වේ. ආර්ථික සාධකය පසුපස හඹායන මානවයා පරිසරය අමතක කර ඇති යුගයක එහි ඵල විපාක අත්විඳින්නට සිදුවන්නේ අද ඔබේ කුසයේ සිටින දරුවාටය. නැතහොත් හෙට ඔබගේ මාතෘත්වය හෝ පීතෘත්වය පතන දරුවාටය. එහෙයින් මානවයා සහ සොබා දහම අතර පවතින අන්තර් සබඳතාව වටහා ගැනීමට කාලය එළඹ ඇත.

පෘථිවියේ තාප තුලාව වෙනස් කරන විවිධ සාධක වේ. මානුෂ ක්‍රියා නිසා දෛනිකව වායුගෝලයට එක්වන කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය නිසා සිදුවන ගෝලීය උෂ්ණත්ව ඉහළයාම දරුණු අනතුරු සඳහා පාදක වේ.

මෙයට විසඳුම් ලෙස පරිසරය සංරක්ෂණය කිරීම කළ යුතුය. මනුෂ්‍ය වර්ගයා ස්වභාවධර්මයේ කොටසක් වන අතර "ස්වභාවධර්මයෙන් සපයන ශක්තිය හා පෝෂණය මත ජීවිත රදා පවතී" යන. එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනෙහි පූර්විකාව තුළින් මිනිසා හා පරිසරය අතර පවතින අන්‍යෝන්‍ය බැඳීම වටහාගත හැකිය. වෘක්ෂලතාදියෙන් සමන්විත මිහිතලයත්, ගංගා, ඇළදොළ වලින් සමන්විත ජලජ පරිසරයත්, වායුගෝලයත් එක්ව සැලකූ කළ පරිසරය පද්ධතියක් ලෙස හැඳින්වීමට පිළිවන. මානව ක්‍රියාකාරකම් මගින් බාහිර බලපෑමක් ඇති නොවන්නේ නම් පරිසර පද්ධතියේ ස්ථායිතාව සුරැකී පවතී. ස්වාභාවික පරිසරයේ උපයෝජකයා වෙමින් මිනිසා සමස්ත පරිසරයම තම අවශ්‍යතා සඳහා භාවිත කරන්නට යාම තුළ ගැටලු මතුවී තිබේ. විද්‍යා හා තාක්ෂණික දියුණුව හමුවේ ලබන ජයග්‍රහණ පාරිසරික ගැටලු සඳහා හේතුකාරක වන අවස්ථා වේ. එසේ සිදුවන පාරිසරික හානීන් ප්‍රතිපූර්ණය කිරීමට මගක් නොවන අවස්ථා ද වේ. ගෝලීය උෂ්ණත්වය ඉහළයාම, මුහුදු ජල මට්ටම ඉහළයාම වැනි විවිධ පාරිසරික විපත් විසිඑක්වන සියවසේ මිනිසාට පවතින අභියෝග වන්නේ එම නිසාය. අප මේ පිළිබඳව වැඩි අවධානය යොමු කළ යුතුය.

මෙසේ දින දින සිදුවන පාරිසරික හානීන් අවම කරගැනීමට පරිසර නීතිය දායක කරගත හැකිය. ජාතික සේම ජාත්‍යන්තර පාරිසරික නීතිය ද පරිසරය ආරක්ෂා කරගැනීමට සහාය කරගත හැකිවේ. පවත්නා පාරිසරික ගැටලු හා පරිසරය ආරක්ෂා කරගැනීමේ ප්‍රතිපත්ති අන්තර්ගත පාරිසරික ප්‍රතිපත්තිමය නීති මාලාවක් සෑම රටකම පාහේ දැකගත හැකිය. ලංකාවේ 1988 අංක 56 හා 2000 අංක 55 දරණ පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත උදාහරණයක් ලෙස දැක්විය හැකිය. ව්‍යවස්ථාපිත නීතිය මතම නොව පොදු නීති ප්‍රතිකර්ම ද පාරිසරික ගැටලු විසඳීමට සහාය කරගත හැකිවේ. එසේම අන්තර්ජාතික යුක්ති අධිකරණ දෙන තීරණ ද වැදගත් ය. එසේම මහජන සුබසාධන නඩුකර මගින් ද පාරිසරික නීතියේ වර්ධනයට විශාල

**විවිධ නීතිමය ප්‍රතිපාදන තුළ පරිසර සංරක්ෂණය පිළිබඳ ප්‍රබලව අවධානය යොමුකර ඇත. නමුත් එසේ පවතින ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමට අප සැමගේ සහාය ඉතා අත්‍යාවශ්‍ය වේ. නැතහොත් ජීවිතයේ සුන්දරත්වය නිසිලෙස අත්විදීමේ අවස්ථාව අපෙන් ගිලිහෙනු ඇත.**

දායකත්වයක් ලබාදී තිබේ. රටවල් තමන්ට හිමි ජෛව සම්පත් රැක නොගත හොත් එම සම්පත් මුළු ලොවින්ම තුරන්වීමේ අවධානමක් පවතී. එනිසා රටක පවතින සම්පත් රැකගැනීමට එම රට සතුවන යුතුකම් සමුදායකි. එසේම ජාත්‍යන්තර වශයෙන් වර්ධනය වන පාරිසරික නීතිය ද ඒ සඳහා බලපෑනු ලැබේ.

අන්තර්ජාතික පරිසර නීතියේ විකාශය තුළ 1972 ස්ටොක්හෝම් ප්‍රකාශනය අතිශයින් වැදගත් වේ. වර්තමානයට ගැළපෙන ලෙස පරිසරයට අදාළ නීති ගොනු කිරීම මෙහි ප්‍රතිඵලය විය. ඊට අමතරව ජුනි 05 ජගත් පරිසර දිනය ලෙස ප්‍රකාශ කිරීම, න්‍යෂ්ටික අත්හදා බැලීම නතර කිරීම, පරිසරය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම ආදිය ද වැදගත් වේ.

ස්ටොක්හෝම් ප්‍රකාශනයෙන් පසුව පරිසරය සම්බන්ධයෙන් වූ සම්මුතීන් රාශියක් බිහි වූ අතර, 1973 නැව් මගින් සිදුවන පරිසර දූෂණය වැළැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය, තර්ජනයට ලක් වූ වන සතුන් හා ශාක විශේෂයන්ගේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතීන් ද මෙහි දී වැදගත්වේ. පරිසරය හා සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුව 1950 දී පිහිටුවනු ලැබීය. එසේම, පරිසරය හා සංවර්ධනය සම්බන්ධයෙන් වූ එක්සත් ජාතීන්ගේ සමුළුව ද මේ අතර වැදගත් වේ. මීට අමතරව දේශගුණික වෙනස්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ ජෛව විවිධත්ව පිළිබඳව වූ සම්මුතිය ද විශේෂ වැදගත්කමක් උසුලයි.

මෙසේ වර්ධනය වන ජාත්‍යන්තර සම්මුතීන් තුළ පරිසර නීතිය අඛණ්ඩව සංවර්ධනය වේ. ඒ තුළ දේශිය පරිසර නීතිය ද සෘජු හා වක්‍ර ආකාරයෙන් සංවර්ධනය වීම සිදුවේ.

මේ යටතේ චිරස්ථායී සංවර්ධනය සඳහා පවතින ජාත්‍යන්තර නීතීන්, ව්‍යවස්ථා ද වැදගත් වේ. අනාගත පරම්පරාවට සංවර්ධනය වීමට ඇති අයිතිය සුරකිමින් සංවර්ධනය කරා යොමු වීම චිරස්ථායී සංවර්ධනය තුළ අවධානයට ගනු ලැබේ. රියෝ ප්‍රකාශනයේ, 4 වන ව්‍යවස්ථාව තුළ සඳහන් වන්නේ චිරස්ථායී සංවර්ධනය උදාකර ගැනීම සඳහා පරිසරය ආරක්ෂාකර ගැනීම යන්න සංවර්ධන ක්‍රියාදාමයේ අන්තර්ගත කොටසක් ලෙස සැලකිය යුතු බවයි.

එසේම 1992 පිහිට වූ අන්තර්ජාතික දේශගුණික වෙනස්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 4 වන ව්‍යවස්ථාව පෙන්වන්නේ සියලුම පාර්ශවයන් විසින්, මිනිසා හඳුන්වා දෙන ලද දේශගුණික විපර්යාසයන්ට තුඩුදෙන සාධක මැඩලීම සඳහා ප්‍රතිපත්තීන් සහ ක්‍රියාමාර්ග ස්වකීය සංවර්ධන ක්‍රියාදාමය තුළට අන්තර්ගත කළ යුතු බවයි.

එසේම පාර්ශවය විසින් ස්වකීය චිරස්ථායී සංවර්ධන ක්‍රියාදාමයන් තුළ කාලගුණය හා කාන්තාරකරණය වැළැක්වීම සඳහා සැලසුම් සහ ප්‍රතිපත්ති සකස් කර ඒවාට ප්‍රමුඛතාව ලබාදිය යුතු බව 1992, කාන්තාරකරණය පිළිබඳ සම්මුතිය තුළ දක්වේ.

අන්තර්ජාතික වශයෙන් චිරස්ථායි සංවර්ධනයේ නීතිමය අංශ හතරක් වර්ධනය වී තිබේ. අනාගත පරම්පරාව උදෙසා ඒ සම්පත් රැකගැනීමේ අවශ්‍යතාව, එම සම්පත් චිරස්ථායි, විචක්ෂණ, බුද්ධිමත් හා ඥානවන්ත ආකාරයට භාවිත කිරීමේ අවශ්‍යතාව, එම සම්පත් එක් රටක් භාවිත කරන විට අනෙකුත් රාජ්‍ය අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත්වීම හා පාරිසරික සලකා බැලීම් ආකාර හා අනෙකුත් සංවර්ධනය සැලසුම් ව්‍යාපෘති හා වැඩසටහන් සමග ඒකාබද්ධව සලකා බැලීම සහ සංවර්ධන අවශ්‍යතා පාරිසරික අරමුණු වලට අනුකූලව සකස් කිරීම එම අංශ අතර වේ.

මෙසේ ජාත්‍යන්තර වශයෙන් පරිසරය ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගනිද්දී ජාතික වශයෙන් ද පරිසරය ආරක්ෂා කිරීමට විවිධ පියවර ගෙන ඇත. ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය පිළිබඳ සැලසුම් සහ ප්‍රතිපත්ති පුළුල් වී ඇත්තේ විවිධ පරිසර හිතකාමීන් ගන්නා ලද ක්‍රියාමාර්ග නිසාය.


1907 දී කොළඹ මහනගර සභාව පැනවූ ජල ආඥා පනත, 1861 දී පනවන ලද මං මාවත් ආඥා පනත ද මෙහිදී වැදගත් වේ. 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත තුළ පරිසර කළමනාකරණය පිළිබඳ ප්‍රතිපාදන දක්වා තිබේ. ඒ අනුව රටේ ස්වාභාවික සම්පත් භාවිත කරන ආකාරය පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පරිසර අධිකාරියට ලබාදේ.

එසේම අප ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ සිවිල් හා දේශපාලනික වශයෙන් හිමිවිය යුතු මූලික අයිතිවාසිකම් දක්වා ඇත. රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීම පිළිබඳ දක්වන 4 වන පරිච්ඡේදයේ පරිසරය පිළිබඳ ප්‍රතිපත්ති දක්වා ඇත. එහි 27(14) වගන්තියට අනුව රජය විසින් මහජනතාව වෙනුවෙන් පරිසරය ආරක්ෂා කිරීම හා සුරක්ෂිත කොට වැඩි දියුණු කිරීම කළ යුතු බව දක්වන අතර 28 වගන්තිය තුළ දක්වෙන්නේ, ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීමට හා ස්වාභාවික සම්පත් රැකගැනීමට යුතුකමක් පවතින බවයි.

1988 අංක 56 දරණ සංශෝධිත පනත ද පරිසර සංරක්ෂණය පිළිබඳ වැදගත් වේ. මෙහි විවිධ වගන්ති මගින් දේශීය ජල තීරය දූෂණය කිරීම, වායුගෝලය, පස, ශබ්ද දූෂණය පිළිබඳ සීමා පනවා ඇත. මෙවැනි පරිසර දූෂණයක් සිදුකිරීම අපරාධමය වරදක් වන අතර ඒවා කඩකිරීම තුළ දඩුවම් හිමිවේ. පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා පිළිබඳ පවතින නීතිමය වාතාවරණය ද පරිසරය සංරක්ෂණය සම්බන්ධයෙන් වැදගත් වේ. 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ පනත මෙහිදී ප්‍රමුඛ වේ.

මෙසේ පවතින විවිධ නීතිමය ප්‍රතිපාදන තුළ පරිසර සංරක්ෂණය පිළිබඳ ප්‍රබලව අවධානය යොමුකර ඇත. නමුත් එසේ පවතින ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමට අප සැමගේ සහාය අත්‍යාවශ්‍ය වේ. නැතහොත් ජීවිතයේ සුන්දරත්වය නිසි ලෙස අත්විදීමේ අවස්ථාව අපෙන් ගිලිහෙනු ඇත.

**දිහිනි ජයසේකර**



# අපද්‍රව්‍ය අමුද්‍රව්‍යයක් කර ගනිමු

අවශ්‍යතා ප්‍රමාණාත්මකව සීමා වූ අතීතය සරල දිවිපෙවෙතකට හුරුව සිටි ජනතාව නොයෙක් දේ ඔතාලීමට, ඔතාගැනීමට, දවටා ගැනීමට යොදාගත්තේ ස්වභාවික ද්‍රව්‍යයන්ය. නමුත් අද වන විට මිනිසාගේ කාර්ය බහුල ජීවිතයේ සමීපතමයා බවට පත්ව ඇත්තේ පොලිතීන් සහ ප්ලාස්ටික්ය. ස්වභාවික ක්‍රියාවලියක් තුළ දිරායාම සඳහා දීර්ඝ කාලයක් ගතවන අතර ඒවා දහනය කිරීමේදී පිටවන අහිතකර වායූ මිනිසුන්ට පමණක් නොව සමස්ත පරිසර පද්ධතියටම අහිතකර ප්‍රතිඵල ගෙන එයි. ඇතුවත් බැරි නැතුවත් බැරි පොලිතීන් සහ ප්ලාස්ටික් නිසි කළමනාකරණයකින් යුක්තව අවම භාවිතයකට ගැනීමත් ප්‍රතිචක්‍රීකරණය සිදුකිරීමත් කාලෝචිතය.

ලංකාව මුහුණ දෙන මෙම ගැටලුවට සාර්ථක විසඳුමක් වශයෙන් මධ්‍යම පරිසර අධිකාරියත්, පාරිසරික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයත් 2007 වර්ෂයේ මැයි මාසයේ සිට ආරම්භ කළ ප්ලාස්ටික් කළමනාකරණ ජාතික ප්‍රතිපත්තිය හඳුන්වා දිය හැකිය. "අපද්‍රව්‍ය හිසරදයක් නොව ආර්ථික සංරක්ෂණ සම්පතක් කර ගනිමු" යන තේමාව යටතේ මෙම ව්‍යාපෘතිය දියත් කරනු ලබයි. මේ සඳහා අරමුදල් මහා භාණ්ඩාගාරය විසින් සපයනු ලබන්නේ මෙරටට ආනයනය කරනු ලබන ප්ලාස්ටික් සඳහා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව අය කරනු ලබන බදු ආදායම් වලිනි. රට තුළ ඉවතලන ප්ලාස්ටික් එකතු කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රමවේදය වර්ෂය පුරාම සිදුවන පරිදි උපායශීලී දැනුවත් කිරීමේ, උපදෙස් සැපයීම සහ දියුණු කිරීම සඳහා මූලික වැඩසටහන් තුනක් ක්‍රියාත්මක වේ.

01 - ප්‍රාදේශීයව ප්ලාස්ටික් අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම හා සංවර්ධනය.

02 - ප්ලාස්ටික් අපද්‍රව්‍ය එකතු කරන්නන් හා ප්‍රතිචක්‍රීකරණය ජාලයක් ඇතිකිරීම මෙන් ම එය වැඩිදියුණු කිරීම.

03 - ඉහත කාර්යයන් ප්‍රවර්ධනය කිරීම

මේ වන විට ව්‍යාපෘතිය මගින් විවිධ සමාජ කණ්ඩායම් සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත. (පාසල් සිසුන්, පළාත් පාලන ආයතන, වෙනත් ආයතන) එසේම දැනුවත් කිරීමේ පත්‍රිකා, අපද්‍රව්‍ය වෙන වෙනම එකතු කිරීමේ මලු, අපද්‍රව්‍ය එකතු කිරීමේ බඳුන් ලබාදීම, අපද්‍රව්‍ය එකතු කිරීමේ ශ්‍රමදාන පැවැත්වීම, පාසල් සිසුන් සහ ප්‍රජා කණ්ඩායම් සඳහා ප්‍රතිචක්‍රීකරණ ක්‍රම හඳුන්වාදීම, පරිසර හිතකාමී රූපවාහිනී වැඩසටහන් ප්‍රචාරය කිරීම, සමරු කලාප, දැන්වීම් මුද්‍රණය, ක්ෂණික ඇමතුම් ක්‍රමයක් පවත්වාගෙන යාම (0773-909090) සිදු කෙරේ.

එසේම ශ්‍රී පාදය, කතරගම, තිස්සමහාරාම විහාරය, අනුරාධපුරය, මිහින්තලේ පොසොන් වැඩසටහන, නුවර ඇසළ පෙරහැර, නාගදීපය, යාපනයේ නල්ලූර් කෝවිල, ත්‍රිකුණාමලය වැනි පූජනීය ස්ථාන වල සහ පල්ලෙකැලේ, මහනුවර, දැයට කිරුළ ජාතික ප්‍රදර්ශන යනාදී අවස්ථාවලදී ප්‍රජා සහභාගීත්ව වැඩසටහන්, පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන්, ශ්‍රමදාන සංවිධානය කිරීමෙන් අපද්‍රව්‍ය සංවර්ධන ක්‍රියාදාමයන් මෙහෙයවනු ලැබේ.

එසේම පන්නල ප්‍රදේශීය සභාව, බලංගොඩ නගර සභාව සහ කුරුණෑගල මහ නගර සභාව යන පළාත් පාලන ආයතනවලට අපද්‍රව්‍ය වර්ගීකරණය කර ප්‍රවාහනය කිරීම සඳහා ට්‍රැක්ටර් සහ ට්‍රේලර් ලබා දී ඇත.

ප්ලාස්ටික්, පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය සිදු කරන පෞද්ගලික අංශයේ කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළුවක් වන අපද්‍රව්‍ය තත්ත්වයෙන් එකතුවන පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය කර ගැනීම සඳහා මූල්‍යමය පහසුකම් ලබා දීමට පියවර ගෙන ඇත. මෙහිදී කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්ක වල ප්‍රමුඛ පෙළේ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ කර්මාන්තකරුවන් තිදෙනෙකුට තම කර්මාන්තය වැඩි දියුණු කර ගැනීමට අවස්ථා සලසා දී ඇත.

**ගයාන් මදුසංක**

යම් නිශ්චිත විෂයක් පිළිබඳව හෝ නිශ්චිත ප්‍රවෘත්තියක් පිළිබඳව ඔබගේ අදහස්, සිතුම් පැතුම් හා හැඟීම් යනාදිය තවත් අයෙකු සමග හුවමාරු කරගැනීම සන්නිවේදනය ලෙස හැඳින්විය හැකි ය. ඔබගේ කථනයෙන්, වචනයෙන් හෝ සමහරවිට ඔබගේ අංග චලනයෙන් මෙන් ම සමස්ත හැසිරීමෙන් ද සන්නිවේදනය සිදුකළ හැකි ය. එනම්, ශ්‍රේෂ්ඨ සන්නිවේදකයෙකු යනු මිනිසුන් පෙලඹවීමේ බලය මැනවින් භාවිත කළ හැකි පුද්ගලයෙකි. ඔහු එම බලය යොදා ගනිමින් තමා වටා සිටින පිරිස් මැනවින් තම විධානයන්ට අවනත කරගැනීමේ හැකියාව ඇති පුද්ගලයෙකු වේ. මානව වර්ගයා විසින් තමන්ට ආවේණික වූ විවිධ ක්‍රම ඔස්සේ තම සන්නිවේදන හැකියාව දියුණු කරගනිමින් සුවිශේෂී පුද්ගලයන් තම චාන්තියෙහි මෙන් ම සංවාදයෙහි උච්චතම හා ශ්‍රේෂ්ඨතම ස්ථානයට පත්වීමට වාසනාවන්ත විය. පහත සඳහන් වන්නේ ඒ ආකාරයෙන් ශ්‍රේෂ්ඨ සන්නිවේදකයෙකු වීමට ඔබට අවශ්‍ය වන්නා වූ ගුරුහරුකම් කිහිපයකි.

# ශ්‍රේෂ්ඨ සන්නිවේදකයෙකු බිහිවන්නේ කෙසේද?

01. සන්නිවේදකයා සතුව ප්‍රබල විෂයානුබද්ධ බුද්ධි මට්ටමක් හා එහි පවතින විචලයන් පිළිබඳව මෙන් ම අනාවරණය කර නොගත් උපායන් පිළිබඳව හැඟීම් හා යථාර්ථවාදී දැනුමක් තිබීම අත්‍යාවශ්‍ය වේ.

02. ලිඛිත වාක්‍යයක් පිළිබඳව වැඩි අවධානයක් යොමු නොකර පවතින තත්ත්වයෙහි හරය කෙරෙහි අවධානය යොමුකර එමගින් ප්‍රබල විසඳුමක් ලබාගත හැකි ලෙස තම ප්‍රකාශයන් ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කිරීම.

03. අභියෝග හා ගැටලු හඳුනා ගැනීම හා ගැටලු ආවරණය නොකිරීම. එමගින් ඔබගේ අවංකභාවය පිළිබඳව ජනයා සතුටු වන අතරම ඔබගේ අභියෝගිතාවයෙන් තොරව අදහස් දැක්වීම කෙරෙහි ඔවුන් ඔබට ආචාර දක්වයි.

04. සෑම විටෙකම සත්‍යය අත්දැකීම ප්‍රකාශ කරන්න. එමගින් ඔබගේ තත්ත්වයට ස්ථාවරභාවයක් ඇතිවන අතර එය ඔබගේ පණිවුඩය ජනයා අතරට ඉතා පහසුවෙන් ගෙන යාමට අවශ්‍ය පදනම සකසයි.

05. ප්‍රලාපයන්ගෙන් තොරව කුමන හෝ භාෂාවකින් ඉතා පැහැදිලිව අදාළ ප්‍රධාන කරුණු වෙත ළඟාවිය යුතු ය.

06. ජනයා ඔබ සඳහා කුමක් කළ යුතු ද? ඔබ ඔවුන්ගෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද? යන්න පිළිබඳව ඔවුන්ට පැහැදිලි කරන්න. මෙය ඔබ ඔවුන්ට විධානයන් ලබාදීමේ ආරම්භක අවස්ථාවක් ලෙසට ද පත්කර ගත හැකිය.

07. ඔබ ජනයා ඉදිරියේ තවකෙකු හෙළා දැකීමට පෙලඹෙනවා නම් එසේ කිරීමට ඔබට ඇති අවස්ථා ගණන ඉතා විරල වනු ඇත. මන්ද නිර්වචනත්වයට වංචා කළ නොහැකි ය.

ඉහත සඳහන් කරන ලද සියලු ගුරුහරුකම් ඔබගේ ආත්ම විශ්වාසය සමග සමපාත වේ. ඔබ ඔබගේ සංවාදයන් පිළිබඳව ඇති කරගත් ආත්ම විශ්වාසත් ඉතා ප්‍රබල මට්ටමක පවතින විට එමගින් යහපත් ප්‍රතිඵල ඔබට උදාකරදෙනු ඇත. දේශපාලන ක්ෂේත්‍රයෙහි ප්‍රබල ජනාධිපතිවරුන් වශයෙන් දනට හඳුන්වනු ලබන්නන් එසේ හැඳින්වීමට පාත්‍රව ඇත්තේ ඔවුන්ගේ ප්‍රබල සන්නිවේදන කුසලතාවන් නිසාවෙනි.

උදාහරණ ලෙස හැරී ටෲමන්, ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට් හා ඒබ්‍රහම් ලින්කන් වැනි ජනාධිපතිවරු හැඳින්විය හැකි ය. මොවුන්ගේ ජීවන දෙස ඉතා සූක්ෂමව විමසා බැලීමේදී හෙළිවන කරුණක් නම් මොවුන්ගේ සන්නිවේදන කුසලතා ඉතා ප්‍රබල ලෙස ජනතා සිත කෙරෙහි බලපෑම් ඇති කළ බවයි. ඉහත සඳහන් කරන ලද සෑම ජනාධිපතිවරයෙකු ම පාහේ ඇමරිකානු ජනතාව සමග යම් යම් ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දුන්න ද, ඔවුන්ගේ සන්නිවේදන හැකියාවන් මාර්ගයෙන් එම තත්ත්වයන් මග හරවා ගන්නා ලදී.

එහිදී ජනාධිපති රොනල්ඩ් රේගන් විසිවන සියවසේ සිටි වූ සාර්ථකම සන්නිවේදකයා ලෙස අවිවාදයෙන් හැඳින්විය හැකි ය. එහිදී ඔහුගේ ප්‍රතිපත්තිවලට ඉතා දැඩි ලෙස විරුද්ධ වූවන් පවා ඔහු ශ්‍රේෂ්ඨ සන්නිවේදකයෙකු ලෙස හඳුන්වාදී ඇත. මෙමගින් අපට අවබෝධ කරගත හැකි කරුණ නම් ආත්ම විශ්වාසය, තම දක්ෂ නායකත්වය මෙන් ම සන්නිවේදන කුසලතා පත් කරවී ය. එමගින් ඔහු ජනතාව තුළ අසමසම පුද්ගලයෙකු බවට පත් කළ බවයි.


ලොව ප්‍රමුඛ පෙළේ ප්‍රධාන විධායක නිලධාරීන් ලෙස හඳුන්වනු ලබන ජැක් වෙල්ක්, රිචඩ් බ්‍රැන්සන් හා ඇපල් සමාගමේ නිර්මාතෘ ස්ටීව් ජොබ්ස් වැනි පුද්ගලයන් පිළිබඳව සලකා බැලීමේදී, ගම්‍ය වන කරුණ නම් ඔවුනොවුන්ගේ ව්‍යාපාර ඉතා දියුණු තත්ත්වයකට ගෙන එනු ලැබුවේ ඔවුන්ගේ සන්නිවේදන කුසලතාවයන්හි තිබූ බලවත්භාවය යි. එමෙන් ම මොවුන් තනිව හැකි සිටීමේදී මොවුන්ට උපකාර වූයේ මොවුන් සතුව පැවතියා වූ කථනයේ බලයෙන් අන් අය පෙලඹවීමේ හැකියාවයි. එහිදී අනුගාමිකයන්ගේ විශේෂ අවධානය දිනාගැනීම, ඔවුන්ට නායකත්වය ලබාදීම හා වගකීම් පැවරීමට අමතරව ඔවුන්ගේ ඉලක්ක සපුරා ගැනීමට තමා වටා සිටින අනුගාමිකයින් තම අරමුණු වෙනුවෙන් උනන්දු කරවීමට ඔවුන් තම සන්නිවේදන කුසලතාවන් භාවිත කරන ලදී.

ශ්‍රේෂ්ඨ සන්නිවේදකයෙකු වීමට අත්‍යාවශ්‍ය ශක්තිය අප තුළ ගැබ්ව පවතින බවත් එමගින් නෝක්කාඩුව ඉහළින් හැකි කිරීමටත් අප ඇති සංවාදයන්ට බලපෑම් කිරීමටත් හැකියාවක් පවතින බව අවසාන වශයෙන් ප්‍රකාශ කළ හැකි ය.

(Www.malcolmoutloud.tv>home>.carrer/business)

පරිවර්තනය ඇසුරිනි
අනෝජ් මධුශංක වීරසිංහ

# හඳුනාගත්තොත් ඔබ මා



අප අසන දකින හැම දෙයක්ම අපට තේරුම් ගත හැකි ද? වටහා ගත හැකි ද? ඇතැම් දේ වටහා ගැනීමට දින කාලාන්තරයකින් නොහැකි ය. ඒ සඳහා කාලාන්තරයක් ගත වේ. ඇතැම් දේ දැක දෙවා අමිහිරි බිහිසුණු ද වටහා ගැනීමට නොහැකි ය. එසේ කාහි සිටියත් වටහා ගැනීමට අපහසු මිනිසුන් මෙසේ ය.

| | |
|---|---|
| සුදු සුදු එක | වෙසෙර |
| බිදු බිදු දකම | මහනට |
| සිදු සිදු දැන් | සසට |
| අනේ... දෙව්දත් කුදුට | මොණ්ඩුර |

මේ ගුත්තිල කාව්‍යයේ කර්තෘ වෑත්තෑවේ හිමියන් දෙව්දත් තෙරුන් වහන්සේගේ වටහා ගැනීමේ ඥානය ගැන අකාරයයි. යමක් නිසි ලෙස වටහා ගැනීමට නොහැකි වීම ජීවිතය අගතියට හෙළීමට හේතු වන බව මින් ගැන වේ. ජීවිත කාලය පුරා වටහා ගැනීමට නොහැකිව අපගේ සිදුවන දේ කොතරම් ද? ඒ අනුව යමක් හෝ යමෙකු හඳුනා ගැනීම, වටහා ගැනීම, අවබෝධ කරගැනීම පහසුවෙන් කළ නොහැකි සංකීර්ණ ක්‍රියාවලියකි.

ඇතැම් දෙයක් වටහා ගැනීමේ සහ අවබෝධ කරගැනීමේ හැකියාව මත සිව්ආකාරයට වෙනස් ශ්‍රාවකයින් කෙවත් ශ්‍රාවකයින් කිහිපදෙනෙක් සිටින බව අංගුත්තර නිකායේ සඳහන් වේ. එනම්

- වහා අවබෝධ කර ගන්නා ශ්‍රාවකයා
- මඳක් විස්තර කිරීමෙන් පසු අවබෝධ කර ගන්නා ශ්‍රාවකයා
- සංදේශය සම්පූර්ණයෙන්ම විවරණය කිරීමෙන් පසුව අවබෝධ කර ගන්නා ශ්‍රාවකයා
- වචනය පමණක් අවබෝධ කර ගන්නා නමුත් අර්ථය අවබෝධ කර නොගන්නා ශ්‍රාවකයා

යනා දී වශයෙනි. මේ සෑම ප්‍රභේදයකටම අයත් පුද්ගලයන් සමග කටයුතු කිරීමට අපට සිදු වේ. එහි දී ඔවුන්ගේ ශ්‍රාවකත්වය පිළිබඳ පවත්නා පූර්ව අවබෝධය මනා සබඳතාවක් ගොඩනැගීම පිණිස හේතු වේ. යමක් අවබෝධ කර ගැනීම කෙරෙහි පුද්ගලයා දක්වන නැඹුරුව හඳුනා ගැනීම සන්නිවේදකයාට, ශ්‍රාවකයාට පමණක් නොව විවිධ තරාතිරමේ වෘත්තිකයන්ට ද අතිශයින් වැදගත් වේ. ආයතන ප්‍රධානියෙකුට තමා සතු මානව හා භෞතික සම්පත් කළමනාකරණය කර ගැනීම පිණිස ඉහත දක්වූ පුද්ගල අවබෝධය අවශ්‍යවේ. එසේම වෛද්‍යවරයා, නිර්මාණකරුවා, මෙන්ම දේශපාලනඥයා ද මිනිසා යමක් වටහා ගැනීමේ නිපුණත්වය හැඳින ගත යුතුය. පුද්ගලයා යමක් වටහා ගැනීමේ ස්වභාවය පූර්වයෙන් විනිශ්චය කිරීමට හැකිවීම සෑම සමාජ සබඳතාවකම යහ පැවැත්ම පිණිස හේතු වේ.

එමෙන්ම ඉහත පුද්ගල ප්‍රභේදකරණය අනුව ඔබ අයත් වන්නේ යැයි හැඟෙන්නේ කුමන වර්ගීකරණයට ද? ඒ පිළිබඳව ඔබ මඳක් සිතා බලන්න. ඒ සමාජ ජීවිතයේ දී මේ සෑම දෙනා සමගම අපට විවිධ ගනුදෙනු කරන්නට සිදුවන බැවිනි.

යමක් නිසි ලෙස අවබෝධ නොවීම පිණිස හේතු වන ශ්‍රාවක දුර්ගුණ පිළිබඳව අංගුත්තර නිකායේ ප්‍රථම, දෙවන හා තෙවන සම්මත්ත නියාම සූත්‍ර දේශනාවන් හි සඳහන් වේ. ඒ සියලු කරුණු සම්පිණ්ඩනය කර යමක් නිසි පරිදි අවබෝධ නොවීමට හේතුවන ශ්‍රාවක දුර්වලතා පහත පරිදි දැක්වීමට පිළිවන. ඒ අනුව ශ්‍රාවකයා

- කථාවට පරිභව කිරීම
- ධර්ම කථිකයාට පරිභව කිරීම
- තමාට පරිභව කර ගැනීම
- එකඟ නොවූ සිත් ඇති වැ වික්ෂිප්ත චිත්තයෙන් යුක්ත ව ධර්මය ශ්‍රවණය කිරීම
- ධර්මය නුවණින් තොරව (නුනුවණින්) මෙනෙහි කිරීම
- ජඩ වීම, කෙළතොලු වීම හා දුෂ්ප්‍රාඥ වීම
- නොදත් දේ දත්තේ යැයි මානයෙන් ධර්මය ශ්‍රවණය කිරීම
- ගුණමකු වූයේ ගුණමකු සිතින් මඩනා ලදුව ධර්මය ශ්‍රවණය කිරීම
- වාද නගන සිත් ඇත ව (උපාරම්භ චිත්ත) සිදුරු සොයන අරමුණින් ධර්මය ශ්‍රවණය කිරීම
- තද බව ඇති ව දේශකයා කෙරෙහි ක්‍රෝධයෙන් ගැටෙන සිතින් යුක්ත ව ධර්මය ශ්‍රවණය කිරීම පෙන්වාදිය හැකි ය.

මෙවැනි ගුණ සහිත ශ්‍රාවකයෝ සන්නිවේදනයෙහි නිසි ප්‍රයෝජන ලැබීමට




සමත් නොවෙති. ඔවුහු ස්වකීය ජීවිතයෙහි ප්‍රගතිය වර්ධනය කර නොගනිති. මෙම මානසික විෂමතා සහිත ශ්‍රාවකයාගේ සමාජ ජීවිතය අක්‍රිය වේ. එපමණක් නොව යමක් නිරවුල්ව වටහා ගැනීමෙ හැකියාව ඔවුන් වෙතින් දුරස් වේ. ඔබ යම් කරුණක් තවත් අයෙකුට ඒත්තු ගැන්වීමට යාමේ දී මෙම ශ්‍රාවක දුර්ගුණයන්ගේ ස්වභාවය පිළිබඳව හැදින ගත යුතුය. අනෙක් අතට ඔබට යමක් හරිහැටි අවබෝධ නොවන්නේ ඔබ ඉහත දුර්ගුණ එකකින් හෝ කිහිපයකින් පෙළීම හේතුවෙනි.

මෙවැනි චර්යාත්මක දුර්වලතා ඇතිවීම කෙරෙහි පුද්ගල චරිත ස්වභාවයන් ඉවහල් වේ. ලොව වසන, ලොව ඉපදුන හා මතුවට ඉපදෙන සැම අයෙක්ම රාග, ද්වේෂ, මෝහ, සද්ධා, බුද්ධි, විතර්ක ආදී කුමන හෝ චරිත ලක්‍ෂණයක් ප්‍රකට කරනු ලබයි. රාග, ද්වේෂ, මෝහ ආදී චරිත ස්වභාවයන්ට අනුව පුද්ගල රුචිකත්වය වෙනස් වේ. ශ්‍රාවකයා තොරතුරු තෝරා ගන්නෙත් ඒවා ග්‍රහණය කරගන්නේත් චරිත ලක්‍ෂණවලට අනුවයි. තම රුචිකත්වයේ සීමාවන්ට හසු නොවන තොරතුරු වෙත නතු නොවීමට ඔහු වග බලා ගනී. එක ම තොරතුරු මගින් වුව ද පුද්ගලයන් කිහිප දෙනෙකු තුළ විවිධාකාර අදහස් ජනිත වේ. ඕනෑ ම රූපයක් දැකීම සහ එය ග්‍රහණය කර ගැනීම සමග ගොඩනැගෙන සිතුවිලි ධාරාව චරිත ලක්‍ෂණයන්ට අනුරූප ව වෙනස් වන ආකාරය හඳුනා ගැනීමට පිළිවන.

ශ්‍රාවක චරිත ස්වභාවයන් පිළිබඳව බුද්ධඝෝෂ හිමියන්ගේ විශුද්ධි මාර්ගයෙහි පහත පරිදි සඳහන්ව ඇත. ''රාග චරිතයා සුළු වූ හෝ සිත්කලු රූපයක් දුටු විට මවිත වූවෙකු මෙන් බොහෝ වේලා සිටින්නේ ය. ස්වල්ප ගුණයෙහි ද ඇලෙන්නෙ නැති දෝෂ ගණනට නොගන්නේ ය. යම් තැනෙක වැසැ යන විට වියෝග නොකැමැති වැ අපේක්‍ෂා සහිත වැ ම යන්නේයි. ද්වේෂ චරිතයා ස්වල්ප වූ ද අමනාප රූපයක් දුටු කල ක්ලාන්ත වූවෙකු මෙන් මඳ වේලාවක් ම බලා සිටින්නේ ය. ස්වල්ප දෝෂයෙහි ද ගැටෙන්නේ ය. ඇති ගුණ පවා ගණනට නොගන්නේ ය. වුසූ තැනින් යන කල මිදී යන පිස්සෙන් අපේක්‍ෂා රහිත වැ ම යන්නේ ය. මෝහ චරිතයා යම් කිසි රූපයක් දුටු කළ එහි ගුණ දෝෂ විවේචනය පර ප්‍රත්‍යයෙන් කරන්නේ ය. අන්‍යයෝ නින්දා කෙරෙත් නම් තෙමේත් නින්දා කරන්නේ ය. අන්‍යයෝ ප්‍රශංසා කෙරෙත් නම් තෙමේත් ප්‍රශංසා කරන්නේ ය. හේ වනාහි අඥාන උපේක්‍ෂාවෙන් යුක්ත ය."

ඉහත විග්‍රහය වෙතින් ඇස මත පදනම් ව ගොඩනැගෙන රූපය ග්‍රහණය කර ගැනීමේදීත් විශ්ලේෂණය කර ගැනීමේදීත් චරිත ලක්‍ෂණයන්ට අනුව එය වෙනස් වන ආකාරය පැහැදිලි වේ. ඒ අනුව සන්නිවේදනයේ තොරතුරු සම්පාදන කාර්යය සහ ඒවා ග්‍රහණය කර ගැනීමේ ස්වභාවය සමග චරිත ලක්‍ෂණ බද්ධ ව පවත්නා බව දක්නට ලැබේ. එමෙන්ම පුද්ගලයාගේ විවිධ ඉරියව්, චර්යාවන් සහ ඔහු නියැලෙන කාර්යයේ ස්වරූපය අනුව චරිත ලක්‍ෂණ හඳුනාගත හැකි ය.

රාගචරිතයාගේ ගමන ශෝභමානය. ඔහු ලීලාවෙන් ඇවිදින්නේය. සෙමෙන් සමව පාද තබමින් සමව පා ඔසවන්නේය. ඔහුගේ ගමන වෙතින් රිද්මයක් හා ලාලිත්‍යයක් දක්නට ලැබේ. ද්වේෂචරිතයාට ඇත්තේ තද රළු ගමනකි. ඔහු පාද අගින් බිම හාරන්නාක් මෙන් ඇවිද යයි. ඉක්මනින් පාද බිම තබා ඉක්මනින් ඔසවයි. මෝහචරිතයාගේ ගමන අවුල් වියවුල් සහිත වූවකි. ඔහු ඇවිදින්නේ තැති ගත්තෙකු විලසින්ය. ගමන් කිරීමේ දී ඔහුගේ පාද විලුඹින් ඉක්මනින් එසවෙයි.

රාගචරිතයාගේ සිටීම හා ඉඳීම ප්‍රසාද ජනකය, මිහිරිය. පහදින සුලු ය. ද්වේෂ චරිතයාගේ සිටීම හා ඉඳීම තදය, දැඩිය. මෝහචරිතයාගේ සිටීම හා ඉඳම අවුල් සහගතය.


රාගචරිතයා මදුර වූ භෝජන ප්‍රිය කරයි. රසවිඳිමින් සෙමෙන් ආහාර ගනී. මිහිරි දෙයක් ලැබුණ විට සතුටට පත් වේ. ද්වේෂ චරිතයා රළු ඇඹුල් ආහාර ප්‍රිය කරයි. කට පුරවාගෙන රස බැලීමකින් තොරව ආහාර ගනී. මෝහචරිතයාගේ ආහාර රුචිය නිශ්චිතව හඳුනාගත නොහැකිය. කුමන රසයට ප්‍රිය දැයි කිව නොහැකිය. ඔහු වික්‍ෂිප්තව නොයෙක් දේ කල්පනා කරමින් අහාර භාජනයේ ද බිම ද විසුරුවා ගනිමින් අනුභව කරයි.

මේ අනුව මිනිසුන් හඳුනා ගැනීම, අවබෝධ කරගැනීම යනු අතිශය සංකීර්ණ ක්‍රියාවලියක් බව පෙනී යයි. මේ සඳහා පුළුල් මනෝ විද්‍යාත්මක, ජීව විද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක ප්‍රවේශයක් අවශ්‍ය වේ. මෙය නූතනයේ දක්වෙන ග්‍රාහක අධ්‍යයනයට පමණක් ලඝු නොවූවකි.

**සමන් රාජපක්ෂ**

රාජිත දිසානායකගේ නවතම නාට්‍ය නිර්මාණය "ආදර වස්තුව" (Love Object) 2013 අගෝස්තු මස වේදිකා ගත විය. "සත්පාලිහිණි, හංසයින්ටත් මං ආසයි, සිහින හොරු අරන්, වීරයා මැරිලා සහ බකමූණා විදි බයියි" යන පූර්ව නාට්‍ය අත්දැකීම් සපිරි පළපුරුදු නාට්‍යකරුවෙකු වන රාජිත ස්වකීය නාට්‍ය විෂයෙහි රජත සම්මානලාභියෙකි.

ඔහුගේ සෑම නාට්‍යයක් ම ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණ වන අතර ම එකී සෑම නාට්‍යයක් ම ලාංකේය මධ්‍යම පාන්තික සමාජ දේශපාලනය පසුබිම් කරගත් නිර්මාණ වෙයි. "ආදර වස්තුව" රාජිත දිසානායකගේ එකී නාට්‍ය පරිචයෙහි වැදගත් සංසිද්ධියක් බව අපගේ අදහසයි. නිර්මාණයේ අන්තර්ගතය සහ ස්වකීය නිර්මාණය විෂයෙහි නිර්මාණකරුවාගේ දෘෂ්ටිය ද එකී නිරීක්ෂණයට හේතු වෙයි.




ආදර වස්තුවට තේමා වන්නේ රාජ්‍ය තන්ත්‍රයේ කිසියම් නිශ්චිත තනතුරකට දේශපාලනික පත්වීමක් ලද විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක්. ඔහුට සමීප විශ්වවිද්‍යාල සගයෙක් වන පෞද්ගලික ආයතන හිමිකරුවෙක් සහ ආචාර්යවරයා හමුවීමට පැමිණෙන පුවත්පත් කලාවේදිනියක් අතර ඔහුගේ කාර්යාල පරිශ්‍රයේ දී ඇතිවන සිදුවීම් පෙළකි. එක් පෙළක නිශ්චිත කෙටි කාලයක් තුළ සිදුවන මෙකී සිදුවීම් පෙළට අතරමගදී එම කාර්යාලයට එන විශ්වවිද්‍යාල සිසු නායකයෙක් ද ඇතුළත් වෙයි. එසේම චරිතයක් ලෙස නාට්‍යයේ දර්ශනය නොවන එහෙත් නාට්‍ය තුළ වන ආචාර්යවරයාගේ බිරිඳගේ සහ දියණියගේ චරිතයන් ද නාට්‍යයෙහි ප්‍රකාශනයට පුළුල් ආයාමයක් සපයයි.

නාට්‍යයේ කතා තේමාව වන්නේ රාජ්‍ය තන්ත්‍රයේ කිසියම් නිශ්චිත තනතුරකට ඉහළ දේශපාලන පත්වීමක් ලද ප්‍රස්තුත තරුණ ආචාර්යවරයා ඒ සඳහා උපස්තම්භක වන්නේ සමාජ මතධාරියෙක් ලෙස අතීතයේ ඔහු උපයාගත් සිවිල් තත්ත්වය සහ ශාස්ත්‍රීය වටපිටාවයි. විවාහක තරුණ සැමියෙක් සහ පියෙක් වන ආචාර්යවරයා සිය විශ්වවිද්‍යාල විද්‍යාර්ථිනියක් සමග ද ආදර සබඳතා පවත්වන්නෙකි. ඒ බව තහවුරු වන්නේ එම මොහොතෙහි ඔහු සම්මුඛ සාකච්ඡාවට ලක් කිරීමට පැමිණ සිටින තරුණ මාධ්‍යවේදිනිය ද වසර ගණනාවකට පෙර විශ්වවිද්‍යාල සමයෙහි ඔහු සමග ප්‍රේමයෙන් බැඳී සිටි තරුණියක වීමෙනි.

නාට්‍ය ඇරඹෙන්නේ ඇය ආචාර්යවරයා හමුවට ඔහුගේ රජයේ නිල කාර්යාල කාමරයට පැමිණීමට ආසන්න මොහොතකිනි. ඇය කාර්යාලයට පැමිණීමට ප්‍රථම සහ සමස්ත වේලාව තුළ ම ස්වකීය කාර්යාලය තුළ ආචාර්යවරයාගේ මූලික හැසිරීම වන්නේ රාජ්‍ය තන්ත්‍රය තුළ විවිධ නිලතල දරණ එවැනි අයගේ මනෝභාවය කුළුගන්වයි. කාර්යාල කාමරයේ ඇති

**සියල්ල අවසන ආචාර්යවරයා ස්වකීය ජංගම දුරකථනය ඔස්සේ අසා සිටින්නේ අහිංසක හෝ අනුකම්පා කළ යුතු එවන් වුන්ගේ ජීවන ගීතයයි. රාජිත දිසානායකගේ "ආදර වස්තුව" අපූර්ව නිර්මාණයක් වන්නේ මෙකී වත්මන් මානව ඛේදවාචකය අප ඉදිරියේ ප්‍රදර්ශනය කරන නිසයි.**

ශීතකරණය රාජිත විසින් පහිලා ප්‍රබල සංඥාවක් ලෙස යොදාගනියි. ආචාර්යවරයා ආයතනයක් ඇතිව හෝ නැතිව වරින් වර ශීතකරණය විවෘත කරමින් ජල බෝතලය ගෙන ශීත කළ ජලය පානය කරයි. අමුත්තන්ට ශීතකරණයේ ඇති සිසිල් බීම පිරිනැමීමට උත්සුක වෙයි. ස්වකීය විසල් නිල කාමරය සහ එහි ඇති ශීතකරණය ඔහුට අභිමානයකි. ඔහු එය විඳියි. ඔහුගේ අවිඥානය එය තමා ලද වරප්‍රසාදයක් සේ දකියි.

සැබැවින් ම මෙය වත්මන් එවැනි නිලතල උසුලනෝගත් අය විෂයෙහි කටුක සත්‍යයක් වනවාක් මෙන් ම රාජ්‍ය තන්ත්‍රය පාර්ශවයෙන් පත්කළ එවැනි අය විෂයෙහි යොදා ගන්නා පොදු උපක්‍රමයක් ලෙස ද සැලකිය හැකිය. ඇත්තම කාරණය නම් එම නිලතල උසුලනෝගත් අයවලුන්ට එම නිලය ගාවිතකර එහි සිය තිරීමට පාලන පාර්ශවයෙන් ලැබෙන කිසිදු පැකිලීමක් නැත. එය ආසන්න ඉතිහාසයේ අනු පාලන පන්තිය වෙනුවෙන් පෙනී සිටීම උදෙසා පාලනයෙන් පිරිනැමුණු ප්‍රාථමික වරප්‍රසාදයක් පමණි. නිල නිවසක්, කාර්යාල කාමරයක්, නිල වාහනයක් වැනි සරල වරදානයකින් පාලකයන් ඔවුන් සතපා තිබේ. එය උගුලකි. එය උගුලක් බව වැටහෙන නමුත් ඔවුනට එම උගුල තුළ සිටිනු හැර වෙන විකල්පයක් නැත. එය වරප්‍රසාදයක් ලෙස පිටස්තර ලෝකය දකින බව සිතමින් එයින් සැනසෙනු මිස වෙනත් විකල්පයක් ඔවුන් හමුවේ නැත.

එබැවින් තමා වරප්‍රසාද ලාභියෙක් බව හැඟවීමෙන් සහ තමාටම හඟවා ගැනීමෙන් එදිනෙදා ගෙවා ගැනීම ඔවුන්ගේ ඉරණම වී තිබේ. මෙකී කටුක සත්‍යය 'ආදර වස්තුව' නාටකීය ලෙස ගොඩනංවනු ලබන්නේ ශීතකරණය හා කාර්යාල කාමරය යොදා ගනිමිනි. වර්තමාන ලෝකයෙ එවැනි මානව ඛේදවාචකයට ලක් වූ තවත් පිරිසක් නාට්‍ය තුළ සංකේතවත් කරනුයේ ආචාර්යවරයා හමුවට එන තරුණ මාධ්‍යවේදියා තුළිනි. රාජ්‍ය නොවන සංවිධාන, ස්වාධීන මාධ්‍ය ක්‍රියාකාරීත්ව සංවිධාන, සිවිල් හෝ මානව හිමිකම් සංවිධාන වැනි බොහෝ නිදහස් යයි සිවිල් සමාජය විසින් පිළිගන්නා ආයතන තුළ බහුතරයක් ක්‍රියාධරයන්ට ඉහළ සිවිල් බලයක් ඇතත් බොහෝ විට ඔවුන්ගේ ජීවිත වල එක් පාර්ශවයක් අඳුරුය. ඒ අඳුරු පාර්ශවය වන්නේ ඉහත කී පාලක පක්ෂයට අනුගත වූ ආචාර්යවරයා වැනි සිවිල් සාමාජිකයින් එළිය කරගත් පාර්ශවයයි. පවුල් සංස්ථාව, යාන වාහන, ගේදොර වැනි භෞතික සාධකයන් හි සිට ආචාර්යවරයා වැනි අයට උරුම සාමාජීය ගෞරවය වැනි දේ ඒ ආකාරයෙන් ඔවුන්ට හිමි නොවේ. එබැවින් කිසියම් අවිඥානික වෛරයක් ඔවුන් වෙත පවතී. එය දෘශ්‍යමාන වන්නේ සමාජ සාධාරණත්වය හෝ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම වැනි ප්‍රගතිශීලී වේශයකිනි.

එහෙත් යථාර්ථය කටුක ය. එකී කටුකත්වය විසින් ඔවුන්ගේ සිහින ක්ෂේත්‍රගත කරනුයේ විදෙස් සම්මන්ත්‍රණ හෝ විදේශයක පදිංචියට යාම වැනි තත්ත්වයක් තුළයි. මේ වර්ග දෙකෙහිම පිරිස් අත්විඳින තවත් කටුක යථාර්ථයක් වන්නේ ඉංග්‍රීසි භාෂාවෙහි ප්‍රවීණ නොවීමෙන් හටගන්නා පසුබෑම සහ හීනමානයයි. බොහෝ විට ඒ සඳහා ඔවුන් විසින් තෝරා ගන්නා විකල්පය වූ කලී සිය දූවා දරුවන්ට ඉංග්‍රීසි ඉගැන්වීමට ගන්නා වෙහෙසයි. තරුණ ආචාර්යවරයා නාට්‍ය අවසාන භාගයේදී සිය මාධ්‍ය සගයාගෙන් ඉල්ලා සිටින්නේ යවන්නේ නම් තමන් ඉංග්‍රීසි කතාකරන රටක තානාපති සේවයට යවන ලෙසයි. ඒ දරුවන් වෙනුවෙනි. එය එවැනි ප්‍රබල සංඥාමය ඉංගිතයකි.

නාට්‍යයෙහි මාධ්‍යවේදිනිය ස්වකීය මාධ්‍ය බලය ප්‍රදර්ශනය කරමින් ආචාර්යවරයාගේ බලය ප්‍රශ්න කරන මුත් අවිඥානකව ඇය එම බලයට ආශාකරන බව පසක් වන්නේ සියල්ල නිම වී නික්ම යා හැකි මොහොත පැමිණ ඇති මුත් (වාහනය පැමිණ රියදුරා කතාකරද්දීත්) ස්වෙච්ඡාවෙන් එහි රැඳීමට, එනම් ආචාර්යවරයාට ගොදුරු වීමට සූදානම් වීම තුළිනි. එය ඇය පෙර ආදරයට වහල් වීම ලෙස අවිඥානිකව ඇයව රවටා ගැනීමට හෝ ආචාර්යවරයා රැවටීමට එහා යන බලය ඉදිරියේ වැතිරීමට ඇති ආශාවේ සංකේතාවේශයයි. එවැනි බොහෝ යුවතියන්, ගැහැණුන් කොතෙකුත් අපට සමාජය තුළ මුණගැසේ. එහෙත් එවැනි අය තමන් රැවටීමට හෝ විකිණීමට කිසියම් සාධාරණ ගෙවීමක් අපේක්ෂා කරයි. එය ලැබේ නම් හීලෑවීමත් නොඑසේ නම් යළි සිවිල් අයිතීන් හෝ මානව හිමිකම් වැනි ස්වකීය වෘත්තිමය සේලයට මුවාවී පහරදීමත් ඒ අයගේ පරිචයයි.

එය අවස්ථාවාදයේ සංකීර්ණ ආස්ථානයකි. උදෙසාගිමත් තරුණ ශිෂ්‍ය නායකයා එවැනි සිවිල් සමාජ ක්‍රියාකාරී සමාජයේ පහළම ප්‍රමුඛ සාමාජිකයා නියෝජනය කරයි. ඔහුගේ ඉව ඇල්ලීම ද ස්වකීය ක්‍රියාකාරීත්වය උදෙසා වන ආයෝජනයක් වෙනුවෙනි. එය ඊට ඉහළ සිවිල් ක්‍රියාධරයා (එය නාට්‍යයේ නියෝජනය වන්නේ මාධ්‍යවේදිනියකගෙනි.) සිටින අත්තට පහළ අත්ත පිළිබඳ බලාපොරොත්තුවයි. ඉව ලද ඇසිල්ලේ රහසේම ඔහු තමාගේ ඉහළ සාමාජිකයා (මාධ්‍යවේදිනිය) ගෙන් අසන්නේ තමාට ද බසයට ගොඩවිය හැකි ද යන්නයි. එවැනි අය වර්තමාන සමාජයේ අපිට බොහෝ සේ හමුවෙයි. කොපමණ පාලනයේ අසාධාරණයට එරෙහිව විදි සටනේ ය. ඊට ඉදිරි පෙළ මහවාදී තලයේ මාධ්‍යයේ හෝ කිසියම් සංවිධානයක ය. ඊටත් ඉහළට පැනගත් අය එක්කෝ රටින් පිටුවහලේ පිටරටය. නැතහොත් නාමික කාර්යභාරයක් සහිත මෙරට සුද වරප්‍රසාදලාභී තනතුරකය. මේ අමිහිරි යථාර්ථය පසක් කර නොගත්තවුන් එක්කෝ අතුරුදහන් වී ඇති අතර නැතිනම් මියගිය සදාසමරන්නවුන් අතරය.

එයින් ඔබ්බේ ඇත්තේ වත්මන් පාලකයා සහ ඊළඟ පාලකයා වීමට විභවයක් සහිත වුවන්ගේ මාරාන්තික සහ වසල ක්‍රියාකාරීත්වයයි. පෞද්ගලික මාධ්‍ය හිමි ආචාර්යවරයාගේ මිත්‍රයා සහ ඔහු විෂයෙහි පත්තුවන වෙඩි හඬ නියෝජනය කරන්නේ එකී පාර්ශවයන්ගේ තිරිසන් මහත්මා ගුණයයි. ඒ සියල්ලට පසුබිමේ මේ සියලු තත්ත්වයන් පිළිබඳ කිසිදු වගේ වගක් නැති සාමාන්‍ය පවුල් සංස්ථාව හමුවෙයි. සියල්ල අවසන ආචාර්යවරයා ස්වකීය ජංගම දුරකථනය ඔස්සේ අසා සිටින්නේ අහිංසක හෝ අනුකම්පා කළ යුතු එවන් වුන්ගේ ජීවන ගීතයයි. රාජිත දිසානායකගේ "ආදර වස්තුව" අපූර්ව නිර්මාණයක් වන්නේ මෙකී වත්මන් මානව ඛේදවාචකය අප ඉදිරියේ ප්‍රදර්ශනය කරන නිසයි. එය අපූර්ව නිර්මාණ වෑයමක යැයි මා විශ්වාස කරන්නේ එය අපට අප පෙන්වාලන කැඩපතක් වන නිසයි.

*අර්ජුන ලොකුලියන*

වැස්සේ ධාරිතාව ගණනය කළ නොහැකි අතර පැය පහක දෙකක් හෝ සමහර විට පැය තුනකට ආසන්න කාලයක් මෙම වැස්සක් ඇද හැළෙන බවට නිර්ණය කළ ඇත. වර්ග කිලෝ මීටර් 64,849.92 පමණ වන භූමි ප්‍රදේශය ම මේ හේතුවෙන් සෝදා පාළුවට ලක්වීමේ අවදානමේ පවතියි. මෙම වැස්සට හසුවූවන් රෝගී තත්ත්වයට පත්ව ඇති අතර අසාධ්‍ය තත්ත්වයේ පසුවන රෝගීන් ද මේ වනවිට හඳුනාගෙන ඇත. වැස්සට හසුවූවන්ගේ රෝග ලක්ෂණ මෙසේ ය

**පොත්පත් පිළිබඳ දරුණු අජීරණය**

**නිරන්තර සංත්‍රාසය**

**නොනවතින කෝපය හෝ දැඩි ශෝකය**

**ප්‍රේම විරහ කුලප්පුව නිසා කුසගිනි පවා නොදැනීම**

**සමහර විට නින්ද නොයෑම**

ඉහත සඳහන් රෝග ලක්ෂණ ඔබ තුළත් පවතියි නම් ඉක්මන් ප්‍රතිකාර සඳහා යොමු වන්න


# මල් පාරේ මහ වැස්සක්

## කැකිර් ගමේදී කළ සන්තැසි නිච්චිය කි

**ගණනය කරන ලද ආපදු ලැයිස්තුව මෙසේය**

| ආපදාව | කෙටි කාලීන පිළියම | දිගුකාලීන පිළියම |
|---|---|---|
| 10.30 දර්ශන වාරය ද අවලංගු කිරීමට සිදුවිය. | වැස්සට හෙදී නොයන ලෙස ඊදියෙන් සායම් පිරියම් කර ගමරට යළි එහි කැදවිය යුතු ය. | යළි සෝදා පාළු නොවන්නට ස්ථිර පිළියම් යෙදිය යුතු ය. |
| පත්තර තට්ටුව සෝදාපාළු වී ඇත. | කියවන පත්තර අවශ්‍යව තිබේ. | කියවීම හා විකිණීමෙහි පරස්පරය පැහැදුව මැන. |
| ඉස්කෝල වංගුවට අලුත් කඩයක් | ලෙඩ වූ පොඩි පැටව් සුවපත් කළ යුතු ය. ඉස්කෝල වංගුවේ අලුත් කඩේ වසා දමමු. | පොත් පත්තර ප්‍රතිජීවක ලබා දිය යුතු ය. |
| ගමට කවර විපතක් වුව ද කොලු කුරුට්ටෙක් පේන මානෙක නැත. | කොලු කුරුට්ටන් යළි ගම්මැද්දට කැඳවමු. | තාරුණ්‍යයට ලෙඩක් නොවන්නට වගබලා ගත යුතු ය. |
| | | |
| නොදනිත් දරුවන් ඇකයෙන් වැටුණා. | ගෙයින් ගෙට ඇවිද ගොස් සොදා පාළුව පිළියම් කරමු. | ගංවතුරෙන් ඇතිවන මහ විනාශය පෙන්වාදිය යුතු ය. |
| ගෙයි මුල්ලෙන් හඳපානට යති කෙලි පොඩ්ඩන් | කෙලි පොඩ්ඩන් ඉස්කෝලේට, දහම් පාසලට ගෙන්වමු. | මව්පිය උණුසුම සොරුන්ට නොදිය යුතු ය. |
| පන්සල් බණ මඩු පාළු වී ඇත. | බණ මඩුව, රැස්වීම්පොළ ප්‍රතිශක්තිකරණ කදවුරු කරමු. | පාසල, පන්සල හා ගම්වැසියන් අතර නොබිඳෙන සම්බන්ධතාවන් ජිහිවූවමු. |
| ප්‍රයිවට් බස් ජංගම නාඩගම් මඩුව (බාල මහලු වෙනසක් නොමැතිව ජංගම T.V නැටුම් නරඹති) | හිස රුදාවට කොට්ට මාරු නොකළ යුතු ය. | නැටුම් හැරුණු විට රටතොට නරඹන්නට බොහෝ දෑ ඇත. |

**බී. වී. සමන්තිකා මාධවී**



# මට මාවත් අහිමි කළා මුහුණු පොතේ කුමාරයා

# facebook

සමස්ත විශ්වයම අතැඹුලක් වූ කල්හි අතීතයේ නැගුනු අතරින් ඉදිරියටම ඇදෙන ලෝකයේ සියල්ල පාලනය කරන සර්ව බලධාරියා වන්නේ තාක්ෂණයයි. තාක්ෂණය නමැති විශ්මිත වචනයත් එහි අන්තර්ගතයත් නොවන්නට කිසිවකුටත් විශ්වය අතැඹුලක් කරන්නට නොහැකිවනු ඇත. විශ්වයේ පවතින භෞතික, අභෞතික, ජීවී අජීවී සියලු වස්තූන් අතර තාරුණ්‍යය නැමති රැඩිකල් ජීවී කළලය ද වත්මන් තාක්ෂණය රියැලිටිකරණයේ ඉහළින්ම නගින බාල රැල්ලකට හසුවී ගසාගෙන යන තත්ත්වයට පත්වීම විශ්වයේ ම අභාග්‍යයකි.

නිකැළැල් මානුෂීය සම්බන්ධතා ගොඩනගා ගනිමින් කෙළිදෙලෙන් හා අර්ථාන්විතව ගෙවා දැමූ තාරුණ්‍යය තාක්ෂණයේ බැඳීමත් සමඟ මෙතෙක් කල් තමා පැමිණි දිශානතිය වෙනස්ම කෝණයකට හරවා ගෙන තිබෙන ආකාරය ද දැකගත හැකිය. අතීතයේ ඇළ, දොළ, ගංගාවල පිහිනූ තාරුණ්‍යය අද තම නිදහස හා විවේකය වෙනුවෙන් හිගමන් යදින්නේ තාක්ෂණයේ පිළිල වලිනි.

වත්මන් තරුණ පරපුර ද උන්මාදයෙන් සෙල්ලම් කරන්නේ විදුරු බෝනික්කන් සමග ය. Face book, Youtube, Skype, E journal, Twitter යන සැම තාක්ෂණික සොයා ගැනීමක් තුළම හොඳ නරක අපූරුවට සංකලනය වී ඇත. අවාසනාව වනුයේ උන්මාදයෙන් පෙළෙන විකල් වූ සිත් ඇති තාරුණ්‍යය නිරන්තරයෙන්ම සොයා යන්නේ එහි අඳුරු පැතිකඩ වීමයි. සමාජ සබඳතාවල යහපත වෙනුවෙන් යොදා ගතහැකි මෙම සමාජ ජාල තුළ වල්මත් වූ තරුණ පරපුර කරන කියන දෑ අදහාගත නොහැකි ය. තාක්ෂණික නිමැවුමේ උපරිම ඵලයක් වූ එහි ඛේදාන්තය වන්නේ තාරුණ්‍යයේ භාවිතය අනුව දිනකට සිදුවන වැඩිම සමාජ අපචාර ප්‍රමාණයක් Face book පිටු අතරින් වාර්තා වීමයි. සීමා මායිම් වැට කොටු නැති මෙම සමාජ ජාල තුළ බාල වයස්කරුවන් මෙන් ම තරුණ තරුණියන් ද තම වටිනා ජීවිත විනාශ කරගන්නා ප්‍රමාණය කෙතරම් ද යත් Face book ජාලයේ තිබෙන ව්‍යාජ පිටු ගණනින්ම එය තහවුරු කරගත හැකි ය. සමාජයේ ම යහපතට යොදා ගත හැකි තාක්ෂණික මාධ්‍යයක් සමාජයේ ම අයහපතට යොදා ගැනිම තුළ සිදුවන විනාශය වටහා ගැනිමට නොහැකි වීමෙන් කියැවෙන්නේ මෙම තාක්ෂණයේ අයහපත් දිශානතියෙන් කෙතරම් බලපෑමක් කර තිබේ ද යන්නයි. පවුල් සංස්ථා බිඳ වැටීම, අඹුසැමි ආරවුල් පමණක් නොව අනවශ්‍ය ගැබ් ගැනීම, ගබ්සා කිරීම, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර ආදී වූ සැම ප්‍රශ්නයක් දෙසම සුපරීක්ෂාකාරීව බලන කල්හි පෙනී යන්නේ සැම ගැටලුවකටම මෙම සමාජ ජාල කෙසේ හෝ සම්බන්ධ වී තිබෙන බවයි.

Face book පිටු අතර සිදු කෙරෙන කථා බහ නැඹුරු වන්නේ අධ්‍යාපනයට නොව ලිංගිකත්වය හා බැදුණු මාතෘකා කෙරෙහිය. කුතුහලය හා බැදුණු සංසිද්ධීන් පිළිබඳව නොරතුරු පිපාසාවෙන් පසුවන තාරුණ්‍යය බොහෝ විට මේ උගුල් වල අවාසනාවන්ත ගොදුරු බවට පත් වෙයි. ඒ සියල්ල සිදුවන්නේ තාක්ෂණයේ මහිමයෙනි. මිනිසා තාක්ෂණය යොදා ගන්නා ආකාරය අනුවය. වල්මත් වූ තාරුණ්‍යය මංමුලා වන දිනය වැඩි ඈතක නොවේ. මෙවැනි නොමනා ක්‍රියා වලින් සිදුවන්නේ තාරුණ්‍යය හා අනාගත පරපුර දිනෙන් දින අන්ධකාරය වෙත ගමන් කිරීමයි. මෙය සමස්ත විශ්වයේම විනාශයේ පෙර ලකුණු පහළ කිරීමක් ද වේ. මේ සියල්ල සිදුවන්නේ තාක්ෂණය හරහා බැවින් බහුතරයේ චෝදනාව එල්ල වන්නේ තාක්ෂණය නමැති විප්ලවීය හැරවුම වෙතටයි.

ලොවක් තැනීමට පෙර රටක් තැනිය යුතුය. රටක අනාගත පරපුර විනාශය කරා ගෙන යන මෙවැනි සමාජ ජාලවලට කිසියම් වූ නිතී රාමුවක් හඳුන්වාදීමත් Face book, You tube, Skype, Twitter, E journal වැනි සමාජ ජාල තුළින් සමාජ විරෝධී ක්‍රියා සිදු කරනු ලබන පුද්ගලයන්ට දැඩි දඬුවම් ලබාදීමත් කෙරෙහි වගකිව යුත්තන්ගේ අවධානය ලක් විය යුතු ය.

එසේම නිසි අවබෝධයෙන් මාධ්‍ය පරිහරණයට අප ද යොමුවිය යුතු ය. එවන් රටක අනාගත ලෝකය වෙත පිය නගන මල් කැකුළු තැවුම් ඉරක් යට තැවුම් සඳක් යට නම් පැතුම් විකසිත කරන දිනය වැඩි ඈතක නොවනු ඇත.

අමිල නුවන් මදුෂංක

# Don't waste your plastic

Do you know
every plastic item
you throw out
will pollute
the environment
and loss of
additional income
for you?



**Hotline : 0773909090**



We shall contribute
for this national effort
& keep the scenic beauty
of our environment
while strengthening
the domestic economy

**National Post Consumer Plastic Waste Management Project**

**Ministry of Environment and Renewable Energy**

**Central Environmental Authority**

Parisara Piyasa, 104, Denzil Kobbekaduwa Mawatha,
Battaramulla, Sri Lanka. Tel: 011 2869104 Fax: +94(0) 112867265

මිල රු 50/=

# සන්නිවේදක

## THE COMMUNICATOR

මාධ්‍ය ත්‍රෛමාසිකය
දෙවන කලාපය - 1997 ඔක්තෝබර්

" ඉඳුම් හිටුම්, කෑම්
බීම්, යෑම් ඊම්,
රැකවරණ කිසිවක්
හරිහැටි නැතත්,
ඈත ගම්දොර අහස්
කුසට දෑත් නගන
ඇන්ටෙනා ගෙනෙන
ලෝකය කුමක්ද....? "





"සන්නිවේදකයා" සහරාව වෙත පාඨක ඔබ දක්වන ප්‍රතිචාර වලට අපි සවන් දුනිමු. ජනමාධ්‍ය පිළිබඳ දත හැදුනා ගැනීමට මෙවන් සහරා අවශ්‍ය බවයි බොහෝ අයගේ මතය.

අද පත්තරවල, ගුවන්විදුලියේ සහ රූපවාහිනියේ වහලුන් බවට පත්ව ඇත. වහල් භාවයෙන් මිදීමට නම් ජනමාධ්‍ය කටයුතු ගැනත්, මාධ්‍යවේදීන් ගැනත් හදාළ යුතුය. අපි ක්‍රම ක්‍රමයෙන් මෙරට ජනමාධ්‍ය විචාරයට එළඹෙන්නෙමු. ඇතැම් මුඛ්‍ය ජනමාධ්‍ය සමාජ අහිතකර ප්‍රවාද ගොඩ නගනු දක්නට ලැබේ. පුවත්පත් කලාකරුවන්, මාධ්‍යකරුවන් පරිහානියට යමින් සිටී. ඩී. බී. ධනපාල, බී. ඒ. සිරිවර්ධන, දයාසේන ගුණසිංහ, යන ප්‍රඥාවන්ත හා විශේෂ පුවත්පත් කතුවරුන් අද නැතිතරම්. මීථ්‍යාව, මායාව, ප්‍රෝඩාව ආදිය ඉදිරියේ නෙත් අයා සිටින බවත් රූපවාහිනිය අභියස සිටින විට හැගේ. විශේෂයෙන් වෙළඳ දන්වීම් විත්දත සංස්කෘතිය වර්තමාන සමාජයේ උත්පන්න වෙමින් පවතී. මෙවැනි දේ ගැන ඔබත් කතා කරන්න. අපිද කතා කිරීමට උත්සාහ ගන්නෙමු. සන්නිවේදකයා ඔබට විවෘතයි.

---

**සංස්කාරකවරු**

# THE COMMUNICATOR

**මාධ්‍ය ත්‍රෛමාසිකය**

*1997 ඔක්තෝබර් - දෙවැනි කලාපය*


3 හිතේ තියා ගෙන නොසිට ලියා තැබීම

7 මට ජයවේවා! හූ...... හූ......... හූ.....

10 ගොවිරාළලා හා වඩුරාළලා තනන අප්පුහාමිලා

14 ඕං ඊං කට්ටු කට්ටු

17 අයිස්ලන්තයට සීතල විකුණන්නෝ

18 බර ඉසිලීමට පුරුදු වන්න

20 මාධ්‍ය ඉසිවරයකුගේ සන්නිවේදන දැක්ම



25 තැන ලොවේ අන් රසඳුනා, ආදරය සේ සුවදෙනා

26 මීයා සහ කෝපි කෝප්පය

28 පත්තර ජොබ් එක ලේසි නැහැ

31 මහදැනමුත්තයි ගෝලයෝ රොත්තයි

33 එඞ්+පස්සික සන්නිවේදනය



34 විචාරයට කෝඳුවක් හැදීම

36 සිසි වන වුවන හැඳි මිටේ නුවණ

39 ගැස් බැස් සහ ජැස්







## දායක වත

**ප්‍රධාන සංස්කාරක**
ආචාර්ය ආරියරත්න අතුගල
කථිකාචාර්ය මාතා තිලකරත්න

**සහාය සංස්කරණය**
අරුණ ලොකුලියන
විජයානන්ද රූපසිංහ

**සම්බන්ධීකරණය**
තිසර සරුපති මුණසිංහ

**දැන්වීම් කළමනාකරණය**
ඉන්දික ගමගේ

**පරිගණක පිටු සැකසුම**
සිත් ලුමියර් සිස්ටම්ස් -912993

**මිල - රු. 25**

**ලිපිනය**
සන්නිවේදකයා
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

විශාල දායකත්වය රු. 100
දායකත්වය සඳහා චෙක්පත්/මුදල් ඇණවුම් "සන්නිවේදකයා" නමට යොමු කරන්න

# රූපවාහිනියේ නිර්ව්‍යාජ පරමාර්ථය

ඇස කන පිනවීමය. ඒ ගැන අටුවා ටීකා අවශ්‍ය නොවන නමුත් එ මගින් ජනතාවගේ අධ්‍යාපන, මානව, සදාචාර බුද්ධි වර්ධනය ගැන සැළකිලිමත් වීම මාධ්‍ය හසුරුවන්නන්ගේ වගකීමය යන්න අපට බැහැර කළ නොහැකි ය.

එම වගකීම තෝරා බේරා ගැනීම නිසාම

## ජාතික රූපවාහිනී සංස්ථාව


- වැඩ සටහන් සඳහා ප්‍රේක්ෂක ප්‍රසාදයක් හිමි කර ගනී.

රූපවාහිනී
ரூபவாஹினி
RŪPAVĀHINĪ

- දේශීය වැඩසටහන් ප්‍රමාණාත්මකව වැඩිකරමින් අපගේ දේශීය අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා පෙරමුණ ගෙන සිටී.

දේශීය වැඩසටහන් ප්‍රතිශතයක් ලෙස වසරින්

1983 - 59.0%
1984 - 56.8%
1985 - 58.3%
1986 - 53.2%
1987 - 55.7%
1988 - 61.0%
1989 - 68.7%
1990 - 70.0%
1991 - 69.0%
1992 - 73.2%
1993 - 72.6%
1994 - 72.5%
1995 - 72.9
1996 - 88.8%



SLRC TV - Com - HP

චින් රාජවංශයට අයත් ෂිග් හුයන්ග් රාජ්‍ය පාලනය කාලයේ දී නිදහස් අදහස් ප්‍රකාශ කළ විද්වතුන් හාරසියයක් පණපිටින් වළලා දැමුවේය.

# හිතේ තියාගෙන නොකිට ලියා තැබීම!



ඇටකටු මත ලිවීම: ක්‍රිස්තු පූර්ව 16-11 ඉපැරණි සටහන්.

ක්‍රි.පූ. 221 සිට ක්‍රි.ව. 220 දක්වා දීර්ඝ කාල පරිච්ඡේදය තුළ චීනයේ පැවැති රාජවංශ දෙකක් නම් චින් සහ හන් යන රාජ පරම්පරාවන් ය. මේ වකවානුවේ චීනයේ මහජනයා වෙත ප්‍රවෘත්ති හා තොරතුරු ප්‍රචාරය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් යොදා ගනු ලැබුවේ කඩතොළු සහ පංසල් වැනි නාලිකාවන්ය. එවක තොරතුරු සන්නිවේදනය සඳහා පැවැති නාලිකා දෙකක් නම් පොත් හා දේශනයන්ය.

බුද්ධිමත් සහ උගත් අය පුරාණ චීනයේ දූෂිත පාලකයන්ට බිය වූහ. චින් රාජවංශයට අයත් ෂිහ් හුයන්ග් (Shih Huang-ti) රාජ්‍ය පාලනය කාලයේ දී නිදහස් අදහස් ප්‍රකාශ කළ විද්වතුන් හාරසියයක් පණපිටින් වළලා දමුවේය. මෙයට හේතුව ඔහුගේ දූෂිත පාලන කාලය තුළ අර්බුද ඇති නොවනු පිණිස ඔවුන් නිහඬ කිරීමය.

චින් රාජ වංශයේ ඇදවැටීමත් සමඟම විශාල වශයෙන් වාචික සම්ප්‍රදායට අයත්ව පැවති ජන සන්නිවේදනය පශ්චාත් කාලයේ රාජ්‍ය පදවි ප්‍රාප්තියට පැමිණි රාජ වංශවල අනුග්‍රහය යටතේ දියුණු විය. මේ සඳහා හන් (Hun) තන්ග් (Tang) සුන්ග් (Sung) සහ මින්ග් (Ming) රාජවංශ නම් වශයෙන් සඳහන් කළ හැකිය. මේ රාජ වංශවල රජවරු බුද්ධිමතුන්ට සහ උගතුන්ට ඇහුම්කන් දුන්හ.

## අධිරාජයා වෙත දැනුම්දීම

එවක මේ සන්නිවේදන නාලිකාවන්ගේ ප්‍රධාන කර්තව්‍යය වූයේ වැඩි වැඩියෙන් අධිරාජ්‍යයා වෙත තොරතුරු සැපයීමය. ජනතාව වෙත ප්‍රවෘත්ති ආරංචි වැනි දෑ සැපයීම ගැන ඔවුන් අවධානය යොමු කළේ නැත. රටේ හැම තැනින්ම ප්‍රවෘත්ති සහ අදහස් උදහස් රැස් කරගෙන අධිරාජ්‍යයා වෙත දනුම් දීම නිල කාර්යයක් විය.

බොහෝ කලක සිටම වාචික සම්ප්‍රදායට අතිරේකව ලේඛනය ද පැවතුණි. චීන සහ ඉන්දියානු ශිෂ්ටාචාරයේ මුල්ම යුග වලදී තල්පත්වල, උණ බම්බුවල, දාරුමය සහ ශිලාමය ඵලකවල ලේඛනය පැවති වග පෙනේ. ක්‍රි.පූ. 221 - 206 කාල වකවානුවේ රජ කළ චින් ෂිග් හුයැන්ග් (Chin shih Huang) අධිරාජ්‍යයාගේ හමුදාවේ අණදෙන නිලධාරී ටෙන්ග් ටියැන් ලේඛනයට අවශ්‍ය "චීන බුරුසුව" හෙවත් ලිවීම සඳහා උපයෝගී කර ගන්නා උපකරණය නිපද වූවේය. එය සැබවින්ම ලේඛන කලාව සඳහා අවශ්‍ය වැදගත් මෙවලමකි.

## කඩදාසි සොයාගැනීම

ජන සන්නිවේදනයේ සීඝ්‍ර වර්ධනයට අවශ්‍ය කඩදාසි නිෂ්පාදනය මුලින්ම සොයා ගත්තේ ක්‍රි.ව. 105 වකවානුවේ දීය. හන් රාජවංශය පැවැති වකවානුවේ සායි ලුං (Tsai Lun) නම් චීන ජාතිකයෙක් කඩදාසිය නිෂ්පාදනය කළේය. මුද්‍රණ ශිල්පය ද මුලින්ම සොයා ගනු ලැබුවේ චීන ජාතිකයකු විසිනි. ඒ ක්‍රි.ව. 593 දී ය. එය සිදු වූයේ සුයි රාජ්‍ය වංශය පාලනය කළ වකවානුවේ ය. මුද්‍රණ ශිල්පයේ ප්‍රාථමික හෙවත් දාරුමය සේයාරූ තහඩු ක්‍රමය ඔහු සොයාගත් මුද්‍රණ ශිල්පය විය.

මුද්‍රණ මාධ්‍යයේ ප්‍රාග්තම අවධිය ක්‍රි.පූ. 700 තරම් ඈතට දිව යයි. මෙවක කීර්තිමත් චීන දාර්ශනිකයින් දෙදෙනෙක් විසූහ. කොන්ෆියුසියස් සහ ලා ඔට්ස් නම් දෙදෙනායි. මේ යුගයේ දී මුල්වරට ප්‍රවෘත්ති එක්රැස් කිරීම සහ ප්‍රචාරය පිළිබඳ පළමුවන ප්‍රයත්නය දරණ ලදයි පිළිගැනීමක් ඇත. එය ති - පාඕ (Ti-Pao) නමින් හැඳින් වේ. "ති" යනුවෙන් හැඳින්වෙන්නේ පළාත් පාලන ආණ්ඩුවේ නියෝජිතයාගේ නිල නිවසයි. එය පිහිටියේ

අධිරාජ්‍යයේ ජාතික අගනුවරය. "පාඕ" යනුවෙන් හැඳින්වෙන්නේ වාර්තා කිරීමය. මේ නියෝජිතයින්ගේ ප්‍රධාන කාර්ය භාරය වූයේ ප්‍රාදේශීය ස්වාමිවරුන්ට හා කුමාරවරුන්ට අධිරාජ්‍යයට අයත් රාජසභාවේ සිදුවන දෑ වාර්තා කිරීමය. ති - පාඕ යනුවෙන් හැඳින්වෙන්නේ නිල වාර්තා කිරීම, රාජ සභාවේ ප්‍රවෘත්ති සංග්‍රහය හෝ රජයේ ගැසට් නිවේදන ක්‍රමය විය හැකිය.

බ්‍රිතාන්‍ය විශ්ව කෝෂයට අනුව "ති - පාඕ" යනු ලෝකයේ ප්‍රථම පුවත්පත ය. ප්‍රථම චීන පුවත් පතේ ආරම්භය ජූලියස් සීසර්ගේ "ඇක්ටා ඩියුර්නා" (Acta Diurna) නමින් හැඳින්වෙන නිල ප්‍රකාශනයටත් කලිනි. මේ ප්‍රකාශනය අයත් වන්නේ ක්‍රි.පූ. 600 ට ය.

## ති-පාඕ ලේඛණය

ති - පාඕ සන්නිවේදනය වර්ධනය වූයේ හන් රාජ වංශයේ පාලනය පැවැති යුගයේය. පුවත්පත් පිළිබඳ ව විවිධ මතිමතාන්තර පළව ඇතත් "ති - පාඕ" ලෝකයේ ප්‍රථම පුවත්පත ලෙස සම්මතව ඇත. "ති - පාඕ" අධිකරණයේ හෝ උසාවියේ නිල ප්‍රකාශන යයි. එය සංස්කරණය කරනු ලැබ නැත. අන්තර්ගත දේවල් වක්මන් පුවත්පත් බසින් ලියවී ඇත. එහෙත් එය ලියවී ඇත්තේ සම්භාව්‍ය රචනා ආකෘතිය ඔස්සේය. කෙසේ වෙතත් "ති - පාඕ" පුවත්පතට පාදකව ඇති මූලික අදහස නම් අදාල පාඨකයින් වෙත ප්‍රවෘත්ති එක්රැස් කර ප්‍රචාරය කිරීමය. මේ අනුව අභිප්‍රාය හා අරමුණ අතින් නිසැකයෙන්ම පුවත්පත් රටාවට අනුකූල වේ. තන්ග් රාජ්‍ය පාලනය පැවැති යුගයේ දී ති - පාඕ දාරුමය තහඩු ක්‍රමය ඔස්සේ මුද්‍රණය කරන ලද බව සඳහන් වේ. මෙය ද සන්නිවේදන ඉතිහාසයේ තවත් අනුස්මරණීය සිද්ධියක් වේ.



කැස්බෑවාගේ ලියමන

ති - පාඕ චීන ජන ජීවිතයේ අඛණ්ඩ අංගයක් බවට පත්විය. ක්‍රමයෙන් එහි රටාවේ යම් යම් වෙනස්වීම් මෙන්ම අළුත් අංගද එක් වූ බව පෙනේ. අධිකරණයෙන් හෝ රාජ්‍ය සභාවෙන් පරිබාහිරව විශාල පාඨක පර්ෂදයක් ඇද බැඳ ගැනීම සඳහා ප්‍රවෘත්ති ප්‍රභාගයට විනා වැනි අලුත් අංග එක්විය.

දවසින් දවස පාඨක ප්‍රසාදය හා උනන්දුව වැඩිවත්ම ඔවුන්ගේ රුචිකත්වය සන්තර්පණය කරනු පිණිස සංක්ෂිප්ත මුද්‍රණයක් බිහිවිය. එය හැඳින් වූයේ (Hsia -Pao) සයා පාඕ යනුවෙනි. අපේ පුවත්පත හෙවත් "සයා පාඕ" ජනතාව අතර බෙදා හැරියේය. තිපාඕ පුවත්පතින් බිහි වූ අංකුරය අනෙක් අය විසින් ද අනුගමනය කරන්නට පටන් ගත්තේය. චාඕ - පාඕ (Chao-Pao) හෙවත් මාලිගා පුවත්, බියන් පාඕ (Bien Pao) හෙවත් කඩතුම් පුවත්, යිපාඕ (Vi-Pao) හෙවත් දූතයා මෙසේ විහිදී ගිය අංකුරයෝය.

ජන සන්නිවේදනයේ සංවර්ධනයෙහි තවත් වැදගත් පියවරක් නම් ක්‍රි.ව. 1038 දී පි ෂෙන්ග් විසින් මුද්‍රණයේ අලුත් නිෂ්පාදනයක් හඳුන්වා දීමයි. මෙය සිදු වූයේ සන්ග් රාජ වංශය පැවති කාලයේය. එය නම් එහාට මෙහාට මාරු කළ හැකි වනයේ මැටියෙන් අච්චු අකුරු නිෂ්පාදනය කිරීමයි. ක්‍රි.ව. 1368 - 1644 වකවානුවේ මින්ග් රාජ වංශය පැවති සමයේ මේ අච්චු අකුරු වැඩි දියුණු කරන ලද්දේ වන්ග් චෙන්ග් (Wang Cheng) විසිනි. ඔච්චු වලනය කළ හැකි අච්චු අකුරු ලීයෙන් කළහ. වර්ෂ 1658 දී පුවත්පත් මුද්‍රණය සඳහා මේ නව මුද්‍රණ ශිල්පය යොදා ගන්නා ලදී. ඊයම් අකුරු භාවිතය මුද්‍රණ ශිල්පයට පිවිසියේ 1644 න් පසු මන්චූ රාජ වංශය පැවති සමයේය.

චීනයේ පුවත්පත් කලා ඉතිහාසයේ රාජ සභා ප්‍රකාශනයක් සේ ඇරඹි මේ සන්නිවේදනය පසු කලෙක මහජනයා වෙත තොරතුරු, ආරංචි, ප්‍රවෘත්ති සපයන වාහකයක් සේ පැතිර ගියේය. සැබවින්ම මෙය ජනතාව ලැබූ පුළුල් නිදහසක් සේ සතුටට පත්කරවන සුළු විය. පුවත්පත් පාලනය හෙවත් මර්දනය පිළිබඳ තොරතුරු චීන ඉතිහාසයේ සඳහන් වේ. කොන්ෆියුසියස් විද්වතකු වූ ලින් - චිහ් (Lin chih) විසින් ක්‍රි.ව. 1160 දී චීනු අධිරාජ්‍යයකු වෙත යවන ලද සන්දේශය එවැන්නකි.

දූෂමාන ආරංචි, කට කතා, ඔපාදූප පැතිර යන්නේ රජයේ නිලධාරීන්ගේ වාර්තා ආශ්‍රය කරගෙනය. මෑත කාලයේ දී කිසියම් පුවතක් දැනගත් විට ඒ පිළිබඳ මහජනයා සැක සංකාවෙන් පසුවන අවස්ථා දක්නට ලැබුණි. මෙවැනි අවස්ථා දඩමීමා කරගෙන නිලධාරයෝ ඒවා පිටපත් කරවාගෙන කුඩා පත්‍රිකා සේ විදේශ රටවල විසුරුවා හරිති. මේ ක්‍රමය සියාඕ පාඕ යනුවෙන් හැඳින්වේ. සියාඕ - පාඕ හි පළවන ප්‍රවෘත්තිවල අඩු ලුහුඬුකම් දක්නට ලැබේ. නොඑසේ නම් පදනම් විරහිතව ගොතන ලද ඒවාය. එසේ වුවත් විද්වත්හු මෙසේ කියති. "ඇයි අපි සියාඕ-පාඕ" එසේ දක්කෙ." පිටිසර බද පළාත්වල මහේස්ත්‍රාත්වරු මෙසේ කියති. "ඇයි සියාඕ - පාඕ අපට ලැබිල තියෙන්නෙ." මෙම කරුණු සත්‍ය නම් එහි බරපතල වරදක් ඇත. එයට හේතුව ප්‍රවෘත්තිය හොර රහසේ නික්ම යෑමට ඉඩදීම වරදක් හෙයිනි. එසේම එය බොරුවක් නම් එය සැබවින්ම නොමග යවන සුළුය. එම නිසා දේවයන් වහන්ස...... මම ඔබ වහන්සේ ගෙන් මෙවැන්නක් වීම වළකන ලෙස ඉල්ලා සිටිමි......"

## මුල්ම ප්‍රවෘත්ති වාරණය

මෙ මගින් පැහැදිලි වන කරුණක් නම් චෝලින් චින් සියාඕ - පාඕ මර්දනය කරන ලෙසත්, පුවත්පත්වලට හෝ ප්‍රවෘත්ති

කළමණාකරණයට මුහුවාවම් බඳින ලෙසත් ඉල්ලා සිටිමය. චෙංගේ සෙන්සම් අධිරාජ්‍යා පිළිගත්තේය. එසේම පුවත්පත් නිදහස නතරවිය. ඈත අතීතයේ ද චීනයේ කතා කිරීමේ නිදහස මර්දනය කරන ලද අවස්ථා නැත්තේ නොවේ. එහෙත් පුවත්පත් නිදහස මර්දනය කිරීම හෙවත් - ප්‍රවෘත්තිවාරණය කරන ලද මුල්ම අවස්ථාව මෙය වේ.

'සන්ග්' රාජ වංශය පැවති වකවානුවේ අක්‍රමවත් ලෙස ප්‍රවෘත්ති වාරණය අරඹා ක්‍රියාත්මක කළත් ඉන්පසු රාජ්‍යත්වයට පත් වූ මින්ග් රාජ වංශයේ පාලනය පැවති සමයේ පුවත්වාරණය සඳහාම විශේෂ වූ වෙනම රජයේ දෙපාර්තමේන්තුවක් පත්කරනු ලැබිය.

ක්‍රි.ව. 768 හා 770 අතර කාල වකවානුව තුළ බෞද්ධ පිරිත් සූත්‍ර වැනි කිසියම් දේශන පාඨ ෂෝටෝකු අධිරාජිනිය විසින් මුද්‍රණය කරවන ලදයි සඳහන් වේ. මේ සඳහා සම්හර විට දාරුමය ඵලකයක් හෙවත් තහඩුවක් හෝ ඉතාම සියුම් ලෝහමය තහඩුවක් භාවිතා කරන්නට ඇතැයි සිතිය හැකිය. මෙහිදී පිටපත් දශ ලක්ෂයක් පමණ මුද්‍රණය කරන ලද අතර, ඉන් ශේෂ වූ පිටපත් තවමත් දක්නට ලැබෙන බව ද සඳහන් වේ.



මුදල් නෝට්ටු - ක්‍රි.ව. 1287

වජ්‍ර සූත්‍රය එලෙස පලවූ මුල්ම ග්‍රන්ථය ලෙස ද සැලකේ.

කොරියාව චීන ජාතිකයන්ගෙන් ආභාසය ලබාගෙන චලනය කළ හැකි ලෝහමය අක්ෂර නිෂ්පාදනය කරන ලදයි පිළිගෙන ඇත. චීන ජාතිකයින් මැටි හා දාරුමය අක්ෂර නිර්මාණයෙහි ආරම්භකයින් ලෙස ඉතිහාසගතව ඇතත් ලෝහමය අක්ෂර නිර්මාණය කරන ලද්දේ ක්‍රි.ව. 1234 දී බව සඳහන් වේ. ජර්මන් ජාතික ජොහැන්නස් ගුටෙන්බර්ග් විසින් යුරෝපයට ලෝහමය අක්ෂර හඳුන්වා දෙන ලද්දේ ක්‍රි.ව. 1455 දී ය. එයට අවුරුදු 200 ට පෙර කොරියානුවෝ මුද්‍රණ ශිල්පයෙහි ප්‍රමුඛයෝ වූ බව සඳහන් වේ.

ක්‍රි.ව. 1234 දී කොරියානුවන් විසින් චලනය කළ හැකි ලෝහමය අක්ෂරවලින් ප්‍රථම වතාවට මුද්‍රණය කරන ලදයි සඳහන් වන පුවත අනාවරණය වූයේ වර්ෂ 1973 දී ය. මෙය ද ඉහළ පෙළේ කොරියානු විද්වතුන්ගේ නිගමනයකි. මහු මෙම නිගමනයට එළැඹියේ චි චික්චි පිම්ක්යුන්ග් නම් වූ සම්භාව්‍ය බෞද්ධ ග්‍රන්ථය ක්‍රි.ව. 1337 දී මුද්‍රණය කරවන ලද බව ග්‍රන්ථයේ අවසාන කොටසේ සඳහන්ව තිබීමෙනි. ප්‍රංශයේ ජාතික පුස්තකාලයේ ඇති කොන්ෆියුසියස් ලිපි එකතුවේ ලෝකයේ දනට සොයාගෙන ඇති ඉපැරණිම ලෝහමය අක්ෂරවලින් නිෂ්පාදිත ග්‍රන්ථය මේ බව සඳහන් වේ. පැරණි පොත්වල කර්තෘත්වය හඳුන්වා දෙන අවසාන කොටසේ එන විස්තරය අනුව මෙම ග්‍රන්ථය මුද්‍රණය කරන ලද්දේ වර්ෂ 1337 දී චුන්ග් - චොන්ග් ප්‍රාන්තයේ දී රජතුමාගේ මුද්‍රණ මන්දිරයේ දී බව සඳහන් වේ.

## චලන අකුරු


චලනය කළ හැකි ලෝහමය අක්ෂර පද්ධතිය සොයා ගැනීමත් සමගම කොරියාව මේ ක්‍රමය ඔස්සේ විවිධ විෂය කේන්ද්‍ර අලලා ග්‍රන්ථ රාශියක් පළ කළේය. ඒ අතර වැඩි වශයෙන් සාහිත්‍යය, කොන්ෆියුසියස් වාදය, බුදු දහම, රජය සහ දේශපාලන විද්‍යාව අලලා පළ කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව අති විශාලය.

චීන ජාතිකයින් විසින් නිපාඩී ප්‍රකාශනය එළි දක්වන ලද අතර, කොරියානුවෝ කී බියුල් (Kee byul) ප්‍රකාශයට පත් කළහ. එය සැබවින්ම රජයේ නිලධාරීන් සඳහා වූ ගැසට් පත්‍රයකි. ක්‍රි.ව. 1520 දී කොරියානු රජය චෝ බෝ (Cho Bo) නමින් ප්‍රවෘත්ති ලේඛනයක් (News Letter) මුද්‍රණය කර බෙදා හැරියේය. මෙහි අන්තර්ගත වූයේ රජයේ තීරණ, පත්වීම් හා නිල නිවේදන පිළිබඳ වාර්තා ය. එය සැබවින්ම රජයේ වාර්තාකරුවන් විසින් ලියා ප්‍රකාශයට පත් කරන ලද්දකි. කොරියානු පුවත්පත් කලාවට පූර්වගාමී වූයේ මේ ප්‍රකාශන සම්ප්‍රදායයි.

මන්චු රාජ වංශයට අයත් තී - සාඕ සහ ඒ වෙනුවට පළ කළ පීකිං ගැසට් පත්‍රය යුන්ග් - චෙන්ග් (1723 - 1735) වකවානුවේ රජකළ අධිරාජ්‍යා විසින් තහනම් කරනු ලැබිය. එය චීනයේ මුද්‍රණය පිළිබඳ එක් අවස්ථාවකැයි එක් ඉතිහාසඥයෙක් සඳහන් කරයි. ජනතාවගෙන් ඇත් වූ මන්චු පාලකයෝ චීන පොදු ජන මතයට බිය වූහ. පිටු 12 කින් සමන්විතව දිනපතා පළ කරන ලද පීකිං ගැසට් පත්‍රය චීන කාසි 200 ක් මිළ විය. මන්චු රාජ වංශයේ අවසානය දක්වා වසර 200 ක් තරම් කල් එය පැවතියේ ය. වර්තමාන තත්වය අනුව සලකා බලනවිට ගැසට් පත්‍රය වූකලී පුවත්පතක් නොවේ.

චන්ද්‍රසෝම විතානගේ

# Get Your Internet Connection From Sri Lanka Telecom



Whatever the information you require, now you need not spend long hours searching for business directories, books, catalogs, etc..

Also you can release information and data to the Internet for world wide circulation instantly.

To obtain the Internet service all you need is a computer terminal and a modem unit which has to be fixed onto your existing telephone.

Special packages are on offer to suit every category of users.

DATACOM DIVISON

**Sri Lanka Telecom Ltd.**


LOTUS ROAD, COLOMBO 01.
TEL: 348576, 423043 FAX: 423043
E-Mal info @slt.lk

Telecom Publicity Division

THE COMMUNICATOR








කතා බැරි අයට අත් උදවු

# මට ජයවේවා! හූ.... හූ.... හූ....

**කථිකයෙකු වන්නේ භාෂා ඥානය නිසාම නොවේ. එසේම විප්ලවීය ගතිය නිසා ද නොවේ. ව්‍යක්ත කථිකයා නිර්මාණය වනුයේ හැකියාවන් රැසකිනි.**

වාචික සන්නිවේදනය පැරණිතම හා පොදු සන්නිවේදන ක්‍රමෝපායයි. භාෂණය පුළුල් ලෙස භාවිතා කරන සන්නිවේදන මෙවලමක්. සරු ලෙස වාචික සන්නිවේදනයේ යෙදීමට දක්ෂතා තිබිය යුතුයි. කිසියම් සංදේශයක් පැහැදිලිව කිරීමෙන් තේරුම් ගැනීම පහසු කරයි. ගුරුවරයා, නීතිඥයා, උපදේශක, පරිපාලක, දේශපාලඥයා, ව්‍යාපාරිකයා, දෙමාපිය මිත්‍ර යනාදීන් හැමටම එය පොදුයි.

යමක් සංක්ෂිප්ත ලෙස කීම (Brevity) ඉතා වැදගත්. ඉතා කෙටි වීමත් ඉතා දිගු වීමත් හොඳ නැ. සුපිරි වචන වලින් වැලකී, ඉතා නිවැරදි (Precise Words) සරල සහ ව්‍යවහාරික වචන උපයෝගී කොට ගෙන සංක්ෂිප්ත බව රැකගත යුතුයි. කාලය පිරවීමට නොව, කාලය හා ශ්‍රාවකයා අතර සම්බන්ධතාව තහවුරු වන ලෙස සංක්ෂිප්ත බව උපයෝගී කොට ගත යුතුයි.

පැහැදිලි බව (Clarity) කථනයේ මූලධර්මයක්. ආරම්භයේ පැහැදිලි බව අනතුරුව පැහැදිලි බව හා අවසානයේ පැහැදිලි බව ඉතා වැදගත් ගුණාංග තුනක්.


සරල වචනවලින්, කෙටි වාක්‍ය හා පොදු වචනවලින් පැහැදිලි බව සොයා යා හැකියි.

ෆ්‍රැන්සිස් ජේ. බෙට්ගින් (Francis J. Betgin) කථනය සඳහා ඉදිරිපත් කරන Seven C's of Communication සංකල්පය ඉතා වැදගත්. නොවලහා කියන (Condid) පැහැදිලි (Clear) සම්පූර්ණ (Complete) සංක්ෂිප්ත (Concise) මූර්තිමත් (Concrete) නිවැරදි (Correct) ආචාරසම්පන්න (Courteous) යනාදිය එම සංකල්පනයට ඇතුලත්.

සවන් දෙන්නන් අවධියෙන් තබා ගැනීම හොඳ කතිකයෙකුගෙ ලක්ෂණයකි. එය හරියට පාපන්දු ක්‍රීඩාවේදී වගෙයි. කථන හෝ දේශන කියන්නෙ යමක් කියාගෙන යෑමක් පමණක්ම නොවෙයි. අවධානය (Attention) දිනා ගැනීම භාෂණයේ මුඛ්‍ය සන්නිවේදන අවශ්‍යතාවක්. දේශපාලනඥයින්ගේ පැරණිතම හා ඉතා බලවත්ම ආයුධය සාර ලෙස කතා කිරීමේ හැකියාවයි. ජාතික නායකත්ව, දේශපාලන පක්ෂ හා ජන බලවේග කතා කිරීමේ සන්නිවේදනයට මුල් තැනක් දෙනවා. එය සාම්ප්‍රදායිකව සිදු වූ දෙයක්. ලෙනින්, හිට්ලර්, මුසෝලිනී, චර්චිල්, කැස්ත්‍රෝ, කෙනඩි, මාටින් ලූතර් වැනි දක්ෂ කථිකයින්. ඔවුන් සතු කථික හැකියාව දේශපාලන දර්ශන, විශ්වාස හා ජනබලවේග ගොඩ නැඟීමට පුවල් ලෙස යොදා ගන්නා. කතා කිරීමේ හැකියාව පොදුවේ දකිය හැකි දෙයක් නම් කැපී පෙනෙන්නේ නැත. සෑම දක්ෂ කථිකයෙකු තුළ ඔවුන්ටම ආවේනික විශේෂතා ඇත.

කථිකයෙකු වන්නේ භාෂාඥානය නිසාම නොවේ. එසේම විප්ලවීය ගතියද නොවේ. ව්‍යක්ත කථිකයා නිර්මාණය වනුයේ හැකියාවන් රැසකිනි. වේදිකාවක හෝ දෘශ්‍ය මාධ්‍යයකදී නම් වාචික හා නිර්වාචික තාක්ෂණික ප්‍රයෝග (Verbal - Non Verbal Techniques) අධ්‍යයනය කළ යුතුයි. දේශනාවකට සවන් දෙන්නෙකු සිනා ගැන්වීම, ප්‍රීති ඝෝෂා කිරීම හා අත් පොළසන් දීමට පෙළඹෙන්නේ කථිකයාගේ දක්ෂතාවයට අනුවයි. ඇතැම් විට අත් පොලසන් දීමත් අවිනිශ්චිත (Hesitant) හෝ විටින් විට අත්පොලසන් දීම (Spacmodic clapping) දකිය හැක්කේ ද කථිකත්වයට අනුවයි. දිගුවිය හැකියි. කෙටිවිය හැකියි. හූකීම (booing), සමච්චල් කිරීම, (Jeering) සහ ප්‍රශ්න ඇසීමෙන් වෙහෙසට පත්කිරීම (heckling) ට ශ්‍රාවකයා පෙළඹවීම විශිෂ්ඨ කථිකයෙකුගේ ලක්ෂණයක් නොවේ.

මුග්ධ සංවාද (hogs conversation) දිගු නිශ්ඵල කතා බහ (Long Winded) හා වැල්වටාරම් දෙඩීම (rambling) මුබර් කමේ ලක්ෂණය. එබැවින් මුබරිකම යනු දක්ෂ කථිකත්වය නොවේ. නාට්‍යමය නිදර්ශන දක්වීම (dramatic illustration) ග්‍රාහක



නොසෙල්වී කතාකිරීම

අවධානය දිනා ගැනීමට අතිශය ප්‍රයෝජනවත්. සෑම කථිකයෙක්ම ජනකාය සමඟින් යායුතු බව එක්තරා කියමනකි (go along with the crowd).



චර්චිල්
ජනහද බැඳගත් සරල, සුගම බසින් කතාකළ ජන නායකයා.....



ලූතර්
සිවිල් අයිතිවාසිකම් වෙනුවෙන් පෙනීසිටි කළු මිනිසා....



කෙනඩි

## තර්කපිට තර්ක

**"ලෙනින් සහෝදරයා පැය තුනක් තිස්සේ කතා කළත් වෙහෙසට පත්වී නැත. හඬ උස් පහත් නොකොට කතා කරන හෙතෙම හැම කරුණක්ම විස්තර කරයි. එකපිට එක තර්ක ඉදිරිපත් කරයි. අසන්නෝ හුස්ම නොගෙන ඔහුගේ කටින් පිටවන වචන අසා සිටි. ඔහුගේ කතා විලාශයෙහි අලංකාරෝක්තියක් නැත. ඔහු අත්පා දිග හරිමින් අංග චලනය නොකරයි. එහෙත් ඔහු අසන්නාගේ සිත් වශී කලාක් මෙන් ඇද බැද සිටි. ඔහු කතා කිරීමට පටන්ගත් විට මුළු රඟහලම නිහඬ විය. අසන්නන් වශී කිරීමට මෙන් හෙතෙම ශාලාව දෙස බැලීය. පැය තුනක් තිස්සේ ඔහුගේ කතාව අසා සිටි එක් අයෙකු වත් කැස්සේ හෝ සෙලවුනේ නැත. නෙත් සිත් ඇදගැනීමෙහි සමත් ලෙනින් දකින හැම කෙනෙක්ම ඔහුට වශී වූහ. මා දුටු ශ්‍රේෂ්ඨතම කථිකයා ලෙනින් සහෝදරයාය."**

**මෙක්සිකෝවේ සිට රුසියාවට ගිය සෙන් - කතයාමා. ශ්‍රේෂ්ඨ ලෙනින් ගේ කථිකත්වය ගැන කී දේ.**

වැනි ශ්‍රේෂ්ඨයින්ට කලින් සංවිධානය නොකොට ස්වෙච්ඡාවෙන් කතා කළ හැකිය. එය සුවිශේෂ ඥාන ශක්තියකි, භාෂණ හැකියාවකි. රොනල්ඩ් රේගන් 1982 යන්ත්‍රයක් මෙන් කතා කළ බව අපි දනිමු. එහෙත් ඔහු ඒ සඳහා නූතන විද්‍යුත් තාක්ෂණික ප්‍රයෝග භාවිත කළ බව දන්නේ කී දෙනාද? ප්‍රේක්ෂකාගාරයට නොපෙනෙන උපකරණ ඔහුගේ කතාවලට උපකාරී විය.

යම් රටක ලිවීමේ හා කියවීමේ අලංකාරික පුද්ගලයින් (rhetorical figures) සීමිතය. ඒ සඳහා ද්විභාෂිකත්වය වැනි හැකියාවන් ද බලපායි. ඉතා වැදගත් වන්නේ තිදහස් ප්‍රකාශනයට ඇති හැකියාවයි. යමෙක් යමක් නිදහසේ ප්‍රකාශ කරන්නේ ද යන්න කතාවෙන් ප්‍රදර්ශනය වේ.

පිටපතක් නොමැතිව කතා කරන්නා (Script bound speakers) ජන ආකර්ශනයට බඳුන් වේ. කෙනඩි සහ මාටින් ලූතර්ගේ ප්‍රසිද්ධ දේශන ජන අවධානය දිනාගන්නේ ඉතා කෂණිකව ඔවුන් හඬෙහි විවිධතාව (Variation in volume) වචන ශබ්ද කිරීමේ ලාලිත්‍යය (intonation) සහ රිද්මය (rhythum) ජනතාවගේ අවධානය දිනා ගැනීම පිණිස මැනවින් හැසිරවීය.

දේශපාලන වේදිකාවෙහි දක්ෂ කථිකයෙකු ලෙස රෝහණ විජේවීර කැපී පෙනේ. අනගාරික ධර්මපාල, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, ජන හදවත් දිනාගත් කථිකයින් ලෙස සැලකේ.

රෝහණ විජේවීර රුසියාවේ ශ්‍රේෂ්ඨ ලෙනින් අනුකරණය කළ බව ඇතැම් විචාරකයින්ගේ මතයයි. ඔහු වේගයෙන් කතා කළ අතර තාර්කිකව කරුණු ඉදිරිපත් කිරීමට සමත් විය. එසේම ඔහුගේ කථිකත්වය තරුණ ජනයා වශීකරණ පුරා වූ බව අජ්ත් කැරැල්ල සමයේ විජේවීරට සවන්දුන් අය පවසයි. ඔහු වේගයෙන් කතා කළ අතර විප්ලවීය ගතියද ඔහුගේ කථිකත්වයට පන දීමට හේතුවිය.


බණ්ඩාරනායක බ්‍රිතාන්‍ය අධ්‍යාපනයෙන් ශික්ෂණය ලද කථිකයෙකි. ඔහු ඉතා තීක්ෂණිකව, තාර්කිකව කථා කළ අයෙක්. යමක් මැනවින් පහදා දීමට ඔහු සතු වූ ශක්තිය ඉතා වැදගත්.

එදත් අදත් කථිකත්වය හොඳ සන්නිවේදන සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීමට අවශ්‍යයි. කථිකත්වය කියන්නේ පාසලේ කථික තරඟයකදී මහේ නොනැවතී කතා කරන එක නෙවෙයි. ඒ වගේම කාටහරි මොනව හරි කියන එක හෝ යටිගිරියෙන් කෑගැසීමක් නෙවෙයි. කථිකත්වය ප්‍රගුණ විය යුතු හදාල යුතු දෙයක්. කට තියෙන පලියට කතා කිරීමක් අද දේශපාලන කථිකයන්ගේ ලක්ෂණයක්. ඒක පාක්ෂික මතයක් සුරක්ෂිත කිරීම සඳහා ඔවුන් සටන් වදිනවා. ඔවුන්ට තියෙන්නේ කෝකටත් කට විතරයි.

ග්‍රාහක



**විජේවීර**
**චච්ඡම වෙනුවෙන් දිවි පිදීම, සදාකල් පවත්වමයි.....**



**බණ්ඩාරනායක**
**මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි.....**



**හිට්ලර්**
**හොඳින් හෝ නරකින් මහජනතාව නම්මවා ගැනීම.....**

■ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ: තරුණ මතවාදයට සවන්දෙමු.

# ගොයිරාළලා සහ වඩුරාළලා තනන අප්පුහාමිලා

## ගොවි රාළගේ පුතා කුඹුරටත්, යකඩ තලන්නාගේ පුතා කම්මලටත්, වළං හදන්නාගේ පුතා සක පෝරුවටත්, වඩු රාළගේ පුතා වඩු මඩුවටත් කොටු කළ හැකිය

ඕනෑම රටක් සංවර්ධනය සහ නවීකරණයට භාජනය කිරීමේදී එරට අධ්‍යාපන ක්‍රමය සකස් කළ යුතු සහ ප්‍රසාරණය කළ යුතු වන්නේ එරටේ ජාතික අවශ්‍යතාවන්ට සහ බහුතර පොදු ජනතාවගේ වුවමනාවන්ට ගැලපෙන ආකාරයටය. එහෙත් අපේ රටේ අධ්‍යාපන ක්‍රමය සකස්ව තිබුණේත්, ප්‍රසාරණය වූයේත් රටේ සහ පොදු ජනතාවගේ වුවමනාවන්ට අනුකූලව නොවේ. යටත් විජිත සමයේ බ්‍රිතාන්‍යයන් විසින් අපේ රටේ අධ්‍යාපන ක්‍රමය ඔවුන්ගේ ඕනෑ එපාකම් වලට අනුකූලව සකස් කරන ලදී. යටත් විජිත සමයෙහි උසස් අධ්‍යාපනය මුළුමනින්ම ප්‍රභූ පන්තියට සහ නාගරික ධනපති පන්තියට සීමා වී තිබිණි. පාසල් අධ්‍යාපන ක්‍රමය සකස් කර තිබුණේ යටත් විජිත ක්‍රමයතුළ එහි පරිපාලන යන්ත්‍රණය මෙහෙයවීම සඳහා අවශ්‍ය සීමිත පිරිස් බිහි කිරීමටය. 1948 දී නිදහස ලබන විට අපට උරුම වූයේ ඉංග්‍රීසීන්ගේ සහ ඔවුන්ගේ ගෝලයින් වූ කළු සුද්දන් ගේ ඕනෑ එපාකම්වලට අනුකූලව සකස් කරන ලද මෙබඳු අධ්‍යාපන ක්‍රමයකි. මෙම අධ්‍යාපන රටාවත්, රටේ සහ බහුතර පොදු ජනතාවගේ අවශ්‍යතාවනුත් අතර දැවැන්ත පරතරයක් දක්නට ලැබුණි. මෙරට ප්‍රභූ සහ නාගරික ධනපති පන්තියේ අවශ්‍යතා කිසිවිටෙකත් මෙරට ජාතික අවශ්‍යතා ලෙස සැලකිය නොහැකිය. ඔවුන්ගේ පන්ති හා දේශපාලන අවශ්‍යතාවනුත්, රටේ ජාතික අවශ්‍යතාවනුත් අතර සුවිශාල පරතරයක් දක්නට ලැබේ. එසේම සියයට විස්සක් (20%) පමණ වන මෙම පිරිසගේ අවශ්‍යතා සහ සියයට අසූවක් (80%) වන ග්‍රාමීය බහුතර පොදු ජනතාවගේ අවශ්‍යතා අතර දැවැන්ත පරතරයක් සහ නොගැලපීමක් දක්නට තිබේ. මේ නිසා 1948 න් පසුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ප්‍රසාරණය කළ යුතුව තිබුණේ මෙම අඩුපාඩු මග හරවා රටේ සහ බහුතර පොදු ජනතාවගේ අවශ්‍යතාවන්ට ගැලපෙන ආකාරයටය. එහෙත් සත්‍ය වශයෙන්ම ඉංග්‍රීසීන්ගේ සහ ඔවුන්ගේ ගෝලයින් වූ ප්‍රභූ සහ නාගරික ධනපති පන්තියේ ඕනෑ එපාකම්වලට අනුකූලව සකස් කර තිබූ අධ්‍යාපන ක්‍රමය හැටේ දශකය ආරම්භ වන තෙක්ම දැඩි වෙනසකට භාජනය නොකෙරිණි. 1950 වන විට විශ්ව විද්‍යාල සිසුන්ගෙන් 81% ක් ම ප්‍රභූ සහ නාගරික ධනපති පන්තියේ පවුල් වලට අයත් වූහ. 60 දශකය දක්වාම මෙම විෂම තත්ත්වයෙහි මූලික වෙනසක් සිදු නොවිණි. එකල විශ්ව විද්‍යාලවල පමණක් නොව ද්විතීයික පංතිවල පවා භාෂා මාධ්‍යය ඉංග්‍රීසි වූ අතර ඉංග්‍රීසි අධ්‍යාපනය බොහෝ දුරට නගරවල ප්‍රභූ පන්තියේ ද දරුවන්ට පමණක් වෙන්වූ පාසැල්වලට සීමා වී තිබුණේය.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රභූ පන්තියට සහ නාගරික ධනපති පන්තියට හිමිව තිබූ මෙම සුවිශේෂී වරප්‍රසාද අහෝසි කර උසස් අධ්‍යාපනයේ දොරටු මෙරට සාමාන්‍ය ජනතාවගේ ද දරුවන්ට විවෘත කර දීමට උත්සාහ කළේ 1956 බලයට පත්වූ මහජන එක්සත් පෙරමුණ රජයයි. මහජන එක්සත් පෙරමුණට මෙම කාර්යය කිරීම සඳහා දැවැන්ත අරගලයක් කිරීමට සිදුවූ අතර එහිදී මෙරට අධ්‍යාපනය සිය මුදලයක් කරගත් ප්‍රභූ හා ධනපති පන්තියේ ප්‍රතිගාමීත්වය සමග හැපීමට සිදු විය. නිදහස ලබා වසර 8 ක් ගෙවී ගොස් තිබුණත් රාජ්‍ය භාෂාව බවට පත්ව තිබුණේ සුද්දන්ගේ භාෂාව වූ ඉංග්‍රීසියයි. 1956 න් පසුව මෙම තත්ත්වය කණපිට පෙරළී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව විය. ලංකා අධ්‍යාපන ඉතිහාසයේ ප්‍රථම වරට දහවන පන්තියේදී රජයෙන් පවත්වන ප්‍රසිද්ධ විභාගයට සිය මව් බසින් පෙනී සිටීමට අවස්ථාව ලැබුණි. ඒ 1957 දීය. ඊත් අනතුරුව ක්‍රමයෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයත්, විශ්ව විද්‍යාල අධ්‍යාපනයත් ස්වභාෂාවෙන් පැවැත්වීමට කටයුතු කෙරුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රභූ පන්තියට තිබූ විශේෂ වරප්‍රසාද කිසියම් ප්‍රමාණයකට අහෝසි වී ග්‍රාමීය සාමාන්‍ය ජනතාවගේ ද දරුවන්ට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අවතීර්ණ වීමට අවස්ථාව ලැබිණි. 1950 දී විශ්ව විද්‍යාල



සිසුන්ගෙන් 81% ක් ඉහළ පන්තියේ පවුල්වල දූ දරුවන් වූහ. 1967 වන විට මවුන්ගේ ප්‍රමාණය 34% දක්වා පහත වැටී සාමාන්‍ය ජනතාවගේ දූ දරුවන්ගේ ප්‍රමාණය 66% දක්වා ඉහළ ගියේය.

එහෙත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ හා වෘත්තීය පන්තියට සීමිත සිදු විශේෂ වරප්‍රසාද නැවත දැනගෙන අධ්‍යාපන ක්‍රමය වන පොදුවේ ප්‍රතිපත්ති අහෝසි කළ නොහැකි විය. මන්ද සාමාන්‍ය ජනතාවගේ දූ දරුවන් ප්‍රමාණය කළ හැකි වූයේ විශ්ව විද්‍යාලයේ කලා විෂය ක්ෂේත්‍රය පමණි. විශ්ව විද්‍යාලවල ඉංග්‍රීසි මාධ්‍යයෙන් ක්‍රියා කළ වෛද්‍ය, විද්‍යා, නීති, ඉංජිනේරු යන අංශ තව දුරටත් වරප්‍රසාද ලාභී ඉහළ හා වෘත්තීය පවුල්වලින් එන දූ දරුවන් සඳහා වෙන්ව තිබුණේය. 1967 වර්ෂයේ දී විශ්ව විද්‍යාලවල කලා අංශවල සිසුන්ගෙන් 53% ක් සාමාන්‍ය පවුල්වල දූ දරුවන් වූහ. එහෙත් වෛද්‍ය අංශයට එම පවුල්වලින් ඇතුළු වූ සිසුන් 5.1% කි. ඉංජිනේරු අංශය සඳහා එය 11.3% ක් විය. නිදහස ලැබ දශක දෙකක් ගතව තිබුණත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පැවැති මෙම විෂමතාවය පවතින බව පිළිගත යුතු වෙයි.



මේ අතර 1956 න් පසුව මහජන එක්සත් පෙරමුණ රජය ක්‍රියාත්මක කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් තවත් පමණ ලැබුණු තීරණාත්මක වෙනසක් සිදුවිණි. එහෙත් පසුගිය පසුව ඇති කරන ලද ප්‍රතිසංස්කරණ නිසා මෙතෙක් සාමාන්‍ය ජනතාවගේ දූ දරුවන් විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා ඇතුළු වීම සිදු වෙත ඉහළ ගියද විශ්ව විද්‍යාල වලින් කලා උපාධිය ලබාගෙන උපාධි ධාරීන්ට රැකියා ලැබීමේ හැකියාව නැවත දැනගෙන අවසන් වන විට හරහට ලෙස සීමා වෙමින් තිබුණේය. 1969 දී රැකියා විරහිත උපාධිධාරීන් 6300 ක් පමණ කරන ලද සමීක්ෂණයකට අනුව සිසුන්ගෙන් 36% ක් එක් අවුරුද්දක් ද, 23% ක් දෙඅවුරුද්දක් ද, 15% ක් තුන් අවුරුද්දක් ද රැකියා නොමැතිකමෙන් සිටි බව හෙළි විය. 1969 - 1970 වන විට ශ්‍රී ලංකාව පුරාම රැකියා විරහිතයින් 5,50,000 දක්වා ඉහළ ගොස් තිබිණි. මෙවැනි තත්ත්වයක් ඇති වීමට වෙනස්කම් හේතු විය. ඉංග්‍රීසින් යටතේ විශේෂ පමණක් සිසුන්ගේ සිත් රජ කම්කරුවට අනුව සත්‍යය කලේ ඉහළක් අතේ අධ්‍යාපන ක්‍රමය පමණක් නොවේ. අපේ සාම්ප්‍රදායික ජීවන රටාව ද ඔවුන් විසින් සත්‍යය කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකාව නිදහස ලබන විට දරුණු වූයේ ඉංග්‍රීසින්ගේ පන සිසුන්ගේ වියවුරක් වූ රෝගීය වෙන්නේව පන්තියේ සිත් රජ කම්කරුවට අනුව සකස් කරන ලද ප්‍රකාරනය කරන ලද අර්ථක්‍රමයකි. වැවිලිකම් ක්‍රමය මත පදනම් වූ ජීවනෝපාය අර්ථක්‍රමය සිදු වැඩි දියුණු අර්ථක්‍රමයක ලක්ෂණ ඊ වන විටත් දක්නට ලැබිණි. එහෙත්, ආර්ථිකයෙන් ක්‍රමයෙන් වෙනස්වීම පරිවර්තන මාර්ගයට යොමු වෙමින් තිබිණ. මෙම ආර්ථික රාමුව විසින් ගෙන ආවේය. ඒ නිසා ආර්ථික ප්‍රතිලාභවලින් වැඩි කොටසක් රෝගීය වෙන්නේව පන්තියට ගිහි වූ අතර ග්‍රාමීය බහුතර ජනතාවට ආර්ථිකයේ ප්‍රතිලාභ අත් නොවූ තරම් ය. 1956 න් පසුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ ඇති කළ නමුත් එය පාලනය කළ මෙකී හැරුණු හැරුණුයක් කලා උපාධියක් ලැබූ සිසුන්ට මෙම ප්‍රතිඵල ආර්ථිකයට ලබාගැනීමක් අනුව විය නොහැකි විය. සිසුනු පැරණි ලෝකයටත්, නව ලෝකයටත් අයත් නැති පිටස්තරයින් පිරිසක් බවට පත්විය.

මෙම තත්ත්වය නිසාත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පැවැති විෂමතාවයන් නිසාත් රැකියා විරහිත උපාධි ධාරීන් අතර පමණක් නොව උපාධි අපේක්ෂකයන් අතර ද අපේක්ෂා භංග හැඟීම වර්ධනය වෙමින් පැවතිණි. මේ නිසා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ගයක් ඉක්මවා ගිය ක්‍රමයක් ඇති කරන පරිවර්තනයක් වෙනුවෙන් පෙනී සිටි සම්ප්‍රදායික වාමාංශික දේශපාලන පක්ෂවලට එහෙත් විශ්ව විද්‍යාල සිසු ව්‍යාපාරය අතර වූ පිළිගැනීම දුර්වල වෙමින් තිබිණි. මේ අතර විප්ලවීය අධ්‍යාපනය වෙනුවෙන් පෙනී සිටි ජනතා විමුක්ති පෙරමුණ වැනි සිසු ව්‍යාපාරයේ අවධානය යොමු විය. විප්ලවීය ක්‍රියාමාර්ගයක් තුළින් වඩා අධ්‍යාපන ක්‍රමය මෙන්ම සමාජ ක්‍රමය ද කඩිනම් වෙනස් කළ හැකි බව සිසුන්ගේ හැඟීම විය. ඒ නිසා උපාධිය පරිපූර්ණ කර ගැනීම සඳහා කරන අධ්‍යාපන කටයුතු අතහැර දමා තරුණ විප්ලවයේ අවශ්‍යතාව වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රබල සාමාජිකයන් වශයෙන් මේ රටවල වැඩි



අනාගත විරුවන්ගේ පිළිරු

කිරීමට විශ්ව විද්‍යාල සිසුයෝ සිටින. මේ ආකාරයට විශ්ව විද්‍යාලවල කලා උපාධි අපේක්ෂකයෝ 71 අප්‍රේල් කැරැල්ලේ ප්‍රහාරකාමී බලඇණිය බවට පත් වූහ. ඔවුන් විසින් ගැමි තරුණ බලඇණිය අවදි කොට රාජ්‍ය බලය අල්ලා ගැනීම සඳහා දරන ලද ප්‍රයත්නය අසාර්ථක වීමෙන් පසුව කැරැල්ලට පෙර කැරලිකරුවන්ගේ ප්‍රධාන බලකොටු දෙකක් වශයෙන් පැවැති විද්‍යාලංකාර හා විද්‍යෝදය යන විශ්ව විද්‍යාල දෙක කැරලිකරුවන් සිරකොට තබන ප්‍රධාන සිර කඳවුරු දෙකක් බවට පත් විය. 1971 අප්‍රේල් කැරැල්ලට සහභාගී වූ තරුණ තරුණියන් අතර විශ්ව විද්‍යාල සිසුයෝ අති විශාල සංඛ්‍යාවක් සිටියහ. කැරැල්ලේ ප්‍රධාන නායකත්වය නියෝජනය කළේ ද ඔවුන් ය. සිංහල ප්‍රජාවලට විද්‍යාවක් ලබා ගැනීම සඳහා විද්‍යාලයක අවකාශය තෝරාගනිමින් එම පසුබිම යටතේ ගම්බද තරුණ තරුණියන් අතරට ගොස් සිටියේ ද ඔවුහු ය. 71 කැරැල්ලේ ප්‍රධාන නායකයින් අතර සිටි රෝහණ විජේවීර, ලයනල් බෝපගේ, ඩබ්ලිව්. උපතිස්ස, සෝමසිරි කුමාරනායක, නානායක්කාර විජේසූරියල, සරත් විජේසිංහ, ජේ පතිරණ-ල යනාදීන් විශ්ව විද්‍යාල තරුණයන් වූ අතර විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් ලැබීමට ආසන්න තත්ත්වයක සිටි තවත් විශාල පිරිසක් ද ඔවුන් අතර වූහ.

71 කැරැල්ල නිදහසින් පසුව දිගින් දිගටම පවත්වාගෙන ආ අධ්‍යාපන ක්‍රමය සම්බන්ධ ගොඩ යටත් විජිත සමාජ ආර්ථික රාමුවද දැඩි ප්‍රශ්න කිරීමට භාජනය කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් එතෙක් අවිචාරයෙන් පවත්වාගෙන ආ අධ්‍යාපන ක්‍රමයෙහි මෙන්ම සමාජ ආර්ථික ව්‍යුහයෙහි ද ප්‍රතිසංස්කරණ රැසක් ඇති කරන ලදී. ඇතිකරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ හේතු කොටගෙන එතෙක් ප්‍රභූ හා දේශීය ධනේශ්වර පන්තියට ආර්ථික ක්ෂේත්‍රයේ තිබූ සීමා විශේෂ වරප්‍රසාද හා ප්‍රතිලාභ අහිමි වූ අතර එම වරප්‍රසාද හා ප්‍රතිලාභ ග්‍රාමීය පොදු ජනතාව අතර ද බෙදී ගියේය. මෙමගින් ග්‍රාමීය බහුතර ජනතාවගේ ආදායම ඉහළ ගිය අතර රටේ ආදායම් බෙදීයාමේ විෂමතාව ක්‍රමයෙන් තුනී විය. මේ ආකාරයටම 1972 දී අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ රාශියක් ඇති කරන ලදී. ඒ අනුව ගාල්ල, මාතර, හම්බන්තොට, මොනරාගල, පොළොන්නරුව, අනුරාධපුරය යනාදී දුෂ්කර දිස්ත්‍රික්කවල, ඈත එබඳු ගම් නියම්ගම්වල සාමාන්‍ය ජනතාවගේ දූ දරුවන්ට විශ්ව විද්‍යාලවල වෛද්‍ය, විද්‍යා, ඉන්ජිනේරු හා නීතිය යනාදී විෂය ක්ෂේත්‍ර හැදෑරීමට දොරටුව විවර කර දීමට දිස්ත්‍රික් කෝටා ක්‍රමය ඇති කරන ලදී. දිස්ත්‍රික් කෝටා ක්‍රමය හඳුන්වාදීමත් සමග එතෙක් විශ්ව විද්‍යාලවල වෛද්‍ය, නීති, ඉන්ජිනේරු සහ විද්‍යා විෂය කමිටුවට ප්‍රභූ හා ධනපති පන්තියට තිබූ ඒකාධිකාරිය අහිමි විය. එම විෂය ක්ෂේත්‍ර ක්‍රමයෙන් සාමාන්‍ය ජනතාවගේ දරුවන් ආක්‍රමණය කළහ. මේ අතර 1972 ට පසුව ගම්බද පාසල්වල විද්‍යා අධ්‍යාපනය ලබා ගැනීමට සීමිත අවකාශ ද පුළුල් කළේය. 1960 වනවිට උසස් පෙළ විද්‍යා පන්ති සහිත පාසල් සියල්ලෙන් 123 ක් පමණි. ඉන් 50% කම සියල්ලම යාපනය හා කොළඹ යන දිස්ත්‍රික්ක දෙකේය. දුෂ්කර දිස්ත්‍රික්ක 4 කම එවැනි පන්ති සහිත එකද පාසලක් වත් නොවීය. සමගි පෙරමුණු රජයේ (1970 - 1977) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හේතු කොටගෙන 1972 වනවිට උසස් පෙළ විද්‍යා අධ්‍යාපනය සඳහා පන්ති සහිත පාසල් සංඛ්‍යාව 209 දක්වාත් 1977 වනවිට එම සංඛ්‍යාව 400 දක්වාත් ඉහළ ගියේය. මේ තත්ත්වය තුළ විද්‍යා විෂයන් හදාරන උසස් පෙළ සිසු සංඛ්‍යාවේ වේගවත් වර්ධනයක් ඇති වූ අතර 1972 සිට දේශීයවල විද්‍යා අධ්‍යාපනයක් ලබන සිසු සංඛ්‍යාව 70% කින් ඉහළ ගියේය. 1972 න් පසුව විශ්ව විද්‍යාලවල වාර්ගික අනුපාත සකස් කරන ලද අතර එය ගම්බද ප්‍රදේශවලින් විශ්ව විද්‍යාලයට ඇතුළත් වන තරුණ තරුණියන්ට ද සියයටත් ලබා ගැනීමට විශාල රුකුලක් විය. 1972 න් පසුව ඇති කරන ලද අධ්‍යාපන හා ආර්ථික ප්‍රතිසංස්කරණ නිසා එතෙක් කල් ශ්‍රී ලංකාවේ මේ අංශ තුළ ප්‍රභූ හා ධනේශ්වර පන්තියට තිබූ සීමා විශේෂ වරප්‍රසාද අහිමි වූ අතර ඒවා ග්‍රාමීය සාමාන්‍ය ජනතාව අතර ද බෙදී ගියේය. මෙබඳු සමාජ පරිවර්තනයක් සිදු කෙරුණේ 71 කැරැල්ලෙන් මිය ගිය තරුණ තරුණියන්ට පින්සිදු වන්නට බව ද අමතක නොකළ යුතුය. මෙවැනි සමාජ පරිවර්තනයක් සඳහා මඟ කළ පිටියේ 71 කැරැල්ලයි.

මේ ආකාරයට රටේ සාමාන්‍ය පොදු ජනතාවගේ දූදරුවන්ට අනුකූලව සකස් කිරීම සමාජ ආර්ථික රටාව මෙන්ම අධ්‍යාපන ක්‍රමය නැවත ප්‍රභූ සහ ධනපති පන්තියේ හිතැති කම්වලට අනුව කප්පාදු කිරීමේ විශේෂ අවධානයක් 1977 බලයට පත්වූ එක්සත් ජාතික පක්ෂයට තිබුණි. එ.ජා.ප. ප්‍රමුඛ දේශපාලන දූෂිතභාවය පුරාම කටයුතු කර ඇත්තේ ද මෙම පවුල් අරමුණුවලින් බව මෙහිදී සිහිපත් කළ යුතුය. 1977 ඇති කළ විවෘත ආර්ථික ක්‍රමය එ.ජා.පක්ෂයේ නිලධාරීන් දරුවා වන දේශීය ධනේශ්වර පන්තිය වර්ධනය ගන්නමින් කළ අතර ග්‍රාමීය සාමාන්‍ය ජනතාව මෙම ප්‍රතිචිව අර්බුදයකට එළිපත්තට විසි විය. අනික් පැත්තෙන් නැවත වරක් තම පන්තියේ දූ දරුවන්ට ඔවුනු [illegible] සඳහා එ.ජා.ප. රජය අධ්‍යාපනය කප්පාදු කිරීම [illegible] ආරම්භ කළේය. ප්‍රථමයෙන් ලංකා [illegible] 1980/80 කැරැල්ලේ [illegible] විය. [illegible] 1981 දී [illegible]

[illegible]

1981 [illegible] 13 [illegible]

ඊ දෙනෙකුම ධවල පත්‍රිකාව එරෙහිව ශිෂ්‍ය ව්‍යාපාරය හරහා දේශපාලනයට පය නැඟූ අය වෙති.

ශිෂ්‍ය විරෝධතා හමුවේ ජේ. ආර්. ජයවර්ධන මහතා ධවල පත්‍රිකාව හකුලා ගත්තේ නැත. රාජ්‍ය මුර බලයත්, ජාතික කුරු බුද්ධියත් යොදවා විරෝධතා වල උණුසුම සිසිල් කර ධවල පත්‍රිකාවට යෝජනා ඔහුත් එය ක්‍රියාවට නැගුවේය. එමෙන් ද නොනැවතී තම පරම්පරාවේ සහ පන්තියේ දූ දරුවන් වෛද්‍ය වරුන් කිරීම සඳහා පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇති කිරීමට පියවර ගත්තේය. ශිෂ්‍යයෝ ධවල පත්‍රිකාවට එරෙහිව මෙන්ම පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇති කිරීමට එරෙහිවද අරගල කළහ. එහෙත් ජයවර්ධන මහතාගේ රජය පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇති කළේය. රාජ්‍ය ත්‍රස්තවාදය විසින් 1988/89 කැරැල්ලේ දී කොළඹ වෛද්‍ය විද්‍යාලයේ ශ්‍රීනා විතාරණගේ මොළයට පරාල ඇණ ගසමින් මරා දමන ලදී. ශ්‍රීනා විතාරණ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවලට එරෙහි විරෝධතා ව්‍යාපාරයෙහි පෙරමුණෙහිම සිටි අතර ඔහු දේශපාලනයට පිවිසියේ ඒ හරහාය. ශ්‍රීනා විතාරණ පමණක් නොව බොහෝ වෛද්‍ය ශිෂ්‍යයෝ ජ.වි. පෙරමුණේ මූලික සාමාජිකයන් වූයේ මෙම ශිෂ්‍ය උද්ඝෝෂණ ව්‍යාපාරය හරහාය. 1971 කැරැල්ලේදී විප්ලවයේ කුණාටුවට හසුවී විනාශ වී ගියේ කලා පීඨ පමණි. වෛද්‍ය, විද්‍යා, ඉංජි පීඨ පුතු හා ධනපති පන්තියේ පරවේණි උරුමයක් ලෙස පැවැති නිසා එම පීඨ විප්ලවයේ කුණාටුවට හසු නොවිණි. කලා පීඨවල සහෝදර ශිෂ්‍යයෝ කැරැලි ගසන විට බොහුන් ප්‍රතිගාමීන් ලෙස ක්‍රියා කළහ. එහෙත් 1988/89 කැරැල්ලේදී විප්ලවයේ කුණාටුවට කලාපීඨ, මෙන්ම විද්‍යා හා වෛද්‍ය පීඨ ද හසුවිය. විනාශ විය. එ.ජා.ප. ජාතික පරම්පරාවේ හා පන්තියේ දූ දරුවන් දොස්තරලා කිරීමට ඇති කළ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල නිසා විශ්ව විද්‍යාලවල වෛද්‍ය හා විද්‍යාපීඨ තුවක්කු දේශපාලනයට නැඹුරු විය. ඉන් විනාශ විය. 1971 කැරැල්ලේ දී මෙන්ම 1988/89 කැරැල්ලේදී ද මෙරට විශ්ව විද්‍යාල කැරැලිකරුවන් රඳවා තබන කඳවුරු බවට පත් කෙරිණි. නැතිනම් වදකාගාර බවට පත් කෙරිණි.

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක්ව පැවැති අවදියේ 1818 සහ 1848 දී මෙරට තරුණයෝ ඉංග්‍රීසි ආණ්ඩුවට එරෙහිව කැරලි ගැසූහ. මෙම කැරලි දෙකම ඉංග්‍රීසීහු මර්ධනය කළහ. එහෙත් එම එකම අවස්ථාවකදීවත් 1988/89 කැරැල්ලේ දී මෙන් සමාජ ව්‍යසනයක් සිදු නොවිණි. ශ්‍රී ලංකා ඉතිහාසයේ දරුණුතම සමාජ ව්‍යසනය හා ඛේදවාචකය 1988/89 කැරැල්ලයි. මේ එහෙත් ලාංකීය සමාජයම කම්පනයට පත් කළ මෙම කැරැල්ලට හේතු ව හේතු සොයා බැලීමට කොමිසමක් පත් කෙරිණි. වර්තමාන ආණ්ඩුවේ කැබිනට් ඇමැතිවරයෙකු වන මහාචාර්ය ජී.එල් පීරිස් මහතා ද එම කොමිසමේ සාමාජිකයකු විය. මෙම කොමිසම 1988/89 කැරැල්ලට මුල් වූ හේතු සාධක සොයා බැලූහ. නිදහස් අධ්‍යාපනය කප්පාදු කිරීම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින විෂමතාව හා විරැකියාව තරුණ අසහනයටත් කැරැල්ලටත් ප්‍රධාන වශයෙන් හේතු වී ඇති බව මෙම කොමිසම පෙන්වා දුන්නේය. ඒ නිසා තුන්වන කැරැල්ලක් ඇතිවීම වැළැක්වීම සඳහා නිදහස් අධ්‍යාපන කප්පාදුව නවතා අධ්‍යාපන ක්ෂේත්‍රයේ විෂමතා අවම කිරීමට හා අධ්‍යාපන ක්ෂේත්‍රය නවීකරණය කිරීමට පවතින අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කළ යුතු බව කොමිසම නිර්දේශ කළේය. ඒ අතර උපාධිධාරීන්ට රැකියා සපයන විධිමත් වැඩ පිළිවෙලක අවශ්‍යතාව කෙරෙහිද මෙම කොමිසම අවධානය යොමු කර තිබිණි.



ප්‍රතිසංස්කරණ අගතාය

පොදුජන එක්සත් පෙරමුණු රජයේ යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරළියට එන්නේ මෙහි ප්‍රතිඵලයක් වශයෙනි. ඒ අනුව යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වල ප්‍රධාන අරමුණ විය යුත්තේ තුන්වන කැරැල්ලක් ඇතිවීම වැළැක්වීමයි. එහෙත් යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලිය දෙස බලන විට පෙනී යන්නේ එය තුන්වෙනි කැරැල්ලට අත වනන බවයි. ඉතිං-බඳින බවයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති විෂමතා අවම කරනු වෙනුවට ඒවා තවදුරටත් පුළුල් කරයි. එසේද නොව නිදහස් අධ්‍යාපනය ද කප්පාදු කරයි. නැවත වරයක් පුතු හා නාගරික ධනපති පන්තියට සවුතු පැළැඳවීමට අවශ්‍ය පසුබිම සකස් කරයි. යෝජනාවලියට එරෙහි ශිෂ්‍ය විරෝධතා මර්ධනය කිරීමට පසුගිය රජය මෙන්ම මෙම රජයද නොපැකිළෙයි. එමගින් තරුණ පරපුර නැවත වතාවක් තුවක්කු දේශපාලනය කරා යොමු කරයි. පවතින අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කළ යුතු බවට කිසිදු තර්කයක් නැත. එහෙත් එය කළ යුත්තේ තවත් සමාජ ව්‍යසනයකට මඟ නොපාදෙන අයුරිනි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලිය සකස් කිරීමේ දී ශිෂ්‍යයන් හෝ, දෙමාපියන්ගෙන්, පාසල් ගුරුවරුන්ගෙන් සහ විශ්ව විද්‍යාල ආචාර්ය වරුන්ගෙන් නොවිමසූ අදහස් ගත්තේ නැත. අභ්‍යන්තරයෙන් උපදෙස් අදහස් නොසලකා හැර ඇත. ජාතික අධ්‍යාපනය කොමිසමේ සීග කළ කාර්යයක දොරටුව දමාගෙන සකස් කළ යෝජනාවලිය වසරටම ක්‍රියාත්මක කිරීමේ තරඟයෙන් සඳ එළි දුටුවේය. යෝජනාවලිය පාර්ලිමේන්තුවේ හෝ පොදුජන සමාජයේ දීර්ඝ සංවාදයකට බඳුන් වීමට ඉඩ හැරියේ නැත. එසේ සංවාදයකට බඳුන් වූයේ නම් යෝජනාවලියේ අඩුපාඩු එසේ සංවාදයකට බඳුන් වූයේ නම් යෝජනාවලියේ අඩුපාඩු මඟ හරවා ගත හැකිව තිබිණි. මේ ප්‍රතිසංස්කරණ හෝ යෝජනා වලිය සංවාදයට බඳුන් වූයේ ඊට එරෙහි වූ ශිෂ්‍ය උද්ඝෝෂණ නිසාය.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් දිස්ත්‍රික් කෝටා ක්‍රමය අහෝසි කිරීමට යෝජනා කර තිබේ. අධ්‍යාපන පහසුකම් අඩු දුෂ්කර දිස්ත්‍රික්කවල ශිෂ්‍යයන්ට වාසි සැලසෙන ආකාරයට සකස් කර තිබූ දිස්ත්‍රික් කෝටා ක්‍රමය අහෝසි කිරීමට ජේ. ආර්. ජයවර්ධන රජය පවා උත්සාහයක් නොගත් උත්සාහයක් නැත. වත්මන් රජය දැන් ජේ. ආර් ගේ සිහිනය සැබෑ කිරීමට ඉදිරිපත් වී සිටියි. මෙරට විචාරකයෝ තිහර දෙවිවල් ලෝක බැංකුව ප්‍රතිගාමී බලවේගයන් ලෙස හංවඩු ගසති. එහෙත් ලෝක බැංකුව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා දිස්ත්‍රික් කෝටා ක්‍රමය පැවතිය යුතු බව නිර්දේශ කළේ 1974 දීය. ලෝක බැංකුව අදටත් එම ස්ථාවරයෙහි සිටියි. එහෙත් වත්මන් රජයට දිස්ත්‍රික් කෝටා ක්‍රමය අහෝසි කිරීමේ විශේෂ මිත්‍යාවක් ඇත. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැගුනහොත් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා උසස් පෙළ සමත්වීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා අභියෝගතා පරීක්ෂණයකට ද පෙනී සිටිය යුතුය. තුන්වන ලෝකයේ රටවල් තබා යෙහිර සංවර්ධිත රටවල් ද විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අවසාන සුදුසුකම ලෙස සලකන්නේ උසස් පෙළ සමත් වීමයි. ඇමරිකා එක්සත් ජනපදය වසර 10 ක් අඛණ්ඩව අභියෝගතා පරීක්ෂණ විෂය පිළිබඳ අධ්‍යනය කළේය. එම අධ්‍යයනවලින් අභියෝගතා පරීක්ෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දුන්නහොත් ඉන් නාගරික මධ්‍යම හා ධනපති පන්තියට විශේෂ වාසි අත්වන බව හෙළි විය. ඒ නිසා ඇමරිකාව අභියෝගතා පරීක්ෂණ හඳුන්වාදීම අත් හරින ලදී. ලෝකයේ සංවර්ධිතම රාජ්‍යයේ තතු එසේ නම් අපේ රටට අභියෝගතා පරීක්ෂණ හඳුන්වා දුන්නහොත් ඇතිවන තත්වය සිතා ගත හැකිය. අනික් පැත්තෙන් මෙම අභියෝගතා පරීක්ෂණය සිදු කරන ආකාරය පිළිබඳව එකරම පැහැදිලි කිරීමක් නැත. දිස්ත්‍රික් කෝටා ක්‍රමය අහෝසි කර අභියෝගතා පරීක්ෂණය හඳුන්වා දුන්න හොත් නැවතත් මෙරට විශ්ව විද්‍යාල පුතු හා ධනපති පන්තියේ පරවේණි උරුමයක් බවට පත් කළ හැකිය. ගොවි රාළගේ පුතා කුඹුරටත්, යකඩ කලත්තාගේ පුතා කම්මලටත්, වළං හදන්නාගේ පුතා සක පුවරුවටත්, වඩු රාළගේ පුතා වඩු මඩුවටත් කොටු කළ හැකිය.

එ.ජා.ප. පාලන කාලය තුළ මෙරට සංස්කෘතියේ ප්‍රදීපස්තම්භ වූ පිරිවෙන් වල් බිහි වීමට ඉඩ හැරියහ. එහෙත් තම පැලැන්තියේ දූ දරුවන්ට පමණක් සීමා වූ සුපිරි ජාත්‍යන්තර පාසල් බිහිවීමට ඉඩ හැරියහ. දේශීය සංස්කෘතියේ ප්‍රකාශ යෝධයකු වූ අභාවප්‍රාප්ත මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා මෙම ජාත්‍යන්තර පාසල්වල පියරු බබාලා මාර්ටින් වික්‍රමසිංහ ගැන තබා ජාතික ගීයවත් නොදන්නා බවට චෝදනා කළේය. එය සම්පූර්ණ සත්‍යයක් බව මේ වනවිට සනාථ වී ඇත. නව අධ්‍යාපන යෝජනාවල මෙම ජාත්‍යන්තර පාසල් පිළිබඳ එක වචන මාත්‍රයක්වත් සඳහන් නැත. ගමේ කජු කිරි කොල්ලන්ට එක් හැන්දකිනුත්, නගරයේ පියරු බබාලාට තවත් හැන්දකිනුත් බෙදීම ගැන පුදුම විය යුතු නැත. 1988/89 දී ගම් නියම්ගම්වල පාසල්වල කොදරුවෝ "කොළඹට කිරි අපට කැකිරි" කියා කෑ මොර ගැවේ මෙම වෙනස ඔවුන් ද දන්නා නිසාය. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් මෙම විෂමතා අවම කිරීමට පියවර නොගැනීම ජාතියේ අවාසනාවකි. මෙරට පුතු හා ධනපති පන්තියේ පවුල්වල දූ දරුවන්ට රැකියා පිළිබඳව ගැටළුවක් නැත. ඔවුන් උපාධි ලැබුවත් නැතත් දේශපාලන හා ඥාති හිත මිත්‍රකම් අනුව තිබෙන රැකියා බෙදා හදා ගනිති. රැකියා නොමැති කමෙන් හැම්දාම පීඩා විඳින්නේ ගමෙන් නගරයට අවුත් උපාධි ලබන ගමේ කජු කිරි කොල්ලන්ය. මෙම උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නයට පිළියමක් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් ඉදිරිපත් නොකරයි. අව සියවසක මේ ආශ්‍රිත ඉතිහාසය දෙස බලන විට මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණය හරහා තුන්වන කැරැල්ලක් ඇති නොවේ යැයි කිය නොහැකිය.

චන්ද්‍ර ලක්ෂ්මන්

# ඕං ඊං කට්ටු කට්ටු

## දෙහි කැපීම පිළිබඳ විද්‍යාත්මක හා සන්නිවේදනාත්මක විමසා බැලීමක්...



ලෙඩ රෝග ඇතිකරවීම මිනිසුන්ට බලපෑම් කිරීමට ශක්තියක් යකුන් හා දෙවියන්ට ඇතැයි යන විශ්වාසය අතීතයේ සිට අද දක්වාම මිනිසුන් අතර පවතිනවා. මෙය ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටවල පමණක් නොවෙයි පෙරදිග රටවල ද දකින්න ලැබෙන විශ්වාසයක්. මේ නිසා පුරාණයේ සිටම එවැනි ලෙඩරෝග, විපත්වලින් වැළකී සිටීමට අපේ පැරැන්නෝ විවිධ ක්‍රම සහ විධි උපයෝගී කරගෙන තිබෙනවා. මේවා ඉතා සරල "කෙම් ක්‍රම" වල සිට මහා පරිමාණයෙන් කෙරෙන ශාන්තිකර්ම දක්වා විහිදී යනවා. ඒ අතරින් භාවිතවන එක ක්‍රමයක් ලෙස "දෙහි කැපීම" හඳුනා ගන්න පුළුවන්.

දෙහිකැපීම් ආකාර කීපයකින් හඳුනා ගත හැකි වෙනවා. ඒ අතර විශාලම "දෙහි කැපීම "හත් අඩියේ දෙහි කැපිල්ල" නම් වෙනවා.

ඒ හැරුණම පුංචි උණක්, හිසරදයක්, උදරාබාධයක් සුව නොවන තුවාලයක් වැනි ලෙඩ රෝගවලට හා තුන්දොස් සමනය කිරීමට, කොඩිවින බන්ධන ආදිය ඉවත් කිරීමට මෙන්ම යක්ෂදෝෂ මග හරවා ගැනීමට භාවිතා කරන දෙහි කැපීම්කුත් දකින්න පුළුවන්. මෙම ක්‍රමය බොහෝවිට වැඩි කලබලයකින් හෝ පිරිසකින් තොරව ඇදුරෙකු විසින් කරන සුළු පරිමාණ ක්‍රියාවක් ලෙස හඳුනාගත හැකියි.


> ගැටේ මෙදෙසි මෝරන
> කල වෙන වෙන දෙසි
> ඔක් මැවෙති
>
> කටේ කෙලත් ඇඹුල්
> වෙමින් විෂ දළ වගෙ
> රේණු වෙති

මෙවැනි ක්‍රම කොහොමවුනත් උපත පිළිබඳව ප්‍රචලිත මතවාද අතුරින් එක් මතයක් බොහොමදෙනා විසින් පිළිගනු ලැබෙනවා. අභාවිත හදි හූනියම් මෙන්ම ඊට ප්‍රතිකර්ම වශයෙන් බලි, තොවිල් සෙත් ශාන්ති ආදියත් තිබුණේ "මහා සම්මත රජ" සමයෙයි. මහා සම්මත රජුගේ බිසව වූ මැණික් පාල දේවියට "වසවර්ති" මාරයා විසින් වින කරන ලදුව, එය මගහරවා ගැනීම සඳහා ශාන්තිකර්මයක් කර තිබෙනවා. මෙය "ඉවසිය" නැමැති කාපිරයා විසින් සිදු කරන ලද්දක්. ශාන්ති කර්මවල උපත සිදුවී ඇත්තේ මේ ආකාරයටයි. "හූනියම් කැපිල්ල" නම් ශාන්ති කර්මයේදී මේ කථාව අනුරූපනය කෙරෙනවා දකින්න පුළුවන්.

සාමාන්‍යයෙන් පොහොය දින හැර සෙසු ඕනෑම දවසකදී "දෙහිකැපීම" සිදු කරනු ලබනවා. එමෙන්ම ඊට රෑයක් හෝ දවාලක් යැයි වෙනසක් ද නැත. රෝගියා හෙවත් ආතුරයා මෙන්ම ඇදුරා ද මේ සඳහා දින කීපයක සිට සූදානම් විය යුතුයි. එනම් ඌරුමස්, කරවල, මාළු ආදී කිලිකෑම වලින් වැළකී සිටීමයි. ඇදුරා ද මේ සඳහා පෙවී සුදු හැඳගත් පසුව දෙහි කැපීම අරඹනු ලබයි. මුලින්ම ගම්භාර දෙවියන් වෙනුවෙන් මල් පැලක් සාදා, වැද නමස්කාර කිරීමෙන් ඒ දෙවියන්ගෙන් අවසර ගත යුතු වෙයි. එයින් පසුව බුදුන් සිහිකර, අවසර ගෙන තිසරණ සහිත පන්සිල් සමාදන් වෙයි. මෙය ආතුරයා විසින් ද කළ යුතු වෙනවා.

මීළඟ [illegible] පුවක් තනනු ලබන්නේ මෙසේයි. පිරුවටයක් එලන ලද පුටුව මත කෙසෙල් කොළයක් තබා ඒ මත ඇඳිරි කැපූ නැමිලි ගෙඩියක් තබයි. ඒ අසල පාට පහේ මල් වර්ග පහක් නැතිනම් 14 ක් හෝ 21 ක් වශයෙන් ද දෙහි ගෙඩි හා කහ කුළක් ද මෙයටම එක්කර ගනී. "ඇට කුරු පහ" යනුවෙන් හඳුන්වන "මු, කල, වී, මු, උඳු" යන ධාන්‍යවර්ග [illegible] ලෙස [illegible] දිය [illegible] කරවල [illegible] ගනියි. මේ හැරුණම කහ, රතු, කළු යන පාට තුනෙන් නූල් පටි ද මෙයට අයත් වෙනවා. කළු නූල කළු යකාට ද, රතු නූල රිරියකාට හා කහ නූල මහසොහොන් යකාට ඇදී වශයෙන් වෙන් වෙනවා.

මේ ද්‍රව්‍යවලට කහ දිය හා සුදු හඳුන් සුවඳ අතපතුරුව කපුරු, සාම්බ්‍රානි දුම් අල්ලා හැකිරීම ආරම්භ කරයි. එය "දුමට දීපවිකර මතුරනවා" යැයි පවසන අතර එම ක්‍රියාව හඳුන්වන්නේ "යහන දිගටි කිරීම" යන නමින්.



## සාම්බ්‍රානි හා දුම්මල මූලික වශයෙන් ලබාගන්නේ ශාකවලින් හා පොළොවෙනි...

කහ සහ සුදු හඳුන් ඉසීමෙන් කිලි කැපීමක් සිදුවන බව විශ්වාසයයි. ආතුරයා මේ අසල පැදුරක පිරුවටයක් පොරවාගෙන වාඩි වී සිටියි. "ඕං නමෝ..... ආදී වශයෙන් සුදු ගුණ මුල්කර ගෙන ගයමින් ඇරඹෙන මන්ත්‍ර ජපකිරීම් බොහෝ වේලාවක් තුළ සිදු කෙරෙනවා.

දෙහි ගෙඩි 7 ක් හෝ 14 නැතහොත් 21 ක් 108 වාරයක් මතුරා ආතුරයාගේ හළලේ තබාගත් ගිරයෙන් කැපීම සිදු කෙරේ. එයින් පසුව තැඹිලි ගෙඩියට සුදු හඳුන් දමා ආතුරයාට බීමට දෙනු ලබයි.

පාට නූලේ නූල්වල ගැට 9 බැගින් දමමින් එක් ගැටයකට 7 වරක් වනසේ මතුරා ආතුරයාගේ අතේ හා කරේ බඳිනු ලබයි. යක්ෂ දෝෂයකදී නම් සමහර විටක මෙවෙලේ ආතුරයා කෑ ගසමින් වෙව්ලන්ට පටන් ගනී. දුම්මල හා සාම්බ්‍රානි දුම් ඇල්ලීම ද එවලේ සිදු කරයි.

මේ ආකාරයට කළ දෙහි කැපීම තුන්දොස් සමනය සඳහා වූවක් නම් ඒ දෙහි ගලාගෙන යන ජල පහරකට දමයි. එයින් සියලු දෝෂ මග හැර යන බව විශ්වාස කරයි.

තුවාල වීම් වැනි දේ සඳහා කරන දෙහි කැපිල්ලේ දී "පස් පැහිරි" දර හා "පස් තෙල්" ප්‍රයෝජනයට ගනියි. පැහිරි දර ලෙස "ඇඹුල් දොඩම්, දෙහි, යකිනාරං, නාරං, කුඩළු දෙහි" යන දර වර්ග ගනී.

පස්තෙල් ලෙස කොහොඹ තෙල්, තලතෙල් පොල්තෙල්, එඬරු තෙල්, මී තෙල්,

**සුවය හා ශාන්තිය ලබාගැනීම උදෙසා**

**මෙවැනි ක්‍රම පැරණි මිනිසා**

**නිර්මාණශීලීව යොදාගත්තා...**





එක්කර ගැනේ. මෙම තෙල්වර්ග සියල්ල කබලකට දමා පැහිරි දර ඇවිලූ ගින්දරෙන් කකාරවනු ලබනවා. දද, කුෂ්ඨ ආදී තුවාල වල මේ තෙල් ආලේප කිරීමෙන් ඒවා ඉක්මනින් වියැළී යයි.

මේ සියලු කටයුතු අවසානයේ "පස් ලෝහ" එනම් රන්, රිදී, තඹ, පිත්තල, සුදු යකඩවලින් තැනූ සුරයක් පසුවේ ස්පර්ශ වන සේ ආතුරයාගේ කරට දමනු ලබයි. සුරයේ ස්පර්ශයෙන් පසුව ඇතුළත රත් වී ලේ සිරුර පුරා දිව යාමට දින 21 ක් ගත වන බව විශ්වාස කෙරෙනවා. එමෙන්ම හිස පිට පාදාන්තය දක්වා ස්පර්ශ කරන අඹ කොළ අත්තකින් දොස් දුරු කර සෙත්පතයි. පසුව එය වහලක් වැනි උස තැනක තබනු ලබනවා.

> "කවේ දතුත් දෙහි ඇට
> වී විෂ දුමෙන් පැගිරි
> වෙති
>
> කැවේ දේත් බොරුව
> නොවෙයි දෙසි උපතක්
> පෙර පැවති"

මෙයින් පසුව දින 21 ක් යනතුරු සියලුම කිලි කටයුතුවලින් හා කිලි ආහාරවලින් වැලකී සිටීමට ආතුරයාට සිදුවේ. ඒ කාලය තුළ දිය ඵලවළු වර්ග බොහෝ විට ඔහුගේ ආහාරයට එකතු වෙයි.

දෙහි කැපීම්වලින් විශාලම අවස්ථාව හත් අඩියේ දෙහි කැපීමයි. එහිදී ගොක්කොල හා කෙසෙල් බඩවලින් තැනූ පියුම් 7 ක් ද නිර්මාණය කරනු ලබනවා. ආතුරයා සිටින පැදුර අසල වට්ටියකට දැමූ කැකුළුහාල්, තොළබෝ කොළ, හීරුක්ස වැල්, දෙහි, දිවි හිස හා මෝල්ගස ද තබා තිබෙයි. මේවා හැඳින්වෙන්නේ "පෙළපාලි" යන නමින්. මේ සියල්ලේ උපත කියැවෙන කවි කියවීම මෙහි විශේෂ අවස්ථාවක් වෙනවා. ඒ දෙහි ආදියේ උපත පිළිබඳව එම කවිවලින් කියැවේ.

"ගැවේ මෙදෙසි මෝරන කල වෙන වෙන දෙසි තික් මැවෙති

කවේ කෙලත් ඇඹුල් වෙමින් විෂ දළ වගෙ රේණු වෙති

කවේ දතුත් දෙහි ඇට වී විෂ දුමෙන් පැහිරි වෙති

කැවේ දේත් බොරුව නොවෙයි දෙසි උපතක් පෙර පැවති"

නාග ලෝකයේ නා රජුගේ සිරුර පලාගෙන දෙහි ගස වැඩුනු අයුරු මේ කවියෙන් දක්වෙයි.

මෙවැනි යාතුකර්ම ශාන්තිකර්ම ආදියෙන් බලාපොරොත්තු වන්නේ රෝගියාට ශාරීරිකව මෙන්ම මානසිකව ද සුවයක් ලබා දීමයි. පළාත්වලින් පළාත්වලට මෙම ක්‍රම වෙනස් වන අතර ඇදුරාගේ ගුරු කුලයෙන්, ගුරු කුලයට ද යම් යම් වෙනස්කම් පවතින බව පෙනෙනවා. දකුණු පලාතේ දී මෙවැනි සුළු දෙහි කැපීම් මෙන්ම දින 3ක් පමණ ගතවන විශාල තොවිල් කිරීම දකින්න පුළුවන්.

වර්තමානයේ ලෝකයේ විද්‍යාත්මක දියුණුව හා සසඳන විට මෙම දෙහි කැපීම වැනි දේ නිශ්ඵල හරසුන් ක්‍රියාවන් ලෙස සැලකීමට යොමුව ඇති අයුරු දක්නට ලැබෙනවා. නමුත් නවීන විද්‍යාවට අනුවද මේවායේ යම් යම් සත්‍යතාවන් පවතින බව අද වන විට සොයා ගෙන තිබෙනවා. මෙයින් සිරුරට මෙන්ම මනසට ද යම් යම් බලපෑම් කළ හැකියි. මෙහිදී භාවිතා කරන අමුද්‍රව්‍යවල විද්‍යාත්මක බලපෑම් ඇසුරින් එය වටහා ගත හැකිවෙනවා.

පස් පැහිරි දර එවැනි විශේෂ බලපෑම් සහිත අමුද්‍රව්‍ය ලෙස ගණන් ගැනෙනවා. "ලී මොනින්" "ස්ගන්ධ තෙල්" වැනි ඒවායේ අඩංගුවන වාෂ්පශීලී තෙල්වර්ග මේ දර

දුම්මේදී වාෂ්ප වෙනවා. එත් කිරීමට නොහා කබල හෝ වළඳ තුළින් වාෂ්ප වී ගලා එන මෙම රසායනික ද්‍රව්‍ය කබලේ ඇති තෙල් හා මිශ්‍ර වෙයි. මෙම රසායනික සංයෝග ප්‍රධාන වශයෙන්ම විෂබීජ නාශක හා පවිත්‍රකාරක ගුණ සහිත ඒවායි. ඒ නිසා සෙසු දරුවලට වඩා වැඩිකාලයක් දුම්බීමත් කිත්දර යම් ප්‍රමාණයකට උණුසුමෙන් වැළකීමත් ද දකින්න පුළුවන්.

පත්තෑල් සාම්ප්‍රදායයෙන් කවි කවිව ගත් විට එහෙම විශේෂ ගුණයක් අත්දකින්න බැහැ. නමුත් කොහොමත් කොළවල ඖෂධීය ගුණයක් තියෙනවා. එසේම මෙම කොළවිසිවල කිසියම් ගුණයක් මිස, මිනිස් සිරුරට අහිතකර බවක් වෛද්‍ය විද්‍යාවෙන් මෙතෙක් ඔප්පුකර නැහැ. මෙම කොළ මිශ්‍රණය තුවාල මත ආලේප කළ විට එය "ඇන්ටිසෙප්ටික්" ලෙසින් ක්‍රියා කරනවා. එනම් තුවාලය මැලවීම හා අවට වනය සහිත කරන ප්‍රතික්‍රියාවන් වලක්වන මාධ්‍යයක් සේ ක්‍රියා කිරීමයි. කොළ මත විෂබීජ වැඩීමට නොහැකි නිසා තුවාල වේලී යාමට ඉඩකඩ සැලසෙනවා. තුවාල සදහාම විශේෂ වූ ගුණයක් මෙම කොළවල නොමැති වුවත් එමගින් තුවාල සුව වී යන්නේ මෙම ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් විදිහටයි. අද බහුලව භාවිතා කරන "ඇන්ටිසෙප්ටික්" වැනි බෙහෙත් වර්ග බොහොමයකම පදනම ලෙස ගෙන ඇත්තේ කොළ වර්ගයි.

සාම්බ්‍රාණි හා දුම්මල මූලික වශයෙන් ලබාගන්නේ ගස්වලින් හා පොතුවලින්. ගස වර්ගවල හා පොතුවල ඇති රසායනික ද්‍රව්‍ය දුම්මලවල අඩංගු වේ. ඒ අතර "රෙසින්" හා "ඇරොමැටික් සංයෝග" ප්‍රධාන වෙයි. මේ මිශ්‍රණයෙන් ලැබෙන දුම් පරිසරය පවිත්‍ර කිරීමට මෙන්ම සුවඳ නැඹීමට ද ඉවහල් වෙයි.

කහ ප්‍රධාන වශයෙන්ම පවිත්‍රකාරකයක් ලෙස ක්‍රියා කරයි. එහි අඩංගු "කාබොලික්" නම් සංයෝගය විෂබීජ නාශකයකි.

සිදු තලෙන් හා තැඹිලි පිරිසිදුකාරක ද්‍රව්‍ය වෙයි. තැඹිලි වතුරට සිදු තලෙන් දමීමෙන් "පේල්ටින්" වලට සමාන ගුණයක් ඇති වෙනවා. මෙයින් ආමාශයේ ජංගම්වල සටල සිහිල් කරවනු ලබයි. නිතර මිදෙන වූ හෝ බඩේ අජීර්ණ තත්වයන් වලදී බඩවැල්වල මාංශපේශී නිතර හැකිලීම නවතා දමීමට මේ දියරයට හැකි වෙනවා.

සාම්ප්‍රදායයෙන් දෙහි බීමට දෙන්නේ ආමාශයේ රෝගීන්ටයි. ආමාශයේ ආම්ලික තත්ව අඩු වූ විට එය යථාතත්වයට ගෙන ඒමට දෙහිවල අඩංගු වන "සිට්‍රික්" හා "ටාටරික්" යන මෘදු අම්ලවලට හැකි වෙනවා. කෘත්‍රිම අම්ල මෙන් ආමාශ බිත්ති තුවාල කිරීමක් මෙම ස්වභාවික අම්ලවලින් සිදුවන්නේ නැහැ. ආහාර ජීර්ණය සක්‍රිය කරන අතරම අධික "C" විටමින් හා සීනි වර්ග ඇතුළත් ග්ලූකෝස් සංයෝග යම්තාක් දුරට ලබා දීමක් ද දෙහිවලින් සිදු කරනවා. මේ නිසා දෙහි ස්වභාවික ආහාරයක් ලෙස සලකන්න පුළුවනි.

" බුලත් විදෑමේදී මේවා ආරක්ෂක අභිචාර ක්‍රම ලෙස සලකනවා.

ප්‍රදේශයේ සංස්කෘතිය හා බැඳී පවතින සංස්කෘතික අංගයක් ලෙස මෙම අභිචාර ක්‍රම වැදගත් වෙනවා. "

මේ වගේ කායික මලපැමිවලට අමතරව ප්‍රබල මානසික මලපැමිත් දෙහිකැපීමක දී සිදු වෙනවා. ඇත්තෙන්ම මෙහිදී සිදුවන්නේ වෛද්‍යමයකට වඩා සෙදුකමක් ලැබී කිමට පුළුවන්. සිරුරට කරන මලපැමකට වඩා මනසට කරන මලපැම වඩා සාර්ථක විය හැකියි. පාට පුල් මතුරා කරට දමීමෙන් එවැනි මානසික මලපැමක් සිදු කෙරෙනවා.

දෙහිකැපීම ඇතුළු සාන්ති කර්ම බොහොමයක් බටහිර මනෝවිද්‍යාවේ ඉගැන්වෙන ප්‍රාථමික ප්‍රතිකාර ක්‍රමවලට සමානව දක්වනවා. එසේම කායික රෝගයකදී පුද්ගල රෝගියාගේ සිතටත් ප්‍රතිකාර කළ යුතු නිසා වෛද්‍යවරයා හෝ වෙදමහතා කරමින් මෙවැනි සාන්තිකර්ම වැදගත්වන බව බටහිර වෛද්‍ය විද්‍යාඥයින්ගේ අදහසයි.

බුලත් විදෑම්ම වශයෙන් ද මෙවාට යම් වැදගත් කමක් ලැබෙනවා. බුලත් විදෑමේදී මේවා "ආරක්ෂක අභිචාර ක්‍රම" ලෙස සලකනවා. ප්‍රදේශයේ සංස්කෘතිය හා බැඳී පවතින සංස්කෘතික අංගයක් ලෙස එහිදී මෙම අභිචාර ක්‍රම වැදගත්





වෙනවා. මිනිසුන්ගේ සිත තුළ සැක සිතාලුම මිථ්‍යාව නැතිව මිටකර ගැනීමට මෙවැනි අවස්ථාවලදී එකට එකතුවීම සමාජයීය පමණිය වර්ධනය කර ගැනීම මිනක් ලෙසද මේ අභිචාර සලකනවා.

පූජා හා සාන්තිය දේව ඇදහීම ලෙසට මෙවැනි ක්‍රම භාවිතා කිරීම තුළින් පැරණි මිනිසා තමන් හිරිතාශමයින් පැවිණි වටිනා නැත පුළුවන් තත් අදිය සහ දක කැමති ය වැදි අවස්ථාවලදී භාවිත කළ පැරණි, අවස්ථාවක ඔහුට සමුවීම, තාලීම, සහ තෝර සහ ඇදී අදිය ද පසුනා කොහම දැනගම විදිහට දක්වන්න පුළුවන්. ඒ හා බැඳුණ යතුර දෙවියන් සිද්ධ පුරාවෘත්ත මිනිස් ඇදහීම් තැව රූප, තම්පිලයෙක, ආයුධිකය වූ දෙවි රෝග, එය එක යකඩයට දිය යුතු පිල්ලි ආදිය පැමිණීමම මිනිසා විනිත් නිරීක්ෂණය කරගත් දෙයක්.

උදරාබාධයකට නියමිත දෙහි වැන් හෝ තැඹිලි පෙව්වයක් දෙනවාට වඩා මේවායේ කුමයක් භාවිතා කිරීම නිරීක්ෂණාත්මක සිතුවිලි මිශ්‍රණ නැඹීම අපේකෂ ඇතිකරවා. මේවා තැනු ලෙසිකයේ දකින්නට ඇති එක හොඳම මිවාගත් දෙයක් (විශේෂයෙන් දෙවියන් හා යකුන්) නිසා නැතු ලෙසේ නිරීක්ෂණාත්මක ලෙස කියන්න පුළුවන්.

කොහොමත් වූයේ අවසානයේදී අපට මේ අභිචාර ගැන නිගමන කීපයක් ගන්න පුළුවන්. මිනිසාට ලෙස මිනිසුන් කළ යුතු නැති, යම්කිසි කායික හා මානසික මලපැමක් කළ හැකි විම එකක්. කෙටුවෙන් පැහැදිලි කරනවා නම් මිනිසුන් මේ සිදුවෙන් දක්වන විශ්වාසය විද්‍යානුකූල වියයක් යම් කාරණා ද්‍රව්‍ය ලෙවිරෝග සුව වන බවය. එය අභිචාරීම මනෝවිද්‍යාත්මක පැතිකයක් ලෙස විග්‍රහ කළ හැකිය. ඒ වගේම මේවා සංස්කෘතිය තුළ පැවතිය යුතු අංග වශයෙන් පව එකක්. එයින් අපේ සංස්කෘතිය යම් තරමකට විදහා පෑමක් සිදු වෙනවා. එමෙන්ම අප සතු වූ නිරීක්ෂණාත්මක කුසලතාවන් එළිදක්වන මගක් නිසා අපට වැදගත්වීම තවත් කාරණයක්.

ඉදින් විද්‍යාව දියුණු වූ පමණිනම් අප සතු මේ ඉතුරුණු දේවල් මඟහරී කළ යුතු ද? විද්‍යාව ගැන නොදත මුදිද අපේ මුතුන් මිත්තන් රසායනික සංයෝගවලින් මලපැමිකළ හැකි අමුද්‍රව්‍ය භාවිතා ගෙනිමින් ලෙඩරෝග සුව කරන්නට අත්දැකීම ලබා නැද්ද?

වෙනස්ථාන ලෙසින් ......
වෛද්‍ය R. P. [illegible] (ආයුර්වේද) සමඟ කළ සාකච්ඡාවක් ඇසුරෙන්

රසිකා [illegible]

# අයිස්ලන්තෙට සීතල විකුණන්නෝ

**ප්‍රේක්ෂකයා වෙත මරණය ලෙඩදුක් වැනි භාවාතිශය සංකල්පයන් සම්ප්‍රේෂණය කරමින් ඔවුන් තුළ නිතර දෙවේලේ තුන්බිය ජනනය කිරීම සන්නිවේදකයන්ගේ කාර්ය භාරය නොවන්නේය .....**



කලා නිර්මාණයකදී ශෝක භාවාත්මක සිද්ධි නිරූපනය අතිශයින් වැදගත්ය. මිනිස් සමාජය සන්තර්පනය කරන ජනප්‍රිය හා ලලිත කලාවන් තුළ භාවාත්මක සංසිද්ධීන් නිරූපණය ප්‍රේක්ෂකයාට සැබෑවම බල නොපායි. එනම් එවැනි කලා මාධ්‍යයන් තුළින් නිරූපනය වන්නා වූ දෙය කුඩා කල්පිතයක් යැයි සිතා බැහැර කිරීමට ඔහුට ඇති හැකියාව නිසාය.

ගැටලුව පැන නගින්නේ ව්‍යවහාරික කලාව තුළ විවිධ භාවයන් නිරූපණය කිරීමේදීය. ව්‍යවහාරික කලාව යනු වෙළෙඳ පොළ තරගකාරීත්වය ජයගනු වස් විවිධ කලාත්මක හැඩතල භාවිතයට ගැනීමය. එම කලාවේ ඒකායන අරමුණ භාණ්ඩ හා සේවා කෙසේ හෝ අලෙවි කිරීම තුළින් නිෂ්පාදනය පුළුල් කර ගැනීමය.

ව්‍යවහාරික කලාවේ නාමයෙන් ප්‍රේක්ෂකයා වෙත මරණය, ලෙඩදුක් වැනි භාවාතිශය සංකල්පයන් සම්ප්‍රේෂණය කරමින් ඔවුන් තුළ නිතර දෙවේලේ තුන්බිය ජනනය කිරීම සන්නිවේදකයන්ගේ කාර්ය භාරය නොවන්නේය. එහෙත් තවමත් කිසිවෙකුට මානුෂික මුහුණුවරක් දීමට නොහැකි වූනු විවෘත ආර්ථිකයේ අදෘශ්‍යමාන හස්තයෙන් මග පෙන්වනු ලැබෙන අදතන ශ්‍රී ලාංකීය සන්නිවේදන ජාලය තුළින් මෙම කාර්යය කෙරෙනු දක්නට ලැබේ.

තම පියාට කොයි මොහොතේ හෝ මරණය ළඟා වෙතැයි බියෙන් පසුවන දරුවෙකු පෙන්වමින් හෝ තම දරුවා සදාතනික අබ්බගාතයෙකු බවට පත්වෙතැයි දෙමව්පියන්ගේ මුහුණට වචනවලින් දමා ගසන වෛද්‍යවරයෙකු දර්ශන පථයට ගෙන එමින් තම භාණ්ඩ හා සේවා අලෙවි කර ගැනීමට ව්‍යාපාරිකයෝ [illegible] සිටිති. තම භාණ්ඩය හෝ සේවාව මිලදී නොගතහොත් ලාංකීය ප්‍රජාව වෙතම [illegible] ළඟා වෙන බව එම දැන්වීම්වල යථාර්ථයයි.

මොවුන් ඉලක්ක කර [illegible] සමාජයේ අති සංවේදී [illegible]. [illegible] දරුවන් හා දෙමව්පියන් [illegible] මානුෂික ක්‍රියා[illegible] තම භාණ්ඩය හෝ සේවාව අලෙවි කර ගැනීමට ඔවුනු [illegible]. "අභවල් සේවය" නොවන්නට [illegible] දරුවා මගේ තාත්තා අද ජීවතුන් අතර නැතැයි ඇතැවෙන්නට සැලැස්වීමෙන් "අභවල් සේවය" නොමැතිව ජීවත් වීම අතියයින් [illegible] නොකියා කියයි. මරණය [illegible] බලවේගය නිසා දෙමව්පිය [illegible] කොයි මොහොතේ හෝ [illegible] දෙබිඩියාවට පත්වන [illegible] නිතැතින්ම භාණ්ඩය හෝ සේවාව මිලදී ගැනීමට පෙළඹේ.

තවත් සංවේගයට කරුණක් වන්නේ මෙවැනි වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා ඉලක්ක වන්නේ බොහෝ විට පහළ මධ්‍යම පාන්තික පවුල් පරිසරය වීමය. අද ශ්‍රී ලාංකික මධ්‍යම පන්තිය වනාහී ගමෙන් නගරයට රැකියා සඳහා සංක්‍රමණය වන ලදුව පවුල් බවට පත්වී නාගරාශ්‍රිතව කුලියට හෝ බද්දට ජීවත්වන පිරිසකි. ඔවුන් අසල බොහෝවිට තම දෙමාපියන්, නෑදෑ හිතවතුන් නැත. තනිකම නමැති හැඟීමෙන් නිරතුරුවම ඔවුහු පීඩා විඳිති. මේ නිසා තම කුටුම්බයේ සාමාජිකයෙකුට අනතුරක් සිදුවීම ඔවුන්ට දරා ගැනීමට අපහසු වන බව රහසක් නොවේ.

මෙසේ ඔවුන් තුළ අවිඥානිකව පවත්නා තනිකම හා පාළුව නැති කර ගැනීමට සිටින කලණ මිතුරා රූපවාහිනියයි. දවසේ කටයුතු හමාර කිරීමෙන් පසුව නිවසට එක්රැස් වී තම පවුලේ සාමාජිකයන් සමග එක්වී රූපවාහිනිය නැරඹීමෙන් ඔවුන් ලබන්නේ අසීමිත [illegible]. එහෙත් එම සතුට අසුරු සැණින්, හදවත දවාලන අග්නි ජාලාවක් බවට පත්කිරීමට වෙළෙඳ දැන්වීම් කලාව ක්‍රියා කරන ආකාරය [illegible]. එය නරඹන්නා තුළ දවසේ වෙහෙස [illegible] කරවනවා සේම ඔවුන් අන්ත අසරණ තත්ත්වයට පත් කරයි.

එයින් සියලු මාධ්‍ය ජයගෙන ඉදිරියට [illegible] නොව කොයි මොහොතේ තම මවට [illegible] පියාට අනතුරක් වේදෝහෝයි සිතසිතා සිටීමට දරුවන් පොළඹවයි. තම දරුවන්ගේ අනාගතය පිළිබඳ සුන්දර සිහින මවනු වෙනුවට දෙමව්පියන් සිතන්නට පෙළඹෙන්නේ තම දරුවා කොයි මොහොතේ හෝ අබ්බගාතයෙකු වේදැයි යන්න ගැනය.

වෙළෙඳ ප්‍රචාරණ නිර්මාණයක් කිරීමේදී ඉලක්ක කණ්ඩායමේ ගතිගුණ ස්වරූපය, රුචි අරුචිකම් ආදිය සැලකිල්ලට ගතයුතුය. බටහිර රටවල්වලනම් ඒ සඳහා මනෝ තත්ත්ව ගවේෂකයන්ගේ සහයෝගය ලබා ගැනේ. මරණය හෝ ලෙඩ දුක්වල දවටා තම සේවාවන් හෝ භාණ්ඩයන් ප්‍රචාරණය කිරීම ඉතා පහසුවෙන් ඉලක්ක කණ්ඩායම වෙත තම භාණ්ඩය සම්ප්‍රේෂණය කිරීම කළ හැකිය. එහෙත් සෛද්ධාන්තිකව එම ක්‍රමය නිවැරදි නමුදු එයින් සමාජයට එල්ල වන බලපෑම සුළු කොට නොතැකිය යුතුය. ප්‍රචාරණ කටයුතුවලදී යොදා ගැනෙන හේතුසාධක සහිත ප්‍රවේශය, [illegible] ප්‍රවේශය, ලිංගිකත්වය උලුප්වන ප්‍රවේශය හා භාවාතිශය ප්‍රවේශය යන ප්‍රවේශ ක්‍රමවලින් ඉතා දැඩි අවධානයෙන් කළ යුත්තේ භාවාතිශය ප්‍රවේශයයි. එය සන්නිවේදන ක්‍රමයකට වඩා දෙපැත්ත කැපෙන ආයුධයකට සමාන වේ.

වෙළෙඳ ප්‍රචාරණ කලාවේ එන ආදර්ශ පාඨයකට අනුව ප්‍රචාරකයාට "එස්කිමෝ වරයෙකුට ශීතකරණයක් අලෙවි කිරීමට හැකියාවක් තිබිය යුතුය. එනම් දවස් තුන්සිය හැටපස් දවසේම අයිස් ගොඩක ජීවත්වන්නෙකුට කිසිසේත්ම ප්‍රයෝජනයක් නොමැති අයිස් පෙට්ටියක් අලෙවි කිරීමට වෙළෙඳ දැන්වීමක් මගින් පෙළඹවීමක් ඇති කළ යුතුය යන්නය.


ව්‍යවහාරික කලාව උලුප්පා දක්වන එවැනි පාඨයක් ආගම කොටගත් වෙළෙඳ ප්‍රචාරකයන්ගෙන් තම භාණ්ඩය හෝ සේවාව කෙසේ හෝ අලෙවි කරගැනීම මිස මානව සමාජයේ යහ පැවැත්ම කෙරෙහි ආශිර්වාදයක් කෙසේ බලාපොරොත්තු විය හැකිද?

**අනුරාධා හෙට්ටිආරච්චි**

## සංවර්ධන සන්නිවේදනය

# බර ඉසිලීමට පුරුදුවන්න


❑ වසර 2031 වනවිට වයස අවුරුදු 65 සිට ඊට වැඩි කණ්ඩායම් ප්‍රබල ලෙස වර්ධනය වේ.



රටක සංවර්ධනය ආර්ථික, සාමාජික, සංස්කෘතික හා සදාචාරාත්මක යන අංශයන්ගෙන් පරිපූර්ණ වූවකි. මහාචාර්ය විමල් දිසානායක, සර් ආතර් ලුවිස් ආදී විද්වතුන් සංවර්ධනය යනු ආර්ථික සංවර්ධනය පමණක් නොවන බව අවධාරණය කොට ඇත. මහත්මා ගාන්ධි තුමා වරක් ප්‍රකාශ කළේ යම් රටක, ජාතියක මිනිසාගේ ස්වියත්වයට හා අනන්‍යතාවට අවශ්‍ය පරම සාධක තුනක් දක්නට ලැබෙන බවකි. එනම්


1. ප්‍රමාණවත් ලෙස ආහාරද්‍රව්‍ය රට සතුව තිබීම
2. සෑම ජන කොටසක්ම යම් වැඩක නිරත වීම
3. සම ආදායම් ව්‍යාප්තිය

තුන්වන ලෝකයේ රටවල් පිළිබඳව විමසන විට ඉහත සඳහන් සාධක පරිපූර්ණව පවතීදැයි සැකසහිතය. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ඇතුළු ආසියාතික රටවල දෛනිකව අපතේ යන ශ්‍රමය අති විශාලය. තමන්ගෙන් කිසියම් මෙහෙවරක් ඉටු නොකොට නිකරුණේ කාලය ගත කරන ජන කොටස් බහුලය. මේ නිසා ජීවිත වූ වැඩ කරන ජනතාවක් විසින් මෙම වැඩ නොකරන ජනකොටස් නඩත්තු කළ යුතුව ඇත. මහාචාර්ය විල්බර් ශ්‍රාම් ඔහුගේ Mass Media and National Development කෘතියෙහි රටකට සංවර්ධන අත්‍යවශ්‍ය සඳහා සෑම ජන කොටසකගේම ... යුතු බවත් අවධාරණය කොට ඇත ... අවශ්‍යතා පිළිබඳ හැඟීමක් ජනතාව ... ඇතිකිරීමට නම් මනා සන්නිවේදන ... රටක් තුළ ක්‍රියාත්මක වියයුතුය. ... විල්බර් ශ්‍රාම්, ඩැනියෙල් ලර්නර්, එවරට් රොජර්ස්, ලුසන් පයි, ඉතියෙල් ද සෝලා පූල් ... සන්නිවේදන විද්වතුන් බටහිර සංකල්ප ... වඩාත් උචිත සංවර්ධන සන්නිවේදන ... සම්පූර්ණයෙන්ම සකස් කොට ඇත්තේ ... භාවිතය පදනම් කොටගෙනයි. ...



ගැටලුව වඩාත් අපට ප්‍රායෝගිකව දක ගත හැක්කේ යටිතල පහසුකම් වල ඌණතාවෙන් පීඩනයට පත්ව ඇති තුන්වන ලෝකයේ රටවලය. එපමණක් නොව සංවර්ධන සන්නිවේදනය (Development Communication) උපත ලබා ඇත්තේ ද තුන්වන ලෝකයේ රටවල ය. විශේෂයෙන් ඌන සංවර්ධිත රටක් වශයෙන් ශ්‍රී ලංකාව ජනමාධ්‍ය භාවිතය අතින් සතුටුදායක තත්ත්වයක පැවතුනද සමස්ත ජනතාවට පොදු සංවර්ධන සන්නිවේදනයන් ප්‍රජාගත කිරීම සඳහා ජනමාධ්‍ය ගන්නා උත්සාහය යම් තිසි තැඩා වැටීමකට ලක් ව ඇති බවක් පෙනේ. ඊට හේතුව වන්නේද ගුවන්විදුලිය හැර සෙසු මාධ්‍යයන් ග්‍රාමීය මට්ටමෙන් දුස්ත ඌණ වීමයි. එහෙත් ශ්‍රී ලංකාව තුළ වැඩිම ග්‍රාහක පිරිසක් ග්‍රහනය කරගත ඇති මාධ්‍ය රූපවාහිනිය නිසා සංවර්ධන සංදේශ බොහොමයක් ශ්‍රී ලංකාවේ රූපවාහිනී නාලිකාවන්ගෙන් එකක හෝ දෙකක පමණක් විකාශනය වනු අපට දක ගත හැකි අතර පැහැදිලිවම එය ග්‍රාමීය මට්ටම දක්වා එය ගලා නොයිය බවත් වර්තමාන සාම තවලම වැනි වැඩසටහන් තුළින් අපට පැහැදිලි වේ. සාමය, යුද්ධයේ ඇති කුරිරු විසතුරු බව, දේශපාලන යෝජනාවලිය ආදී කාලීන ප්‍රබල අවශ්‍යතා පිළිබඳ ජනමාධ්‍ය හරහා ජනතාව අමතු කාලය අවසන් කොට පුද්ගලාන්තර හා කණ්ඩායම් සන්නිවේදනය හරහා ජනතාව ඇමතීමට අද පටන්ගෙන ඇත. පැවිත්ම සෙයින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රාමීය සංවර්ධනය සඳහා පුද්ගලාන්තර හා කණ්ඩායම් සන්නිවේදනය භාවිතයට ගැනීම [illegible] සාර්ථක වන බවයි. මෙම සන්නිවේදන [illegible] දැනුවත් වන ජනතාවට දෙවනුව ජනමාධ්‍ය මගින් සංදේශ ප්‍රජාගත කිරීම සාර්ථක [illegible] හැකිය.

කෙසේ වුව ද ශ්‍රී ලංකාවට උචිත සංවර්ධන සන්නිවේදන සැලැස්මක අවශ්‍යතාවය අද අපට පැහැදිලිව පෙනේ. රූපවාහිනී යන්ත්‍රයක් පිනමාපටයක් තිසි දා නොදුටු ජනකොටස් ශ්‍රී ලංකාවේ තවමත් වාසය කරන බව නොරහසකි. එම නිසා සමස්ත ජනතාවට වඩාත් උචිත, පහසුවෙන් දිරවාගත හැකි සංවර්ධන සන්නිවේදන සැලැස්මක් අද සකස් විය යුතුව ඇත. ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය දෙස බලන විටත් ඉදිරියේදී ඇතිවිය හැකි දුර්භික්ෂ පිළිබඳව විද්‍යාඥයින් දක්වන අදහස් පිළිබඳව විමසිලිමත් වන විටත් පැහැදිලිවන්නේ මීට වඩා ක්‍රමානුකූලවූත් සීග්‍රයෙන් ක්‍රියාත්මක වන්නා වූත් සංවර්ධන සැලැස්මක් රට ට අවශ්‍ය




බවයි. 1981 වයස අවුරුදු 65 සිට ඊට වැඩි ජනගහනය මිලියන 0.5 ක් වූ අතර 2031 වන විට එම සංඛ්‍යාව මිලියන 3 ක් දක්වා වර්ධන වන බව සොයාගෙන ඇත. 1981 ජනගහනය මිලියන 2 ක් වූ අතර වයස අවුරුදු 0-4 කණ්ඩායම 2031 වන විට වර්ධන වන්නේ මිලියන 1.5 ට වඩා මදක් වැඩි වශයෙනි. ඒ බව ඉහත සඳහන් වගුව තුළින් වඩාත් පැහැදිලි වේ.

මේ අනුව වසර 2031 වන විට වයස අවුරුදු 65 සිට ඊට වැඩි කණ්ඩායමේ ප්‍රබල වර්ධනයක් අපට දක ගත හැකිය. එහෙත් මෙහි අවධානය යොමු කළ යුතු වැදගත්ම කාරණය වන්නේ මෙම විශාල කණ්ඩායමේ නඩත්තුව ඊට පහළ මට්ටම් විසින් කළයුතු වීමයි. එසේ නම් මේ සඳහා පැහැදිලිවම ශ්‍රී ලංකාව හැම අංශයකින්ම සංවර්ධනය විය යුතුය.

21 වන සියවස ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා වඩාත් උචිත සංවර්ධන සන්නිවේදන ආකෘතිය පහත සඳහන් මූලික කරුණු පදනම් කරගෙන ගොඩ නැගිය යුතු ය.

1. හැකි ඉක්මනින් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට අදාළ ජාතික න්‍යාය පත්‍රයක් (National Agenda) සකස් කිරීම.
2. මූලික අත්‍යවශ්‍ය සංවර්ධන සාධක පිළිබඳව සමස්ත ජනතාව දැනුවත් කිරීම සඳහා පුද්ගලාන්තර හා කණ්ඩායම් සන්නිවේදනය හැකි උපරිම ආකාරයෙන් භාවිතයට ගැනීම
3. මහජනතාව විසින් දක්වනු ලබන ප්‍රතිචාර මැනවින් සැලකිල්ලට හා විමර්ශනයට භාජනය කිරීම හා නිවැරදි අදහස් ක්‍රියාත්මක කිරීම
4. ජනමාධ්‍ය භාවිතය පුළුල් පුලල් කිරීම හා ඊට අදාළ යටිතල පහසුකම් වර්ධනය කිරීම.
5. පුද්ගලාන්තර හා කණ්ඩායම් සන්නිවේදනය තුළින් අවබෝධයක් ලබන ජනතාව වෙත දෙවනුව ජනමාධ්‍ය මගින් සංවර්ධන සන්දේශ ඉදිරිපත් කිරීම.

හැකි ඉක්මනින් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට අදාල ජාතික න්‍යාය පත්‍රය හඳුනා ගැනීම බලයේ පවතින ඕනෑම දේශපාලන පක්ෂයක් විසින් කළ යුත්තකි. විශේෂයෙන් වර්තමානයේ පවතින සංවර්ධන ගැටළු මැනවින් හඳුනාගත රටේ සංවර්ධනය උදෙසා 21 සියවසට උචිත ජාතික න්‍යාය පත්‍රයක් සකස් කිරීම අද අත්‍යවශ්‍ය ඇත. එපමණක් නොව රටේ පවතින සන්නිවේදන සම්පත්, සංස්කෘතික වටාපිටාව, සහ ජනමාධ්‍ය භාවිතය පිළිබඳව මැනවින් අධ්‍යනය කොට රටට වඩාත් ප්‍රායෝගික සන්නිවේදන සැලැස්මක් සකස් කළයුතුය. සංවර්ධන සංදේශ පමණක් නොව ඕනෑම සංදේශයක් ග්‍රාහක ගත කිරීමේ දී ජනතාව වඩාත් සමීප සන්නිවේදන ක්‍රමෝපායන් හඳුනා ගත යුතු ය. මෙහිදී වඩාත් පැහැදිලි කරුණක් වන්නේ ශ්‍රී ලංකාව තුළ තවමත් ජනමාධ්‍ය භාවිතය අවශ්‍ය පරිදි කේන්ද්‍රගත වීමක් නොමැති බවයි. එම නිසා ජනමාධ්‍ය භාවිතය වෙනුවට හෝ ඒ හා සමගාමීව ශ්‍රී ලාංකික සමාජය තුළ තවමත් ව්‍යාප්තව භාවිතයේ පවතින පුද්ගලාන්තර හා කණ්ඩායම් සන්නිවේදයන් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. බොහෝ විට ශ්‍රී ලංකාව වැනි සාම්ප්‍රදායික අදහස් ගරුකරන රටක තවමත් අනුපාතික වශයෙන් ග්‍රාමීය සමාජ මට්ටම 65% - 70% අතර ප්‍රමාණයක් වේ. රූපවාහිනිය වැනි ප්‍රබල ජනමාධ්‍යන් තවමත් ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්තව නොපවතින නිසා සහ මෙම මාධ්‍යය දීපව්‍යාප්තව ස්ථාවර වනතුරු පුද්ගලාන්තර සන්නිවේදනය හා කණ්ඩායම් සන්නිවේදනය පදනම් කරගත් රැස්වීම්, සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු අදියට මෙන් ම ගැමි නාට්‍ය ක්‍රමෝපායන්ටද ප්‍රධාන තැනක් දිය යුතු වේ. මෙවැනි සන්නිවේදන උපක්‍රම මගින් පැහැදිලිව පොදු ජනතාවට සමීප වීමට අවස්ථාව සලසා ගත හැකිය.

සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදියේදී සජීවි ලෙස ග්‍රාහක ප්‍රතිචාර ලබාගත හැකි අතර ඒ ඔස්සේ ජනතා අපේක්ෂා හඳුනාගත හැකිවා පමණක් නොව ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා මහජන සහභාගිත්වය මැනවින් ලබාගත හැකි වේ. සංවර්ධනය සඳහා සහභාගිත්වය අත්‍යවශ්‍ය සාධකයක් වන අතර මෙනිසාම සහභාගිත්ව සංකල්පය නමින් සංකල්පයක් ද බිහි වී ඇත.

ලෝකයේ බොහෝ දියුණු රටවල ප්‍රාදේශීය ජනමාධ්‍ය ආයතන බහුලව දකගත හැකිය. මෙනිසා විවිධ සාධක මත ප්‍රාදේශීය වශයෙන් ඇති වෙනස්කම් හඳුනාගත ප්‍රාදේශීය මට්ටමින් ජනතාවට වඩාත් සමීප වීමට හැකි තත්වයක් ප්‍රාදේශීය ජනමාධ්‍ය ආයතන මගින් උදාකර ගත හැකි ය. එපමණක් නොව සමස්ත ජනතාව යම් තිසි දිනක ජාතික තලයට ගැනෙන ඒකාග්‍රතාවක් ගොඩනගා ගැනීමටද එතුළින් හැකියාවක් ලබාගත හැකිය.


කෙසේ වුවද ශ්‍රී ලංකාව තුළ දනට පවතින මාධ්‍ය භාවිතය අනුව 21 සියවස දක්වා ශ්‍රී ලංකාව ගමන්කරවීමේ දී මේ සියළු සාධක හඳුනාගෙන වඩාත් උචිත සංවර්ධන සන්නිවේදන ආකෘතියක් නිර්මාණය කළ යුතු වේ.

**කථිකාචාර්ය මායා තිලකරත්න**

1965 | 1970 | 1975 | 1980 | 1985 | 1990 | 1995 | 2000 | 2005 | 2010

මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට විශාල ග්‍රන්ථ සංඛ්‍යාවක් දායක කොට ඇත. ඒ අතර සන්නිවේදන ශබ්දාකරය අතිශයින්ම වැදගත්ය. ඔහුගේ ග්‍රන්ථකරණය අගය කිරීම උදෙසා මෙම විශේෂාංගය වෙන්වේ.

මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් "සන්නිවේදකයා" උදෙසාම ලියන ලද විශේෂ ලිපියක්ද මේ සමග වේ.



# මාධ්‍ය ඉසිවරයෙකුගේ

# “මාධ්‍ය සංස්කෘතිය” සංස්කෘතියක් ගොඩ නගමු” සංස්කෘතිය විනාශ කරන්නට ඉඩ නොදෙනු”

මේ අපට ඇසෙන ප්‍රකාශන දෙක තුනක්. ඒවායින් කියැවෙන්නේ එක්කෝ දනට නැති දෙයක් අලුතින් ගොඩ නැගීමක්ද? එහෙමත් නැත්නම් දනට ඇති දෙයක් විනාශ වෙන්නට ඉඩ නොතැබීමක්ද? කෙසේ වෙතත් මාධ්‍ය සංස්කෘතිය කියන්නේ ඉංග්‍රීසියෙන් මීඩියා කල්චර් (Media Culture) යන්න ඔස්සේ සිංහලට ගලා ආ යෙදුමක් වශයෙන් සලකන්න පුළුවන්.

මීඩියා කල්චර් හෙවත් මාධ්‍ය සංස්කෘතිය මුලින්ම භාවිතයට ආවේ සම්මත සමාජ විද්‍යාවේ ඉම පුළුල් වී මාධ්‍ය සමාජ විද්‍යාව හෙවත් මීඩියා සෝෂියොලොජි (Media Sociology) යන විෂය ශාඛාව ප්‍රචලිතවීමත් සමග බව පෙනෙනවා. මේ සම්බන්ධව වඩාත් ප්‍රබල ලේඛනය ලෙස මට පෙනෙන්නේ වොරන් කේ ඇගී (Waren K. Agee) පිලිප් එච් ඕල්ට් (Phillip H. Ault) සහ එඩ්වින් එමරි (Edwin Emery) විසින් 1986 දී සම්පාදනය කරන ලද මේන් කරන්ට්ස් ඉන් මාස් කමියුනිකේෂන් (Main Currunts in Mass Commnuications) නමැති සන්නිවේදන ලිපි සංග්‍රහයට ඇතුළු වන ද මීඩියා රෝල් ඉන් සොසයිටි (The Media role in Society) යන ඒකකයට අයත් හැඳින්වීමෙනුයි. එහිලා සමාජය හා මාධ්‍යය අතර බැඳී පවතින සන්නිවේදන සාධක 8 ක් නිසා මාධ්‍ය සංස්කෘතිය යන්න නවරේදයි වටහා ගන්නට පුළුවන් වෙනවා. එම සාධක 8 මාධ්‍ය කෙරෙහි ඇති වන අයහපත් බලපෑම් ලෙස දක්වා තිබෙනවා.

01. ඉන්ඇකියුරසීස් (Inaccuracies) යනු වැරදි සහගත හෝ සත්‍යය නොවූ යන්නයි. ඇකියුරේට් යන්නෙහි අර්ථය නම් යමක් නිවරදි ලෙස ඉටු කිරීමයි. මාධ්‍ය ලෝකයක අසත්‍යය හා වැරදි සහගත සන්දේශ මඟින් ඊට හසුවන ග්‍රාහකයා නොමඟ යවන බව අමුතුවෙන් කිව යුතු නැහැ. එබඳු තත්ත්වයක් ඇති වූ විට මාධ්‍යයකින් ඊට හසුවන සංස්කෘතියට වැරදි වැටහීම් ඇතිවීම ස්වාභාවිකයි. මාධ්‍ය මෙහෙයවන්නන්ට ජෝසප් පුලිට්සර් (Joseph Pulitzer) හඬ නගා නොවරක්ම කීවේ නිවරදි වන්න! නිවරදි වන්න! නිවරදි වන්න! (Auuracy! Auuracy! Auuracy!) යනුවෙන් පුලිට්සර්ට එසේ කීමට උවමනා කළේ මාධ්‍යය තියමුවන් අතින් නිවරදි සංදේශ ගොඩනැගුණු විට නිවරදි යහපත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩ නැගෙන නිසයි.

02. මෙය හැඳින්වී ඇත්තේ ඇරෝගන්ස් (Aerogance) යනුවෙන් ඉන් අදහස් කරන්නේ ද්වේෂය හෝ අහංකාරය යන්නයි. මාධ්‍ය මෙහෙවන්නන් හෙවත් මාධ්‍ය කරුවන් මානාධික පුද්ගලයන් බවට පත් වීමෙන් සංස්කෘතියකට සිදුවිය හැකි අනර්ථය අපමණයි. ඉන් සිදුවන එක් හානියක් නම් තමන් පක්ෂපාතී වන පිටුපෙම තම වරද පිළිගැනීමට මැලි වීමයි. ප්‍රජාතාන්ත්‍රික සමාජයකදී මෙම ආකල්පය අතිශය දුෂ්ට ප්‍රතිඵල ගෙන දෙනු වලක්වන්නටද අපහසුයි. එවිට කිසියම් වරදක් උවමනාවෙන්ම කොට එය නොපිළිගැනීමට තරම් අහංකාර වී මාධ්‍යයක් මෙහෙයවනු දක ගැනීමට පුළුවන්. එබඳු අහංකාර තත්ත්වයක් වලක්වා ගැනීමට පුළුවන් නම් මාධ්‍යයකින් ඇති කරන බලපෑම් සංස්කෘතියක පැවැත්මට හිතකර වන්නටත් පුළුවන්.

03. අන්ෆෙයානස් (Unfairness) යනුවෙන් ඉංග්‍රීසියෙන් කියැවෙන්නේ "වටින්නේ නැහැ", "හරි නැහැ" යන අර්ථ දෙන යෙදුමක්. නිවරදි දිවි පෙවතක් ගත කරන කෙනෙකුගේ ඒ දිවි පෙවතට මාධ්‍යයක් හානි පමුණුවනවා නම් එය සංස්කෘතියකටම එල්ල කෙරුණු තර්ජනයක් ලෙස සලකන්නට පුළුවන්. එය එක්කෝ සමාජ නියෝජනයකට එල්ල කෙරෙන තර්ජනයක් වෙන්නට පුළුවන්. නැතහොත් සමස්ත සමාජයටම එල්ල කරන තර්ජනයක් වෙන්නටත් පුළුවන්. මේ අතර තුටුවමනා ලෙස බොල් වීරයකුගේ ප්‍රතිරූපයක් උවමනාවට වඩා ඉහළ



සංස්කෘතියේ දුර බැලීම.

# සුනන්ද මහේන්ද්‍රයන්ගේ සන්නිවේදන ග්‍රන්ථකරණය





## ජීවන දායාද

ලොව එළිය කළ දක්ෂ පුද්ගලයින්ගේ අත්දැකීම්, ජීවන සිදුවීම් පිළිබඳ දුර්ලභ සටහන් එකතුවක්.

## නිර්මාණාත්මක සන්නිවේදනය


ශ්‍රව්‍ය දෘශ්‍ය හා ලිඛිත සන්නිවේදනය ප්‍රබලව හා නිර්මාණශීලීව යොදාගැනීම සඳහා යෙදුණු පුරෝගාමී ප්‍රයත්නයකි.




## Key terms in Culture and Communication

දේශීය සංස්කෘතික මූලාශ්‍රයන් සන්නිවේදනාත්මක ... ගැදැරීම හා ජාත්‍යන්තර ප්‍රජාව වෙත ඔලයා... සැලැස්වීම.




## සන්නිවේදනයේ ස්වභාවය සහ අරමුණු

සන්නිවේදන නිර්වචන සංකල්ප, පුද්ගලාන්තර සන්නිවේදනය, මාධ්‍ය භාවිතය, වාණිජ ප්‍රචාරණය ආදිය ගැන ලියැවුණ විෂය ග්‍රන්ථයක්.

කොට දක්වා සැබෑ චරිතයකුගේ ප්‍රතිරූපයක් බිඳ වැටීමට සැලැස්වීමද මාධ්‍යයකින් සංස්කෘතියකට එල්ල කරන ප්‍රහාරයක් ලෙස සලකන්නට පුළුවන්. කෙනෙකුට බලෙන් වැඳුම් පිදුම් කිරීමට හෝ සත්කාර සම්මාන කිරීමට හෝ සැලැස්වීම මාධ්‍ය මෙහෙයවීමේ සැබෑ මෙහෙවරක් වන්නේ නෑ. එබැවින් නොකල යුත්තක් නුවුවමනා ලෙස කිරීම නොවටිනා මාධ්‍ය ක්‍රියාවක් ලෙස පෙන්වා දී තිබෙනවා.

04. ඩිස්රිගාඩ් ඔෆ් ප්‍රිවසි (Disregard of Privacy) යනුවෙන් අදහස් කරන්නේ පෞද්ගලිකත්වයට නොසැලකීම යනුවෙන් අදහස් කරන්නේ පෞද්ගලිකත්වයට නොසැලකීම යන්නයි. ජන සමූහයකගේ පැවැත්ම රැදී පවතින ප්‍රධානතම සාධකයක් ලෙස සැලකෙන්නේ ඒ සමූහයේ පෞද්ගලිකත්වය ආරක්ෂා වීමයි. පෞද්ගලික ජීවිතයකට මාධ්‍යයකින් එල්ල වන සාධක විවේක අපහාසය, ද්වේශය වැනි තත්ත්වයන් බවට පත් වෙනවා. අපට නිදහසේ ජීවත් වීමට ඇති අයිතිය පසුදු කරන හැම සාධකයක්ම ඉවත් කිරීමට සිදුවී තිබෙනවා. මාධ්‍යයක් කෙනෙකුගේ ජීවිතයේ පෞද්ගලිකත්වයට බාධා කරන්නේ කෙසේදැයි අහන්නට ඉඩ තිබෙනවා.

"මට මගේ පාඩුවේ ඉන්න දෙන්න" යයි කියමනක් බිහිවී තිබෙන්නේ මක් නිසාදැයි සිහිකිරීම වැදගත් වෙනවා. "හැම දේකටම වඩා මම මගේ පෞද්ගලික ජීවිතය අගේ කරනවා" යැයි කෙනෙක් කියන්නට පුළුවන්. "මගේ ඡායාරූප මට උවමනා නැති විදියට ගන්න එපා", "මම නොකී දේ මා කී ආකාරයකින් පළ කරන්න එපා" යනාදී වශයෙන් සමාජයක ජීවත් වන පිරිස් නියෝජනය කරන්නන් කියනු අපට ඇසෙනවා. එහෙත් සැබවින්ම කෙනෙකුට පරම වශයෙන් තමන්ගේ පාඩුවේ ජීවත් වන්නට පුළුවන්ද? මෙය වඩාත් හොඳට තර්කානුකූලව ඇසුවේ සොක්‍රටීස්.

"මගේ පාඩුවේ මම මගේ වැඩක් බලාගෙන හිටියානම් මට මේ දඬුවම ලැබෙන්නේ නෑ" යි සොක්‍රටීස් කී බව ඔහුගේ ගෝලයා වන ප්ලේටෝ අපට මතක්කර දෙනවා.

මාධ්‍ය සම්බන්ධයෙන් නම් ඊටත් වඩා වෙනස් මුහුණුවරක් මෙම පෞද්ගලිකත්වය යන්නෙන් විවරණය කරන්නට වෙනවා. මාධ්‍යකරුවන් සදාචාරයට පටහැනි ලෙසින් අත්තනෝමතික ලෙස පුද්ගලයෙකුගේ පෞද්ගලිකත්වයට හානි පමුණුවන අවස්ථා කොතෙකුත් දකගන්න පුළුවන්.

ඒවා විවරණය කළ යුත්තේ මාධ්‍ය මඟින් පෞද්ගලිකත්වයට සිදුවන හානි වශයෙනුයි. මාධ්‍යයක් මඟින් පුද්ගලයෙකුගේ ජීවිතය නුවුවමනා අයුරකින් හෙළි කරන්නට පුළුවනැයි අදහසක් ප්‍රචලිතව පවතිනවා. කිසියම් සමාජ සිද්ධියක මානුෂික පැත්ත විමර්ශනය කරනු වෙනුවට එහි සන්ත්‍රාසය ඉස්මතු කර පෙන්වීමද මීටම සමාන විපතකට පත්වුවකු පිළිබඳ කතාව විදහන්








## සිත්තරාගේ පුතුයා

පැරණි කතන්දර කලාවට යම්ප
ගවේෂණශීලී කෙටිකතා එකතුවක්.
නිර්මාණාත්මක උත්සාහයක්.




## කැලේ මහත්වරු

අප්‍රිකාවේ ජනකතාවකට නව අර්ථකථනයක්. අප්‍රිකාවේ ජන නායක ජෝමෝ කිනියාටා විසින් ලියන ලද Gentlemen of the Jungle කතාවේ පරිවර්තනය.




## සන්නිවේදන ශබ්දකරය

සන්නිවේදන විෂය ඉම
පුළුල් කිරීම හා
ස්ථිර කිරීම සඳහා වන
මහා කාර්යයක්.
සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයේ
පුරෝගාමී කාර්යයක්.

## ජනමාධ්‍යයේ නැගීම

ලෝක ජනමාධ්‍ය ඉතිහාසයේ
වැදගත් සන්ධිස්ථාන පිළිබඳ
විමර්ශනයක් - තුන්වන මුද්‍රණය.

පිළිබඳ මානුෂික කතාවකට වඩා බොව්යන රස ගැනීම සඳහා ලියැවෙන කියැවෙන මාධ්‍ය කතාවක් බවට පත්වෙන අවස්ථාද දකගන්නට පුළුවන.

05. ඉන්සෙන්සිටිවිටි (Insensitivity) යනු සූක්ෂ්මාත්මකභාව හෙවත් සංවේදීබවින් ඈත්වීමයි. ජනමාධ්‍යකරුවකු තමන් හමුව ඇති සංස්කෘතික සාධක 4ක් වන ජාතිය, වර්ණය, ලිංගිකත්වය සහ ආගම (Race, Colour, Sex, Religion) දෙස බලන්නේ කෙබඳු ආකල්පයක පිහිටාද? ඒවා ප්‍රාථමික සංස්කෘතික සාධක වශයෙන් නොසලකා අපහාසාත්මක ලෙස බලන්නට හුරු කළහොත් එම මාධ්‍යයෙන් බිහි වන්නේ අයහපත් මාධ්‍ය සංස්කෘතියක්. එක් දේශ සීමාවක ජීවත් වන විවිධ ජාතීන් අතර පවතින සංස්කෘතික ලක්ෂණ නොහැඳින එක් සංස්කෘතියක් අනෙක් සංස්කෘතියට වඩා සුපෙරහැවියක් ඇති බව හුවා දක්වීම අයහපත් ප්‍රතිඵල ගෙන දෙනවා නිසැකයි.

මාධ්‍යකරුවන්ගේ කාර්යභාරයේදී අන්තර් සංස්කෘතික අවබෝධය ඇති කිරීම සඳහා ඔවුන්ට නිවැරදි දැක්මක් ලබාදීමට සිදු වෙනවා. සුදු ජාතිකයන් සහ කළු ජාතිකයන් එකට ජීවත් වන සමාජයකදී ඔවුන් අතර පවතින ජාති භේද වර්ණ භේද තුරන් කිරීමට මාධ්‍ය සංස්කෘතියක් ගොඩ නඟන්නට පුළුවන් විය යුතුයි.

06. ජන සමූහයකට අපහාසයක් ඇති කිරීම හැඳින්වෙන්නේ කොන්ටෙම්ට් ෆො ද කොමියුනිටි (Contempt for the Community) යනුවෙන්. ජන මාධ්‍යයක් මෙහෙයවීමේදී ඊට හසුවන ග්‍රාහක ලෝකයට නින්දා අපහාස අත්වන්නේ කවර කාරණා නිසාද? එක් නිදසුනක් දක්වහොත් දෙමළ මිනිසෙකු සිංහල කතා කරන හැටි අපහාසාත්මක හා හාස්‍යජනක ලෙස මවා පෑම සිංහල ජනයාට අපහාසයක් නොවුනත් දෙමළ ජනයාට අපහාසයක් වන්නට පුළුවන්. එහි විකල්ප අවස්ථාවක් ඒ හා සමානයි. දෙමළ මිනිසුන් සිංහල කතා කරන්නේ වැරදිවා නම් මාධ්‍ය සංස්කෘතියකින් කළ හැක්කේ එය නිවැරදි කිරීමක්. පෙරදිග වෙසෙන අප කිසිවෙකුට සුද්දන් වාගේ ඉංග්‍රීසි උච්චාරණය කරන්නට පුළුවන්කමක් නැහැ. එසේ කිරීම අප සලකන්නේ අනුකරණයක් වශයෙනුයි. එහෙත් ඉංග්‍රීසි කතා කරන අපට සුදු ජාතිකයන් සිනාසුනොත් අපට ඇතිවන්නේ වේදනාවක් නොවේද? අප කාලයක් යටත් විජිත යුගයක පසුවූ නිසා අප පාලනය කළ සුදු ජාතිකයන්ට සිනා නොවන බව සැබෑය. ඒ වෙනුවට සුදු ජාතිකයන් වගේ ලෙස අනුගමනය කිරීමේ "සිරිතක්" ගොඩ නැගී ඇති බව පෙනී යනවා. මාධ්‍ය සංස්කෘතියක් මෙම අනුකරණාත්මක තත්ත්වයට වැටුණොත් සිදුවන්නේ විපත්තියක්.

07. අනුරු හෝ අනාමිකයා නන්නාඳුනන්නා හුවමිනා ලෙස උස් කොට දක්වීම ජනමාධ්‍ය විචාරකයන් හඳුන්වන්නේ ග්ලෝරිෆිකේෂන් ඕෆ් ද අන්නෝන් (Glorification of the unu-

## ග්‍රන්ථකරණයේ වගතුග .....



### ශාස්ත්‍රීය

සන්නිවේදන ක්ෂේත්‍රය සහ ජනසන්නිවේදනය
ජනමාධ්‍යයේ නැගීම
සන්නිවේදන ගවේෂණ
සන්නිවේදන විචාර ප්‍රතිචාර
ජන කතා ලෝකය
කඩෑ ලොවින් බිඳක්
ජනශ්‍රැතිය සහ පෝලන්ත ජනකතා
ශබ්ද මාධ්‍යය සහ ශ්‍රී ලංකාවේගුවන් විදුලිය
සන්නිවේදන ශබ්දාකරය
නිර්මාණාත්මක සන්නිවේදනය
ජීවන දායාද
සිංහල කවි සහන්දර
ජනමිතක පොතින්
පුවක් මල් කුමාරි
හිරෝෂිමා කතාව සහ පරමාණු බෝම්බය
ජනශ්‍රැතිය සහ නිර්මාණය
ජාතක කතා සම්ප්‍රදාය
ඩබ්ලිව්. ඒ. සිල්වාගේ අප්‍රකට කෙටි නිර්මාණ සහ සන්නිවේදන සටහන්
කතාකවය
ගුවන්විදුලි නාට්‍ය හතක්
සිංහල සහරා ඉතිහාසයේ සන්නිවේදන දායාද
නාට්‍ය කලාව හා හැම්ලට්
සන්නිවේදන ස්වභාවය හා අරමුණු
ඉමාක් බංශවීක් සිංගර් (ඔහු හා ඔහුගේ නිර්මාණ)
ආර්. කේ. නාරායන් (ඔහු හා ඔහුගේ නිර්මාණ)
සිංහල ජනකවි සඳහා ප්‍රවේශය
ගම්පෙරළිය: නිර්මාණාත්මක රසවිඳීම හා කතා කලාව
කතාවෙන් කතාව
සක් රටවල ජන කතන්දර
ඔහුගේ ලෝකය හා තවත් ගුවන්විදුලි නාටක
ඉලංගරත්න නම්වූ නිර්මාණ ශිල්පියා සහ දේශපාලකයා
පිලිප් ගුණවර්ධන කොයා යැම

Miracle Makers
Memory and Message
Man and Myth
Parables of Buddha
Key terms in Culture and Communication

### නිර්මාණ

| | |
|---|---|
| කොකුචිත් | ගැහැනියක් |
| ඔහුගේ ලෝකය | ගුවන් විදුලි නාට්‍ය හතක් |
| වෙනකාවී සන්ධානව | ඉසිවරයාගේ ගමන |
| නුවනක්කාර සවටයා | උණු අළුපල |
| එහෙර මෙහෙර කුරුලු | රවුරු වලල්ල |
| ගෙවනැලි අඳ මිනිස්සු | ගුරුවරයකුගේ කතාව |
| එය මෙසේ සිදුවිය | වාල්මිකී ඔබට කිව්වේ සීතා |
| ඉරබෝරය | සරලෙකුගේ ගීතය |
| කාල රෑ කුලු හඬා ඇදුනා | බිරිඳ සහ බිඳුරිය |
| හෙට සුන්දර දවසකි | රතු ලන්තෑරුම |
| ජන හතුරා (පරිවර්තන) | සිත්තරාගේ පුතුනා |
| උඩගෙදර මහත්මියගේ වස්තුව | එහෙර මෙහෙර කුරුලු |
| හිතමිතුරෝ (පරිවර්තන) | කොතුරු වැස්ස |
| රාජද්‍රෝහියකුගේ කතාවක් | වඩ සඳවුරක සිට |

### ළමා

| | |
|---|---|
| ඇත්ගාලේ ගැටවරයා | දිය කිඳුරිය |
| අසිරිමත් සොහොන | කුඩා වඩුරාළ |
| නිල් වෙරළ | වලේ වැටුණු පිරිස සහ වෙනත් කතා |
| මුහුණු දෙක | කෝකිලාව සහ තවත් කතා |
| නිකං හොසිට් දරුවෝ | කැගල් මහත්තුරු |
| ඇතාගේ බර | Varuna and the mango |
| කර්රැක | The Wonderful Charm |
| බුදුන් දුටු දැරිය | |
| පියපුතු උරුමය | |

sual) යන සංකල්පයෙන් විටෙක අපට අපුරු නොවූ කිසියම් සිද්ධියක් හෝ චර්යාවක් ජන මාධ්‍ය කරුවෙකුගේ ආකල්පයෙන් තුවුමනා ලෙස පුම්බා තැබීමට උවමනා වන බව පෙනෙන්නට තිබෙනවා. පුවත් ලෝකයේදී මෙය වඩාත් කැපී පෙනෙන සාධකයක් අපට නොවැදගත් වන චරිතයක් හෝ සිද්ධියක් හෝ අතිශයෝක්තියට නැංවීම එහි එක් පැත්තක්. අනෙක් පැත්ත නම් ව්‍යාජ තොරතුරකින් අප රවටා තැබීමයි. සැබෑ තොරතුරු සොයා ගැනීමට අපහසු වූ අවස්ථාවලදී මෙසේ ව්‍යාජ තොරතුරු අපූර්වත්වයට නැංවීම ග්‍රාහක සිත මත් කිරීමක් වශයෙන්ද සලකන්නට පුළුවන.

08. සාවද්‍ය ලේඛනය හා සංස්කරණය හැඳින්වෙන්නේ බැඩ් රයිටින් ඇන්ඩ් එඩිටින් (Bad Writing and Editing) යනුවෙන්. ශික්ෂණයක් ලැබූ ජනමාධ්‍යකරුවකු තම බස හැසිරවීම කෙරෙහි දැඩි උනන්දුවක් දක්වනවා. එය ප්‍රාථමික අවශ්‍යතාවක් වුනත් තම විෂයට අදාල ගුණාංගයක් ලෙස සකස් කර ගන්නවා. සාවද්‍ය ලේඛනය හැම විටෙකම ග්‍රාහකයා අතරමං කරන බව අපට පෙනෙනවා. මෙහිදී වැරදි සහගත සංස්කරණය යනුද ඊටම බද්ධ වූ තත්ත්වයක්. මැනවින් සංස්කරණය කරනු ලැබූ ජනමාධ්‍ය සංදේශ හැමවිටෙකම අර්ථවත් අත්දැකීමක් හා වෙහෙසකර නොවූ ඇල්මක් ලබා කර දෙනවා.

ඉහතින් දක්වන ලද කරුණු 8 විවරණය කරමින් එඩ්වින් එමරි කියා සිටින්නේ ඒ හැම සාධකයකින්ම ග්‍රාහක සංස්කෘතියක් අවබෝධ කර ගැනීමට මාධ්‍ය කරුවකුට හැකිවන බවයි. එබැවින් මාධ්‍ය සංස්කෘතිය යන්න ග්‍රාහක සංස්කෘතියේම සජීවි අංගයක්. ග්‍රාහක සංස්කෘතියට ආගන්තුක වූ මාධ්‍ය ව්‍යුහයකින් යහපත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩ නැගීම අපහසු වෙනවා. ග්‍රාහකයා නිතර අපේක්ෂා කරන්නේ තමන්ට සමීප වූ මාධ්‍ය ව්‍යුහයක් දක ගැනීමටයි. ව්‍යාජ වටපිටාවක් මවන, ඒ වටපිටාවේ නුවුවමනා සංත්‍රාස බිහුර ආගන්තුක සිද්ධි සමූහයක් ගොඩ නැගුණු විට එය ග්‍රාහක විශ්වාසය දිනාගැනීමට අපොහොසත් වන බලවේගයක් බව පෙන්නුම් කරනවා. රාජ්‍ය තන්ත්‍රයකට අවශ්‍ය පරිදි අධිපතිවාදී සන්නිවේදන රටාවකින්ද මෙම අහිතකර මාධ්‍ය සංස්කෘතිය ගොඩ නගන්නට පුළුවන්.

(මේ සටහන සම්පාදනයේදී "මාධ්‍ය සංස්කෘතිය" පිළිබඳ එඩ්වින් එමරි (Edwin Emery) ගේ පුරෝගාමී මත සමුදායක් ඇසුරු කිරීමට සිදුවිය)

මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

## සමාජ විද්‍යාත්මකව ආදරය කිරීම ......



# නෑත ලොවේ අන් රසඳුනා ආදරය සේ සුවදෙනා

මානව සමාජයේ පැවැත්ම ආදරය මත තීරණය වී ඇතැයි යමෙකුට සිතුනහොත් එය නිවැරදිය. ඒ තරමට ආදරය මිනිසාට හා ඔහුගේ සමාජයට වැදගත් වී ඇත. එය මිනිසාට පමණක් නොව සෙසු සත්ත්වයින්ට ද පොදු වූවකි. මිනිසාගේ ආදරය විවිධය. එහි සීමා සහ ප්‍රමාණයන් වෙනස්ය. ඒ ඒ පුද්ගලයාට අනුව ඔහුගේ හෝ ඇයගේ ස්වභාවය මත එය වෙනස් වේ. මේ තුමන ස්වරූපයක් ගනු ලැබුවද මිනිසාගේ ආදරය විවාහය, පවුල සහ ලිංගිකත්වය තරම් සංකීර්ණ මෙන්ම විවිධ විද්වතුන්ගේ අවධානයට ලක්වූ වෙනත් සම්බන්ධතා ජාලයක් නොමැත්තේය.

තියඩෝර් කෙම්පර් (Theodore Kemper) පෙන්වා දෙන අන්දමට අප වටා සිටින පුද්ගලයින් කොටස් දෙකකට බෙදා දක්විය හැකිය. එනම් "අපි කැමති අය" සහ "අපි ආදරය කරන අය" යනුවෙනි. අපි කැමති අය යනුවෙන් අදහස් කරන්නේ අපගේ එදිනෙදා ජීවිතයට බොහෝ ද සපයන්නාවූ පුද්ගලයින්ය. අපි ආදරය කරන්නාවූ අය යනුවෙන් අදහස් කරන්නේ බෙහෙවින් ශක්තිමත් අනුරාගී හැඟීම් ඇති කරන්නාවූ පුද්ගලයින්ය. අප ඔවුන් ලෝකයේ ඇති වඩාත් වටිනාම දේ ලෙස සලකයි. අප කැමති අය සම්බන්ධයෙන් ඇත්තේ ප්‍රිය මනාප හැඟීමකි. ආදරය පවතින්නේ ඊට වෙනස් වූ මානයකි. එයට ප්‍රිය මනාප වීම සැම විටම අවශ්‍ය නොවේ. එය බොහෝ සෙයින් හැඟීම්බර තත්ත්වයකි. එය බොහෝ විට වෙනස් විය හැකි සහ වඩා උච්චතම තත්ත්වයකට පත්විය හැකි හැඟීමකි. අපට අවශ්‍ය නම් ආදරය කරන්නාට සමීප වේ. එසේ නොමැති නම් කෙසේවත් එවැන්නක් සිදු නොවේ. ආදරය පිළිබඳව අදහස් දක්වන ඇලන් කර්ක්හොෆ් සහ කීත් ඩේවිස් (Alan Kerckhoff and Keith Davis) නම් සමාජ විද්‍යාඥයින් තම ප්‍රගංසාත්මක අවශ්‍යතා පිළිබඳ න්‍යායන් ආදරය පෙරහනයකට (Filter) සම්බන්ධ කරයි. මාස හයකට පෙර ආදරෙන් බැඳුනු ජෝඩු අධ්‍යයනය කළ ඔවුන් දෙදෙනා යමෙක් විවාහ වීමට පෙර ආදරයේ අදියර තුනක් පසු කරන්නේ යැයි පෙන්වා දී ඇත. එනම්,

1. පුද්ගලයින් තම කායික, සමාජීය සහ සංස්කෘතික සමානාත්වයන් මත එකට සම්බන්ධ වන අවධිය.
2. පුද්ගලයින් එකිනෙකාට සමීප වෙමින් තම අදහස් එකිනෙක පෑහෙන්නේදැයි සොයා බලන අවධිය. මෙය "අගය එකඟතුව" (Value Consensus) ලෙසද හැඳින්විය හැකිය.
3. පුද්ගලයින්ගේ අවශ්‍යතා, අදහස් එකිනෙක පෑහෙමින් ආදරය තහවුරු කර ගන්නා අවධිය. මෙය අවශ්‍යතා ප්‍රශංසාත්මකව ඉටු කර ගත් අවධිය ලෙසද හැඳින්විය හැකිය.

මෙම අවධි තුන පසු කිරීමට ආදරය කරන්නන් හට සැලකිය යුතු කාලයක් ගත වේ. එහෙත් එය අනවශ්‍ය ක්‍රියාවලියක් ලෙස හැඳින්විය හැකිය. පළමු හෝ දෙවන අවධි පසු කරමින් සිටින විට තම ආදරය විවාහය වැනි ජීවිතයේ වැදගත් සම්බන්ධයක් පිළිබඳව තීරණයක් ගැනීමට සිදු වුව හොත් එය පවුල් ජීවිතයේ සාර්ථකත්වයට බාධාවක් විය හැකිය. මේ අනුව නියමිත අවධි තුන ඔස්සේ යමින් විරුද්ධ ලිංගිකයා ආකර්ෂණය කර ගැනීමට (Opposites Attract) ක්‍රියා කිරීම ආදරයක පැවැත්මට වැදගත් වන්නේ යැයි ඉහත පෙරහන න්‍යායෙන් පෙන්වා දිය හැකිය.



පිරිමියා වඩාත් ලෞකික මෙන්ම සැම දෙයකටම දොස් දකින්නෙකි. ගැහැණිය බොහෝවිට උත්තරීතර ආදරයක් අපේක්ෂා කරයි.

ආදරය පුද්ගල අන්තර් ක්‍රියාවේ සූක්ෂම ප්‍රතිඵලයක් සහ පූජා විධියක් (Love as a Ritual) ලෙසද හඳුන්වයි. එසේ කියන්නේ ප්‍රකට සමාජ විද්‍යාඥයෙකු වන රැන්ඩල් කොලින්ස්ය (Randall Collins). අප ඉතාමත් ඉහළ සමාජ තත්ත්වයකින් සහ පහළ විශ්වදේශ වාදයකින් (Cosmopolitanism) යුක්ත වන විට සමූහයේ සංකේත ඉදිරියේ පෙනී සිටිමින් එහි සාමාජිකයන් අතර ශක්තිමත් බැඳීමක් සහ අනුකලනයක් ගොඩ නගා ගනී. මෙසේ එකතු වීමෙන් එකිනෙකා අතර ගොඩ නැගෙන පොදු පිළිවෙත් අනුව සමාජ පූජාවිධියක් (Social Ritual) නිර්මාණය වේ. එහි සතර සඳහන් ලක්ෂණ අන්තර්ගතය. එනම්,

1. මුහුණට මුහුණ ලා ගොඩ නැගෙන අන්තර් ක්‍රියා
2. එකිනෙකාගේ අවධානය යොමු වන්නේ

පොදු අරමුණු හෝ ක්‍රියාකාරකම් දුලක්ෂ කර ගැනීම සඳහාය.

3. මෙදා හදා ගත් හැඟීම් සහ පූජා පිළිවෙත් ගොඩ නගා ගැනීම.
4. හැඟීම් මත පදනම් වූ සංකේත සහ ඉදිවූ අරමුණු ගොඩ නගා ගැනීම.

පසුවෙති. මෙම ලක්ෂණවලට අනුව ආදරය විග්‍රහ කර ගත යුතුය. ආදරවන්තයින් මුහුණට මුහුණ ලා අන්තර්ක්‍රියා (Face-to-Face Interaction) ගොඩ නගා ගනී. ඔවුන් එකතු වූ තැන අන් සියල්ල අමතක වී ඔවුන්ගේ ලෝකයක තනි වෙයි. ඔවුන් කවුරුන් හැකි තැනක තනි වීමට කැමතිය. ආදරවන්තයින් හට පොදු අරමුණු තිබේ. ඔවුන් එකිනෙකාගේ ආදරය ගැන කතා කරයි, ලිපි ලියයි, එකිනෙකා දෙස බලා සිටී, ස්පර්ශ කරයි, සියලු දුක් කම්කටොලු විඳ දරා ගනී, ඔවුනොවුන්ගේ ප්‍රතිපත්ති මත ක්‍රියා කරයි. ඒ අනුව ආදරය වැඩිම තීව්‍රතාවයක් ඇති පූජා විධිය ලෙස (The Most High - Intesity Ritual) හැඳින්විය හැකිය. සත්තකින්ම ආදරය යනු හැඟීමකි. එය මුහුණට මුහුණ ලා හමුවීමකින් හා එකිනෙකාගේ මෙදා ගත් උවමනාවන් නොමැතිව කිසිවිටක එහි සම්පූර්ණ බලයට නොපිවිසේ. එය කුමන අන්දමේ හැඟීමක්ද? එය ආශාව සහ උතුම් කොට සැලකීමකි. සමහර විට ආදරය අවබෝධය හා මිශ්‍ර වේ. ආදරයේ කායික ක්‍රියා කාරකම් වන සිප ගැනීම, සිර බැඳීම, ලිංගික සංසර්ගය වැනි ක්‍රියාද මේ ආකාර වේ. එහෙත් ලිංගික එකතුවීම ආදරයේ මූලික අංගයක් නොවේ. විවාහකයින්ට සමාජීය අවසරයක් ඇතිව..., ආදරයේ කොටුකාරයින් හට එය එසේ නොවිය යුතුය. නමුත් ලිංගික සංසර්ගය වනාහි ආදරය මෙදා ගැනීමේ සහ එකතුවීම යන හැඟීම ගොඩ නගා ගැනීම සඳහා උපකාරී වන්නකි. ආදරයට සංකේත තිබේ. ඉදිවූ අරමුණු තිබේ. හදවත, මුදු, තෑගි ආදිය ආදරයේ සංකේතයන්ය. මෙම සංකේතයන්ගෙන් තම ආදරයේ ප්‍රත්‍යක්ෂත්වය මතකයට නගයි. මෙවැනි ආදරයේ පූජා විධි ආදරවන්තයන් අතර ප්‍රජනීයත්වයක් වර්ධනය කරයි.

ආදරවන්තයින් තම ආරම්භක සම්බන්ධතාවලින් වඩාත් ගැඹුරින් පරමාදර්ශ ගොඩ නගා ගනු ලැබුවද පසු අවධියේදී වඩා යථාර්ථවාදී දෘෂ්ටියකට පිවිසේ. ඔවුනට ඇති වටම එකට කාලය ගත කල නොහැකි යයි තේරුම් ගන්නේ මෙවැනි දෘෂ්ටියකට පිවිසි විටය. ඉන් පසු ක්‍රමයෙන් සාමාන්‍ය ජීවිතයකට එකිනෙකා පිවිසේ. එසේම මෙහිදී ඇති වන ප්‍රශ්නය වන්නේ වඩාත් ආදරය කරන්නේ පිරිමියාද? ගැහැණියද? යන්න සඳහා ගැනීමයි. සාමාන්‍යයෙන් අපි ආදරය ගැන සිතන්නේ ගැහැණියගේ පැත්තෙන්ය. පිරිමියා වඩාත් ලෝකික මෙන්ම ඇති දෙයක් දෙස දකින්නෙකි. ගැහැණිය බොහෝ විට උත්කර්ෂවත් ආදරයක් අපේක්ෂා කරයි. නමුත් සාක්ෂි තුළින් පෙනී යන්නේ පිරිමියා ගැහැණියට වඩා ප්‍රේමනීය ආදරයෙන් පලා යන බවයි. ආදරයට පිවිසීමේදී ද ගැහැණියට වඩා පිරිමියා ප්‍රේමනීය. පළමු දැකීම හෝ හමුවීමේදීම ආදරයක් අපේක්ෂා කරන පිරිමි ප්‍රතිශතය 66% කි. එහෙත් පළමු හමුවීමේදීම ආදරයක් අපේක්ෂා කරන ගැහැණුන්ගේ ප්‍රතිශතය 57% කි. මෙයින් පැහැදිලි වන්නේ ස්ත්‍රිය සහ පිරිමියා ආදරය සම්බන්ධයෙන් යම් අපේක්ෂාවන්ගෙන් යුක්ත බවයි. එය ඇති සමාජයකටම පොදු ලක්ෂණයකි.

**කථිකාචාර්ය ජේ. කරුණාතිලක**

# මීයා සීහ

අ (Internet) යනු විද්‍යුත් සම්බන්ධතා ජාලයකි. දැල් රටාවකි. එමගින් ලොව පුරා පරිගණක එකිනෙකට සම්බන්ධ කරනු ලබයි. මේ මහා සන්නිවේදන ජාලයේ ඇතිවීම සිදු වූයේ මෙම 19 වන සියවසේ වේගයෙන් වෙනස්වන ලෝකයේ තවත් වෙනස්කමක ඉදිරි පිම්මක් වශයෙනි.

මේ පරිගණක ජාලයේ සම්බන්ධය ඉතා පුළුල්ය. එය භාවිතයට ගැනීම ද රටින් රටට වෙනස් වේ. විශේෂයෙන් අප රටවලට වඩා බොහෝ විශයෙන් වෙනස් ආකාරයට දියුණු රටවල එහි යථා ස්වභාවය දකිය හැකියි. සාමාජීය වශයෙන් තවමත් එහි බලපෑම අපේ රටවල් තද බල ලෙස ආක්‍රමණය කර නැත. ඒ නමුත් ජපානය වැනි රටවල අද මේ පිළිබඳ නව විචාර සංකල්ප, පරීක්ෂණ, සඳහා සමාජය තුළින්ම දොරටු විවර වී තිබේ.

අන්තර් ජාලා හි සිහිවීම අතින් ජපානය ඇමරිකානුවන්ට පසුගාමී වුවත් භාවිතය පුළුල් ස්වරූපයෙනි. 1995 වන විට රට තුළ එක්තරා කැළඹීමක් ඇති කරමින් "ඉන්ටර් නෙට්" යන වදන නොඇසෙන තැනක් හෝ නොඇසෙන දවසකින් තොරවන්නට විය. ජපානය පුරා එය භාවිතයට ගන්නා සංඛ්‍යාව මිලියන 03 දක්වා ඉහළ යාමේ අන්තර් ජාලයට සම්බන්ධ වීමේ පැසසුම් කරුවන් ගේ ද අවශ්‍ය වර්ධනයක් මේ ඉදිරි කාල පරිච්ඡේදය ඇතුළත පැහැදිලි ලෙස පෙන්නුම් කෙරුණි. 1995 ජපානයේ වසන්ත සමය වන විට සමාගම් 30 ක් පමණක් මේ සේවාව ලබා දී තිබුණත් දෙසැම්බර් අවසානය වන විට ප්‍රමාණය 150 දක්වා වැඩි විය.



වඩා වැදගත් වන්නේ අලෙවිය වැඩි වත් ම පරිගණක භාවිතා කරන්නන් ගේ හැකියාවන් ද ඉහළ යෑමයි. පරිගණක යන වදන මත්තේ අන්තර් ජාලය කෙරෙහි තද බල රුචියක් වර්ධනය වූ පිරිසක් ලෙස ජපන් ගැහැණියන් ඉදිරියෙන් සිටී. ඇත්ත වශයෙන්ම ඔවුන්ට පරිගණක ක්‍රියා කරවීම දුෂ්කර ව තිබුණේ ප්‍රායෝගිකව එය භාවිතයට නොදන්නා බැවිනි. එහෙත් එය සිදු නොවී...

ඔවුන් එදිනෙදා භාවිතයට හැකිවූ ...
ජපානයේ දක්නට හැකිය. ...
සාප්පු යෑමත්, පොත් කියවීමත් ...
දවසකට ද දරුවන් හා කාලය ගත කිරීම ...
සංචාරක තොරතුරුයක් වෙත් කර ...
අද ජපන් ගැහැණියන්ට ඇතුළත් ...

පොතක් වැදගත්ම කාරණය ...
අන්තර්ජාලා කැෆේ නම් කාලා (Internet Ca...
වලට ඇදී එන සංඛ්‍යාව ...
ප්‍රමාණාත්මක වර්ධනයකි. මේ ...
කාලවක දී ආහාර පාන ...
ලොව පුරා තොරතුරු ද ...
ජාලය මත්තේ අවසානය ...

# කෝපි කෝප්පය



අලුත් හැඟීම් ඇති ආකාරය මෙවැනි ආපන ශාලාවකදී දකින්නට හැකිය. මේ පිළිබඳ ඇති වූ උනන්දුව විශේෂයෙන් අනාගත ලෝකයේ ජීවිතයක් පිළිබඳ ආශාව මිනිසුන් තුළ ජනිත කරවන්නකි. මේ නිසා ම තව තවත් අන්තර්ජාල සම්බන්ධතා සහිත ආපන ශාලා ජපානය පුරා දකින්නට හැකිය.

ජපානයේ මෙම ආපනශාලාවකට ඇතුළු වීම ගාස්තු වශයෙන් යෙන් 2,000 අය කරන මුත් මෙහෙත් පුද්ගලයන්ට එය ගෙවීමත් නොහැකි තරමිය. මේ දෙවර්ගයට අමතරව තවත් "අන්තර්ජාල ආපන ශාලා" වර්ගයක් තිබේ. කෝපි පානය සඳහා වෙන් කළ ගාස්තු පහ කාර්යාල ආපන ශාලා තුළ තිබී ඒ තිබේ. නමුත් මෙවැනි පරිගණක පිළිබඳ දැනුමක් ඇතිවත් නොවන අය දෙයක් සම්බන්ධ කිරීමට වන අතර අර දී සමඟ. එනම් ඉතා දෙවර්ගය කලුවම් ප්‍රසිද්ධ ජාලයට සම්බන්ධ වීම ඉලක්ක වන මුත් මෙවැනි නිදහස ඇත්තේ ආහාර පාන මිලදී ගැනීම හා සම්බන්ධවයි. මෙවැනි කෝපි කෝප්පයක් සාමාන්‍ය මිළට බිව හැකිය. නමුත් මිනිත්තු 30 ට සම්බන්ධතාවයකට යෙන් 500 පමණක් අය කරයි. මෙම ආපන ශාලා ඉලක්ක වන්නේ තාක්ෂණ ප්‍රේමීන්ට නොව විදේශිකයන් හා ව්‍යාපාරිකයන් වෙතය. ටෝකියෝ නගරවල සිසුයෝ විවෘත වූ ඉන්ටර්නෙට් ආපන ශාලා වැඩි වේගයෙන් තුඩා නගරවල ද විවෘත වීම පටන් ගෙන තිබේ.

කෝපි පානය කරමින් ලොව වටා යැවීම මෙහෙත් මිනිස් මේ තුළට ගොස් වදිනු දකින හැකිය. අද ජපානය පුරාම අනු සියයෙන්නාගේ මෙන් කණ්ඩායම ව ඇතුළුවූ මේ වර්ගයේ ආපන ශාලා ප්‍රමාණය අති විශාල ය. මෙම අන්තර්ජාල ආපනශාලා ජපානයේ විවිධ වර්ගයන් දකින්නට තිබේ. මෙවැනිනක ඇති වටපිටාව හා එහි ගැවසෙන පිරිස පාරිභෝගිකයා තුළ යම් වෙනසක් ඇති කිරීමට සමත් ලෙසටවලින් සකස්වී ඇත.

1995 නොවැම්බරයේ දී සර්දු තුවසයාතාගේ හි මේ වර්ගයේ The Cybernet Cafe ආපන ශාලාවක් ආරම්භ කරන ලදී. මේ මෙහෙයුම් ව්‍යාපාරයේ දී පරිගණක ය හා අන්තර් ජාලයට තුරුලුවූ විවෘ පවිත්‍රයන්ට නොදින් ඉඩ හැලෙන්. ඉලක්ක පාරිභෝගිකයන්ට මෙම සිට මිනිත්තු සිහිපයක් ගත කර විත් විවිධ මෙහෙයුම් කෝපි ගැනීමට හැකියාව ලැබේ.

මෙම ආපනශාලා එයටම ආවේණික රටාවක් පවත්වාගෙන යනු ලැබේ. මිනිත්තු 30 ට යෙන් 450 ක් ගාස්තු වශයෙන් අය කරන අතර කෝපි කෝප්පයක් කෝලා හෝ බියර් පානය සඳහා යෙන් 300 ලබා ගනී. Cyber Cafe යන්න ජපන් යොවුන්නයන්ට උනන්දුවක් මෙහි. යොවුන්නයන් උසස් විද්‍යාලවල සිසුන් සාකල් තැරුණු විශේෂ මෙම අන්තර්ජාල ආපන ශාලාවට දිව එනු ලෙස දකුනත් ගෙනට පත් වී තිබේ. විශේෂයෙන් සාකල් නිවාඩු කාලවල දී එය තරුණ ගැහැණු තරුණින් ගේ සාරාංශයක් වී යයි.

විවිධ අන්තර්ජාල ආපන ශාලා අතුරින් ජපානයේ දකින නැති තවත් වර්ගයකි, ව්‍යාපාරික ආපන ශාලා. මෙය ව්‍යාපාරිකයන්ට සම්බන්ධ වීමට වන අතර ලොව පුරා ව්‍යාපාරික තොරතුරු ප්‍රචාරණයට දැඩි උනන්දුවෙන් ජපන් ව්‍යාපාරිකයන් මෙම ව්‍යාපාරික අන්තර්ජාල ආපන ශාලාවල ගැවසෙනු දක්නට ලැබේ. අංග සම්පූර්ණ සුරක්ෂිත ඇඳුම් කට්ටලවලින් සැරසුණු ව්‍යාපාරික පිරිස් මෙහි සිටි. "අන්තර්ජාල සමඟින් විවේකය" යන්න මෙවැනි අරමුණු අතර වේ.

අනාගත ලෝකයේ යන්ත්‍ර සූත්‍ර මත පදනම් වූ තොරතුරු ප්‍රවාහය පිළිබඳ සිහින මවන ජපන් තරුණයින්ගේ විලාසිතා ද ඒ ආපන ශාලා වැඩි වේගයෙන් තුඩා නගරවල ද විවෘත වීම පටන් ගෙන තිබේ.

කෙසේ වුවත් ජපානයේ සිදු වූ මේ ඉන්ටර්නෙට් ආපන ශාලා පිළිබඳ මෙහෙත් දෙනාගේ දෙනය වන්නේ යම් දෙවල් සිදු වූ වෙනස ඉතාමත් වැඩි බවයි. කෙසේ වුවත් ජපන් වැසියන් හෙට දෙනය වන්නේ අන්තර්ජාල ආපන ශාලා ආරම්භකයින්ට නොතිබුණු ලෙස බවයි. ඒවායේ සේවාවන් කරියටම නොදන්නා යම්කුට මින් පොහොසත් වූ යහපත් පුද්ගලයන් හා සම්බන්ධ වැඩි මුදල් ගේ අදහසයි. මේ නිසා ම දිනෙන් දින ජපානය පුරා ඇති කෝපි ප්‍රසිද්ධ අන්තර්ජාල සහිත ආපන ශාලාවලට නොව වැඩෙන පාරිභෝගික පිරිස ද ඉහළ යමින් පවතී.

Pacific Friend සඟරාවේ Eiko Arai ගේ ලිපිය ඇසුරෙන් සකස් කළේ

**ආශිර්දීනි භාශා අත්තනායක**



# පත්තර ජොබ් එක ලේසි නෑ

# ඉන්දියාවේ වගතුග

**බොහෝ හොඳ දේශපාලඥයන් ප්‍රසිද්ධ අවස්ථාවලදී පුවත්පත් කලාව, කලාවේදීන් ඉතා බැරෑරුම් ලෙස අගය කළ ද ඔවුන් නොමැති අවස්ථාවලදී ඔවුන්ව විවේචනය කරයි.**

සෑම තරාතිරමක දේශපාලකයන්ට මාධ්‍ය සමඟ ඇත්තේ ඇතුවත් බැරි නැතුවත් බැරි අන්දමේ සම්බන්ධතාවයකි. මාධ්‍ය වගකීමෙන් තොරව ක්‍රියා කරන්නේ යයි ඔවුන් සෑම විටම දොස් නැගුවත් තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා මාධ්‍ය මත ඔවුන් යැපේ. සත්‍ය වනාහි පාලකයන් විසින් සෑම විට ම අප්‍රිය සහ ප්‍රතික්ෂේප කළ දෙයක් වීම මෙයට හේතුවයි.

දේශපාලකයන් අතර පුවත්පත් කලාවේදීන් අනාවශ්‍ය වූ යක්ෂයන් ලෙස සැලකීමේ නම්‍යතාවයක් ඇත. ඔවුන් ඉදිරිපිටදී සත්‍ය ලෙස හැසිරුන ද ඔවුන් නොමැති විට දී ඔවුනට නිග්‍රහ කිරීමට ද මොවුහු පෙළඹෙති. බොහෝ හොඳ දේශපාලඥයන් ප්‍රසිද්ධ අවස්ථාවලදී පුවත්පත් කලාව, කලාවේදීන් ඉතා බැරෑරුම් ලෙස අගය කළ ද ඔවුන් නොමැති අවස්ථාවලදී ඔවුන්ව විවේචනය කරයි.

එක් දිනෙක අගමැති රජිව් ගාන්ධි ගුවන්ගතවීමත් දූරදර්ශන් සේවය ආවරණය කරමින් සිටියදී ගුවන්යානය පියාසර කිරීම අසාර්ථක විය. මෙම මුළු අවස්ථාවම ඉතා අගනා ලෙස ආවරණය කෙරුණු අතර ගුවන් ගතවීම අසාර්ථක වූයේ මිනිත්තු දෙකක පමණ කාලයකි. මෙම අවස්ථාවේදී සංස්කරණ මැදිරියට පැමිණි දූරදර්ශන [illegible] ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියෙක් [illegible] මිනිත්තු දෙක සම්පූර්ණයෙන් [illegible] කිරීමට සැරසෙන්නේද' යනුවෙන් විම[illegible] සංස්කාරක වරයා ඔහු දෙස [illegible] කියා සිටියේ එය ජාතික මට්ටමේ [illegible] ප්‍රයත්නයක් වුවත් මෙය දවසේ ප්‍රධා[illegible] බැවින්, සම්පූර්ණයෙන් නො පෙන්වී[illegible] කරන අපරාධයක්' යනුවෙනි. [illegible] සංස්කාරකවරයාට පින්සිදු [illegible] දූරදර්ශන් ප්‍රේක්ෂකයන්ට ගුවන් [illegible] ගුවන් ගත වී නැවත පොළොවට [illegible] සම්පූර්ණ ලෙස නැරඹිය හැකි විය.

වරක් සොබා ඇමති වරයා [illegible] ඉන්දිය ගුවන්විදුලි ප්‍රවෘත්ති මැදිරිය [illegible] බලන සංස්කාරකවරයාට දූරකථන[illegible] කතා කොට ඔහුට විකාශය කිරීමට [illegible] බොහෝ දේ පිළිබඳව කියාගෙන [illegible] වැඩ බලන සංස්කාරක වරයාට ඒ [illegible] විකාශය කිරීමට අවශ්‍ය නොවීය. [illegible] ශූරෝත්මීය සංචාරයක යෙදී සිටි[illegible] මෙලෙසම දූරකථන ඇමතුම් ලැබී[illegible] අවස්ථා දෙකේදී ම සොබා ඇමතිවරයා[illegible] අවශ්‍යතා විකාශය [illegible] සංස්කාරකවරයා ගත් තීරණය ප්‍රවෘත්ති [illegible] අංශයේ අධ්‍යක්ෂවරයාගේ ප්‍රශංසාව[illegible]

මොංදිර් වරාම් සිං ගෙමැතිව [illegible] කාලයේදී ප්‍රවෘත්ති මැදිරිය ඇමතු [illegible] තමා අගමැති නිවසින් කතා කරන [illegible] පැවසීය. ඡන්ද ලාභත්ය පිළිබඳව [illegible] කොමිසමේ තීරණය ගැන වැඩි දෙක [illegible] ඉන්දිය ගුවන් විදුලි සේවයෙන් ප්‍රචා[illegible] බව ඔහු කීය. තවද එය නිවැරදි [illegible] ආකාරය පිළිබඳ මොහු විසින් සංස්කා[illegible] පැවසීය. සංස්කාරක කියා සිටියේ [illegible]

මගින් කෙරෙන මෙවන් ප්‍රකාශ භාර ගත නොහැකි බවත් ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙසත්ය. ඒ පිළිබඳ විලන ප්‍රචාරයද එලෙසම වූ බැවින් නැවත දුරකථන ඇමතුමක් ලැබුණි. මෙවිට ඒ වරාං සිංගේ නීතිඥයා බවත් පෙර කතා කළේ තමාම බව තවකා නිවැරදි නොකල ප්‍රකාශය ප්‍රචාරය වූ බවත් දන්වීය. සංස්කාරක වරයා මෙවරද කියා සිටියේ ඉහත කී දෙයමය. මද වේලාවක් දුරකථනයේ රැඳී සිටීමට ඔහුට අණ ලැබුණි. ඉන් පසු කතා කළේ වරාං සිංය. ඔහු ද පැවසුවේ ප්‍රකාශය නිවැරදි විය යුතු බවය. අගමැති වරයාගේ කථනය හඳුනාගත් සංස්කාරකවරයා පැවසුයේ අගමැති තුමනි පළමු ඇමතුමෙන් පසුව මා ප්‍රධාන මැතිවරණ කොමසාරිස් වරයාගෙන් ඒ පිළිබඳව විමසුවා. මුළු ප්‍රකාශයම නැවත එය ලබා දුන් පුද්ගලයාට කියවීමෙන් පසු ඔහු කියා සිටියේ එය නිවැරදි බවය. එම නිසා ඔබ සඳහන් කළ පරිදි මෙය නිවැරදි කිරීම අනවශ්‍යය. එහෙත් ඔබට යමක් කීමට ඇත්නම් මම එය ද ප්‍රචාරය කරන්නෙමි' යනුවෙනි. වරාං සිං දුරකථනය ආපසු තැබූ අතර සංස්කාරක වරයා ඔහුගෙන් පිළිතුරක් ලැබෙන තුරු බලා සිටියද එය සිදු නොවීය.

මහත්මා ගාන්ධි, පුවත්පත්වලට, දන්වීම් ලබා ගැනීම ගැන විරුද්ධ විය. ඔහු කිසිම දිනෙක දන්වීම් භාර නොගත් අතර, පාඨකයන්ගෙන් ලැබෙන මුදල් පත්‍රය පවත්වාගෙන යාමට තරම් නොවන විට පත්‍රය වසා දැමිය යුතු බවද නැවත නැවතත් කීය.

ප්‍රබලතම ප්‍රවෘත්ති පත්‍ර ආයතනයක් විසින් අග්‍රාමාත්‍ය කාර්යාලයේ සම ලේකම් වරයකුගේ බිරිඳ තම ආයතනයේ නව සඟරාවක කර්තෘ ලෙස පත්කර ගැනිනි. මෙම සඟරාව දොරට වැඩීමේදී පැවති භෝජන සංග්‍රහයකදී එම ආයතනයේ විධායක නිලධාරියකු පැවසුවේ තමා ප්‍රථමයෙන් මෙහි කර්තෘ තෝරාගත් බවත් ඉන් අනතුරුව සඟරාවට නමක් යෙදීම කර්තෘවරියට භාර කළ බවත් ඇගේ සිතුම් පැතුම්වලට අනුව මෙම සඟරාව සකස් විය යුතු බවත්ය. මෙම කතුවරිය ඉතා සතුටින් පසුවූයේ ද, ඇයට තම පරිපාලනයට එරෙහිව කීමට දෙයක් නොවූයේද තම ස්වාමියාට රාජ්‍ය සංස්ථාවකට මාරුවීමක් ලැබෙන තුරු පමණි.




උත්තර ප්‍රදේශ් හි පුවත්පත් කර්තෘ වරයෙකුට අන්තර්ජාතික සම්මානයක් හිමි වූ විට, එම පුවත්පතේ තරුණ අයිතිකරු විසින් අපි පුවත්පත පළ කරන්නෙ, සම්මාන ලබන්නේ කවිරුවත් මන්දයි විමසූ බව කියනු ලැබේ. මෙය අන්තවාදී උදාහරණයක් විය හැකි වුවද, ඉන්දීය මාධ්‍ය අයිතිකරු කර්තෘ සම්බන්ධතාවය මොනවට පිළිබිඹු කරයි. නර්සිම්හන් වැනි පලපුරුදු පුද්ගලයන්ට පවා වසර තිහක සේවයකින් පසුව වුවද දිනාගත හැකි වූයේ සහකාර කර්තෘ පද විය පමණි. ඉහළ නිලතල පවුලේ සාමාජිකයන්ට වෙන් වී තිබීම මෙයට බලපෑ ප්‍රධාන හේතුව වේ.

එක්තරා ප්‍රසිද්ධ ප්‍රාන්ත පුවත්පතක හිමිකරුවෙක් දවස අවසානය වනතෙක් කාර්යාලයේ රැඳී සිටීමට පුරුදුව සිටියේ ප්‍රවෘත්ති රැගෙන පැමිණෙන නගරයේ වැදගත් පුද්ගලයන් තමා හමුවිය යුතු බව හඟවමිනි. මෙසේ පැමිණි පුද්ගලයකු දිනක් මෙම පුවත්පතේ සහය කර්තෘ වරයෙකුට රැස්වීමක් ඇමතීම සඳහා ආරාධනය කළවිට හිමිකරු කියා සිටියේ 'ඔබට ඔබේ ප්‍රවෘත්ති මගේ පුවත්පතේ පළ කර ගැනීමට අවශ්‍ය නම් ඔබ මා කරා පැමිණිය යුතුය. එසේ නොවේ නම් තමණක් ඔබ 'උගතුන්' ඔබගේ රැස්වීම්වලට කැඳවා ගන්න යනුවෙනි.

සාමාන්‍ය ජනයා හා දේශපාලනඥයන්, පුවත්පත් කලාවේදීන් හා මාධ්‍යවේදී කර්තෘන් ආධ්‍යාත්මිකව උසස් පුද්ගලයන් ලෙස සැලකුවද, හිමිකරුවන් ඔවුන් සලකන්නේ සාමාන්‍ය ව්‍යාපාරිකයන් ලෙසය. මෙහිදී මෙම හිමිකරුවන් සාමාන්‍ය ජනයාගේ ආකල්පය කෙරෙහි තැකීමක් නොකලද, දේශපාලනඥයින් හා විශේෂයෙන්ම බලයේ සිටින දේශපාලනඥයන්ගේ ආකල්ප කෙරෙහි සැලකිල්ලක් දක්වයි.

එක් පුවත්පත් ව්‍යාපාරිකයෙකුට අගමැති වරයෙකු සමග පිටරට යාමට ද අවස්ථාව ලැබුණි. මෙය ඔහු ජීවිත කාලයක් පුරා බලා සිටි අවස්ථාවක් වූවාට සැක නැත. ඔහු පුවත් පතෙහි එක වාක්‍යකුදු නොලීවද, ඔහු ගමන් කළ ගුවන් යානයේ සිටි ජනමාධ්‍ය ආයතනවල නියෝජිතයන්ගෙන් තම පුවත් පතට වැඩි වාසි ලබා ගැනීමට ඔහුට හැකි විය. මෙම කර්තෘ - හිමිකරු ගැටලුවලදී අග්‍රාමාත්‍ය කාර්යාලයේ අදහස වූයේද මෙවැනි කාරණාවලදී වෘත්තීය කර්තෘන්ට වඩා හිමිකරුවන් සමග ගනුදෙනු කිරීම වඩා යෝග්‍ය බවය.

හිමිකරුවන් සතු මෙම මානසික ව්‍යාකූලතාවය සමහර විට වෙනත් ආකාරයේ ප්‍රශ්න වලටද තුඩු දේ. එක්තරා තරුණ පුවත්පත් හිමිකරුවකුට කර්තෘ වීමේ කැමැත්තක් වුවද, නොසිතූ විරූ ස්ථාන හා උසාවි වලටද යාමට සිදුවන බව ඇසීමෙන් ඔහු තම අදහස ඉවත දමන ලදී. එහෙත් මොහු තම පුවත්පතේ කර්තෘ මණ්ඩලය රැස්වීම්වලට සහභාගී වීම පුරුද්දක් කරගෙන සිටියේ, තම පුවත්පතෙහි ගමන් මාර්ගය හැසිරවීමේ තම ආශාව මුදුන් පමුණුවා ගැනීම සඳහාය. මෙය දිනෙන් දිනම සිදුවන හිමිකරුගේ ඇඟිලි ගැසීමක් වුවද ඔහු ප්‍රසිද්ධියේ කටමැත දොඩන්නේ කර්තෘ මණ්ඩල රැස්වීම්වලට නිතර සහභාගී වීමේදී තමා තම සේවකයන්ට තමා ඉදිරියේ දුම්බීමට පවා ඉඩදී ඇති බවය. මෙය සෑම විටම ව්‍යාකූල තත්වයන් ඇති කරවයි. මෙයද සැබවින්ම අමාත්‍යාංශ ලේකම් කට පොලිස්පති වීමේ හා අණදෙන නිලධාරී වීමේ, කොස්තාපල් කෙනකු වීමේ හා එකවර මේ සියල්ලන්ම වීමේ අවශ්‍යතාවයද වැනිය.

පළමු පෙළ ඉන්දීය පුවත්පතක මුල් පිටුවෙහි විශ්‍රායල්, සොල්දාදුවක විසින් ලෙබනන් ජාතික කුඩා ළමයකුට වතුර කෝප්පයක් පිළිගන්වන 'මානව හිතවාදී' ඡායාරූපයක් පළ කිරීමෙන් විශ්‍රායල් ජාතිකයෝ ප්‍රචාරක කුමන්ත්‍රණයක් ඇති කළහ. අන්තර්ජාතික මට්ටමින් මෙය දකිය යුත්තේ එකල විශ්‍රායලය සම්බන්ධයෙන් වූ අහිතකර මාධ්‍ය හා විශ්‍රායලය පිළිබඳ ඉන්දියාව දරණ ආකල්පය පිළිබඳ අවබෝධයකින් යුතුවය. මෙම ප්‍රවෘත්තියට සම්බන්ධ පුද්ගලයකුට ස්විට්සර්ලන්ත බැංකුවක ගිණුමක් විනි නම් එය අවාසි සහගත තත්වයකි. එය එසේ නොවේ නම් එය ඊටත් වඩා බැරෑරුම් තත්වයකි.

ඉන්දීය ලේඛන කලා අධ්‍යාපනය ගැන ඉතා උනන්දුවූ පුද්ගලයෙකි, මාධ්‍ය උපදේශක වශයෙන් විසි වසරක් පමණ පලපුරුද්ද ගරධා ප්‍රසාදි මහතා. කෙටි කාලයක් ඔහු ඉන්දීය ජනසන්නිවේදන අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ වරයාව සිටියේය. වරෙක ඔහු මේ සම්බන්ධයෙන් කියා සිටියේ 'ලේඛන කලාව උගන්වන බොහෝ දෙනා සිතා සිටින්නේ එය සමාජ විද්‍යාව කියාය' යනුවෙනි. ලේඛන කලා අධ්‍යාපනයේ ගැටලු මෙම ප්‍රකාශයෙන් මොනවට කියා පායි.

තවත් සමහරු ලේඛන කලා අධ්‍යයන පංතිය රැකියාවකට හෝ විවාහයට පෙර රැඳී සිටිය හැකි තවත් එක් ස්ථානයක් ලෙස සලකති. මනාව උගත් ශිෂ්‍යයෙකු මෙවන් ආයතනයනට ගිය විට මොහුට නිතරම පිළිගැනීමක් ඇතිවන අතර ඔහු ඔවුන්ගේ සහෝදර සේවකයෙක් ලෙස සැලකේ.

ලේඛන කලා අධ්‍යාපනය ලබා දීමේ යෙදී සිටින්නන් බොහෝ විට ලේඛන කලාවේ යෙදී සිටින්නන් නොවේ. මෙලෙස දිනෙන් දිනම ලේඛක වෘත්තිය හා ලේඛණ කලා අධ්‍යයන අංශ අතර පරතරය වැඩි වන බව පෙනී යයි.

ලෝක් සභා හි තම ප්‍රථම වාරයේදීම අමිතාබ් හච්චන් අසාර්ථක වීමට හේතුව ඔහු සිනමා මාධ්‍ය හා දේශපාලන ජන මාධ්‍ය වෙන්කර හඳුනා ගැනීමට අපොහොසත් වීම නිසාය. මන්ද යත් ඔහු මාධ්‍ය සමග සම්බන්ධ වීමට පත්කර තිබුනේ කිසිදිනෙක පාර්ලිමේන්තු සැසිවාර ආවරණය නොකළ අපරාධ වාර්තාකරුවකු බැවිනි. එහි ප්‍රතිඵලයක් ලෙස මොහු තම රාජකාරිය හරියාකාරව ඉටු නොකලා පමණක් නොව අගමැති කාර්යාලයේ රැකියාවක් සොයා ගැනීමටද අමිතාබ් සම්බන්ධතාව යොදා ගනිමින් දේශපාලනඥයකු වීමටද උත්සාහ දැරීය. ඉන්දීය කර්තෘවරුන් හා හිමිකරුවන් ද ලේඛණ කලා අධ්‍යාපනය පිළිබඳව උනන්දුවක් නොදක්වති.

Media Issues හි Media Criticism ලිපිය ඇසුරෙනි.

මෙලනි රෝවෙල්

දේශීය සිනමාවේ
ප්‍රගමනයට
අත්වැලක් වූ...




වයර් හවුස් (පුද්ගලික) සමාගම
අංක 177, පංචිකාවත්ත පාර, කොළඹ 10.
☎ 433673 - 448369 - 437114

# මහදැන මුත්තයි, ගෝලයෝ රොත්තයි !

# රාජ්‍ය නාට්‍ය උළෙල - 97

ක



හැමෝටම හැමෝම ආසයි !

# "විරෝධය, විනිශ්චය මණ්ඩලයට...."

මේ තරගයට සමගාමීව කෙටිනාට්‍ය 7ක තරගයක් පැවතුණි. මෙවර විනිශ්චය මණ්ඩලය වූයේ, මහාචාර්ය මැන්දිස් රෝහණධීර(සභාපති), ශන්මුල ජයවර්ධන, සේන ජයන්ත වීරසේකර, ප්‍රේමරංජිත් තිලකරත්න, සයිමන් නවගත්තේගම, ආර්. ආර්. සමරකෝන්, සරත් සුරසේන, අශෝක හඳගම, චන්ද්‍රසේන දසනායකයි.

විනිශ්චය මණ්ඩලයක් කියන්නේ සාක්කුවට ගහමින්ට එකක් වැටෙන නින්ද නාට්‍ය විකක් බලල මොනව හරි තීරණයක් දෙන එකක් කියල වර්තමාන විනිශ්චය මණ්ඩලවලට පත්වෙන අය හිතන් ඉන්නෙ. ඒ දෙන තීරණය කොයිතරම් සාධාරණ වියයුතුද සහ එයින් නිර්මාණ ක්ෂේත්‍රයේ අනාගතයට වන බලපෑම කොතරම්ද යන්න නිර්මාණකරුවන්ට කොතරම් සාධාරණයක් වියයුතු ද යනාදී දේ ගැනත් සැලකිය යුතු බව මේ විනිශ්චය කරුවන් හිතට ගන්න ඕන.

අනෙක් කාරණය විනිශ්චය මණ්ඩලයක් කියන්නේ සාම්ප්‍රදායිකව සාමූහිකව ක්‍රියාත්මක වී එක් පොදු තීරණයකට එළඹිල එය ප්‍රකාශයට පත් කිරීමයි. යම් කිසි විදියකින් ඒ සාමූහිකත්වය බිඳී පෞද්ගලිකත්වය මතුවී තම තමන්ගේ නින්ද මාධ්‍යවලින් කාන්දු වෙනවනම් ඒ කියන්නෙ ඒ අය විනිශ්චය මණ්ඩලය නුසුදුසුයි. විනිශ්චය දුන්නට පස්සෙ ඒව ගැන අවසාන විග්‍රහයන් කෙරෙනව නම් ඒක බලපාන්නෙ නාට්‍ය ක්ෂේත්‍රයට. යම් උද්ඝෝෂණයක් හෝ විරුද්ධ විකක් කෙරෙනවනම් ඒක කලින්ම කෙරෙන්න ඕන. විනිශ්චයකරුවන් අතර තම තමන් අකමැති එකට ඉදගෙන තීරණ ගත නොහැකි තත්වයන් පෞද්ගලිකව පැන නැගිල තියෙනව නම් ඒ ගැනත් විනිශ්චය මණ්ඩල රැස්වෙන මුල් සාකච්ඡාවලදී දක්වල නැගිටල යන්න ඕන. නැත්නම් එකඟ වෙලා ඉදිරියට ක්‍රියා කරන්න ඕන.

තම තමන්ගෙ මත ප්‍රකාශ කරමින් සුදු හුණු ගා ගන්න හදන එක ගැන සයිමන් නවගත්තේගම මෙසේ කියල තිබුණා.

"අපේ ගම්වල කියන්නා වාගෙ කණ වැන්දුම් ගෑණු වගේ එහෙම පව් පව් ගාන අයත් ඇති. ඔවුන් කියන්නෙ ඒ තත්වෙට වැටෙන්ඩ කියලද?

අවසන් විනිශ්චයට නැගෙන විරෝධතාවලට විනිශ්චය කරුවෝ සියළු දෙනාම එකට මුහුණ දිය යුතුයි. ඒක පොදු තීරණයක් නිසා. එහෙම නැතුව තීරණ ගැන තම තමන්ගෙ පුද්ගලික අදහස් දක්වමින් සුදු හුණු ගාගන්න දැඟලීම වැරදියි.

රාජ්‍ය නාට්‍ය උළෙල පිළිබද සයිමන් නවගත්තේගම මහතා ලියූ පුවත්පත් ලිපියක විනිශ්චය මණ්ඩලේ සභාපති මහාචාර්ය මැන්දිස් රෝහණධීර විසින් තමා ඇතැම් කියන ප්‍රකාශයක් උපුටා දක්වා තිබුණ. "අනුසෙලා කරුණයන්ට සම්මාන දෙන්න යන්නෙ උන් ජේ.වී.පෙ. කාරයො නින්ද උන්ට බයවෙලා". කවුද මේ කියන්නෙ? රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසන් වටයේ විනිශ්චය මණ්ඩලේ සභාපති. එතැනින් එහාට විනිශ්චය මණ්ඩලේ තීරණ ගැන කතා කරන්න ගැම විහිළුවක් වුණත් මේ විනිශ්චය මණ්ඩලය තුළ සභාපතිගේ මෙම අමන හා මුග්ධ ප්‍රකාශයට එරෙහිව කැරලි ගැසූ මනුෂ්‍යයෙක් සිටි බව ඉතන ලිපියෙන්ම පැහැදිලි වෙනවා.

මේ රටේ කරුණයන්ට හරි වැඩිහිටියන්ට හරි තමන් කැමති දේශපාලනයක් කරන්නටත් ඒ දේශපාලනයට අනුගතව නාට්‍යයක් හෝ වෙනත් කලා කටයුත්තක් කරන්නට ඇති ප්‍රජාතාන්ත්‍රික අයිතිය එහෙම පිටින්ම පැහැර ගන්නට සහ ඔවුන්ගේ නිර්මාණ එකී දේශපාලන කෝණ තුළ දමා කිරුම් මිනුම් කරන්නට මහාචාර්ය මැන්දිස් රෝහණධීරයන්ට ඇති අයිතිය කුමක්ද යන්න ප්‍රශ්න කළයුතු කරුණකි. තියන වගයෙන්ම කලාව සම්බන්ධව පමණක් නොවෙයි, අනෙකුත් සමාජ, ආර්ථික හා දේශපාලන කරුණු සම්බන්ධව ට වුණත් මෙය මහා භයානක තත්වයක්. මහාචාර්ය වරයා ප්‍රකාශ පැහැදිලිවම දක්වනවම පූර්ව නිගමන සිහියකට එළඹ ඇති බව පැහැදිලිව පේනවා. "මේ රටේ ඉන්න ජේ.වී.පී. කාරයින්ට කලා කටයුතුවල යෙදීමට අයිතියක් නැත. එසේ කළත් සම්මාන ලබා ගැනීමට අයිතියක් නැත. කවුරුන් හෝ සම්මාන දීමට උත්සාහ කළොත් රට වුව දෙන්නේ ද නැත" යන හිට්ලර්ගේ න්‍යායයි.


අනෙක් අතට රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසාන වටයට තේරුණු නාට්‍ය හදපු නාට්‍යකරුවන් යූ.ඇන්.පී. ද, ශ්‍රීලංකා ද, ජේ.වී.පී. ද එල්.ටී.ටී. ද කියන්න නොදනිමු. අපට දැනගන්න වුවමනාවක් නැත. ප්‍රේක්ෂකයන් වශයෙන් අප බලන්නේ නාට්‍ය පමණයි. එහෙත් නාට්‍යකරුවන්ගෙ කිරිපල්ල සොය සොයා සම්මාන දීමට සභාපතිට ඇති වුවමනාව කුමක්ද යන්න හදබල ලෙස අප ප්‍රශ්න කරනවා. එසේම ඔහුගේ දේශපාලන නිරුවත ද ඔහුම මහාව ප්‍රදර්ශනය කළේ මෙසේය. "මං තමුසෙල දෙන ඇමතිතුමාට, උප ඇමතිතුමාට ලෙනින් රිපෝට් කරනවා". රෝහණධීර තර්ජනය කරයි. ඔහු මුලපුතේ සිටුවා ඇත්තේ කාගේ වුවමනාවන් ඉටු කිරීමටද යන්න වග ඔහුගේ කතාවෙන්ම පැහැදිලිවෙයි.

විනිශ්චයාසනය සඳහා සිටි දෙනා එළැඹෙන විට එකඟවන එක පොදු වැදගත් තීරණයක් ඇත. එනම් උළෙල අවසන් වන තෙක් විනිශ්චය පිළිබඳ කිසිදු තොරතුරක් හෙළි නොකළ යුතුය. විනිශ්චයන් පමණක් නොව එක් එක් අය අතර ඇතිවූ කතාබහ පවා හෙළි කිරීමට තරම් නැතිවිය. එසේම මෙම විනිශ්චය මණ්ඩලයට අදාළ ගත් පිරිසගෙන් 6 දෙනෙකු නිර්මාණකරුවෝ. ඔවුන් එකිනෙකා හඳුනනවා. තමන් එකඟ නොවන දෑ සමග පොදු තීරණ ගැනීම සඳහා අදාළ නොගෙන ඉන්නට තිබුණා. එහෙම තමන්ට පවා කිව යුත්තේ ද එයයි. තමතමන්ගේ සුදුසුකම් ගැන කියා පාන අයකුගෙන් බලාපොරොත්තුවන විනිශ්චය කෙබඳු එකක් විය හැකිද?

නාට්‍ය නිර්මාණයද කරුණ හෝ ප්‍රවීණ යන මිම්මට අදාළ වන්නක් නොවේ. නිර්මාණයක තාරුණ්‍යය යන නිර්මාණ ශිල්පියාගේ වයස අනුව ඇතිවන දෙයක් නොවේ. මේ නිසා අපට වැදගත් වන්නේ නිර්මාණය විනා එය ඉදිරිපත් කරන අයගේ වියපත්කම නොවේ. අන්දකීම් නිසරු නම් ප්‍රවීණ තරුණ භේදය නොතකා එය ප්‍රතික්ෂේප විය යුතුය. ජාතික මට්ටමේ ප්‍රධාන උළෙලකදී ඒ මට්ටම රැක ගැනීම ඉතා අවශ්‍යය. එමැවින් විනිශ්චය මණ්ඩලය සිය තීරණ ප්‍රකාශයට පත් කිරීමේදී ඒ ගැනත් දැඩිසේ සලකා බැලිය යුතුය. රාජ්‍ය නාට්‍ය උළෙලේදී පමණක් නොව මේ රටේ බොහෝ තරඟකාරී විනිශ්චයන් සඳහා අනුව ගන්නා බොහෝ දෙනෙකුට ඒ සඳහා උචිත විශේෂ සමාධියක් නැතිබව කවුරුත් පාහේ දනී. ඔවුන් මුදලක් තමන්ට ලැබෙන ගෞරවනාමය හෝ වෙනත් ලාභයක් නිසා හෝ මෙබඳු භාරදූර කටයුතුවලට සම්මාදම්ව අවැඩක් කරයි. හොඳට තීරණයක් ගැනීමට අසමත් වන ඔවුන් වැරදි මිනුම් දඬු භාවිත කර නිර්මාණ සංහාරයක යෙදෙති. ඇත්ත වශයෙන්ම තරුණ නිර්මාණ කරුවන්ගේ විරෝධයද ඔවුන්ටය.



අනුමණ්ඩලය ගිනි ගනී...!



ගරු සරු නැති ගුරු තරු...

ජීසර තරංගනී මුණසිංහ

## ධර්ම සන්නිවේදනය

# ඒහි+පස්සික සන්නිවේදකයාණෝ

**සන්නිවේදන කාර්යයේදී තම ධර්මය යම් යම් වෙනස්කම්වලට ලක්කොට එමගින් තම ශ්‍රාවක ජනයා අමන්දානන්දයට පත්කර ඇත.**

ලෝකයේ පහළ වූ ශ්‍රේෂ්ඨතම ජන සන්නිවේදකයා ගෞතම බුදුරජාණන් වහන්සේය. ඌර්ණ රෝම ධාතුවෙන සැදුම් ලත් ලලාට තලය සාපොච්චේකුට හා සමාන නැහැය පිපී දිලෙන පියුමක බඳු මුහුණ, ආරෝහ පරිනාහ සම්පන්න (උසට සරිලන මහත) කාය සම්පත්තිය, කයෙහි පිළිබිඹු වන දෙතිස් මහ පුරිස ලක්ෂණ සහ උන්වහන්සේගේ පා පියුම්හි සොභාවයෙන් පිහිට තිබූ එකසිය අටක් වූ මංගල සලකුණු තුළින් උන්වහන්සේ සෙසු සමාජයෙන් කැපී පෙණුනි.

බුදුන්වහන්සේ තුළ වූ චිත්තාකර්ශනීය ප්‍රබල සන්නිවේදන ලක්ෂණයක් ලෙස තමා වෙත එන තැනැත්තා තමාට ඇමතීමට පෙර තමා එම තැනැත්තාට ඇමතීම (පුබ්බභාසී) නිරතුරුව තමා හමුවට එන තැනැත්තන්ට මිතුරෙකු මෙන පිළිගැනීම (මිතතමානා) නිතර මද සිනහවෙන් දෙතොල සරසා ගෙන සිටීම (උත්තානමුඛෝ) තමන් වෙත පැමිණි අය සමඟ සතුට සාමිචිචියේ යෙදීම (සම්මෝදනා) අනායන් සමඟ හදවතින් බැඳුණු යහළුවකුගේ අදහස හුවමාරු කර ගැනීම (සඛිලෝ) පෙනවා දිය හැකිය. සමාජය තමා වෙත නතු කර ගැනීමෙහිලා වචනය, සිනහව, පැහැය, ඉරියව්, උපාය ශිලි ලෙස භාවිතා කොට ඇත.

පුද්ගල මනෝ භාවයන් වටහා ගෙන එම චරිතයන් එකින් එක බෙදා වෙන්කොට විභජ්ජවාදී න්‍යායෙන් ධර්මය දෙශනා කොට තිබේ. රාග චරිත ඇත්තන් හඳුනාගෙන ඒ අයට රාගයේ ආදීනවද මෝහ චරිත ඇත්තන්ට මෝහයේ ආදීනවද ශ්‍රද්ධා චරිත ඇත්තන්ට ශ්‍රද්ධාවේ ආදීනවයන්ද ආදී වශයෙන් චරිත හඳුනාගෙන ධර්මය අවදි කොට ඇත.

සන්නිවේදන කාර්යයේදී තම ධර්මය යම් යම් වෙනස්කම්වලට ලක් කොට එමගින් තම ශ්‍රාවක ජනයා අමන්දානන්දයට පත්කර ඇති අවස්ථා දක්නට ලැබේ. මේ සඳහා රිද්ම, තාල, ගද, පද, ශබ්දාලංකාර රූපාලංකාර භාවිතා කොට ඇත. මහා මංගල සූත්‍රයේදී ප්‍රශ්නෝත්තර ක්‍රමයට ධර්මය සන්නිවේදනය කරයි. පරාභව සූත්‍රයේ දී දෙවියන් විසින් ප්‍රශ්න නගන අතර, බුදු හිමියන් එකිනෙකට පිළිතුරු දෙයි.

ශ්‍රාවකයෙකුට ධර්මය දේශනා කරන විට ඔහුට අයත් සමාජයෙනම උදාහරණ ගෙන දැක්වීම විශේෂ ලක්ෂණයකි. කසීභාරද්වාජ සූත්‍රයේදී නගුල, කෙවිට, කුඹුර, ගවයන් සහ බීජ උපමා කර ගනිමින් කෘෂිකාර්මිකයාට ධර්මය සන්නිවේදනය කරයි. මෙලෙස කොසොල් මහ රජුට රාජ කතා පිහිපත් කර දෙමින් කළ ධර්ම සන්නිවේදනය කොසල සංයුක්තයේ ප්‍රකට කරයි. ගොවියාට ගොවි කතා, ගැමියාට ගැමි කතා, ගොපල්ලාට ගොපලු කතා මෙන්ම පැවිද්දාට පැවිදි කතා, දෙවියන්ට දෙව් කතා, බමුණන්ට බමුණු කතා යනාදී වශයෙන් තම වෘත්තියමය ගැටළු විසඳමින් තමන් අසවිදින සමාජය තුළින්ම සත්‍යය සන්නිවේදනය කර ඇත. උත්සාහ ගැනීම සන්නිවේදන ලක්ෂණයකි. භෞතික පරිසරයෙන් චිත්ත මනෝභාවයන් විචිත්‍ර ආකාරයෙන් විවරණය කළ අවස්ථාවක ලෙස අජාසත්ත කෝසලාපය පිහිපත් කළ හැකිය. තම පියාණන් ඝාතනය කළ අජාසත් ඒ තුළින් දැඩි චිත්ත සංතාපයට පත්විය. තම රාජ්‍ය පාලන කාලය දිනෙන් දින පිරිහෙන්නට විය. ඇති ඇමතිවරු දෙස් දෙවොල් තබන්නට විය. පෙපරිදදෙන් රජුගේ සිත් තැවුල් දිනෙන් දින වර්ධනය විය. සත පුරුෂයකුගේ පිහිට පැතිය. බුදුහිමියන් බැහැදකින්නට වන වැදුණි. වනයේ රෞද්‍ර භයංකර වටපිටාව රජුගේ සිත තිගැස්මට පත් කළේය. වර්ණවත් සහ සුගන්ධවත් තුරුලිය, මල්ගොමු තුළින් රජුගේ සිත පහන් විය. තම සව්වන් පිරිවරා එකම ආකාරයකින් වැඩ සිටින එකම ඉරියව් පවත්වන බුදුපාමොක් මහසඟන රජුගේ සිත ඇද ගත්තේය. ධර්මය ශ්‍රවණය කිරීමට පෙර රජුගේ සිතෙහි සහන් සිහිවිලි ජනිත කරලීමට මෙම පරිසරය උපකාරී වී ඇත.

බුදුහිමියන දහම් දෙසීම සඳහා වන වදුල හිස් භූමි තුරු සෙවන භාවිතා කර ඇත. මෙහි සන්නිවේදන ලක්ෂණය වන්නේ තම ශ්‍රාවකයාගෙ චංචල සිත නිශ්චල කොට එකම අරමුණකට යොමු කිරීමයි. වේළුවනය, ජේතවනය, පාරලෙය්‍ය වනය, මිගදාය, ඉසිගිලිය වැනි භූමි මෙන්ම ඇසතු තුග රුක් සෙවන බෝ සෙවන, කිරිපළු රුක් සෙවන සහ නිල්වන් තණබිම් මෙලෙස භාවිතා කර ඇත. හිස රැවුල් බා අනිත්‍ය මුසු වර්ණයෙන් යුත් චීවර දරාගෙන එකම මොහොතක එකම පේළියකට ඉරියව් පවත්වන සමූහ වශයෙන් වැඩ වසන මහසඟරුවන දුටු ඕනෑම අයෙකුගේ සිත එම දර්ශනය කෙරෙහි ඇදී යයි. මෙම ආකර්ශණයේ සියුම් අදහස වන්නේ නිර්වාචික සන්නිවේදනයයි.

ඒහි + පස්සික ( ඇවිත් බලන්න) ආදී ගුණයන් තුළින් පිළිබිඹු වන්නෙ අවබෝධය මගින් ආලෝකය දකින බවයි. මල් බුද්දහමේ පූජා භාණ්ඩයකි. එමගින් නිර්මලත්වය, ප්‍රසන්නත්වය, ප්‍රකට කරයි. කඩුපුල් මලේ සිට වතුසුදු මල දක්වා සදේවක ලෝකයා තෙරුවන් නැමදීමට භාවිතා කරයි. පුෂ්පයන් උපයෝගී කර ගැනීමෙන් පූජක සිතෙහි පාප චේතනා වියැකී යයි. පිවිතුරු සිතුම්න පිබිදී එයි. පවිත්‍ර දහමක පහස ලබයි. මේ මල් මුනිඳුට පූජා වේවා. මේ මල මෙන කය ගැන වැටහේවා යන්න සිතට නැගේ. තවත් අයුරකින් කිවහොත් මෙම අවාචික උපක්‍රමය මගින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය හෙවත් බෞද්ධ පදාර්ථය යම්බඳු ප්‍රමාණයකට මානව සිත් සතන් කරා සන්නිවේදනය වේ. මෙය අතිශය සියුම් සන්නිවේදන ක්‍රමයකි.

ධර්මය ප්‍රභේද කර දේශනා කිරීම තවත් සන්නිවේදන උපක්‍රමයකි. යම් ගැඹුරු කරුණු පැහැදිලි කිරීමේදී එකම දෙය ආකාර ගනනාවකින විග්‍රහ කරයි. දුක පිළිබඳ සංකල්පය ධම්මචක්කපවත්තන සූත්‍රයේ දී සැකවින් දක්වා සච්චවිභංග සූත්‍රයේ දී ප්‍රභේදයන්ට බෙදමින් එම කරුණ විධාන පැහැදිලි කරයි. නිර්වාන සංකල්පය ප්‍රකට කිරීම සඳහා ත්‍රිලක්ෂණය, චතුරාර්ය සත්‍ය, ත්‍රි ශික්ෂාව, ආර්ය අෂ්ටාංගික මාර්ගය යන න්‍යායන් තුළින්ද ප්‍රකට කරයි.

> **ඒහි + පස්සික**
> **( ඇවිත් බලන්න)**
> **ආදී ගුණයන් තුළින්**
> **පිළිබිඹු වන්නේ**
> **අවබෝධය මගින්**
> **ආලෝකය**
> **දකින බවයි.**

තවත් සන්නිවේදන උපක්‍රමයක් වනුයේ තම ග්‍රාහකයා තමා කෙරෙහි තබන විශ්වාසයයි. බුදුන් මගේය (මමේව බුද්ධෝ) දහම මගේය (මමේව ධම්මෝ) සඟුන් මගේය (මමේව සංඝෝ) යන න්‍යායට අනුව තමා කෙරෙහි ග්‍රාහකයාගේ විශ්වාසය දිනා ගැනීමයි. තමන්ගෙම යන නැගිමකින ස්ථානව දහමහි සිත නතු කිරීමට ශ්‍රාවකයා තුළ විශ්වාසය ගොඩ නගයි.

බුද්ධ දේශනාවේදී භාවිතා කොට ඇති උපමා උපමේය, භාෂා තවත් සන්නිවේදන උපක්‍රමයකි. සිත දියෙන ගොඩ ගත් මෙක්කුට උපමා කරයි. ශරීරය මන්දිරයකට උපමා කරයි. තවද චිත්ත සද්ධාව බීජයක ලෙසත් තපස හෙවත් භාවනාව ජලය ලෙසත් ප්‍රඥාව නගුල ලෙසත් රූපකාර්ථවත් කරයි. ලී වඩුවෙකු දැව නිර්මාණය කරන ලෙසිනුත්, හී වඩුවෙකි ආයුධ නිර්මාණය කරන ලෙසිනුත් නැණවතා විසින් තම සිත සකස් කළ යුතුය. මෙවැනි භාවසූචක උපමා රූපක, පිහුල වශයෙන් යොදා ගනිමින් වාචික අවාචික සන්නිවේදනයේ පෙදී ඇත.

තවත් වැදගත් සන්නිවේදන උපක්‍රමයක් වනුයේ මුද්‍රා ක්‍රම භාවිතයයි. ඒ අතර අභය මුද්‍රා, සමාධි මුද්‍රා, ධර්ම චක්‍ර මුද්‍රා, භූමිස්පර්ශ මුද්‍රා, වරද මුද්‍රා, විතර්ක මුද්‍රා වැනි මුද්‍රා සඳහන් කළ හැකිය. මෙය ප්‍රබල ලෙස නිර්වාචික සන්නිවේදනයට නෑකම් කියන්නෙකි. බුද්ධ දහමේ සමාධිය, තර්කනය, වාදපතාගීර්ණ බව නිර්මලත්වය, ප්‍රඩත්වය අභය ප්‍රදානය වැනි මානසිකා ඒ තුළින් ජනිත කරයි. අනුරාධපුර මහසෙව්නා උයනෙහි නිර්මිත සමාධි ප්‍රතිමාව දෙස් විදෙස් ජනයාගේ සුවහසක් ගෞරවාදරයට පාත්‍ර වෙයි. එහි අඩවන් වූ දෙනෙතින් බලන්නා වූ මෙත් මුදිතා කරුණා ගුණ වචනයට නැගීම අපහසුය. එමගින් හැඟී යන්නේ වචනාර්ථය අභිබවා යන ධර්ම සමුදායක් එමගින් ජනිත වන බවයි.

ගෝනාපීනුවල මේධානන්ද හිමි



බැන්ඩිට් ක්වීන්



සාවිත්‍රීගේ රාත්‍රිය

# විචාරයට කෝදුවක් හැදීම

## අප්‍රබුද්ධ රසිකයින්ට ප්‍රබුද්ධ වෙස් මුහුණක් පැළඳවීම පලක් නැති ක්‍රියාවක්...

ධර්මසිරි බණ්ඩාරනායක ප්‍රබුද්ධයි. ශේකර් කපූර්..... ඔව් ඔහුත් ප්‍රබුද්ධයි. "බවදූක" හා "බැන්ඩිට් ක්වීන්" සමග නෝනාහාමි සහ පුලාන්දේවියත් ප්‍රබුද්ධයි. "ධර්මසිරි බවදූක" හා "නෝනහාමි" වටා පෙළ ගැහෙන රසික පිරිසටත් මේ ප්‍රබුද්ධ ලේබලය වැදෙනවා. මේ ප්‍රවනතාවට ප්‍රතිපක්ෂව තවත් අතුරුළු ධාරාවක් තිබෙනවා. සුනිල් සෝම පීරිස්, හේමසිරි සෙල්ලප්පෙරුම, මිල්ටන් ජයවර්ධන වැන්නවුන් අපට හමුවන්නේ මෙන්න මේ ප්‍රවනතාව තුළ "සුදු අක්කා", "සාවිත්‍රීගේ රාත්‍රිය" වැනි චිත්‍රපට ගොනු කෙරෙන්නේ මේ රාමුව තුළ. නෝනාහාමිට ප්‍රතිවිරුද්ධව සාවිත්‍රිලා සහ සුදු අක්කලා අපට හදි ගැහෙන්නේ මේ අප්‍රබුද්ධ ආකෘතිය ඇතුලේ.

මේ බෙදිල්ල තව දුරටත් වලංගු ද කියලයි අපි හොයල බලන්න ඕනෑ. මේ ප්‍රබුද්ධ හා අප්‍රබුද්ධ බෙදිල්ල තුළ සම්මත ඒකාධිකාරී දුගදක් තිබෙන බවයි දන්නම තිතෙන්නේ. "බලා ඉන්ඩ බෑ! දිගත් වැඩියි!! තේරෙන්නැනෙ!!! "බවදූක" බලන අය කියන්නේ මෙවැනි කතා. "සුදු අක්කා" බලන අයත් එසේක කතා කියනවා. "එන්ඩ එක මරු නේද. කොහොම ද සනෝජා, මරු ෆිගර් එක. ෆයිට් තිබුණනං ෂෝක්..." ඔන්න ඔය වගේ කතා. ප්‍රබුද්ධ විචාරකයින්ගේ කතා සහා අප්‍රබුද්ධ රසිකයින්ගේ කතා අතරත් වෙනසක් තිබෙනව. ධර්මසිරි බණ්ඩාරනායක, ශේකර් කපූර්, මිල්ටන් ජයවර්ධන හා සමන්ත තිලවතුර පිළිවෙලින් "බවදූක", "බැන්ඩිට් ක්වීන්", "සුදු අක්කා" සහ "සාවිත්‍රීගේ රාත්‍රිය" යන චිත්‍රපටවල අධ්‍යක්ෂවරු. සම්මත ඒකාධිපති බෙදිල්ලට අනුවනම් මේගොල්ලො ප්‍රබුද්ධ හා අප්‍රබුද්ධ කියල බෙදන්න පුළුවන්, ඉතා පහසුවෙන්ම. මේ බෙදිල්ල සම්ප්‍රදායික මතධාරීන්ගේ "හිතුවක්කාර, ඔලමොට්ටල බෙදිල්ලක්. "බවදූක" නොබලන තරුණයින් හා "බැන්ඩිට් ක්වීන්" නොබලන බහුතර ප්‍රේක්ෂක පිරිස "සුදු අක්කා" හෝ "සාවිත්‍රී" වෙත නැඹුරුවීම මේ සම්මත විචාරකයින්ට රුස්සන්නේ නෑ. වෙළඳ සමාජයක් තුළ කලාකෘතියත් වෙළඳ භාණ්ඩයක්. "බවදූක", "සාවිත්‍රීගේ රාත්‍රිය", "බ්ලෙන්ඩින්ස්", "සුදු අක්කා", "බැන්ඩිට් ක්වීන්" මේ කොයි චිත්‍රපටයත් වෙළඳ භාණ්ඩයක්. අපි මේ කොයි චිත්‍රපටය නරඹන්නෙත් සල්ලි ගෙවලයි. අවසානයේ කලාකෘතිය ජනතාවට අලෙවි කෙරෙනවා. වාණිජවාදී සමාජයක් තුළ මෙක ප්‍රදුමයට කාරණාවක් නෙවෙයි. කොහොමත් මේ වාණිජවාදී හැඩරුව තුළ සමාජයත් කලාවත් අතර පවතින්නේ කිසියම් අවිනිශ්චිත, සැනෙකින් වටහාගත නොහැකි දුරස්ථ භාවයක්. කලාව හා සමාජය අතර වන අන්තර් සබඳතා තක්සේරු කරන්නට නව විචාර මිනුම් දඬු ඕනෑ කරන්නෙත් මේ නිසයි. බහුතර ප්‍රේක්ෂක පිරිසක්, විශේෂයෙන්ම යෞවන පරම්පරාවේ බහුතරයක් "ස්වර්ණා" හෝ "නෝනාහාමි" ප්‍රතික්ෂේප කොට "සනෝජා" හෝ "සුදු අක්කා" වැළඳ ගැනීම දෙසත් අපි විචාරක්ෂියකින් බලන්න ඕනෑ. සම්ප්‍රදායික මතදාරීන් හා සම්මත විචාරකයින් වගේ විවෘත ආර්ථිකයටවත්, නූතන තාක්ෂණයට බලවේගයන්ටවත් දොස් තබමින් හිටියාට වලක් නෑ. මේ දෝෂාරෝපන තුළින් ඉස්මතු කෙරෙන්නේ නව විචාරක්ෂියක අවශ්‍යතාවක්.

"බවදූක" හෝ "සුදු අක්කා" යන චිත්‍රපට දෙක සම්භාවයද? කලාත්මකද? වානිජද? ජීවං ද? ගොළද ද? ප්‍රබුද්ධ ද

අප්‍රබුද්ධද කියල නොසොයා වෙනත් කෙදිල්ලක්, වෙනිං ලේබලයක් හොයාගත්තොත් නරකද? "බවදූත" හෝ "සුදු අක්කා" එහෙමත් නැත්නං "බැන්ඩිට් ක්වීන්" හෝ "ලෝෆර්" නරඹා සිනමා හලෙන් පිටතට චිත්‍රපටය තවමත් නොබැලූ තම හිතවතකුට ඒ ගැන පවසන සරලම, සංක්ෂිප්තම ක්‍රමය මොකක්ද? චිත්‍රපටය "හොඳයි" එහෙමත් නැත්නම් "නරකයි". චිත්‍රපටයක් "හොඳ" හෝ "නරක" විදියට වර්ග කරන්න බැරිද? ජනප්‍රිය චිත්‍රපට අතරේත් "හොඳ" සහ "නරක" චිත්‍රපට තිබෙනවා. ජනප්‍රිය රැල්ලෙත් "හොඳ" සහ "නරක" සිනමා කරුවන් සිටිනවා. ඒ වගේම කලාත්මක හෝ සම්භාව්‍ය ලේබලයෙන් අප වෙත සපැමිණෙන "විශිෂ්ඨ" මට්ටමේ චිත්‍රපටවලත් හොඳ වගේම නරක චිත්‍රපටත් තිබෙනවා. ලාංකීය ජනප්‍රිය සිනමාව තුළ වර්ග කෙරෙන චිත්‍රපට කිහිපයක් ගනිමු. "සජ්ජනකතා", "රත්තරන් මිනිහෙක්", "මායා", "ආත්මා", "මිහිදුම් සිහින", "හිතහොඳ චන්ඩියා", "සුදු අක්කා", "ඇගේ වෛරය", "සාවිත්‍රිගේ රාත්‍රිය", "වියරු ගැහැණියක්"......... මේ චිත්‍රපට නැරඹූ කෙනෙකුට "හොඳ" සහ "නරක" කියන විදියට මේ චිත්‍රපට කිහිපය වර්ග කරන්න බැරිද? මේ වර්ග කිරීමට අදාලව ඒ ඒ රසිකයා තුළ විවිධ වූ හේතු සාධක තිබෙනවා. එක් එක් රසිකයාගේ රසිකත්වය මතයි මේ හේතු සාධක පෙළ ගැහෙන්නේ.

කලාත්මක බව හා ජනප්‍රිය බව එකිනෙකට ප්‍රතිවිරෝධීයි. ඒත් ජනප්‍රිය රැල්ලේ යම් යම් සුවිශේෂතා කලාත්මක බවිනුත් පරිපූර්ණ වූ සංධිස්ථාන එමටයි. විජය කුමාරණතුංග ජනප්‍රිය රැල්ලේ නිමැවුමක්. ඔහු "කැඩපතක ඡායා" චිත්‍රපටයට එක්කළ රංගනය කලාත්මකයි, විශිෂ්ඨයි. බ්‍රෙෂ්ට් වැනි ලෝප්‍රකට නාට්‍ය කරුවෙක් පොදු ජනතාව ඉලක්ක කරගෙන කළ විශිෂ්ඨ මට්ටමේ නාට්‍ය බෙහෙවින් ජනප්‍රිය වුණා. ජෝතිපාලගේ ඇතැම් ගීතවල අපූර්ව ගැඹුරක් තියෙනවා. අතුල අධිකාරිගේ "විසිරුණු මල් පෙති" කියන ගීතය හෝ නාමල් උඩුගමගේ "බැස යන සඳ" වැනි ගීත තුදෙක් ජනප්‍රිය කෝදුවෙන් පමණක් මනින එක සාධාරණ නැ. ශේක්ස්පියර්, චාලි චැප්ලින්, ඇල්ෆ්‍රඩ් හිච්කොක් වැනි ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණකරුවන්ගේ නිර්මාණ බෙහෙවින් කලාත්මකයි. ඒ වගේම ජනප්‍රියයි. දන් හිතෙනව ජනප්‍රියභාවයයි කලාත්මක භාවයයි එකිනෙක මත යැපෙන, අන්‍යෝන්‍ය සබඳතා දක්වන සංකල්පයක් කියල. අපේ සිනමාවේ එච්. ඩී. ප්‍රේමරත්න වැනි සිනමාකරුවන් සජ්ජනකතා වැනි චිත්‍රපට හරහා ලාංකීය ජනප්‍රිය සිනමාවට කිසියම් විදග්ධ මුහුණුවරක් ඇදීමට උත්සාහ කළෙත් මේ හැඩරුව තුළයි. සුදු අක්කා, සාවිත්‍රිගේ රාත්‍රිය වැනි චිත්‍රපටයක ජනප්‍රිය භාවය පමණක් විභාග කිරීම ප්‍රමාණවත් නැ. මේ චිත්‍රපටවල පවත්නා සිනමාරූපී ගුණය, කලාත්මක ගුණය ආදියත් මැන කිරා බලන්න ඕනැ. විදග්ධ ජනප්‍රිය සිනමාවකට ඉඩකඩ සැලසෙන්නේ එවැනි අනුබලයන්ගෙනුයි.

ජනප්‍රිය සිනමා සංස්කෘතිය විව්‍යාත ආර්ථිකයේ නිමැවුමක් බවයි ඇතැමුන් පවසන්නේ. මූල්‍යමය තරඟකාරීත්වය ඔස්සේ තාක්ෂණයත්, අනුකාරවාදීබවත් සමාජ ගත වෙනවා. වේග රිද්මය, සරල භාවාතිශය වින්දනය, විදග්ධයින් හා ඔවුන්ගේ නිර්මාණ දඬිසේ හෙලා දකීම වානිජ සංස්කෘතියේ ව්‍යාප්තවීමට සමපාතව හටගත් තවත් බලවේගයන්. අපි නරඹන බොහෝ ජනප්‍රිය රැල්ලේ සිංහල චිත්‍රපට හින්දි හෝ බටහිර සිනමාවේ "ෆොටෝ කොපි", "සාවිත්‍රිගේ රාත්‍රිය" නරඹද්දී අපට මතක් වෙන්නෙ මීට කලකට ඉහතදී අපි නැරඹූ ක්‍රිස්ටල් හාට්" කියන චිත්‍රපටිය. රූපවාහිනී චැනල කිහිපයකින් ආලින්දයටම පැමිණෙන හින්දි චිත්‍රපට නරඹන රසිකයෝ දන් ආයාසයෙන් වෙනමම දිනයක්, වෙලාවක් ශ්‍රමය හා මුදල් විය හියදම් කරගෙන කොපි චිත්‍රපට බලන්න යන්නෙ නැ. සිංහල ජනප්‍රිය සිනමාව


සුදු අක්කා

"නන්නත්තාර" වෙන්නෙ ඔන්න ඔහොමයි. ජීවන් කුමාරතුංග නටනවාට වැඩිය හොඳට සලමන්බාන් නටනවා. සබීතා පෙරේරාට වැඩිය හද සසල කරවන තරමට මධුරි ඩික්සිත් සහ ජූහී චව්ලා අඩනවා. ජැකී ෂෙරොෆ්, ආර්නෝල්ඩ්, ස්ටැලෝන් වැනි නූතන සිනමා රසිකයින් අදහන වීරයින් ඇවිත් අපේ සිනමාවේ රොබින් ප්‍රනාන්දු, විල්සන් කරු, ටෙඩී විද්‍යාලංකාර වැන්නන්ගේ සිංහාසනවල හරිබරි ගැහිල ඉඳගෙන.

ජනප්‍රිය සිනමාව රසික බුද්ධියට නිගා කරනවයු. අපේ සංස්කෘතික අනන්‍යතා විනාශ කරනවයු. ප්‍රබුද්ධයින්ට හා ඔවුන්ගේ නිර්මාණවලට අපහාස කරනවයු. මේ කතාවල ඇත්තක් තියෙනවද. නැත්තෙම නැ. කොහොමත් ජනප්‍රිය ශිල්පීන්ට අනන්‍යතාවක් නැති බව සුලබව පෙනෙන දෙයක්. රත්ජන් රාමනායක, විජය කුමාරණතුංග කෙනෙක් වෙන්න දඟලනවා. "විජයග්‍රහණය" කියල මෑතකදී නැරඹූ ජනප්‍රිය චිත්‍රපටයේ රහපූ සහන් විජේසිංහත් විජය වෙන්න දඟලනවා. ප්‍රියංකර පෙරේරා, සතිස් පෙරේරා, අමිත් වල්පොල, ඉෂාක් බෙග්, රනිල් මල්ලවආරච්චි වැනි නූතන ජනප්‍රිය සංගීත සංස්කෘතියෝ "තරු" වලටත් අනන්‍යතාවක් නැතිබවයි පෙනෙන්නේ. "සුදු අක්කා" චිත්‍රපටයේ සංජය ලීලාරත්නගේ රංගනයත්, සාවිත්‍රිගේ රාත්‍රිය චිත්‍රපටයේ රාසි අන්වර්ගේ රඟපෑමත් කැපී පෙනෙන රංගන සම්මාදමක් නොවන්නෙත් ජනප්‍රිය සිනමා සංස්කෘතියෝ සුලභ අනුකරණවාදී ගති ස්වභාවය මත. ඒත් පුලාන් දේවිය ලෙස රඟන සීමා බිස්වාස් සහ ජේදුරු ලෙස රඟන ජැක්සන් ඇන්තනී අපූර්ව රංගන අනන්‍යතාවන් මතු කරනවා. සංජය ලීලාරත්නට හෝ රාසි අන්වර්ට ලැබෙන ඉහල ජනප්‍රියත්වය තාවකාලිකයි. මේ නිසාම ඔවුන්ගේ පැවැත්මත් තාවකාලික වෙන්න පුළුවන්. මේක සාහසික නිගමනයක්ය සංජය හරි රාසි අන්වර් හරි කිව්වොත් මට අභියෝග කරන්න පුළුවන් ජනප්‍රිය සිනමා සංස්කෘතියේ මූලධර්ම ඇසුරෙන් මේ පූර්ව අර්ථකථනය අනාගතයේදී සාධනය කරන බවට. ජැක්සන් ඇන්තනීට හෝ සීමා බිස්වාස්ට ලැබෙන ජනප්‍රියත්වය අභිබවමින් ස්වකීය රංගන ශක්‍යතාවන් මතු කරන්නට ඔවුන් වෑයම් කරන බව පෙනෙනවා. විදග්ධ ජනප්‍රියභාවයේ සර්වකාලීන වටිනාකමට ජැක්සන් සහ සීමා නිදර්ශන විදියට තැකිය හැකියි.

කොහොමත් උසස් රසිකත්වයක් විශිෂ්ඨ මට්ටමේ රසඥතා මට්ටමක් අත්පත් කර ගන්නට සාමාන්‍ය බහුතර රසික සමූහයා උත්සාහ කරන්නේ නැ. අප්‍රබුද්ධ රසිකයින්ට ප්‍රබුද්ධ වෙස් මුහුණක් පැළඳ වීම ඵලක් නැති ක්‍රියාවක්. බහුතර ප්‍රේක්ෂකාගාරයේ රසඥතා මට්ටම එකම ඉහළ තලයකට ගෙන ඒමත් නිෂ්ඵල වෑයමක්. පොදු සිනමා ප්‍රේක්ෂකාගාරයේ විවිධ මට්ටම්වල, එකිනෙකට වෙනස් වූ තල මත පවතින රසිකත්වයන්ට ප්‍රජාතන්ත්‍රීය ලෙස සහ ජීවනයෙන් පැවැතීමට ඉඩ සැලසීමයි කළ යුතු වන්නේ. ඒකාධිපති ස්වරූපය වෙනුවට එවැනි ප්‍රජාතන්ත්‍රීය පරිසරයක් නූතන සිනමා ප්‍රේක්ෂකාගාරය තුළ වැපිරිය යුතු බවයි ප්‍රගතිශීලීන්ගෙ මතය. එකිනෙකාගේ තෝරා ගැනීමේ පරාසය එකිනෙකට වෙනස් වන බැවින් "බවදූත" ට ලැබෙන විචාරක අවධානයම සාවිත්‍රිට සහ සුදු අක්කාටත් ලැබීම සාධාරණ ප්‍රජාතන්ත්‍රීය අනුබලයක්. ජනප්‍රිය සිනමාව අද්‍යතන සිනමාව තුළ ඉල්ලා සිටින නව විචාර මිනුම් දණ්ඩ නිර්මාණය විය යුතු වන්නෙත් මෙකී අනුබලයේ සානුභාවයෙන්මයි.

අජිත් ගලප්පත්ති

කලාත්මක බව හා ජනප්‍රිය බව එකිනෙකට ප්‍රතිවිරෝධීයි. ඒ ජනප්‍රිය රැල්ලේ යම් යම් සුවිශේෂතා කලාත්මක බවිනුත් පරිපූර්ණ වූ සන්ධිස්ථාන එමටයි.


# සිසිවන චුවන හැ ඩි ම් ටේ නුවණ

"Women" නිසන වචනය සහ රූපය සිතුම් පැතුම් හා ආකල්ප වලට බලපෑම් කිරීමට සමත් වචනයක් ලෙසයි මාධ්‍ය ලෝකයේ සැලකෙන්නේ. ඇතමුන්ගේ මතය වන්නේ රූපවාහිනිය ගෘහස්ථ (Domestic) සහ විචිත්‍රාද්භූත (Romantic) මාධ්‍යයක් ලෙස ගොඩනැගීමට බලපෑ ප්‍රධානතම හේතුව ගෙදර දොරේ වැඩ වේලාවක් සිටින කාන්තාවන් උදෙසා වැඩ සටහන් ඉලක්කව පැවතීමයි. විශේෂයෙන් බ්‍රිතාන්‍ය, ඇමරිකාව වැනි රටවල ගෘහ සේවක සේවිකාවන් දෛනික කාලයෙන් වැඩි කොටසක් රූපවාහිනිය ඉදිරියේ ගෙවන බව තහවුරු වී ඇත.

කාන්තා නිමිකම් පිළිබඳ ප්‍රදෙශ්තීන්හි ගුවන් විදුලි හා රූපවාහිනී සඳහා මෛථුනය (Sex) තහනම්. එහෙත් පුවත්පත් සම්බන්ධවයෙන් මෙය තරමක් වෙනස්. එයට හේතුව ඉලක්ක පාඨකයින් සඳහා පුවත්පත් මාධ්‍ය භාවිත කළ හැකි වීමයි.

කාන්තාව හා මාධ්‍ය සම්බන්ධ ජාත්‍යන්තර අවධානය වඩාත් යොමුවූයේ 1982 පැරිසියේ පැවති "කාන්තාව හා ජනමාධ්‍ය" යන සමුළුවේදී. බොහෝ පර්යේෂකයින්ද මෙම මාතෘකාව පිළිබඳ අධ්‍යයනය කරමින් සිටී.

පොදුවේ ජනමාධ්‍ය වල කාන්තාව ආකාර දෙකකින් දක්නට ලැබේ. පළමු වැන්න ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ කාන්තාව අඩුවෙන් රැකියාවල යෙදී සිටින බවයි. දෙවැන්න එහෙත් ස්ත්‍රී ප්‍රතිරූපය ජනමාධ්‍යවල බෙහෙවින් දකිය හැකි වීමයි. ඇතැම් මාධ්‍යවල කාන්තාවන් සේවය කළ ද තීරක මට්ටමේ රැකියාවල නියුතු ප්‍රතිශතය ඉතා අඩු ය. එබැවින් මුළු ලොවම ජනමාධ්‍ය පාලනය පුරුෂාධිපත්‍යයට යටවී ඇත. මෙය දියුණු හා දියුණු වෙමින් පවත්නා සියලු රටවල පොදුවේ දක්නට ලැබෙන්නක්.



මැක්බ්‍රයිඩ් (MacBride) කොමිසම පෙන්වා දෙන්නේ ක්ෂණික හෝ ඉතා වැදගත් සිදුවීමකදී හෝ දේශපාලනික සිදුවීමක දී වැඩියෙන් පුරුෂ පුවත්පත් කලාවේදීන් ක්‍රියාකාරී වන බවයි. ප්‍රධාන පුවත්පත් මාධ්‍යවල කතුවරියන් හා පුවත්පත් ආයතන අධ්‍යක්ෂිකාවන් දක්නට ඇත්තේ කලාතුරකින් බවයි බටහිර රටවල අත්දැකීම වන්නේ.

ඇමරිකාවේ සිනමා කර්මාන්තයේ නියැලෙන චිත්‍රපට අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව තුන්දාහක් පමණ වෙනවා. ඒ අතරින් කාන්තාවන් සිටින්නේ 23 දෙනෙකි. විශාල වශයෙන් නිෂ්පාදන කටයුතු වල සහ සහාය කටයුතුවල ඔවුන් නිරතව සිටී. එහෙත් වැදගත් තීරණ ගන්නේ පිරිමි.

## තීරක මට්ටමේ රැකියාවල කාන්තා සේවා වියුක්තිය

ස්වාධීන මාධ්‍ය ආයතනවල තත්ත්වයත් මීකයි. බ්‍රිතාන්‍යයේ පුරුෂයින්ට වැඩියෙන් පක්ෂපාතීවන අතර සුදු ජාතික පිරිමින්ගේ ආධිපත්‍යය බෙහෙවින් දකිය හැකිය. ටන්ස්ටෝල් (Tunstall) නැමති විශේෂඥයාට අනුව රැකියා සහ විශේෂ අත්කම් වැනි නිර්මාණ කාර්යයන්හි දීත් කාන්තාවගේ අධ්‍යාපනය හා පුහුණු හැකියා පිරිමියාට වඩා අඩුය.

රූපවාහිනිය හා පුවත්පත් කාන්තා ප්‍රතිරූපය විකෘති කිරීම ගැන චෝදනා ලැබිය යුතුයි. බුද්ධි මාධ්‍යයනට අනුව කාන්තාව ස්ත්‍රී ලිංගික භාණ්ඩයකි. එසේම වෙනස් නොවන චරිතයකි. නිශේධනීය ප්‍රතිරූපයකි. (Negative Image) මෙම අපරාධයෙන් ප්‍රධාන චූදිතයා වන්නේ වෙළඳ දැන්වීම් කරුවායි.

මැක්බ්‍රයිඩ් කොමිසන් වාර්තාවලට අනුව ස්ත්‍රිය, පොදු ජනතාවගේ ආකල්ප මත නිර්වචනය වෙයි. එම ආකල්ප හැඩ ගැසීමට බලපාන්නේ මාධ්‍යයන්ය. ඉන්දියාවේ චිත්‍රපටවල රඟපෑම සඳහා චරිතාංග ලෙසට කාන්තාවන් 46 තෝරා ගත්තා. ඉන් 12 ක් පමණයි වෙනත් රැකියාවක නිරත වෙලා හිටියෙ. ඉන් 9 දෙනෙක් සාම්ප්‍රදායික කාන්තාවන්ගේ රැකියා කළ අය. මැක්බ්‍රයිඩ් කොමිසම මෙවැන්නක්ද පවසයි. කාන්තාවන් හා සම්බන්ධ වැදගත් සිදුවීම් පිළිබඳ ජන මාධ්‍ය යොමු කරන අවධානය ද අඩුයි.

පුවත්පත් සඟරා ආදියෙහි ලියැවෙන ප්‍රබන්ධ හා රූපවාහිනී ගුවන්විදුලි නාට්‍ය, චිත්‍රපට වැනි සටහන් යනාදියේ කාන්තාවගේ ලක්ෂණ බෙදා දක්විය හැකියි. බොහෝ කාන්තා චරිත පිරිමියාට යටත්ව සිටී. එසේම මුද්දර නිසයි. මිත්‍යා විශ්වාස දරයි. අධික ලෙස හැඟීම් බරව හැසිරේ. විශේෂයෙන් වෙළඳ දැන්වීම්වල ගෙදර වැඩ පල කරගෙන සිටින, බාහිර රූපය කාමුක හැඟීම් දනවන ලෙස නිරූපනය වෙයි. පාර්ශ්වෝගික භාණ්ඩ


වඩාත් සිත් ගන්නා සුළු කිරීමට කාන්තාව අත්‍යවශ්‍යම වන තවත් භාණ්ඩයකි, ප්‍රතිරූපයකි.

අධ්‍යයන වලින් හෙළිවන කරුණුවලට අනුව ජනමාධ්‍ය වල ස්ත්‍රිය නිරූපනය වෙලා තියෙන්නෙ ස්ත්‍රිය පිළිබඳ සමාජයේ ඇති සාම්ප්‍රදායික අදහස් ප්‍රතික්ෂේප කිරීමට සවිලත ලෙස නොවෙයි. ඒවා වඩාත් හොඳින් තහවුරු වන ලෙසයි. ඇතැම් විට කාන්තාවට බලපාන අයුක්තිය අසාධාරණය පැහැදිලි නොරුණත් ඒවා ප්‍රතික්ෂේප කිරීමට නොපෙළඹේ. චිරස්ථායිව සම්ප්‍රදායික ගැහැණිය වතුලෙස ආරක්ෂා කෙරේ.

ගුවන් විදුලියට වඩා රූපවාහිනියයි කාන්තා ප්‍රතිරූපයට බලපෑම් කරන්නේ. වැඩසටහන්වලත්, වෙළඳ දැන්වීම් වලත් කාන්තාව විචිත්‍ර, කාමුක වර්ගයකි. ඉන්දියාවේ කාන්තා සංවිධාන පෙන්වා දෙන්නේ රූපවාහිනී වැඩසටහන්වල කාන්තාවගේ කාර්ය භාරය මධ්‍යම පංතික කාන්තාවන්ගේ දෘෂ්ටියෙන් පෙන්නුම් කෙරෙන බවයි. කෘෂිකාර්මික ශ්‍රම බලකායෙන් 36% කාන්තාවන් නියෝජනය කරන ඉන්දියාවේ, මාධ්‍යවල කාන්තාව නිරූපනය වෙන්නෙ කිසිදා නිෂ්පාදනයකට දායක නොවන, වඩාත් ගෘහ සේවයෙහි නියුතු කැනැත්තියන් ලෙසයි. ඇතැම් විට කාන්තාව සැරසිලි සහිත උත්සවවල නටන කළඹනක්. ඉන්දියාවේ සංස්කෘතික වෙනස්කම් කාන්තාවට බලපාන බවක් මාධ්‍යවලින් නොපෙනේ. ගැහැණිය සතු ස්ථානය ගෘහයයි. ඇයගේ අගය කළ හැකි වස්තුව භෞතික රූප කායයි. කාන්තාව සතු ශක්තිය හා දැනුම යෙදිය යුත්තේ ගැලපෙන පුරුෂයෙකු සොයා ගැනීමට සහ ඔහු තමන් ළඟම රඳවා ගැනීම පිණිසයි. ගැහැනිය පරාධීනය, ලජ්ජාශීලිය, අවනතය, නිහරුය. හොඳ ගැහැණිය නම් සාම්ප්‍රදායිකත්වය අගය කරන ගැහැණියයි. දිගු කාලීනව වේදනා දරයි. භක්තිමත් ය. ධාර්මිෂ්ටය.

තම අයිතිවාසිකම් ගැන සොයන, කතාකරන, ස්වාධීනත්වය සොයන කාන්තාව ප්‍රිය නුපදයි. ඇයගෙන් තමන්ටත් අන් අයටත් සතුටක් ගෙන දිය නොහැකිය. ගැහැණිය ගේ පරම සතුරා ගැහැණියමය.

ඉන්දියාවේ ජොෂි ක්‍රියාකාරී කණ්ඩායාමට අනුව කාන්තාවගේ වටිනාකම අතීතයේ සිට හැඩ ගැසෙන්නකි. ගැහැණිය ස්වභාවයෙන්ම ඉවසිලිවන්තය. ඇගේ සියලුම ගුණාංග හුරු පුරුදු කරන්නේ අනාගත බිරිඳක්, මවක් ලෙස හැඩ ගැන්වීමටයි. රූපවාහිනී ළමා වැඩසටහන්වලින් අනිවාර්යයෙන්ම වටිනා කම් අගය කෙරේ. ලිංගික පීඩනය විනාශ කර දැමිය යුතුයි. මෙම කොමිසම රූපවාහිනී වෙළඳ දැන්වීම් කමිටුවක් මගින් සියුම් ලෙස නිරීක්ෂණය කළ යුතු බව පෙන්වා දෙයි. ස්ත්‍රී ප්‍රතිරූපයට අවමන් වන ලෙස වෙළඳ දැන්වීම් සකස්විය යුතු බවද ඔවුන් පැහැදිලි කරයි.



කාන්තාව ගැන ප්‍රතිරූප ගොඩ නැගීමට එකම හේතුව මාධ්‍ය නොවේ. මාධ්‍ය තුළින් ද ඒ සඳහා ප්‍රතිකාර කළ හැකිය. සයිඩා බානු (Saida Banu) ලක්නව්වල සමස්ත ඉන්දීය ගුවන් විදුලි සේවයේ (AIR) ප්‍රථම කාන්තා නිවේදිකාවයි. ඇය 1940 මුල් භාගයේ සිට ළමා වැඩසටහන් කළා. එකාලේ ඇයට විරුද්ධව චෝදනා නැගුණා. ඇය අශික්ෂිත රැකියාවකට ගිය බවයි. බොහෝ අය පැවසුවේ ඇගේ පවුලෙහුත් ඇයට චෝදනා නැගුණා. නරක ගැහැණියෙකු වූ බව ට ඇය රැකියාවට ගිය මුල්ම දවසෙ ඇගේ පවුලෙ අය ගීත ගයන ගැහු එක්ක සම්බන්ධතා පවත්වන්න එම රජ්ජාවට ගියා කියලා හොඳටම බනින්න පටන් අරන්. ඇය දෙමව්පියන්ට මෙහෙම බොරුවක් කොහලා. විශේෂිය ගායිකාවන් ගුවන් විදුලියට ඇතුළු වෙන්නෙ වෙනම දොරකින්, ඉතින් එම දොර ඇය පාවිච්චි කරන්නෑ කියන එකයි ඒ බොරුව.

රූපවාහිනිය සම්බන්ධව අධ්‍යයනය කළ කැනඩාවේ ටොරොන්ටෝ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ඇලිස් ඊ. කර්ටිනි සහ තෝමස් ඩබ්ලිව් විල්ල් පවසන්නේ රූපවාහිනී වෙළඳ දැන්වීම්වල කාන්තාවන් සහ පිරිමින් සමාන ලෙස දකිය හැකි බව. William J. O. Donnell සහ Karen S. O. Donnell පවසන්නෙ රූපවාහිනී වෙළඳ දැන්වීම්වල පිරිමියා දෘශ්‍යමාන නිෂ්පාදන (Visible Products) වල. ඒ කියන්නෙ නිවසින් පරිබාහිර නිෂ්පාදන සඳහා යොදා ගනු ලබන වර්ගයක්. කාන්තාව ගෘහස්ථ නිෂ්පාදන (Domestic Products) සඳහා වැඩිවශයෙන් යොදා ගැනේ. විශේෂයෙන් නිවස කාන්තාවගේ ආධිපත්‍යය බව අවධාරණය කෙරේ. ඇය කතා කරන බොහෝ දේ මොට්ට (Stupid) නොපත්ථල් (Naive) ප්‍රලාප (gossipy) හැඟීම්බර (emotional) පැමිණෙන දේ විඳින (Passive) විකෘති (Confused) අපේක්ෂාවෙන් හෝ සංවේගයෙන් සිටින (Concerned) කියවන (wordy) නීරස (insipid) ලෙස දක්වෙයි.

මුද්‍රිත මාධ්‍යයට

කාන්තාව

ස්ත්‍රී ලිංගික භාණ්ඩයකි.

ශුනෙස්කෝවද මේ පිළිබඳ අධ්‍යයනය කර තියෙනවා. ඔවුන් පවසන්නේ මාධ්‍යවලට පෙනී සිටින කාන්තාව ඇය පිළිබඳව සමාජයෙන් විග්‍රහයක්, නිර්වචනයක් ඉල්ලා සිටී. සාම්ප්‍රදායික වෙනස් නොවන ගති සඳහා උනන්දු කරවයි. ජනයා පිට තව හැසිරීම පටවයි. ගැලපෙන හැසිරීම පෙන්වා දෙයි. පිළිගත යුතු සහ නොයුතු දේ දනවයි.

ජනමාධ්‍ය ප්‍රවෘත්තිවල කාන්තාව දෙවන පංතියේ මනුෂ්‍යයෙකි. ඔවුන් වටා ගෙතෙන ප්‍රවෘත්ති සුපුරුදු ඒවා වේ. සිල් ප්‍රදර්ශන, අත්කම්, කොණ්ඩා මෝස්තර, ඉවුම් පිහුම් හා ඇඳුම් මෝස්තර යනාදියි.

ලෝකයේ ජනප්‍රිය ඇමරිකා සඟරාවල කාන්තාව අත්‍යාවශ්‍ය රූපයකි. එසේම ඇය නිරර්ථක සහ නිෂ්ඵල ලද වර්ගයකි. Playboy, Ladies, Home Journal යනාදිය කාන්තාවගේ ඡායාරූප භාවිත කරන්නේ අනුන් සන්තර්පනය කිරීමට සියල්ල කැපකළ පෙනී සිටින්නියක් ලෙසිනි.

මේ සියල්ල අතර පෙනෙන කරුණකි කාන්තාවගේ ප්‍රතිරූපය විනාශ කර ගැනීමටත්, සාම්ප්‍රදායිකත්වයෙන් මිදුනු නොවීමටත් ඇය ද හේතුවී ඇති බවක්. බොහෝ කාන්තාවන් රූමත් ලෙස හා අවිනිරුවන් ලෙස පෙනී සිටීමටත්, කැමැත්ත දක්වයි. විශේෂයෙන් කාන්තා කර්තෘත්වය දරන කාන්තා ප්‍රකාශනවලත්, කාන්තා වැඩසටහන්වලට ඇය වඩාත් කතා කරනුයේ විචිත්‍රාදඥක ලෝකයක් පිළිබඳව ඉවුම් පිහුම්, මැහුම් ගෙතුම් කරන හැටි පිළිබඳව, හැඩ වැඩ වෙන හැටි පිළිබඳව. ඇය මුහුණ දෙන ඛේදවාචකය කතා කරන්නෙ අතලොස්සක්.

ආචාර්ය ආරියරත්න ඇතුගල

# සීමාසහිත සණස සංවර්ධන බැංකුව

106, ධර්මපාල මාවත, කොළඹ 07.
දුරකථන: 01-686385, 075-330823

## සීමාසහිත සණස සංවර්ධන බැංකුවේ දර්ශනය

දුප්පත්කම පිටුදැකීමටත්, සමාජ සාධාරණත්වය සාක්ෂාත් කිරීමටත්, විශේෂ අවධානය යොමුකරමින් සංවර්ධනයෙන් හා සමුපකාර ප්‍රතිපත්තිවලට නැඹුරු වූ මූල්‍ය සේවාවන් මගින් මහජනයාගේ ආදායම් හා රැකියා මට්ටම් වර්ධනය කිරීම

## සීමාසහිත සණස සංවර්ධන බැංකුවේ සාරධර්ම

1. ගනුදෙනු කරුවන් ද, කොටස් හිමියන්ද, තරගයට එලඹ සිටින්නන්ද සමග ගනුදෙනුවලදී බැංකුවේ හා එහි ශාඛාවන්වල සියළුම මට්ටම්වලදී සාදාචාරාත්මක යයි සම්මතවූ තත්ත්වයන් වර්ධනය කිරීමට හා ඒවා ඒ තත්ත්වයෙන්ම පවත්වා ගැනීම.
2. මූල්‍ය සේවාවන් සැපයීමෙහිලා නවක්‍රම සම්පාදනයටත් හා ඉල්ලුම් තත්ත්වය අනුව කටයුතු කිරීම.
3. සැම වෙළෙඳ ගනුදෙනුවලදීම ආචාරශීලීව ද වෘත්තීය ක්‍රියාදාමයෙන් ද ක්‍රියාකිරීම.
4. ආගම, ලිංග භේදය, ජාති භේදය, සමාජ තත්ත්වය හා භාෂාව පිළිබඳව වෙනස්ව නොසැලකීම.
5. මූල්‍ය සේවාවන්හි යෙදීමේදී අයහපත් වූද, නීතියට පටහැනි වූද ක්‍රියාකාරකම්වලින්ද වැළකීම.

# ගෑස්, බෑස් සහ ජෑස්

## ආ ට ක
## නා ක
## වේප යුංගම්



19 සියවස අගභාගයේ සහ 20 සියවස මුල්භාගයේ කාර්මික සහ තාක්‍ෂණික භාවිතයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ජනප්‍රියත්වයේ සීමාවන් සුදුරාගිය අතර කෘතිකව සහ සීඝ්‍රයෙන් ලොව පුරා ව්‍යාප්ත වූ නව සන්නිවේදන මාධ්‍යයන්ගේ බිහිවීම සමඟ කලාවේ සම්ප්‍රදායික ස්වරූප මෙන්ම සෞන්දර්ය විද්‍යාත්මක දෘෂ්ටීන් මුළුමනින්ම විපර්යාසයකට භාජනය විය. කලාවක් මෙන්ම කර්මාන්තයක් වන සිනමාව එහි ආරම්භයේ සිට ම ස්වකීය මාධ්‍ය ස්වභාවයේ පොහොසත්කම් අනුව ජනයා විශාල වශයෙන් ආකර්ෂණය කර ගනිමින් අනෙක් කලා මාධ්‍යයන්ගේ අනන්‍ය පැවැත්මට "තර්ජනාත්මක" ලෙස අභියෝග කොළේය. ළමා, තරුණ, මහලු සියල්ලන් එකවර තෘප්තිමත් කිරීමේ හැකියාව සහිත වූ එම කෘතීන්ගේ ජනප්‍රියත්වය කාලයේ සීමාවන් ඉක්මවූ අතර අද පවා ඒවා රසවිඳීමට මිනිසුන් කැමැත්තක් දක්වති. සැබැවින්ම, ජනප්‍රියභාවය සහ කලාත්මකභාවය ප්‍රතිවිරෝධාත්මක ලෙස "ප්‍රවා දක්වන" මිණුම් දඬු, චැප්ලින් වැනි සිල්පීන්ගේ ප්‍රතිභාව මගින් "මර්දනවන්" බවට පත්වූ බව පෙනේ.

මෙසේ, එක් අතකින්, සිනමාව මාධ්‍යයක් වශයෙන් රසිකයන් විශාල ප්‍රමාණයක් ආකර්ෂණයට ගන්නා අතරම අනෙක් අතින්, ජනප්‍රිය ලකුණුවලින් පොහොසත් "මියුසික් හෝල්", "ජෑස්", "කැබරේ", "සර්කස්", "නැටීස්" වැනි ප්‍රසංග රංග ශාලා සහ සමාජ ශාලා මස්සේ පැතිරෙන්නට විය. ඒවා යුරෝපයේ සහ ඇමෙරිකාවේ ප්‍රබල භාවිතයන් බවට පත්වන අතර සංස්කෘතික හැඩගැස්මේ නව ප්‍රවණතා ඒවා තුළින් ප්‍රකට විය. එ මෙන්ම ප්‍රේක්‍ෂකයා තමා වෙත රඳවා ගැනීමේ හෝ ආකර්ෂණය කර ගැනීමේ නව ස්වරූප ගොඩනැංවීමේ විධික්‍රම සංවර්ධනය කිරීමට භාවිතකරුවන් පෙළඹුණු අතර සංකල්පමය සහ භාවිතමය වශයෙන් විවිධාකාරත්වයෙන් පොහොසත් සෞන්දර්ය ව්‍යවහාර රාශියක් අත්හන්තර දීමට එම ගැටුමණ සමත් විය.



මාධ්‍යයක් වශයෙන් රූපවාහිනියේ ව්‍යාප්තිය සමඟ ජනප්‍රියත්වයේ නව ස්වරූප රාශියක් ප්‍රකට කෙරුණ ස්වභාවයෙන්, විසිරී සිටින අති විශාල මිනිස් සමූහයාගේ විවිධ වින්දන අවශ්‍යතා තෘප්තිමත් කිරීමේ හැකියාවෙන් එය පොහොසත් ය. සිනමාව වැනි මාධ්‍යයන්ගේ ජනප්‍රියත්වයට පවා ප්‍රබල ලෙස අභියෝග කරන රූපවාහිනිය තුළින් නව ජනප්‍රිය භාවිතයන් නිරන්තරයෙන් හඳුන්වාදෙනු ලැබේ. එක් අතකින්, සිනමාශාලාවලට නොගොස් විඩියෝ මාධ්‍යයෙන් සිනමා කෘති නැවත නැවත නැරඹීමට බොහෝ දෙනා පුරුදු වී සිටින අතර අනෙක් අතින් ටෙලි සිනමාව මගින් ජනප්‍රිය භාවිතයක් බවට පත්ව තිබේ. "සෝප් ඔපේරා" නමින් හැඳින්වෙන ඇඳුම් විලාසිතා "ප්‍රසංග" රූපවාහිනී ප්‍රේක්‍ෂකයන් අතර බොහෝ සෙයින් ජනප්‍රිය ය. "වාසන්", "ඩ මංකේ" වැනි කෘතීන් රූපවාහිනී මාධ්‍යය මස්සේ අතර මෙන්ම වැඩිහිටියන් අතර ද වඩාත් ජනප්‍රියත්වයට පත්ව ඇත. ඇතැම් සංගීත කණ්ඩායම් පවා හොඳුණු කතා ඇසුරින්, කළ සිනමා නිර්මාණවල ගීත ප්‍රසංගිකව ඉදිරිපත් කිරීම සිදු වූ අවස්ථා තිබුනද ගීතවල ප්‍රසංගික ස්වරූප රූපවාහිනී මාධ්‍යය මස්සේ වර්ධනය වූ බව පෙනේ. (ගීත ප්‍රසංගිකව ඉදිරිපත් කිරීම "මියුසික් හෝල්", "කැබරේ" වැනි ප්‍රවණතාවලද වූ ස්වරූපයකි.) එනම්, "පොප්" ගීතවල ජනප්‍රියත්වය එහි දෘශ්‍යමය රටා සංකල්පය මත රඳාපවතින ස්වභාවයක් ප්‍රකට විමයි. අනෙක් අතට, "ජනප්‍රියත්වය" ආරූඪ කරමින් ජනප්‍රියත්වයක් ලබාදීමේ විශේෂ හැකියාවක් රූපවාහිනී මාධ්‍යයට තිබේ. එනම්, යම්කට ජනප්‍රියභාවයක් තිබෙන බව ඔවා පෙන්වමින් අනුකරණයෙන් එය පිළිගැනීමට පෙළඹවීමේ ශක්‍යතාවයක් රූපවාහිනී මාධ්‍යයට තිබෙන බවයි. එමෙන්ම මල්ලවපොර වැනි ක්‍රීඩාවලට ප්‍රසංගික

වට්නාකමක් "ව්‍යාජයෙන්" ආරූඪ කිරීම අනුව ප්‍රේක්ෂකයන් අතර ජනප්‍රිය අංග බවට ඒවා පත්ව තිබේ. විද්‍යුත් ශ්‍රව්‍ය-දෘශ්‍ය භාවිතයක් මෙන්ම මුලික වශයෙන් ජනමාධ්‍ය ස්වරූපයෙන් වනුභගත රූපවාහිනියට මනුෂ්‍යයාගේ දෛනික සන්නිවේදන මෙන්ම රසවින්දන අවශ්‍යතා රාශියක් එකවිට තෘප්තිමත් කිරීමට ඇති හැකියාව අනුව එය ජනප්‍රියත්වය අතින් පොහොසත්ම මාධ්‍යය බවට පත්වී තිබෙන බව අවිවාදයෙන් පිළිගත හැකිය.

ජනප්‍රිය කලාව නැත්නම් කලාවේ "ජනප්‍රියත්වය" යන ස්වභාවයන් ඓතිහාසික වශයෙන් විකාශනය වෙමින් විවිධ සහ සංකීර්ණ ස්වරූප ඔස්සේ හැඩ ගැසෙන ආකාරය පිළිබඳව සෞන්දර්යවිද්‍යාත්මකව යම් හෝ අවබෝධයක් අපට ලැබිය හැකිය.

1950 ගණන්වල සිට ඇමෙරිකාවේ සහ යුරෝපයේ හට ගෙන ව්‍යාප්ත වූ "පොප්" යනුවෙන් සුවිශේෂ අර්ථයකින් හඳුනාගන්නා නූතන ප්‍රවණතා පවතී. "ජෑස්" යනුවෙන් හැඳින්වෙන සංගීත විශේෂය විසිවන සියවස මුල් භාගයේ වන විටත් බෙහෙවින් ජනප්‍රියත්වයට පත්ව තිබූ අතර 1950 ගනන්වල ඇමෙරිකාවේ සහ යුරෝපයේ විවිධ මාධ්‍යවල ජනප්‍රිය හෝ විරෝධාකල්ප නිර්මාණකරුවන් විසින් ලැබූ උත්තේජනය අනුව මෙම "පොප්" ප්‍රවණතාවයේ මූලයක් "ජෑස්" වෙත බලපා ඇති බව පෙනේ. එමෙන්ම විවිධ සංකල්ප සහ ස්වරූප වෙනස්කම් සහිතව 1950 දශකය වන විටත් "ජෑස්" විශේෂය වර්ධනය වෙමින් තිබුණි.

මෙසේ, "ජෑස්" සංගීතයේ හෝ බොබ්මාලි ප්‍රමුඛ කන්ඩායමේ "රෙගේ" සංගීතයේ සිට "රොක්" සංගීතය දක්වාත් "ඇබා", "බොනියම්" සංගීත කන්ඩායම්වල සිට නානා මෞස්තොච්රි දක්වාත් එල්විස් ප්‍රෙස්ලිගේ සිට මැඩෝනා සහ මයිකල් ජැක්සන් දක්වාත් විකාශනය වූ පෙරළිකාරී ප්‍රසාංගික සංගීත ප්‍රවණතාවය මෙම "පොප්" ගණයට අයත්වන සේ හඳුනාගැනීම නිවැරදිය. ප්‍රසාංගික සංගීත ස්වරූප හැරුණු විට අනෙකුත් කලා මාධ්‍යයන්ට ද "පොප්" බලපෑම විහිදුනු අතර ශරීරය මුල් කොටගත් ක්‍රියාව මත පදනම් වූ "බොඩි ආට්" වැනි ප්‍රවණතා මේ හා ඉතා සමීප සම්බන්ධයකින් යුක්ත වූ බව හැඟේ. මෙම "පොප්" ප්‍රවණතාවයේ සුවිශේෂ ස්වභාවයක් ලෙස හඳුනාගත හැක්කේ එහි විරෝධාකල්ප මුහුණුවරයි. මනුෂ්‍ය ජීවිතයේ නව ස්වරූප සහ අවශ්‍යතාවලට ගැළපෙන අත්විඳීමක් ගොඩනැංවීම සඳහා අතිශයින් සංකීර්ණ පරිසරයක් තුළ ක්‍රියාත්මක වූ නිර්මාණකරුවන් ස්වකීය නිර්මාණ ක්‍රියාකරන්නට විය.

**"පොප්" ප්‍රවණතාවයේ සුවිශේෂ ස්වභාවයක් ලෙස හඳුනාගත හැක්කේ එහි විරෝධාකල්ප මුහුණුවරයි.**

ජෑස් වලදී වාදකයන් ඒ ඒ වාදක භාන්ඩ එක් එක් වාදක භාණ්ඩ වලින් වාදනය වන තාල වලට සහ හඬ ප්‍රමාණයන්ට ප්‍රතිවිරුද්ධ ලෙස වාදනය කරනු ලබන අතර ඒ මත නව සංගීතමය ඒකත්වයක් ගොඩනැගේ. "ජෑස්" කලු ඇමෙරිකානු ජාතිකයන්ගෙන් ප්‍රභවය වුවකි. ස්වකීය නිර්මාණ ක්‍රියාව ජැමෙයිකාවේ නිදහස් අරගලය සමඟ සම්බන්ධ කිරීම බොබ්මාලි ප්‍රමුඛ කණ්ඩායමෙන් ("බොබ්මාලි ඇන්ඩ් ද වේලර්ස්") සිදුවූ අතර ඔවුන්ගේ "රෙගේ" සංගීත රටාව කලු ජාතිකයන්ගේ නිදහස පිළිබඳ තේමා වාදනයක් බවට පත්විය. වර්තමාන "රොක්" සංගීතය ලබා ගන්නා මුල් ආභාෂයක් "රෙගේ" සංගීතයේ තිබෙන බව ඇතැම් විට පිළිගැනේ. විරෝධාකල්ප මුහුණුවර සෑම විටම "පොප්" නිර්මාණකරුවන්ගේ තේමාවන් හෝ වස්තු තුළ ප්‍රකට නොවන අතර ඇතැම් විට ඒවා ඔවුන්ගේ විධික්‍රම හෝ භාවිතයන් තුළ ප්‍රකට වේ.



විශාල ජනසමූහයා අතර ගොඩනැඟී තිබෙන එල්විස් ප්‍රෙස්ලිගේ, මැඩෝනාගේ, මයිකල් ජැක්සන්ගේ දවැන්ත ප්‍රතිරූපවල පදනමෙහි එම නිර්මාණකරුවන්ගේ ප්‍රතිභාව ප්‍රකට වන බව පිළිගැනීම සාධාරණය. "රොක්" සංගීතය තුළ විවිධ ප්‍රභේද හැඩ ගැසෙමින් තිබෙන අතර ඒවා සංකල්පමය සහ විධික්‍රම අතින් විවිධාකාරත්වයක් පෙන්නුම් කරයි. "පොප්" සංගීතයට අනුව සාමූහිකව නටන "ඩිස්කෝ" සහ "බ්‍රේක් ඩාන්ස්" වැනි ජනප්‍රිය ❂ "පොප්" ප්‍රවණතාවයේම අංගයන් වේ.

රසත් කොඩිකාර

THE COMMUNICATOR

මාධ්‍යකරුවන්

අත්තනෝමතික ලෙස

කෙනෙකුගේ

පෞද්ගලිකත්වයට

හානි පමුණුවන

අවස්ථා කොතෙකුත්

දැකගත හැකියි.

පුවත්පත් ලෝකයේ

මෙය වඩාත් කැපී පෙනේ.

නොවැදගත්වන චරිතයක් හෝ

සිද්ධියක් අතිශයෝක්තියට

නැංවීමත්, ව්‍යාජ තොරතුරු

අපූර්වත්වයට පත්කොට

ග්‍රාහක සිත් මත් කිරීමත්

සිදු කෙරේ.